# මනුෂ්‍යත්වය සහ සංවර්ධනය

## සංවර්ධනය යළි-පරිකල්පනය කිරීම ගැන පාසැල් රචනා සහ සිතුවම්



cepa
centre for poverty analysis

# මනුෂ්‍යත්වය සහ සංවර්ධනය

## සංවර්ධනය යළි-පරිකල්පනය කිරීම ගැන පාසැල් රචනා සහ සිතුවම්

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ (CEPA) ප්‍රකාශනයකි

2015 සැප්තැම්බර්

Think Tank Initiative අනුග්‍රහයෙනි

© දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය 2015
පළමු වන මුද්‍රණය - 2015

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සූචිකරණ දත්ත

මනුෂ්‍යත්වය සහ සංවර්ධනය : සංවර්ධනය යළි-පරිකල්පනය කිරීම ගැන පාසැල් රචනා සහ සිතුවම්. - කොළඹ : දරිද්‍රතා විශ්ලේෂන කේන්ද්‍රය, 2015
පි. 102: රූප සටහන් ; සෙ.මී 21

ISBN 978-955-1040-92-5

i. 338.95493 ඩිව් 23

1. ආර්ථික සංවර්ධනය - ශ්‍රී ලංකාව
2. ආර්ථික සංවර්ධනය - රචනා

මෙම ප්‍රකාශනයේ ප්‍රකාශන හිමිකම දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය සතු ය. මෙම පොතේ යම් කොටසක් ප්‍රතිනිෂ්පාදනය කරන්නේ නම් ඊට පෙර කතුවරයාගෙන් සහ ප්‍රකාශකයාගෙන් නිසි අවසරය ලබා ගත යුතු වේ.

CEPA ප්‍රකාශන මාලාව මේ වන විට අධ්‍යයනයන්ගෙන්, සංස්කරණය කරන ලද වෙළුම්වලින්, කාර්ය පත්‍රිකාවලින් හා සංක්ෂිප්ත ලියවිලිවලින් සමන්විත වේ. මෙම අධ්‍යයනයෙහි ලා ප්‍රකාශිත අර්ථ නිරූපණ හා නිගමන ඒ ඒ කතුවරයාගේ වන අතර, CEPA ආයතනයේ හෝ ප්‍රකාශන අනුග්‍රාහකයන්ගේ දැක්මවල් හෝ ප්‍රතිපත්ති නියෝජනය නො කරයි.

මෙම ප්‍රකාශනයෙහිලා යොදා ගෙන ඇති ඡායාරූපවල අයිතිය CEPA කාර්ය මණ්ඩලය සතු ය.

ISBN: 978-955-1040-92-5

මෙම ප්‍රකාශනය පිළිබඳ සියලු විමසීම් පහත සම්බන්ධතා වෙත යොමු කළ යුතු යඃ

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය
29, ආර්.ජී. සේනානායක මාවත,
කොළඹ 7
ශ්‍රී ලංකාව
දුරඃ +94(011) 4690200, 2676955
විද්‍යුත් තැපැලඃ info@cepa.lk
වෙබ් අඩවියඃ www.cepa.lk

**චන්ද්‍රගුප්ත තේනුවර** ශ්‍රී ලංකා සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි. ඔහු ප්‍රවීණ චිත්‍ර ශිල්පියෙක් සහ කලා විචාරකයෙක් වේ.

**කේ. කේ. සමන් කුමාර** ප්‍රකට ලේඛකයෙක් සහ කවියෙකි. ඔහු සාහිත්‍ය විචාරකයෙක් ද වේ.

**දිල්ෂාන් බෝඅංග** නිදහස් මාධ්‍යවේදියෙකි. ඔහු Sunday Observer පුවත්පතට කලා විචාර ලබා දීමෙන් දායක වේ. ඊට අමතරව ඔහු ලේඛකයෙක් සහ කවියෙක් ද වේ.

**දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA)** දරිද්‍රතාව ආශ්‍රිත සංවර්ධන ගැටලු පිළිබඳව වඩා යහපත් අවබෝධයක් ඇති කිරීමෙහි නිරත ස්වාධීන, ශ්‍රී ලාංකික බුද්ධිමය සාමූහිකයකි. දරිද්‍රතාව යනු ජය ගත යුතු අසාධාරණයක් බවත්, දරිද්‍රතාව පරාජය කළ හැකි වන්නේ ජාතිකව සහ ජාත්‍යන්තරව ප්‍රතිපත්ති සහ පරිචයන් වෙනස් කිරීමෙන් දරිද්‍රතාවට පත්ව සිටින ජනයා සමග එක්ව වැඩ කිරීමෙන් බවත් CEPA විශ්වාස කරයි. ආයතනයේ දී අපගේ අවධානය යොමු වන්නේ ස්වාධීන විශ්ලේෂණ සම්පාදනය, සංවර්ධන ක්‍රියාකාරකයන්ගේ හැකියාවන් ගොඩ නැගීම හා ප්‍රතිපත්තිමය බලපෑම් සඳහා අවස්ථාවන් සොයා ගැනීම කෙරෙහි ය. අප පෙලඹී සිටින්නේ වෙළඳ පොළ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දක්වන අතරතුර තර්කානුකූල අනුභූතික සාක්ෂි මත පදනම්ව සේවා සැපයීමේ ප්‍රබල නැඹුරුවකිනි. CEPA ආයතනය, සේවා දායකයන්ගේ ඉල්ලීම් මාර්ගයෙන් මෙම වෙළඳ පොළ නැඹුරුව පවත්වා ගෙන යන අතරතුර, ඊට සමාන්තරව පුළුල් තේමාත්මක ක්ෂේත්‍ර පහක් පදනම් කර ගෙන ස්වාධීන පර්යේෂණ න්‍යාය පත්‍රයක් සපුරා ගැනීමට උත්සාහ කරයිඃ එනම්, පශ්චාත් ගැටුම් සංවර්ධනය, ගොදුරු වීමට ඇති ඉඩ, සංක්‍රමණය, යටිතල පහසුකම් හා පරිසරය යි. අවසන් වශයෙන් ගත් කල CEPA පරිශ්‍රම දරන්නේ ජාතික, කලාපීය, ආංශික, වැඩසටහන් හා ව්‍යාපෘති මට්ටම්වල දී දරිද්‍රතාව ආශ්‍රිත සංවර්ධන ප්‍රතිපත්ති කෙරෙහි බලපෑම් කිරීම සඳහා දායක වීමට ය.

# ස්තූතිය

මෙම ප්‍රකාශනය එළි දුටුවේ බොහෝ දෙනාගේ දායකත්වයේ ප්‍රතිඵලයක් ලෙසය.

Reimagining Development (සංවර්ධනය යළි-පරිකල්පනය කිරීම) වැඩසටහනට නායකත්වය දුන් ආචාර්ය වගීෂා ගුණසේකරට විශේෂ ස්තූතියක් හිමිවේ. මෙම ප්‍රකාශනය සඳහා විචාර සැපයීමෙන් දායකවූ ප්‍රවීණ ලේඛක කේ. කේ සමන් කුමාරටද, ප්‍රවීණ චිත්‍ර ශිල්පී, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චන්ද්‍රගුප්ත තේනුවරටද නිදහස් මාධ්‍යවේදී දිල්ෂාන් බෝඅංගටද අපි කෘතඥපූර්වක වන්නෙමු. ප්‍රකාශනයට අදාළ පරිවර්තන කටයුතු සිදු කළ අනුර හෙට්ටිආරච්චිටද අපගේ ස්තූතිය හිමිවේ.

තරඟයේ කටයුතු සම්බන්ධීකරණය කළ චාලිකා සසිකානිට ද, ඇයට සහයෝගය දැක්වූ තාහිරා කාදර් හටද තුති. ප්‍රකාශනය සංස්කරණය කළ ධනුක බණ්ඩාරද, ප්‍රකාශනයේ වැඩකටයුතු මෙහෙයවූ චතුරංගා වීරසේරකරද ස්තූති පූර්වකව සිහි කරන්නෙමු.

අනුග්‍රහය Think Tank Initiative.

# පෙරවදන

සංවර්ධනය සහ මනුස්සකම යන තේමාව යටතේ දරිද්‍රතා විශ්ලේශණ කේන්ද්‍රය විසින් පවත්වන්නට යෙදුනු පාසල් රචනා තරඟයේ අවසන් වටයට තේරුණු රචනාවන් මෙසේ කළඑළි දැක්වීම එයට සහභාගී වූ අනාගත ලේඛක ලේඛිකාවන් දිරිගන්වන්නක් වනු නොඅනුමානය.

වර්තමානයේ අප ඉදිරියේ පවත්නා අභියෝගාත්මක ගැටළුවක් සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමත්, ඒ විසඳීම කෙරේ අනාගත පරපුරේ චින්තනමය දායකත්වය උරගා බැලීමත් මෙම තරඟයේ අභිප්‍රාය විණි.

එහිදී සංවර්ධනය යනු හුදු භෞතික හෝ ආර්ථික සංවර්ධනය පමණක් නොවේය, සංස්කෘතික, ආකල්පමය මෙන්ම අධ්‍යාත්මික පාර්ශ්වයක්ද එහි වන බව පිළිබඳව මේ අංකුර ලේඛක ලේඛිකාවන් දැනුවත්භාවයකින් යුතු වීම සැළකිය යුතු කරුණකි. හුදු ආර්ථික දියුණුව හා ඒ සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් කෙරේ පමණක් සැළකිල්ල දැක්වීම ප්‍රමාණවත් නොවන බවද, එම සංවර්ධන ක්‍රියාවලිය තිරසර සංවර්ධනයක් වියයුතු බවද බොහෝ දෙනා අවධාරණය කරනු ලැබ තිබිණි.

ජනවිඥණය තුළ සංවර්ධනය වශයෙන් පවත්නේ පාරවල්, පාලම්, ජලාශ, වැව්, ගංගා හැරවීම්, වේලි මෙන්ම ගොඩනැගිලි යනාදියයි. මේ සියල්ල මිනිස් ජීවිතය සඳහා යටිතල පහසුකම් වේ. කෘෂිකර්මය, කර්මාන්ත, වෙළඳම, අධ්‍යාපනය මෙන්ම සංචලනය සඳහා ඇති යටිතල පහසුකම්ය. ඒ අතින් මේ සියල්ල මිනිසාගේ භෞතික දියුණුවට අත්‍යාවශ්‍ය කාරණාය. භෞතික දියුණුව මිනිසාගේ සංස්කෘතික හා අධ්‍යාත්මික දියුණුවට අත්‍යාවශ්‍ය කාරණයක් වන බැවින් මේ ඒ සඳහාද යටිතල පහසුකම් සැපයීමක් වේ.

මෙම රචනාවන්හි අසමාන සංවර්ධනයෙන් පීඩාවිඳින අප වැනි රටක වන සමාජවිෂමතාවන් පිළිබඳ ආකල්පමය වශයෙන් අවධානය පහළ තලයක පැවතුනද, තිරසර නොවන සංවර්ධනයේ ප්‍රතිවිපාක, අතුරුඵල පිළිබඳ බොහෝ දෙනා අවධානය දක්වා තිබිණි. එහිදී පාරිසරික කාරණා ප්‍රමුඛ විය. පරිසර විනාශය සහ එහි පාලනය කළ නොහැකි ප්‍රතිවිපාක සියළුම රචනාවන් තුළ අවධාරණයට ලක්ව ඇත.

අප රට තුළ සංවර්ධන කතිකාව එදා පටන් කොට ගොඩ නැගී තිබෙන්නේම ආණ්ඩු පෙරළි හා ජන්ද පොරොන්දු මත හෙයින් ජන විඥණය තුළද එම අධ්‍යාත්මික හෝ සංස්කෘතික සංවර්ධනය යන්න කාවැදී නොමැත. අනෙක් අතින් අධ්‍යාත්මික සංවර්ධනය ගැන කතා කරන ආගමික නියෝජිතයන් ප්‍රායෝගික ජීවිතයට හෝ සංවර්ධන කතිකාවට අදාලව නොව ඒ මිනිස් ස්වභාවය හෝ ගුණවගාවට ආවේණික පාරභෞතික කාරණාවක් බවට ධ්‍රැවීකරණය කොට ඇත. එයින් අධ්‍යාත්මික සංවර්ධනයත් භෞතික සංවර්ධනයත් යනු ද්විත්ව විභේදනයන් බවට පත් කොට ඇත.

මෙම රචනා තුළ දෙවනුව සදචාරාත්මක හා අධ්‍යාත්මික වශයෙන් වන පරිහානිය පිළිබඳ කාරණාව ඉස්මතු වනු දකිත හැකිය. මිනිස්කම, දයාව, කරුණාව වැනි ගුණාංග දිනෙන් දින පිරිහීම පිළිබඳ විවිධාකර නිදසුන් යොදා ගනිමින්, විවිධ ප්‍රවෘත්ති උපුටා දක්වමින් අවධාරණය කිරීමට මේ අංකුර ලේඛක ලේඛිකාවන් උත්සුක වී තිබේ.

පොදුවේ සළකා බලන විට මෙම රචනාවන්ගේ දකිත හැකි මූලික දුර්වලතාවන් අතර

- තම ස්වාධීන, ස්වායත්ත දැක්මකට වඩා රජය, ජනමාධ්‍ය, පාසල හා ආගමික ආයතනවල මතවාදය යළි යළි පුනරුච්චාරණය කිරීම
- සංවර්ධනය පිළිබඳ රජය විසින් ස්ථාපිත කොට ඇති මතවාදය වැඩි වශයෙන් පිළිගනිමින් එයට ඌන පූරණයන් එක් කිරීම
- රැවුලත් කැඳත් දෙකම ඕනෑය යන අකාරයෙන් නූතන තාක්ෂණයේ ආශ්චර්යයත්, පරිසරය රැකගැනීමත් ගැන යෝජනා කළද ඒ අරභයා ප්‍රායෝගික, තිරසර දැක්මක් නොමැතිවීම
- ආකල්පමය වශයෙන් ඇති සීමාවන් මත ඇතිවන අතීතකාමී ස්වභාවය
- යළි යා නොහැකි පැරණි රජදවස වන්දනා කරමින්, එම සමාජයේ පැවති පීඩාකාරී මෙන්ම මනුෂ්‍යත්වයට තරම් නොවන වැඩවසම් ලක්ෂණ නොතකා හැරීම
- සංකීර්ණ අවශ්‍යතාවන්ගෙන් හෙබි සංකීර්ණ සමාජයකට නොගැලපෙන අතීත විසඳුම් ගෙන ඒම
- අධ්‍යාත්මික සංවර්ධනය පිළිබඳ කාරණයේදී දැඩි ආගමික හා සදචාරවාදී වීම
- සමාජයක සංවර්ධනය ප්‍රජාතන්ත්‍රවාදය, නෛතික ප්‍රතිපාදන, විනිවිදභාවය, වගවීම යනාදී වශයෙන් සිදුවන සංවර්ධනයක් හා ඒ මත පදනම් වන ආකල්පමය පරිවර්තනයක් වෙනුවට අතීතය, ආගම හා සදචාරවාදී බව ඔස්සේ ඉස්මතු කිරීම
- සංවර්ධනය මගින් සමාජයේ වෙනත් ජාතීන්, ජනකණ්ඩායම්, ස්ත්‍රිය හා ළමුන්, සමාජයේ අනතුරාසන්නභාවයට ලක්ව සිටින වෙනත් ස්ථර සම්බන්ධයෙන් හා ඔවුන්ගේ ජීවිතවල ඇති කළ යුතු පරිවර්තනයන් පිළිබඳ දැක්මක් නොමැති වීමෙන් පවත්නා අසමාන සංවර්ධනයත්, ධූරාවලියත්, පුරුෂ මූලිකත්වයත් විනිවිද නොදැකීම
- ජාතිකෝන්මාදී ආකාරයට බටහිර හා වෙනත් දියුණු රටවල් අධ්‍යාත්මික වශයෙන් පිරිහුණු රටවල් ලෙස අරුත් ගන්වමින් ව්‍යාජ දේශභිමානී ස්වරූපයක් ඉස්මතු කිරීම
- පොදුවේ මිනිස්කම, අධ්‍යාත්මික හා ආත්මීය දියුණුව සමාජක්‍රමයේ, නෛතික පද්ධතියේ, සමාජයේ ව්‍යුහමය හා ආකල්පමය වෙනස්කම් මත සිදුවන්නක් ලෙස නොව විද්‍යාත්මක නොවන හුදු ආගමික හෝ විඥාණවාදී ආකාරයකින් දැකීම

ඉහත දුර්වලතා සැබැවින්ම මෙම දරුදැරියන්ගේ මතවාදය පිළිබඳව පමණක් නොව රටක් වශයෙන් සංවර්ධනය පිළිබඳ අපගේ කතිකාව පවතින පසුගාමී තත්වය පිළිබඳ දර්ශකයකි. සංවර්ධනය පිළිබඳ නැවත සිතීමේදී සමාජයක සංවර්ධනය සමාජයේ ව්‍යුහාත්මක හා ආකල්පමය වෙනස්කම් නොතකා හරිමින් කළ නොහැකිය. එතැනදී සමාජයක් තිරසර ලෙස සංවර්ධනය කිරීමට වඩාත්ම අහිතකර ලෙස බලපාන්නේ පසුගාමී ආකල්පයන් හා ප්‍රතිසංස්කරණවලට ඇති හුඹස් බියයි.

තාක්ෂණ විරෝධය සේම අතීතකාමය මගින් අතිශය පටුතැනකට සංවර්ධනය ගෙනයයි. එනම් අධ්‍යාත්මික යටිතල පහසුකම්වන ආකල්පමය, සංස්කෘතිකමය හා ව්‍යුහාත්මක යාවත්කාලීන කිරීම් වෙනුවට ආගමික වචනහරඹ, අලංකාරයන් හා සුලභවැකි ඇදබැම් තුළ වෙළඳපලමය තාක්ෂණ විභූතිය පමණක් ඉස්මතු වෙයි. මේ වෙළඳපල මතවාදයේ ඌනපූරණය වන්නේ පදනම් විරහිත මතවාදයන් හා ආගමිකත්වයයි. කොල්ලකාරී වෙළඳපලට මෙන්ම යාවත්කාලීන නොවූ මතවාදයන්ටද සමාජමය ප්‍රතිසංස්කරණ, ආකල්පමය වෙනස්කම් හා ව්‍යුහමය වෙනස්කම් අවශ්‍ය නොවේ.

අතීත කාමය තුළ ඉතිහාසය සම්බන්ධ බොහෝ ආකල්පයන්හි දක්නට හැක්කේ නූතන ඉතිහාසවේදය හෝ පුරාවිද්‍යාව විසින් මෑතකාලීනව කරන ලද සොයාගැනීම් කිසිවක් නොවේ. කොටින්ම පණ්ඩුකාභය රජුගේ පෞර රාජ්‍යය තුළ පැවති බහුත්වවාදී, ප්‍රජාතාන්ත්‍රික ලක්ෂණ හෝ අනුරාධපුර මුල්යුගයේ පැවති ජාත්‍යන්තර වෙළඳ සංස්කෘතිය හා සමාජ ව්‍යුහය පිළිබඳ යාවත්කාලීන වීම් කිසිත් අධ්‍යාපනය හෝ මතවාදය තුළට කාන්දුවී නොමැති තරම්ය. එසේ වී නම් සංවර්ධනය යනු පරිසරය සමග සුසංවාදී තිරසර සම්බන්ධතාවක් පමණක් නොව සමාජයේ සියලු වෙනස්කම් ගැබ්කොට ගත්තක් බව මෙන්ම, සමාජය ප්‍රතිව්‍යුහගත කිරීම හෝ නව ආකල්පමය වෙනසක් අවශ්‍ය බව සියල්ලන් වටහා ගනු ඇත. නාගරිකත්වය කෙරේ වන කුහක විරෝධය හා ගම වර්ණනා කිරීමද මෙහිම ඵලයකි.

මෙම මතවාදී සීමාවන් අප රටේ සංවර්ධන කතිකාව, මාධ්‍ය, අධ්‍යාපනය සහ ආගමික කතිකාවන් විසින් පවත්වා ගෙන යනු ලබන්නකි. මූලික ගැටළුව ඉන් බැහැර වෙනත් ඇසකින්, කෝණයකින් ස්වාධීන ලෙස දකින්නට අසමත්වීමයි. සැබැවින්ම සිරස් සිතීමත් මිස තිරස් (lateral) සිතීමක්, කියවීමක් නැති වීමයි.

අනෙක් අතින් රචනා ශෛලීන් අතින් වුවද දක්නට ලැබෙන ප්‍රවේශය පාර්ලිමේන්තු කතා, රූපවාහිනී වාද, පුවත්පත්වල භාවාතිශය ආවේගකාරී අදහස් දැක්වීම්, ආගමික දේශනා, දේශාභිමානී කතාන්දර ආදියේ එකතුවක් මිස බුද්ධිමය ප්‍රවේශයක් නොවේ. කොටින්ම පවත්නා තැනින් සංවර්ධන කතිකාව ඉදිරියට ගෙනයාමක් හෝ සංවර්ධනය පිළිබඳ නැවත සිතීමක් මේ රචනා තුළ දක්නට නොලැබෙන තරම්ය. දශක ගණනාවකට පෙර මෙම මාතෘකාව යටතේ ලියන්නට දෙනු ලැබී නම් මෙවැනිම අදහස් අපට සොයා ගත හැකිවනු ඇත. කාරණය පාරිසරික හා ජනහිතකාමී රටක් පිළිබඳ තම සිහිනය යන්න තමාගේම සිහිනයක් ලෙස ඉදිරිපත් කරන්නට කිසිවකු සමත් නොවීමයි.

සිහිනයක් යනු තව කෙනෙකුට ඒ ආකාරයෙන් දැකිය හැක්කක් නොවේ. බොහෝ දෙනෙකු උපුටා දක්වනු ලැබ ඇති රතු ඉන්දියානු නායක සියැට්ල්ගේ ප්‍රකාශය සඳ අමරණීය වන්නේ මේ සිහිනය ප්‍රකාශ කරන බැවිනි. තමන්ගේ ප්‍රශ්නයක් තමන්ගේ තැනින් ගැනීමකට වඩා මෙම බොහෝ රචනා තුළ දක්නට ලැබෙන්නේ තමන්ට පිටතින් ඇති රටේ ප්‍රශ්නයක් කතා කිරීමකි. ඒ තුළ තමා සොයා ගත නොහැකිය. එවිටම ඒ මගේ සිහිනයක් වන්නේ නොවේ.

රජයේ ප්‍රතිපත්තිය මූලික වශයෙන්ම දල ජාතික නිෂ්පාදිතයේ අනුපාතයන් වැඩි වී නම් වර්ධනයක් වගේම සංවර්ධනයක් අත්පත් කර ගෙන ඇතිය යන්න මත පදනම් වෙයි. එහෙත් රටක පුරවැසියන්ගේ ජීවිතවල යහපැවැත්ම එයින් මනින්නට නොහැකිය. පුරවැසියන්ගේ යහපැවැත්ම හා දල ජාතික නිෂ්පාදිතයෙන් මනින සංවර්ධනය එකක් හැටියට ගත නොහැකිය. එසේ නම් එවන් සංවර්ධනයකින් ඇති ඵලය කුමක්ද වැනි ප්‍රශ්න අහන්න කවුරුවත් උත්සාහ කරලා තිබුණෙ නෑ.

සංවර්ධනය ගැන හිතන්න එකතු වෙන්නෙ ආර්ථික විද්‍යාඥයො විතරක්මද? ආර්ථික විද්‍යාඥයො විතරක් නම් ඒ හිතන සංවර්ධනය මෙච්චර කල් හිතපු එකෙන්, සංඛ්‍යා ලේඛන උඩ පදනම් වෙච්ච සංවර්ධනයෙන් වෙනස් වේවිද? සම්මත අර්ථ ශාස්ත්‍රඥයො පමණක් නොව මේ කතිකාවට විකල්ප ආර්ථික ක්‍රියාධරයින්, ක්ෂුද්‍ර ආර්ථික කටයුතු පිළිබඳ විශේෂඥයින් සහ ක්‍රියාධරයින්ද අවශ්‍යයි.

ඒ විතරක් නෙමෙයි ප්‍රධාන ධාරාවේ වගේම විකල්ප ආර්ථික හා සමාජ විද්‍යාඥයන්, දේශපාලන ක්‍රියාධරයින්, දේශපාලකයන්, කලාකරුවන්, අධ්‍යාපනවේදීන්, සම්මත වගේම විකල්ප වෛද්‍යවරුන්, මනෝ වෛද්‍යවරුන්, ආගමික නායකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන් සියළු දෙනා සංවර්ධනය ගැන ආයිත් හිතනන දයක විය යුතුයි.

සමාජ දේශපාලන හා ආර්ථික පැත්ත ගැන වගේම පුරවැසියන්ගේ යහ පැවැත්ම, ආචාර ධර්ම, වටිනාකම්, කලාව, පරිසරය, නාගරික සංවර්ධනය, ස්ත්‍රිය ... ඒ විතරක් නෙමෙයි ළමුන්, දනුම් ධුරාවලිය වගේ හැම දෙයක්ම සංවර්ධනය කියන කතිකාවෙන් බැහැර කරන්න බෑ.

මේ ගැටළු පිළිබඳව කවුරුවත් ප්‍රශ්න කරන්න උත්සාහ කරලා නෑ. අනිත් එක සංවර්ධනය මනින මිනුම් දණ්ඩක් හැටියට කලාව ගැන, ළමුන්ගේ ස්වාධීනත්වය හෝ ඔවුන්ගේ ජීවන හා මානසික තත්වය ගැන, කාන්තාවන්ගේ නිදහස ආදිය ගැන කවුරුවත් අදහස් දක්වලා තිබුණේම නැති තරම්.

රචනාවල ශෛලිය බොහෝ විට රූපවාහිනී වාද විවාද, පාර්ලිමේන්තු වාද විවාද හා කථික තරඟමය ස්වභාවයක් ගන්නවා. එහිදී සංයත බව වෙනුවට මතුවන්නේ ඕලාරික ස්වභාවයක්.

අනෙක් අතින් රචනාවල ඒකීයත්වයක් වෙනුවට විසිරුණු, හැම අතින්ම කරුණු ගෙන ඕබ්බන ලද ස්වරූපයක් මතු වෙනවා. සැබැවින්ම බොහෝ උපුටා ගැනීම්වලින් කිසිවක් තහවුරු කරනු නොලබයි. ඒවා හුදු අලංකරණයන් පමණක් බවට පත්වේ. උචිතබව මෙන්ම ඒකීය බව වැනසේ.

ප්‍රස්ථාව පිරුළු, වාක්සම්ප්‍රදයයන්, සම්ප්‍රදයික යෙදුම් යොද ගැනීමේදී ඒ යෙදීමෙන් ලේඛනය පොහොසත් වෙතැයි සිතාගෙන ඒ නිරන්තරවමයෙදීමෙන් තේමාව හුදු ශිල්ප හරඹ මගින්, අලංකරණයන්ගෙන් තහවුරු කිරීමක් බවට පත්වේ. එය බුද්ධිමය සිතීම අවහිර කරයි. වරක් පවසන ලද දෙය නැවත පැවසීමේ පුනරුක්ත දෝෂය, එකම දෙය උපමා අලංකරණ, උදහරණ මගින් නැවත නැවත තහවුරු කිරීම බාධාකාරීවේ.

මෙම දුර්වලතාවන් පිළිබඳව මෙම අංකුර ලේඛක ලේඛිකාවන් අවධානය දක්වීම අත්‍යාවශ්‍ය වේ. ලිවීම කෙරේ වන ප්‍රතිභාව, කැපවීම මෙම දරු දැරියන් තුළ නොමඳව දකිත හැකිය. සතතභ්‍යාසය තුළින් අනාගත සමාජයට මංහසර දක්වන ලේඛක ලේඛිකාවන් බවට පත්වීමේදී ආකල්පමය වශයෙන් යාවත්කාලීනවීමත්, විවෘත මනසක් ඇති කර ගැනීමත්, විසංවාදී අදහස් තුළින් තමන්වම ප්‍රශ්න කර ගැනීමත් වැදගත්ය.

එසේම ඒ සියල්ලටමත් වඩා තමන්ගේම ඇසකින් දකින්නට, තමාගේම සිහිනයක් දකින්නට උත්සාහ කිරීම වැදගත්වේ.

**කේ. කේ. සමන් කුමාර**<br>
**ලේඛක, විචාරක**

# හැඳින්වීම

අප සමාජයේ බොහෝ දෙනා සංවර්ධනය අවබෝධ කරගෙන ඇත්තේ, ආර්ථිකමය හා තාක්ෂණික ජව සම්පන්න භාවය ලෙසය. පසුගිය වකවානුව පුරාවටම සංවර්ධනය කියා අප දුටුවේ අධි වේගී මාර්ග, වරාය සහ ගුවන් තොටුපල සහ සුපිරි වෙළඳ සංකීර්ණ ගොඩ නැගීම ආදියයි. දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) "සංවර්ධනය සහ මනුස්සකම" මැයෙන් රචනා තරඟයක් සංවිධානය කරනු ලැබුවේ, සංවර්ධනය පිළිබඳ මෙවන් ජනප්‍රිය සහ අවිචාරශීලි අදහස් නැවත සිතා බැලීමකට ලක් කිරීමටය.

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය මෙම තරඟය සංවිධානය කරනු ලැබුවේ "Reimagining Development" (සංවර්ධනය යලි පරිකල්පනය කිරීම) යන වැඩසටහනට නායකත්වය දුන් ආචාර්ය වගීෂා ගුණසේකරගේ යෝජනාවක් මුල් කර ගෙනය. තරඟයේ ත්‍යාග ප්‍රධානෝත්සවය අවසානයේ, තම ස්තුති කතාව කරමින්  ඇය පවසා සිටියේ මුදලට සහ බලයට එහා ගිය තුන්වෙනි මානයක් අප සංවර්ධනය තුළ දැකිය යුතු බවයි. තවද සමාජය විසින් "සාර්ථකත්වය" සංකල්පකරගත ඇති ආකාරයද ඇය අභියෝගයට ලක් කළාය. සංවර්ධනයේ තුන්වෙනි මානය මානුෂීය ගුණධර්ම සහ අයිතිවාසිකම් කැටිකර ගත්තක් විය යුතුය. සංවර්ධනය පිළිබඳව විචාරශීලිව සිතීමේ වැදගත්කමද ඇය අවධාරණය කළාය.

අමර්ත්‍යා සෙන් විසින් රචිත *සංවර්ධනය නිදහස ලෙස* (*Development as Freedom*) යන කෘතියේ, සංවර්ධනය මානව අයිතිවාසිකම් සහ  නිදහස් අතර ඇති සම්බන්ධතාවය මනාවට පැහැදිලි කර ඇත. ඔහුට අනුව සංවර්ධනය හුදු ආර්ථික සංවර්ධනයකට ලඝු කිරීමට නොහැකිය. මානව නිදහස / අයිතිවාසිකම් සංවර්ධනයේම කොටසක් විය යුතු බව ඔහුගේ තර්කයයි. එමනිසා සැබෑ සංවර්ධනය සංවර්ධනයේ නාමයෙන් මානව අයිතිවාසිකම් පාවා නොදෙන්නක් විය යුතුය. සංවර්ධනය, මානව අයිතිවාසිකම් කැටුව පැමිණිය යුතුය. දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය මගින් ඉහත තරඟය සංවිධානය කරන ලද්දේ සංවර්ධනය සහ අපගේ ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් පිළිබඳ වඩා පුළුල් කතිකාවක් නිර්මාණය කරනු පිණිසය. ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් වලින් වියුක්ත සංවර්ධනය, සැබෑ සංවර්ධනය නොවන වග අපේ අදහසයි.

මෙම එකතුවේ ඇතුලත් රචනා, ඉහත රචනා තරඟයේ අවසන් වටයට තේරුණු ඒවා වේ. සියලුම රචනා, ලේඛකයෙකු සහ විචාරකයෙකු වන දිල්ෂාන් බෝඅංග විසින් විචාරයට ලක් කර ඇත. එම විචාරද, රචනා සමගම මෙම පොත් පිංචේ මුද්‍රණය කර ඇත. මෙම රචනා වල සාධනීය ලක්ෂණ බොහෝ ඇතත්, ඒවා මගින් ප්‍රකාශ වන සමහර දෘෂ්ටිවාදීමය ස්ථාවරයන් අපි ප්‍රශ්න කරමු. රචනා සියල්ලක්ම පාහේ, සංවර්ධනය යනු හුදු ද්‍රව්‍යමය සංවර්ධනය යන ජනප්‍රිය ප්‍රවාදය අභියෝගයට ලක්කරයි. රචනා ප්‍රජාතාන්ත්‍රික අයිතීන් පිළිබඳ  සංවාදයක් ගොඩ නො නැගුවද, සංවර්ධනය සමග අත්වැල් බැඳ ගත යුතු"අධ්‍යාත්මික ගුණ වගාව" බොහෝ රචකයන්ගේ අවධානය ලක් වේ. මින් ගම්‍ය මාන වන්නේ බොහෝ රචකයන් හට සංවර්ධනය පිළිබඳ යම් කිසි විවේචනයක් සහ විචාරාත්මක දැක්මක් ඇති බවයි. රචනා සියල්ලක්ම පාහේ අධික ලෙස මුදල් පසු පස හඹා යෑමට ලෝල්වූ සමකාලීන සමාජය විවේචනයට ලක්කරයි. ඒ නමුත් මෙසේ අධික තෘෂ්ණාව සහ පාරිභෝගික වාදයට උඩ ගෙඩි දෙන, ධනවාදී ආර්ථික මොඩලය විවේචනයට ලක්වීමක් අපට මෙම රචනා තුල දැක ගත නොහැකිය. සමහර රචනාවල සමාජ වටිනාකම්වල, රචකයන්ට අනුව ඇතිවී ඇති ඛාදනය පිළිබඳ කාන්සාවක් සහ ශ්‍රී ලංකාවේ අතීත "ශ්‍රී විභූතිය" අහිමි වීම පිළිබඳ වේදනාවක් ද අන්තර්ගතය. සමාජ වටිනාකම් යනු නිබඳවම වෙනස්වන ගතිකයන් වන අතර අතීත "ශ්‍රී විභූතිය" යන්න බොහෝ විට වර්තමාන දෘෂ්ටිවාදීමය ඕනෑ එපා කම් මත සංකල්ප ගත කර ගන්නා ලද්දකි. මෙවන් කාරණා සම්බන්ධයෙන් වඩාත් විචාරශීලි අවබෝධයක් පාසල් සිසුන් අතර ඇතිවීම වැදගත්ය. රචනාවල දෘෂ්ටිවාදීමය සීමා සහිත භාවය

පිළිබඳ තියුණු විවේචනයක් කේ. කේ. සමන් කුමාරගේ පෙරවදනේ ඇතුලත් වේ.

මෙම රචනා වල අප දකින ප්‍රධාන අඩුවක් නම් "මනුස්සකම" සහ දේශපාලනික අයිතීන් අතර ඇති සම්බන්ධතාවය බොහෝ රචනා තුළින් ප්‍රකට නොවීමය. මනුස්සකම හුදෙක්ම අධ්‍යාත්මික ගුණ වගාවෙන් හෝ ආගමික නැඹුරුවකින් ඇති වනු ඇතැයි සිතිය නොහැක. මනුස්සකම යන්න දේශපාලනිකය. මනුෂ්‍යයන් හට මනුෂ්‍යන් වශයෙන් ජීවත් වීම සඳහා දේශපාලනික සහ ආර්ථිකමය නිදහස අවශ්‍ය වේ. මෙම නිදහස තහවුරු කළ හැක්කේ, ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් හරහාය. ජනතාවට මෙම ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් ලබා දිය යුත්තේ රජය මගින්ය. වර්මාන ශ්‍රී ලාංකික දේශපාලනික කතිකාව තුල ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් පිළිබඳ විශාල උද්යෝගයක් ඇත. මෙය ඉතා සාධනීය සහ ප්‍රගතිශීලි ප්‍රවණතාවයක් බව කිසිදු සැකයක් නැත. නමුත් සංවර්ධනයේ මෙම දේශපාලනික පැතිකඩ රචනා මගින් ග්‍රහණය කර ගෙන ඇති බවක් නොපෙනේ. "මනුස්සකම" සාරධර්ම හා ගුණ දහම් වලින් එහා ගිය දේශපාලනික ප්‍රපංචයකි. මනුස්සකම පිළිබඳ දේශපාලනිකව සිතීමේ වැදගත්කම මෙම රචනා කියවන අපට මනාව පැහැදිලි වේ.

රචනා වලට අමතරව, රචනා තරඟයත් සමඟ සංවිධානය කළ චිත්‍ර තරඟයේ හොඳම චිත්‍ර දහය අතරට තේරුණු නිර්මාණද අප මෙම ප්‍රකාශනයට ඇතුලත් කර ඇත. එම චිත්‍ර පිළිබඳ විචාරයක් අපි ප්‍රවීණ චිත්‍ර ශිල්පී, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චන්ද්‍රගුප්ත තේනුවර සමඟ කළ සාකච්ඡාවක් ඇසුරෙන් සම්පාදනය කර ඇත. ඒ චිත්‍ර සියල්ලක්ම පාහේ අඩුවැඩි වශයෙන් කලාත්මකව සාර්ථක නිර්මාණ වේ. සෑම චිත්‍රයක්ම පාහේ මානුෂීය ගුණධර්ම අගය කරනා අතර, හිංසනය පිටු දකී; සාමූහික ශ්‍රමය නිරූපණය කරයි. එනමුත් බහුතරයක් චිත්‍ර වලින් නිරූපනය වන්නේ, සංවර්ධනය පිළිබඳ ඉතා ඒකාකෘතික අදහස්ය. බොහෝ චිත්‍ර වල සංවර්ධනය සංකේතාත්මක වන්නේ සුපිරි ගොඩනැගිලි, මංමාවත්, ගුවන් යානා සහ චන්ද්‍රිකා යන ආදියෙන්ය. ද්‍රව්‍යමය සංවර්ධයට එහා ගිය සංවර්ධනයක් අපට බොහෝ චිත්‍ර තුළ දැකිය නොහැක.

යම් චිත්‍ර සම්ප්‍රදාය අලංකාරිකයක් ලෙස හුවා දක්වයි. එක් අතකින් මෙම චිත්‍ර වලින් පිළිබිඹු වන්නේ සංවර්ධනය සහ සම්ප්‍රදාය අතර ඇති අර්බුදයයි. සංවර්ධනය, පොරොන්දු වන්නේ නූතනත්වයයි. අප සමාජයක් වශයෙන්, සංවර්ධනය අපේක්ෂා කලත්, සංවර්ධනය සමඟින් නිරන්තරයෙන් වෙනස් වන සමාජ වටිනාකම් දැක කැළඹීමට පත්වේ. මෙය සංස්කෘතික පිරිහීමක් ලෙසද ඇතැමුන් දකී. එම නිසා සමහර චිත්‍රවල සම්ප්‍රදාය සහ නූතනත්වය අතර යුතෝපික මුහුවක් දක්නට ලැබේ. සම්ප්‍රදායේ ඇති නිර්මලත්වය ආරක්ෂා කරගනිමින්, නූතන සංවර්ධිත සමාජයක් බවට පරිවර්තනය වීම, සමහර චිත්‍ර මගින් අනාගතය පිළිබඳ ඉදිරිපත් වන දැක්ම වේ. නමුත් මෙම දැක්ම කොතරම් යථාර්තවාදීද යන්න ගැටලුවකි. චිත්‍ර වල සම්ප්‍රදාය හඟවන සංකේත භාවිතයත්, රචනාවල අතීත ශ්‍රී විභූතිය වර්ණනා කිරීමත් එකම මනෝභාවයේ ප්‍රකාශයනයන් දෙකකි.

ජාතීන් අතර සංහිඳියාව බොහෝ චිත්‍රවල ප්‍රමුඛ තේමාවක් වේ. ඒවායේ සිංහල, දෙමළ සහ මුස්ලිම් යන ජනවර්ග සහජීවනයෙන් වාසය කරන බවක් පෙනේ. ඒ නමුත්, රටේ පවත්නා ජනවාර්ගික ගැටළු පිළිබඳ තියුණු කියවීමක් හෝ ඒවාට ප්‍රතිචාරයක් මෙම චිත්‍ර වල සොයාගැනීමට අසීරුය. තවත් සඳහන් කළ යුතු කාරණයක් නම් ජනවර්ග තුනට අයත් පුද්ගලයන් චිත්‍ර තුල නිරූපණය කර ඇති ආකාරයයි. දෙමළ ගැහැණිය සෑමවිටම නිරූපණය වන්නේ කළු පැහැයිනි. ඇගේ නළලේ පොට්ටුවකි. ඇයට සාපේක්ෂව සිංහල ගැහැණිය තරමක් සුදුය. මෙලෙස ජනවර්ග ප්‍රතිනිර්මාණය කිරීම පදනම් වන්නේ සාමාන්‍යකරණයන් (generalisations) මතය. සාමාන්‍යකරණයන් සියලු දෙනාම සම්බන්ධයෙන් වලංගු නොවන අතර අද රටේ පවත්නා ජනවාර්ගික ගැටලුවලටද මෙම සාමාන්‍යකරණයන් යම්තාක් දුරට හෝ බලපා ඇත. මෙහි උත්ප්‍රාස ජනක දෙය වන්නේ,

චිත්‍ර වාර්ගික හා ආගමික සහජීවනය ප්‍රතිනිර්මාණය කරන ආකාරය තුළම වාර්ගික ගැටලුව නිරායාසයෙන් නිරූපණය වීමය.

මෙම ප්‍රකාශනයේ ප්‍රමුඛ පරමාර්ථය වන්නේ පාසල් සිසුන් අතර සංවර්ධනය පිළිබඳ වඩා විචාරශීලී අවබෝධයක් ඇති කිරීමය. තවද මෙම ප්‍රකාශනය හරහා තරඟය සඳහා සහභාගි වී හොඳම රචනා දහය සහ හොඳම චිත්‍ර දහය අතරට තේරුණු සිසුන්ගේ නිපුණතා අගය කිරීමටත්, ඒවා වැඩිදියුණු කිරීමටත් අපි බලාපොරොත්තු වෙමු. මෙම ප්‍රකාශනයේ අන්තර්ගත විචාර මේ සඳහා දායක වනු ඇතැයි අපි සිතමු.

**ධනුක බණ්ඩාර**
**සංස්කාරක**
**දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA)**

# පටුන


**අවසාන වටය සඳහා තේරුණු රචනා දහය**
(සියලුම විචාර දිල්ෂාන් බෝඅංග විසිනි)

එච්. වයි. ඒ. ජේ. රත්නායක ........ 1

ශානිකා ඇන් මධුභාෂිණී ප්‍රනාන්දු ........ 11

එදිරිසිංහ ආරච්චිලාගේ චමිල දුමින්ද ........ 19

ඉෂිනි චින්තිකා රාමචන්ද්‍ර ........ 28

ඩී. ජී. සසංක චලන ගිම්හාන ........ 35

කරුවලගස්හීන්ගේ ඤාණෝභාස හිමි ........ 43

ටී. පී. දීපානි චාමිකා ........ 53

පී. ශෙහානි රන්දිකා සිල්වා (තෙවන ස්ථානය) ........ 59

ඕ. ඩබ්ලිව්. රිස්නි යසස්වී වීරසූරිය (දෙවන ස්ථානය) ........ 72

ආර්. පී. දේදුනු වත්සලා රාජපක්ෂ (ප්‍රථම ස්ථානය) ........ 80

**අවසාන වටය සඳහා තේරුණු චිත්‍ර දහය**

එම්. සිතාරා සුභාෂිණී ........ 87

ඩබ්ලිව්. එම්. වරුණි රන්ශිමා ගල්ලැල්ල ........ 88

එන්. ජී. උපුලි හංසිකා ........ 89

ප්‍රසන්තිකා සඳරේණු මීගහගෙදර ........ 90

ආර්. ෂෙහානි තාරකා රත්නකුමාර ........ 91

එච්. පි. සමාධි ලෝචනා ප්‍රේමසිරි ........ 92

එච්. කේ. ඒ. වෙනුර දිල්ෂන්ක ඩි සිල්වා ........ 93

වෙනුරි නිහාරා උඩුවෙල (තෙවන ස්ථානය) ........ 94

ආර්. රාජිත ලක්ෂාන් (දෙවන ස්ථානය) ........ 95

ඒ. චානක මදුසංක තෙන්නකෝන් (ප්‍රථම ස්ථානය) ........ 96

**සංවර්ධනය නැවත සිතා බැලීම සහ ප්‍රතිනිර්මාණය** ........ 97
(චන්ද්‍රගුප්ත තේනුවර සමඟ සංවාදයක් ඇසුරෙන්)

# සංවර්ධනය සහ මනුස්සකම
# රචනා දෘහය සහ විචාර

# සංවර්ධනය සහ මනුස්සකම

එච්. වයි. ඒ. ජේ. රත්නායක
11 ශ්‍රේණිය,
හ/විජයබා ජාතික පාසල, හුංගම

සංවර්ධනය සහ මනුස්සකම බොහෝ සෙයින් එකට බැඳී පවත්නා සංකල්ප දෙකකි. රටක් සැබෑ වශයෙන් ම සංවර්ධනය අත්පත් කරගන්නේ හුදු තාක්ෂණය පමණක් භාවිත කිරීමෙන් නොව මනුස්සකමත් ඊට කැටි කොටගෙනය. ලෝකයේ දැනට බලවත් එමෙන්ම දියුණුවට පත් රටවල් ඔවුන් සංවර්ධනය වී ඇති බව අප වැනි දියුණු වෙමින් පවතින රටවල්වලට කියා පෑවත් එවැනි රටවල්වල සැබැවින්ම මනුස්සකම නැතහොත් මානුෂීය බව ඉතිරිවී ඇත්දැයි යන්න බලවත් ගැටලුවකි. එමනිසා අප රටද එවැනි භෞතික වශයෙන් පමණක් සංවර්ධනයක් අත් පත් කොට නොගෙන ඒ තුළට මනුස්සකමත් එක් කරගත යුතුය. අද අප දිවා රෑ ලෝක ප්‍රවෘත්ති නරඹන විට අපට පෙනී යන්නේ කෙමෙන් කෙමෙන් මේ මුළු ලොවම යුද පිටියක් වන බවට හෙළි වන කරුණුය. එක් එක් රටවල විවිධ අභ්‍යන්තර ගැටලු නිරාකරණය කර ගත නොහැකි වූ විට ඔවුහු ලෝක සාමයටද තර්ජන ගර්ජන ඇති කරති. මා ඉහත සඳහන් කළ පරිදි ලෝකයේ ධනවත් එමෙන් ම දියුණු රටවල්වලද මේ ගැටලුකාරී තත්ත්වය පවතී. මෙයට හේතු සොයාගෙන යන විට අපට එහි ප්‍රධාන සාධකය හමුවේ. ඒ මනුස්සකම දිනෙන් දින පිරිහී යාමයි. යහපත් මනුෂ්‍ය ගති ලක්ෂණ ඉහත බලවත් යැයි කියන රටවල්වලට කියා දීමට හොඳම කාලයයි. ඒ අවි ආයුධ වලින් වත් හුදු කටවහරින් වත් නොව ක්‍රියාවෙනි. එනම් දිළිඳු යැයි කියන අප වැනි රටවල් සාරධර්මයන්ගෙන් පිරුණු පූර්ණ සංවර්ධනයට භාජන වී ලෝකයේ බාහිර අතපෙවීම්වලට යටත් නොවී ස්වාධීනව රටේ පාලනය ගෙනයමින් සැමට ආදර්ශයක් වීමෙනි. සංවර්ධනය පිළිබඳව නොව පූර්ණ සංවර්ධනය පිළිබඳව මෙතැන් සිට මම වචන හරඹය අරඹමි. ඉන්පසු මනුස්සකම කෙරෙහි එළඹීමට මට එය මහත් රුකුලක් වනු ඇත.

එතරම් පරිණත මනසක් ද පරතෙර සොයා ගිය දැනුමක් ද නැති සුඛෝපභෝගී ජීවිතයකට සිහින මවන අප සංවර්ධනය දුටුවේ මෙලෙසිනි. මීට වසර 4 කට පමණ පෙර මා සියැසින් දුටු සංවර්ධනය ඔබ හා බෙදා ගැනීමට කැමති වෙමි. 2010 වර්ෂයේ පෙබරවාරි මාසයේ එක් පාසල් දිනක අපි ගුරුවරුන් කීප දෙනෙකු සමග හම්බන්තොට වරාය බලා පිටත් වීමු. පාසල් බස් රථයෙන් බැස මා හා අනෙක් මිතුරු මිතුරියන් (පාසලේ) සිනාසිසී මීටර් 500 ක් පමණ කඳු ගැට්ටක් වැනි උස තැනකට ගියෙමු. එහිදී දුටු දර්ශනය මට මැවි මැවී පෙනෙන්නාක් මෙන් මාගේ සදාකාලික මතකයට එක්විය. එහි දී ඇති වූ සංවාදයකි මේ.

මොහොට්ටාල ගුරුතුමිය : පුතාලා හොඳට බලාගන්න මේ ඉස්සරහට වැඩ ඉවරවෙන්න තියෙන විශාල දැවැන්ත වරායක්.

මමඃ අර බලන්න අර ඒවා නිකං පස් කන රාක්ෂයෝ වගේ.

ඉහත සංවාදය ඇති වූයේ මේ වන විට වැඩ අවසන් ව ඇති මාගම්පුර ජාත්‍යන්තර වරාය දෙස බලමින් සිටියදීය. එවකට 7 ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ මා ඉතා විශාල බැකෝ සහ දොඹකර ආදී යන්ත්‍ර දුටුවේ එලෙසිනි.

සන කැලෑවල්වල අලි ඇතුන් සැරිසැරූ එදා මෙවන් ආශ්චර්යවත් වරායක් ඉදිරියට ඉදි වේවි කියා සිතුවේ කවුරුන්ද? එදා දර්ශනයෙන් පසු නිවස බලා පැමිණි මම දිව්වේ වත්ත පහළටය. ඒ මව සහ නංගී දැක බලා ගැනීමටය. දෙව්ලොව දූටුවෙකු පරිද්දෙන් කුසගින්නේ වුවද ඒ දීර්ඝ විස්තරය එදා මා ඔවුන්ට කීවේ අංග චලනත් සමගය. එය ඔවුන් හට නියමාකාරයෙන් තේරුණා දැයි අදවත් මම නොදනිමි. සංවර්ධනය පිළිබඳ පළමු දර්ශනීය සංකල්පය මාගේ මනස තුළට යන්නේ එදිනය. සාමය ලැබූ රටක් ලෙසින් දැන් අපි සංවර්ධනය කරා ඒකීය මවකගේ දරුවන් මෙන් පිය නගමු. ජාත්‍යන්තර ගුවන් තොටුපළ, ජාත්‍යන්තර ක්‍රීඩාංගණ ඉදිවන මේ කාලයේ සංවර්ධනයේ විශාල බලාපොරොත්තුවක් ශ්‍රී ලාංකිකයන් වන අප සිත් තුළ තිබීම පුදුමවීමට කාරණා නැත. එක් අතකින් සංවර්ධනය යනු මගේ අදහසට අනුව නම් මිම්මකි. මෙම මිම්මෙන් රටවල් සංවර්ධනය වෙමින් පවතින රටවල් නමින් රාජ්‍යයන් සියල්ල කාණ්ඩ කළ හැකි ය. සැබැවින් ම ධරණීය හෙවත් පූර්ණ සංවර්ධනයක් යනු සංවර්ධනය තුළින් අනාගත පරම්පරාවන්ට ඔවුන්ගේ වුවමනාවන් සපුරා ගැනීමට ඇති හැකියාව සීමා නොකර වර්තමාන වුවමනාවන් සපුරාලීමට ක්‍රියා කරලීමයි. නමුත් අද ලෝකයේ සංවර්ධනය යැයි කියනා දෙයින් මතු පරම්පරාවට වුවමනා සපුරාගැනීම කෙසේවෙතත් ඔවුන්ගේ ජීවිත බේරාගැනීමට සටන් කරලීමට සිදුව ඇත. ඒ සංවර්ධනයේ අයහපත් ප්‍රතිඵල හෙයිනි. නමුදු තිරසර සංවර්ධනයකින් මනුසත්බවින් පිරිපුන් හෙටක් මතු පරම්පරාවට උදා කර දිය හැකි ය. අපි සංවර්ධනයේ අරමුණු දෙස බැලූ විට පෙනී යන්නේ මතු පරම්පරාවටද වර්තමාන සමාජයටද සියලු සම්පත්වලින් පිරි සාමකාමී වාතාවරණයක් නිර්මාණය කිරීම ඒවායේ අරමුණු බවය. එසේ නම් මේ අරමුණු පෙරදැරිව ආරම්භ කළ යුතු සංවර්ධනය පියවර කිහිපයකින් සමන්විතය.

ප්‍රථම පියවරඃ- පළමුව රටෙහි වර්තමාන සමාජයේ මිනිස් අවශ්‍යතා උපරිමයෙන් සපුරා තිබීම.

දෙවන පියවරඃ- රටෙහි වෙසෙන ජව මූලික එනම් කාර්ය බලකාය උපරිම දායකත්වයත් සමග සංවර්ධන ක්‍රියාවලියට දායක වීම.

තෙවන පියවරඃ- රාජ්‍යයේ බලධාරීන් එනම් පාලකයන් රටේ සංවර්ධන ක්‍රියාවලියේ යටි ඉලක්කයන් ඔස්සේ කාර්ය බලකාය මෙහෙයවීම

හතරවන පියවරඃ- සංවර්ධන ක්‍රියාවලිය සිදුවෙද්දී ගැටුම්, අර්බුද, බාහිර බලපෑම්, තර්ජන අතරේ ද ක්‍රියාවලිය නොනැවැත්වීම. එම ගැටලු, අර්බුද ආදී බාහිර දෑ වලට කඩිනමින් විසඳුම් සෙවීම. (මෙය රටේ පාලකයන් අතරින් ඉටුවිය යුතුය).

අවසාන පියවරඃ- රටේ සියලු පුරවැසියන් අතර අභ්‍යන්තර ගැටුම් තත්ත්වයන් උදා නොකරමින් රටේ කාර්ය බලකායට ශක්තියක් වෙමින් රටේ සාමය පවත්වා ගැනීම.

ඉහත සංවර්ධන ක්‍රියාවලියක් යම් රටක ක්‍රියාත්මක වේ ද එම රටෙහි නිදහස්, නිවහල්, තිරසර සංවර්ධිත යුගය වැඩි ඈතක නොවේ.

ශ්‍රී ලංකාව තවමත් සංවර්ධනය වෙමින් පවතින රටවල්වලට අයත් වන්නේ ඉහත මා සඳහන් කළ පළමුවන පියවර වන රටෙහි වර්තමාන සමාජයේ මිනිස් අවශ්‍යතා කඩිනමින් සහ උපරිමයෙන් සපුරා නොතිබීම නිසාය. මෙහිදී අපේ රටේ දැවැන්ත සංවර්ධනයකට අත්පොත් තබද්දී ඉහත කාරණාව මෙම ක්‍රියාවලිය මන්දගාමී කරයි. එමෙන් ම සංවර්ධනය ප්‍රමාදවීමට අප රටේ පුරවැසියන්ගේ ගැටලු, ඔවුන්ගේ දරිද්‍රතාවය, අසරණකම යන කරුණුද බලපායි. මෙම ක්‍රියාවලියේ දී සංවර්ධනය සමග මනුස්සකම අත්වැල් බැඳ ගන්නේ අවසාන පියවරින් මා සඳහන් කළ රටේ පුරවැසියන්ගේ එකමුතුකම, සාමය වැනි සාධක මත පදනම් වී දෑයේ දූ දරුවන්ගේ දහදියෙන්, වීර්යත්වයෙන් ගොඩනැගුණු තිරසර සංවර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙන්ය. එයට ප්‍රවේශයක් ගැනීමට ප්‍රථමයෙන් සංවර්ධනයේ ඇති යහපත් හා අයහපත් ප්‍රතිඵලයන් ගැන සඳහන් කිරීම සුදුසු යැයි සිතමි.

මෙහි යහපත් ප්‍රතිඵල ලෙස ඔබ මා කවුරුත් දන්නා තාක්ෂණික මෙවලම් භාවිතයට පැමිණීම, ගෝලීයකරණය, සන්නිවේදන අංශයේ දියුණුව, රටෙහි ජනතාවට සැපවත් ජීවිත අත්කර දීමට නිෂ්පාදනය වූ සහ වෙමින් පවතින යන්ත්‍ර සූත්‍ර, රාජ්‍යයන් හි දරිද්‍රතාවය අඩුවී සමාජ විෂමතාවයන් අඩු වී යාම, එදිනෙදා ජීවිතයේ දී මෙන් ම කර්මාන්ත ආශ්‍රිත නව ක්‍රමෝපායන් හඳුන්වා දීමත් සමග අඩු කාලයකින් ඵලදායිතාව වැඩි කරගැනීම යනාදිය දැක්විය හැකිය. මෙහිදී යම් ආකාරයකින් මනුසත්බව වැඩිදියුණුවන යහපත් ප්‍රතිඵල ඇත. එනම් ගෝලීයකරණයයි. ගෝලීයකරණය යනු සරල අදහසින් නම් භූගෝලීය වශයෙන් දූරස්ථ බව ඉක්මවා සමාජීය වශයෙන් ලෝකය සමීපව කටයුතු කිරීමයි. මෙහි වාසි පිළිබඳව විමර්ශනය කළවිට පෙනී යන්නේ එයින් ජාත්‍යන්තර වෙළඳාම පුළුල් වීමයි. මෙම ගෝලීයකරණයට හොඳම නිදසුනක් නම් ශ්‍රී ලාංකිකයන් වන අපට නිවසේදීම විදේශ රටක ක්‍රිකට් හෝ ඕනෑම ක්‍රීඩා තරගයක් නැරඹීමේ අවස්ථාවයි. සැබැවින්ම අප රටත් එම තරගය පැවැත්වෙන රටත් අතර කිලෝමීටර් දහස් ගණනක පරතරයක් තිබුණත් එම තරගයේ සජීවී නැවුම් ශබ්ද රටා අපේ සවනට ඇසෙයි. මෙතරම් වූ දියුණුවක්, සංවර්ධනයක් ශීඝ්‍රයෙන් සිදුවන යුගයක ජීවත් වන්නට ලැබීම කෙතරම් භාග්‍යයක් ද? මෙහිදී මනුස්සකම ගෝලීයකරණයේ තවත් එක් ප්‍රතිඵලයකි. සමාජයෙහි මිනිසුන් අතර දුලභව පවතින මනුස්සකම මෙතුළින් මුළු ලෝකය පුරා සාමයේ පණිවුඩය රැගෙන යමින් දසත පැතිරෙයි. සංවර්ධනයේ යහපත් ප්‍රතිඵලයක් වන ගෝලීයකරණයෙන් මනුසත්බවට අගයක් එක් කරයි. ලෝකයේ දසත තිබෙන විවිධ වූ සංස්කෘතීන්, ජාතීන්, ආගම් අතර සහනශීලිත්වය හා සංහිඳියාව ඇති වීම මෙම ගෝලීයකරණයෙන් සිදුවේ. එවිටම ලොවෙහි මිනිසුන්ගේ සදාචාරාත්මක ගුණධර්ම ඇතිවී මානුෂීය බව ඉබේටම හටගනී. උදාහරණයක් ලෙස පසුගිය දිනක තාක්ෂණයේ පිහිටෙන් අපට ලැබුණු රූපවාහිනියේ මාස 3 ක දරුවෙකු හට සැත්කම් 8ක් කෙරුණු බව විකාශනය වූ ආරංචියකින් මාගේ හද සසල විය. එවන් වූ ප්‍රවෘත්ති ජනයාට ඇසීමත් සමග තව තවත් ඔවුන්ගේ මානුෂීය බව මුවහත් වේ. එනම් අප රටේ ද මෙවන් වූ දරුවන්ගේ අසරණතාවය දැක ඔවුන්ට පිහිට වීමට අපේ සිත් තුළ ද බලවත් ඕනෑකමක් ඇති වේ. කුල, වර්ණ, ජාති භේද නොසලකා මනුෂ්‍යයන්ගේ විවිධ විෂමවූ අසරණ හා පීඩිත තත්ත්වවලදී ඔවුන්ට උදව් කිරීමට ද අසරණ ජනතාවගේ ගැටලු දැක දේශීය හෝ විදේශීය වේවා ඔවුන්ට පිහිට වන මනුස්සකම හඳුනන පුද්ගලයින් කොතරම් ඇත්ද?

සැබැවින්ම විය යුත්තේ මේ ගෝලීයකරණයේ මහිමයෙන් තවත් එවන් වූ සානුකම්පිත හදවත් වලින් පිරිපුන් ජනතාව සමාජයේ පැතිරී යාමයි.

ගෝලීයකරණය පමණක් නොව තිරසර සංවර්ධනයේ මනුෂ්‍යත්වය වපුරන තවත් ක්ෂේත්‍ර ඇත. ඉන් අද සමාජයේ බොහෝ විට දැකගත හැක්කේ සන්නිවේදන අංශයේ දියුණුවයි. රූපවාහිනිය, රේඩියෝව වැනි සුලභ ජනමාධ්‍ය තුළින් අද සමාජ ගැටුම් විවරණය කෙරෙයි. එමෙන්ම ජනතාවගේ අසරණතා, රෝග, ව්‍යසන ආදියද සුලභව දක්නට ඇත. එහි දී ලේ වර්ගයක්, වකුගඩු වැනි ඉන්ද්‍රියන් පරිත්‍යාග කිරීමට කැමති අයෙකු සිටිනවා නම් අමතන්න යයි දැන්වීම්, ප්‍රචාරණ ඔබ කොතෙකුත් දැක ඇත. එම ප්‍රවෘත්ති අසන ශ්‍රාවකයා තුළ එවැනි ජනතාවගේ අසරණ බව පිළිබඳ නිතැතින්ම කනගාටුවක් ඇති වේ. තමාගේ මේ අනිත්‍ය ස්කන්ධයෙන් කොටසක් දීමට දිනෙකට කොතෙකුත් ඉදිරිපත් වෙනවාද? ඉහත මා සඳහන් කළ පරිදි දියුණු ජනමාධ්‍ය කොට්ඨාසයක් නොතිබුණා නම් ප්‍රේක්ෂක හෝ සාමාන්‍ය පුරවැසියෙකුට රටේ දිළිඳු බව, රෝගවලින් පීඩිත බව, ඔවුන් හට අනුකම්පාව, දයාව අවශ්‍ය බව කෙසේ දැනෙන්නද? මෙයින් පිළිබිඹු වන ප්‍රශස්ත කරුණක් නම් සංවර්ධනයේ දායකත්වයෙන් සමාජයේ මිනිසුන් අතර යහපත් මානුෂීය ගුණධර්ම වර්ධනය යම්තාක් වැඩි වී ඇති බවය. එනම් මනුස්සකම ඇති කිරීමට මෙන්ම නැති කිරීමටද මෙම සංවර්ධනයට හැකි බවය.

සෑම ක්‍රියාවකටම ඊට ප්‍රතිවිරුද්ධ වූ ප්‍රතික්‍රියාවක් ඇත්තා සේම යම් කටයුත්තක් හෝ ක්‍රියාවලියකින් සියයට සියයක්ම අපේක්ෂිත යහපත උදාකර ගත නොහැකි ය. අවාසනාවක මහත සංවර්ධනයේ අනිසි ප්‍රතිඵල ද දූන් දූන් ලෝකයේ පැහැවීමට පටන් ගෙන තිබේ. තාක්ෂණයේ ශීඝ්‍ර දියුණුවත් සමග මිනිසුන්ගේ රාජකාරිවලට සහනයක් උදා වී ඇති බව සැබෑය. නමුදු අද ලෝකයේ සාමයට තර්ජන, ගර්ජන එල්ල කරන විවිධ ත්‍රස්තවාදී ක්‍රියා, මිනී මැරුම්, සමූල ඝාතන දිනෙන් දින වැඩි වී ඇත. ඒවා හා සමානව බොහෝ රටවල ජනතාවට සීමා බාධක පනවා ඇත. ඒවාට එරෙහිව කෙරෙන උද්ඝෝෂණ, උපවාස, කලහකාරී හැසිරීම් ලෝක සංවර්ධිත රටවල්වල ද දැකගත හැකිය. එසේ නම් මේ කුරිරු සමාජ විරෝධී ජනතා සාමය විනාශ කරන බලවේගවල උප්පත්තිය සංවර්ධනයෙන්ම සිදු වී ඇති බව පැහැදිලි ය.

මිනිසාගේ ජීවිත ඔපවත් කරන යහපත් තාක්ෂණික මෙවලම් නිපදවෙද්දී ත්‍රස්තවාදය පදනම් කොට ගෙන නවීන අවි ආයුධ සමස්ත ලෝකයේ ම ව්‍යාප්ත විණි. එහිදී, ඇල්බට් අයින්ස්ටයින්ගේ නොදැනුවත්භාවයෙන් ඇමරිකානුවන් පරමාණු බෝම්බය නිපදවූ දා පටන් අද දක්වා මේ සංවර්ධනයේ අහිතකර ප්‍රතිඵල ලෙස සැණෙකින් ජීවිත දහස් ගණනක් වුවද නැති කරලීමට සමත් භයානක අවි ආයුධ භාවිතයට පැමිණෙමින් තිබේ. එසේ ගත් කල සමාජය එන්න එන්නම කුරිරු වෙද්දී කෙසේ මනුසත් ගුණධර්ම රැකේවි ද යන ප්‍රශ්නය අපට පැනනගී. එමෙන් ම මෙම සංවර්ධනයෙන් පරිසරයේ ජීව අජීව යන වස්තු සියල්ලටම බලපෑම් එල්ල වේ. කෙමෙන් කෙමෙන් සංවර්ධනයේ පියගැටපෙළ නගින එකිනෙකා පරයන මිනිසුන් හට අවසානයේ ඇති වන්නේ කලකිරීමක් පමණි. ඒ තමන් විසින් පරිසරයට නිසි යුතුකම් ඉටුකළාද නැතහොත් අපට පණනල ලබා දෙන පරිසරය වනසා දැමුවාද යන ප්‍රශ්නය සිතට වදදීම නිසාය. පරිසරයේ ඇති ස්වාභාවික සම්පත් වනසා ඒවා අධිපරිභෝජනය කර දියුණු වීමට උත්සාහ ගන්නා මිනිසුන්ට පරිසරය විසින් ද නිසි දඬුවම් දෙනු ලැබේ. සැබෑ මනුසත් ගුණධර්මයන් නම් පරිසරයට දයාව කරුණාව ලබාදී ඔවුන් සමග ගුණධර්මයන්ගෙන් කටයුතු කිරීමයි.

නමුත් අද වන විට අප රටේ විතරක් නොව සියලු විදේශ රටවල ද ගස්වැල් වනසා ස්වාභාවික රක්ෂිත වනසා ඒ සුන්දරත්වය විනාශ කර ඔවුන්ගේ දූවැන්ත සංවර්ධන ඉලක්ක කරා පිය මනියි. එසේ නම් පැරණි මුතුන් මිත්තන් දේවත්වයෙන් සැලකූ ස්වාභාවික පරිසරය වර්තමාන පටු ආකල්ප ඇත්තන්ගේ ග්‍රහණයට ලක් වීමටද වැඩි කාලයක් නොමැත. මේ මිනිසාගේ කුරිරු අධර්මිෂ්ඨ ක්‍රියාවලින් බැටකන්නේ අජීවී පරිසර පද්ධතිය පමණක් නොව එම පරිසර පද්ධතිය මත යැපෙන සතුන්ය. සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට මිනිසා විසින් සිදුකරන ලද ක්‍රියාවලින් අද කොපමණ සත්ව කොට්ඨාස ප්‍රමාණයකට වඳ වී යාමට සිදුව ඇත් ද? වර්තමානයේ බොහෝ කතාවට ලක්වන කාර්මික පරිසරවලින් එක් වන විෂ දුම්වලින් අතුරු ප්‍රතිඵල නොයෙකුත් අපට දැක ගත හැකි ය. එයින් ප්‍රධානතම අහිතකර සංඝටකයක් නම් අම්ල වැසිය. මේවායින් සිදුවන්නේ ස්වාභාවික වනාන්තර විනාශ වීම, පසට මෙම රසායනික ද්‍රව්‍ය එකතුවී ගංගා, ඇළ, දොළ, විනාශයට ලක්වීමසහ ඒ හේතුවෙන් සතුන් මියයාමයි. බටහිර යුරෝපය, නැගෙනහිර ඇමරිකාව, ජපානය, චීනය වැනි සංවර්ධිත රටවල්වල මෙම පරිසර විනාශය බොහෝ සෙයින් සිදු වෙමින් පවතී. මෙවන් අසරණ සතා සිව්පාවන්ගේ වන සම්පතත් ජලාශත් විනාශ කර දැමීමට පවා අද මිනිසුන්ගේ සිත් කුරිරු වී ඇත. මෙය මනුෂ්‍යත්වයේ විශාල පරිහානියකි. මනුසත් බවෙන් තොර මෙවන් වූ බලවත් වැරදි මිනිසා පරිසරයට සිදු කරද්දී පරිසරයද ඊට ප්‍රතිවිපාක ලබා දේ. ගංවතුර ගැලීම්, නිතර නාය යෑම්, මහා පරිමාණයේ ලැව් ගිනි විතරක් නොව මිනිසාට සෘජුව දෙන දඬුවම් නම් ශ්වසන ආබාධ, නොයෙකුත් පිළිකා, හම් අසාත්මිකතා, ජාන විකෘතිතා ආදියයි. එසේ නම් දැන්වත් මේ සංවර්ධනයේ තිරසර නොමැතිකම හේතුවෙන් ඇති වූ අනිසි ප්‍රතිඵල මීළඟ පරම්පරාවට උරුම කර නොදී මනුෂ්‍යත්වය කැටි කොටගත් කුරිරු පටු අරමුණු වලින් තොර සංවර්ධනයක් උදාකර ගැනීමට සුදුසු කාලයයි.

සංවර්ධනය හඳුනා ගැනීමෙන් පසු අපි දැන් මනුෂ්‍යත්වය පිළිබඳ කරුණු හඳුනාගමු. සැබැවින් ම මනුෂ්‍යත්වය නොහොත් මනුස්සකම මිනිසුන් ලෙසින් ඉපදෙන සියල්ලන් අතර නොමැති කරුණකි. ඒ නිසාදෝ දිනෙන් දින සමාජය විවිධ විෂම ආත්මාර්ථකාමිත්වයකට බඳුන් වී ඇත. මා නම් මනුස්සකම යනුවෙන් හඳුන්වන්නේ මනුස්සයෙකුට තවත් මනුෂ්‍යයෙකු හෝ ජීව අජීව වස්තුවක් වෙත පරාර්ථකාමී ලෙස බැලීමට හෝ දැකීමට පවතින හැකියාව වේ. යමෙකු තුළ මනුස්සකම අඩංගු නම් ඔහුට හෝ ඇයට නිරන්තරයෙන් අන්‍යයන් විඳින දුක් පීඩා, අසරණතා, ව්‍යසනයන් පිළිබඳ තම සිත් තුළද බලවත් දුකක් කනගාටුවක් ඇතිවේ. රටක් වශයෙන් තිරසර සංවර්ධනයකට පියමං කිරීමේ දී අනිවාර්යයෙන්ම මනුසත් බව ඒ සංවර්ධන ක්‍රියාවලියෙහි අඩංගු විය යුතුය.

අද සමාජයේ කලාතුරකින් මේ මිනිසත්බව නැතහොත් මනුස්සකම දැකගත හැකි ය. එබැවින් නව පරපුරේද මනුස්සකම හා පරිණත වැඩිහිටියන් ද අපේක්ෂා කළ නොහැකි ය. ඔබ මහ පාරේ යන එන විට අන්ධ පුද්ගලයන් පාර මාරු වීමට උත්සාහ කරන ආකාරය දැක ඇති. එවන් අවස්ථාවක එවැනි පුද්ගලයෙකුට සහාය වීමට උත්සාහ කරන්නේ කීයෙන් කී දෙනාද? එයිනුත් බහුතරයක් ළමුන් වීම සමස්ත වැඩිහිටි සමාජයම ලජ්ජා විය යුතු කරුණකි. ඉහත සඳහන් අවස්ථාවේ අර සහායට ආ පුද්ගලයා තුළ මනුස්සකමක් තියෙනවා යැයි අප කියන්නේ නිතැතිනි. තවද මනුස්සකම හඳුනා ගැනීමට අපට බොහෝ අවස්ථා ඇත.

යම් අයෙකුගේ කරදරයක්, අසරණකමක් දකින සහ එයට අතහිත දෙන පුද්ගලයෝ සැබෑ මනුෂ්‍යත්වය හඳුනන මිනිස්සු වෙති. ජීව වස්තූන් මෙන්ම අජීව වස්තූන් කෙරෙහි දයාව කරුණාව දක්වීමට ඉහත සඳහන් කළ උත්තම පුරුෂයාට හැකි යැයි මම සිතමි. මිනිසුන් කෙරෙහි පමණක් නොව සතුන් සිව්පාවුන් කෙරෙහි අපරිමිත සෙනෙහස දක්වන පුද්ගලයෝද මෙලොව තුළ වෙසෙති. ඊට හොඳ නිදසුනක් වන සති කිහිපයකට පෙර අන්තර්ජාලයේ ළමා පුවත් වල පළවුණු උණහපුලු පැටව් 8 දෙනෙකුට විවිධ වූ සත්කාර කරමින් ඔවුන් මාස 2 ක් පුරා රැකබලාගත් වයස අවුරුදු 11 ක දියණියක එරට පරිසරවේදීන්ගේ ද ඇගයුමට ලක්වීම නම් කළ හැකි ය. එසේ නම් සැබැවටම අද සමාජයේ මනුෂ්‍යත්වය නැති වී ගොසින් ඇතැයි අපට කිව නොහැකි ය. අප ඉදිරියට කළ යුතු වන්නේ ඉතිරි වී තිබෙන මේ දුර්ලභ මනුෂ්‍යත්වය සංවර්ධනයට කැපිකොට තිරසර සංවර්ධනයකට උරුමකම් කීමයි. එසේ කිරීමට පෙර අප මනුස්සකමේ විපර්යාසයට මේ සංවර්ධනය කෙසේ බලපෑවේ ද යන්න සොයා බලමු.

දැන් දැන් ශීඝ්‍රයෙන් දියුණු වන ලෝකයත් සමග තාක්ෂණයත් එන්න එන්නම දියුණු වෙයි. මේ අතරේ සන්නිවේදන තාක්ෂණය ද ඒ හා බැඳුණු නව මෙවලම් ද මිනිසාගේ භාවිතයට පැමිණේ. එදා ගැමි පරිසරයේ මේ කිසිදු සම්පතක් නොතිබුණත් ඔවුන් සතුව ඉතා ශක්තිසම්පන්න මනුස්සකමක් තිබුණේය. එදා මිනිසුන් හට විශාල බලාපොරොත්තු, ඉලක්ක ද තිබුණේ නැත. එමනිසා ඉතා රසවින්දනයෙන් යුතු සාරධර්ම වලින් පිරිපුන් සමාජ ජාලයක් පැවතී තිබුණි. නමුත් මේ ශීඝ්‍ර දියුණුවත් සමග අද සමාජයේ මිනිසුන් විවිධ වූ අයහපත් ක්‍රියාකාරකම් රැසකට මුහුණ පා ඇත. ඉන් එකක් නම් අන්තර්ජාලයේ විවිධ අසභ්‍ය දෑ වලට ඇබ්බැහි වී සිටීම, මෙවන් වූ අසභ්‍ය වීඩියෝ පට, කුරිරු පරිගණක ක්‍රීඩා, සමාජ විරෝධී ක්‍රියාදාම චිත්‍රපටවලින් කෙටි රසවින්දනයක් ලබා ගැනීම ආදියයි. අද තරගකාරී සමාජය හේතුවෙන් එදා මෙන් නොව මිනිසා තම රසවින්දනය පවත්වාගැනීමට කරන ඉහත ක්‍රියා නිසා ඔවුන් තුළ හරවත් සිතුම් පැතුම් බිහි වන්නේ නැත. යන්ත්‍ර මෙන් ක්‍රියා කරන මොවුන් තුළ කෙසේ නම් මනුස්සකමක් තිබිය හැකිද? එදා ළමා පරපුර ගැමි සීතල මඳනලේපහස විඳිමින් වැඩිහිටියන්ට ගරුකරමින් සමාජ ආචාර ධර්මවලට ගරු කළ පිරිසක් විය. නමුදු අද වායු සහ ශබ්ද දූෂණ වලින් පිරිපුන් තට්ටු පිට තට්ටු නිවාස වල ඔවුහු හුදෙකලාව වාසය කරති. ඔවුන්ට තද ඝෝෂා මැද දක්නට ද අසන්නට ද ලැබෙන දේ කිසිසේත් ම මිහිරි නොවේ. විවිධ ගැටුම් කලහකාරී හැසිරීම්වලින්

පීඩිත වන ඔහු හෝ ඇය සමාජ සීමා මායිම් බිඳ පිවිසෙන්නේ අන්තර්ජාලයටය. දරුණු කුරිරු පරිගණක ක්‍රීඩා, චිත්‍රපටවලින් ඔහු රසවිඳීමට පුරුදු වෙයි. අවසානයේ මොවුන් සමාජගත වන විට මොවුන් ගේ අතට ලැබෙන්නේ අවි ආයුධයි. මෙවන් වූ ළමා පරපුරකින් අනාගතයේ මනුෂ්‍යත්වයෙන් පිරිපුන් ජීවිත අපට ලබා ගත හැකි වේද? යන්න කාටවත් සිතාගත නොහැකිය. එසේ නම් මේ සංවර්ධනයේ අවසාන ප්‍රතිඵලය මනුස්සකමෙන් තොර සමාජ සංස්කෘතියක් ද යන්න සිතා බැලිය යුතු කරුණකි. මේ සියලු මිනිස් ක්‍රියාකාරකම් වලට හේතුව මිනිසා සතු එකිනෙකාට වෙනස් වූ ආකල්පයි. නමුත් මේ තිරසර නොවන සංවර්ධනයකින්, මිනිසාගේ ආකල්ප අයහපත් කිරීම මිස යහපත් වීමක් නම් සිදු වන්නේ නැත. මිනිස් ආකල්ප, සිතුම් පැතුම්වලට බලපාන තවත් අංගයක් නම් සන්නිවේදන අංශයේ විද්‍යුත් ජනමාධ්‍යයන්.

සරලව ගත් කල රූප පෙට්ටිය විවිධ වූ සමාජයන්ට වෙන් වෙන්ව විකාශය කරන අර්ථ රහිත රූපවාහිනී වැඩසටහන් වලින් අද මිනිසුන් හෙම්බත් වී හමාරය. නමුදු මෙම රූපවාහිනියෙන් සමාජයට වැඩදායී වන වැඩසටහන් ද විකාශය වූවත් බහුතරයක් අද සමාජ සිරිත්, ගුණධර්ම වලට පටහැනි බටහිර ශෛලියක ආභාසය ලබන ඒවාය. මේවා තුළින් මිනිසුන් කෙටි රසවින්දනයක් ලැබුවත් ආධ්‍යාත්මික වශයෙන් වැටෙන්නේ විශාල පරිහානියකටය. එසේ නම් මෙවන් වූ ආධ්‍යාත්මික පරිහානියකට පත් පුරවැසියන් ට අන් අයගේ හැඟීම් දැනීම්වලට අනුකූලව කටයුතු කළ හැකිද යන්න මතුවන ප්‍රශ්නාර්ථයකි. එසේ නම් මේ සංවර්ධනය තුළින් මනුස්සකම වැඩි වශයෙන් සෝදා පාළුවකට ලක්ව ඇත.

සැබැවින් ම මේ තිරසර නොවන සංවර්ධනයේ දියුණුවත් සමග මනුසත්කමින් තොර සමාජයක කොටස්කාරයින් වීමට අපහට සිදුවේ. මනුසත්බව සංවර්ධනයේ බලපෑමට යටත්වූ බව කියන උදාහරණ රැගත් පුවත් පසුගිය සතිවල ජනමාධ්‍ය තුළින් අප කන වැකිණි. ඇමරිකාවේ සත්ව උද්‍යානයක පසුගිය දිනක ජිරාෆ් කෙනෙකු මරණයට පත්කිරීමේ පුවත, ඉන් මාගේ හද සසල කරන්නට සමත් විය. දැන් සංවර්ධනයේ මහිමයත් සමග ජීවියෙකුගේ ලේ බිංදුවකින් ඔහුගේ ආදි පරම්පරා රැසක් පිළිබඳ තොරතුරු සොයා ගත හැකි ය. ඒ තාක්ෂණයේ සහායෙන් එම සත්වෝද්‍යානයේ පශුවෛද්‍යවරුන් සහ අදාළ බලධාරීන් සොයා ගෙන ඇත්තේ එම ජිරාෆ්ගේ දෙමාපියන් ලේ ඥාතීන් වන බවත් දිනෙක මේ ජිරාෆ්ගෙන් ජාන විකෘති පරම්පරාවක් බිහිවිය හැකි බවත්ය. මෙයට එම වෛද්‍යවරුන් සිතූ පිළියම වන්නේ විදේශීය රටවල් වලින් මෙම ජිරාෆ් භාරගැනීමට ඉදිරිපත්ව සිටියදීත් ප්‍රසිද්ධියේ ගෙල කපා මරා එම උද්‍යානයේ ම සිංහයින්ට කන්නට දීමයි. මෙහි දී වරදවල් දෙකම පැටවෙන්නේ එම බලධාරීන්ටයි. ඒ ජීවීන් බෝ කිරීමේ දී දක්වූ නොසැලකිල්ල සහ අකාලයේ අසරණ සතෙකුගේ ජීවිතය විනාශ කිරීමයි. මේ කිසිත් නොදන්න ඒ තරුණ ජිරාෆ් තමාගේ ජීවිතයේ අවසාන මොහොත වනතුරුම කෙළිදෙලෙන් ගත කළ බව මාධ්‍ය පවසයි. මෙවන් වූ අසරණයෙකුගේ ජීවිතය බිල්ලට දීමට අර බලධාරීන්ට හැකි වූයේ කෙසේද? මනුසත්බව සම්පූර්ණයෙන් ම ඔවුන් තුළින් නැති වී යාම ඊට හේතුවයි. මනුසත්බවින් තොර සමාජයක ජීව අජීව වස්තූන් කෙරෙහි ඇති වන පීඩනය මෙපමණකැයි කිව නොහැකි ය. මෙවන් වූ ජීවිත විනාශ කිරීමට මෙම නරුමයින් වැනි මිනිසුන්ගේ හදවත් කුරිරු වූයේ ඇයි දැයි මම නොදනිමි.

දැන් දැන් මේ කුරිරු සමාජය යහපත් සාමකාමී සමාජයක් ලෙසට සැලසුම් කිරීමට කාලය එළඹ ඇත. එනම් නියම මනුස්සකම ආදී වූ ගුණ ධර්මයන් සමාජයේ ස්ථාපිත කිරීමට කාලය එළඹී ඇත. එය අනාගත ලෝකය භාරගැනීමට සිටින අපගේ සැබෑ යුතුකමකි. එය යුතුකමක් විතරක් නොව අප සතුව ඇති වගකීමක් ද වේ. ඉහත මා ඔබලාට ගෙනහැර දැක්වූ කරුණු වලට අනුව මනුස්සකම පිරිහීයාමට මේ තිරසර නොවන භෞතිකමය සංවර්ධනය හේතු වී ඇත. එසේ නම් මනුස්සකම කැටිකොට ගත් තිරසර සංවර්ධනයකට ගමන් කරනා ආකාරය දැන් පෙන්වන්නෙමි. මා මාගේ රචනාවේ සංවර්ධනය වීමේ මග යටතේ දක්වා ඇති අවසාන පියවර වන්නේ රටේ

පුරවැසියන්ගේ එකමුතුකම, සාමය වැනි ගුණදහම් දියුණු කරගනිමින් රටේ කාර්ය බලකාය ට සහාය දීමයි. එතැනදී අද සමාජයේ තත්ත්වය බැලූ විට පෙනෙන්නේ එකිනෙකා පරයන හුදු තරගකාරිත්වයක් මිස එකමුතුකමක් නොවේ. අපි රටක් වශයෙන් තිරසර සංවර්ධනයකට අත්පොත් තබද්දී පවුලේ සිට ඒකීය රටක් දක්වා එකමුතුකම පෙන්විය යුතුය.

බස්රථයේ, පොදු ස්ථානවල, පාසලේ, වැඩබිමේ යන සෑම තැනකදීම අසරණයාට ගැරහීම නොකළ යුතුය. ලබන සංවර්ධනය සම්පූර්ණ කරගැනීමට සමාජ විෂමතා බිඳ තමාගේ මෙන් ම අන්‍යයන්ගේ ද යහපත උදෙසා එකමුතුවෙන් වැඩෙහි පිවිසිය යුතුය. උදාහරණයක් ලෙස වැඩබිමේ දී යම් පුද්ගලයෙකු යම් කරදරයකට පත්ව සිටී නම් සැබෑ මනුෂ්‍යත්වයෙන් ඔහු වෙත දෑත් දිගු කළ යුතුය. සංවර්ධනය තිරසර කරගැනීමට අප කළ යුතු සහ අප නිරන්තරයෙන් පවත්වා ගත යුතු කටයුතුවල සාමය උදා කළ යුතුය. සාමයෙන් තොරව රටක් තිරසර සංවර්ධනයකට ගමන් කළ නොහැකි ය. මෙහි යම් කාර්යයක් රටෙහි පාලකයන්ට බලපැවැත්වුවද වැඩි කොටස රටේ පුරවැසියන් විසින් සිදුවිය යුතුය. පවුල් පරිසරයේ සිට වැඩබිම දක්වා එදිනෙදා වන අභ්‍යන්තර ගැටුම් පාලනය කර ඒවාට ඵලදායී විසඳුම් සෙවිය යුතුය. මෙහි රාජ්‍යයේ පුරවැසියා හට මනා ගුණාංග රැසක් විය යුතුයි. ඒ

- ❖ මනා හික්මීමක් සහිතව විනීතව කටයුතු කිරීම.
- ❖ රාජ්‍යයේ සම්පත්වලින් ඵලදායී අයුරින් උපරිම සේවයක් ගැනීම.
- ❖ නිරතුරුව රටේ සංස්කෘතික උරුමයන් ආරක්ෂා කරගැනීම.
- ❖ යහපත් සමාජීය ආචාරධර්මවලට අනුකූල වීම.
- ❖ සෑම ජනවර්ගයකටම ආදරය දක්වමින් සහජීවනයෙන් කටයුතු කිරීම.
- ❖ සැමවිටම මැදිහත්භාවයෙන් සමාජ ප්‍රශ්න දෙස දෑස යොමු කිරීම.

ඉහත කරුණු කාරණා පුරවැසියා විසින් මනාව පවත්වා ගැනීමෙන් රාජ්‍යයේ එකමුතුකම, සාමය, සංහිඳියාව, ඇතිවේ. එවිට අප ලබා ගන්නා වූ සංවර්ධනය තිරසර කිරීමට අමුතුවෙන් මනුස්සකම කැටි කිරීමට වුවමනා නැත. ඒ මන්දයත් තිරසර සංවර්ධනයේ යහපත් ඵලයක් ලෙස මනුස්සකම හැඳින්විය හැකි නිසාය.

# විචාරය

රචනය ඇරඹෙන්නේ මනුෂ්‍යත්වය සංවර්ධනයේ පොදු ප්‍රතිඵලවල කොටසක් විය යුතු බවත් 'සංවර්ධිත ජාතියක' තත්වයට ළඟා වීම සඳහා අප උත්සාහ දරන විට බටහිර දී සාරධර්ම හා ද්‍රව්‍යමය තත්වයට අතර ඇති වන ප්‍රමුඛතාව පිළිබඳ ගැටුම්වලට අපගේ ඉරණම හැඩ ගැස්වීමට ඉඩ නො දිය යුතු බවත් අවධාරණය කරමිනි. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන සිසුවා ආර්ථික ප්‍රතිපත්තිවල හා රජයේ තීරණවල ස්වාධීනත්වය අනතුරේ නො හෙළිය යුතු බවට ඉතා වැදගත් කරුණක් ඉදිරිපත් කරයි. එබැවින් සිය සංවර්ධන පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට උත්සාහ කිරීමේ දී රජයක ප්‍රතිපත්තිය විය යුත්තේ මොන යම් හෝ විදේශීය බලයක අවශ්‍යතාවන්ට සේවය කිරීම නො වේ.

සිසුවා තමන් හම්බන්තොට වරායේ ඉදි කිරීම් කටයුතු දැකීමෙන් ලද පෞද්ගලික අත්දැකීම විස්තර කරමින් කොතරම් නම් මහා පරිමාණ තාක්ෂණයක් දැයි විස්මයට පත් වන අතර තමන් යටිතල පහසුකම් සංවර්ධනයේ පැත්තෙන් සංවර්ධන සංකල්පය වටහා ගන්නා ආකාරය ගැන කතා කරයි. රටට ආදායම් උපයා දීමේ ස්වරූපයෙන් ආර්ථික සංවර්ධනය උදෙසා දායක වීමේ අභිප්‍රාය ඇතිව මහා පරිමාණ පහසුකම් නිර්මාණය කිරීමට තිබෙන හැකියාව කොතරම් වුවත් අනාගත පරම්පරාවන්ට සීමිත සම්පත්වල ප්‍රතිලාභ නෙළා ගත හැකි බව සහතික කිරීම සඳහා තිරසර සංවර්ධනය ආදර්ශ පාඨය බවට පත් විය යුතු ය යන්න ගැන සිසුවා දැනුවත් බව ද රචනය පෙන්වා දෙයි.

රචනය තුළ දක්නට ලැබෙන ප්‍රශ්නකාරී දෙයක් වන්නේ අප රට තුළ තව මත් මුල් බැස නැති බව පෙනෙන ප්‍රතිපත්තියකට සම්බන්ධිතව සහතික කළ සූත්‍රයක් ලෙස ම පාහේ ඉදිරිපත් කොට විස්තරාත්මකව පැහැදිලි කෙරෙන 'සංවර්ධන අවධි' න්‍යායේ මූලාශ්‍රය සඳහන් කිරීමට සිසුවා අසමත්ව තිබෙන්නේ මන්ද යන්න යි. සමහර විට ආර්ථික විද්‍යා විෂය නිර්දේශය තුළින් මෙම න්‍යායික රාමු සොයා ගැනීමට පිළිවන් විය හැකි නමුත් මූලාශ්‍ර ද සැපයෙන්නේ නම් ඒවාට පාඨකයන්ට ඒත්තු ගැන්වීමේ ශක්තිය ලැබේ.

සිසුවා සංවර්ධනය සම්බන්ධයෙන් ගෝලීකරණයේ ධනාත්මක පැතිකඩවල් ලෙස සැලකිය හැකි දෑ වටහා ගෙන ලැයිස්තුගත කර ඇත. කෙසේ වුව ද ගෝලීය පරිමාණයකින් දියුණු වෙමින් පවතින සන්නිවේදන තාක්ෂණය නිසා ඉබේ ම ගෝලීය සහෝදරත්වය පිළිබඳ හැඟීම දියුණු වෙති යි සිසුවා ගන්නා ස්ථාවරය තරමක් අයථාර්ථවාදී බවක් පෙනී යයි.

සන්නිවේදන තාක්ෂණයට මානුෂීය ක්‍රියා මාර්ගවල ප්‍රවර්ධනය වේගවත් කරන්නෙකු බවට පත් විය හැකි ය. කාර්යක්ෂම සන්නිවේදනය හරහා මනුෂ්‍යත්වය සත්තකින් ම සැලකිය යුතු ලෙස දියුණු කළ හැකි බව විදේශීය ආධාර දෙන්නන් මහා විපත්වලට ගොදුරු වූවන් වෙත නොමසුරුව ආධාර යැවීම හා අප්‍රමාදීව ආධාර රැස් කිරීමේ ව්‍යාපාර බිහි වීම ගැන පළ වන ජාත්‍යන්තර ප්‍රවෘත්තිවලින් පෙනේ. එහෙත් විපතක් හෝ වෙන යම් සානුකම්පික සිදුවීමක් පිළිබඳ ප්‍රවෘත්තියක් අසන්නට ලැබුණු විට එය අසන ඒ ඒ පුද්ගලයා අනුව මානුෂීය හැඟීම් ඇති වීමට හෝ නොවීමට ඉඩ ඇත. කෙසේ වුව ද මෙය වනාහි පුද්ගලවාදී තර්කයකි. ඛේදජනක ප්‍රවෘත්ති නරඹන බොහෝ අය අකර්මණ්‍ය නරඹන්නන් බවට පත් වන අතර අවශ්‍යතා ඇති අයට උපකාර කරන කිසිදු ක්‍රියාවක් උදෙසා පෙරට නො එති. එබැවින් මෙම තර්කය

ඒකාන්ත ප්‍රකාශයක් ලෙස සැලකිය නොහැකි ය.

සන්නිවේදනය මානව සමාජය තුළ තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරන අතර රචනය වර්තමාන සංවර්ධනය සන්නිවේදන තාක්ෂණය තුළ සිදු වන දියුණු වීම්වලට සම්බන්ධ කොට තේරුම් ගැනීමේ කොටසක් ලෙස සන්නිවේදන තාක්ෂණය නමැති සාධකය නිවැරදිව ග්‍රහණය කර ගෙන ඇත. අද දවසේ දී යම් ගැටලුවක් පිළිබඳව දැනුවත්කම මින් අඩසියවසකට වඩා කඩිනමින් ඇති කළ හැකි ය. එහෙත් සිසුවා නිවැරදිව පෙන්වා දෙන පරිදි යහපත් දෑ කිරීමට තිබෙන හැකියාව සමගින් අපරාධ සඳහා තාක්ෂණය අවභාවිතයෙහි යෙදීමේ ඉඩකඩ ද වැඩි වී ඇත.

රචනය මෙම වත්මන් යුගයේ දී සතුන්ට හිංසා කිරීමේ හා ස්වභාව ධර්මය විනාශ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මහා විපත් ඇති වන ආකාරය ගැන කතා කරයි. කෙසේ වුව ද සිසුවා කර්මය නමැති සාධකය ගැන සඳහන් කිරීම එය ක්‍රියාවලියේ නොවෙන් කළ හැකි කොටසක් බව හැඟවීමක් ලෙස පෙනී යන නමුත් ඔහු ක්‍රියාවන්හි ප්‍රතිඵලයන් ය යන අර්ථයෙන් කර්ම බලය ගැන කතා කරන ආගමික ඉගැන්වීම් උපුටා නො දක්වයි. එහෙත් සිසුවා පළ කරන මෙම වැටහීම තවත් සිතිවිලි ධාරාවක් උපදවයි. එනම් සහෝදර මිනිසුන් ද සතුන් ද ස්වභාව ධර්මය ද කෙරෙහි වූ සහානුකම්පික බව විදහා පාන ප්‍රතිපත්ති අනුව වටහා ගන්නේ නම් සංවර්ධනය සියලු ජීවීන් හට වඩා වැඩදායක ප්‍රතිඵල ලබා දෙන අතර සතුන්ගේ හා ස්වභාව ධර්මයේ යහපැවැත්ම නො තකා සංවර්ධනයේ නාමයෙන් ඉදිරිපත් කෙරෙන ප්‍රතිපත්ති ඒවායේ විනාශකාරී බව නිසා පරිසරයෙන් මිනිසාට අහිතකර ප්‍රතිවිපාක ජනනය වීමට හේතු වේ.

තාක්ෂණයේ දියුණුව අසභ්‍ය සාහිත්‍යය වැනි 'වැඩිහිටි විනෝදායන මාර්ග' ද දැන් ළමයින්ගේ මානසික සෞඛ්‍යය හා සදාචාරය කෙරෙහි බොහෝ අහිතකර බලපෑම් ඇති කරන බව පෙන්නුම් කර තිබෙන ප්‍රචණ්ඩ වීඩියෝ ක්‍රීඩා සංස්කෘතිය ද බඳු සාධක බිහි කර ඇත. රචනය මෙම සාධක වර්තමානයේ පෙරට යමින් තිබෙන ගෝලීය ගම්මානයේ ඍණාත්මක පැතිකඩවල් ලෙස දැනුවත්ව අවධාරණය කරයි.

රචනය හෘදය සාක්ෂිය වෙත ඉතා වැදගත් ප්‍රශ්නයක් ඉදිරිපත් කරයි: එනම් සංවර්ධනයේ අවසන් ප්‍රතිඵලය වන්නේ මනුෂ්‍යත්වයෙන් තොර සංස්කෘතියක් තිබෙන සමාජයක් ද? මෙම පදනම මත රචනය විද්‍යාවේ නාමයෙන් එළිපිට ම කෙරෙන සත්ව හිංසනය පෙන්නුම් කරන්නේ මනුෂ්‍යත්වයෙන් තොර සංවර්ධන මාවතක් වන බව ගැන කතා කරයි. කෙසේ වුව ද සිසුවා සතුන්ට සැලකීම සම්බන්ධ මානව සදාචාරාත්මක ප්‍රමිතීන් සාර්වත්‍රික යැයි සිතන බවක් පෙනෙතැයි සඳහන් කළ හැකි ය. විශේෂයෙන් ම සතුන් හා ස්වභාව ධර්මය පිළිබඳ මානව දැනුමේ දියුණුව අනුව සතුන් දෙස බලන ආකාරය සලකන විට අප හා බටහිර අතර බොහෝ සංස්කෘතික වෙනස්කම් ද පවතී. මේ සම්බන්ධයෙන් ගත් විට වර්ධනය වන ගෝලීයකරණ සංසිද්ධිය හේතුවෙන් බටහිරින් ගලා එන ඍණාත්මක අදහස් හා ආකල්ප නිසා සමාජය තුළ අපගේ ම අනාගත මනුෂ්‍යත්වය අවදානමට ලක්ව ඇති ආකාරය පෙන්වමින් වෙනසක් ගෙන හැර පා රචනය තවත් දියුණු කළ හැකි බව කිව යුතු ය.

මිනිසුන් අතර සාමය පැවතීම තිරසර සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කරන කවර රටකට වුව ද ඉතා වැදගත් සාධකයක් යැයි ප්‍රකාශ කරනු ලැබේ. රචනය මේ සඳහා එහි අවසන් කොටසෙහි ආදර්ශ පුරවැසියා සතු විය යුතු ගුණාංග ගණනාවක් ද එකින් එක සඳහන් කරයි. රචනය අවසන් වන්නේ තිරසර සංවර්ධනයෙන් ඉබේ ම මනුෂ්‍යත්වයේ නැගීමක් සහතික වන බවට විශ්වාසය පළ කරමිනි. මෙම නිරීක්ෂණයන් ශුභවාදය සමග ද බටහිර චින්තනයෙන් මෙහෙයවෙන සංවර්ධන ක්‍රියාවලියේ දී අගය කළ යුතු හා නොකළ යුතු

දැ ගැන කෙරෙන ඉතා ප්‍රශංසනීය ප්‍රකාශයන් සමහරක් සමග ද බැඳී තිබෙන අතර ශ්‍රී ලංකාව තුළ සංවර්ධන ක්ෂේත්‍ර හා පැතිකඩවල් වඩා මැනවින් හඳුනා ගත හැකි ආකාරය සහ ඒවා මනුෂ්‍යත්වය පිළිබඳ අපගේ හැඟීම හුදෙක් ද්‍රව්‍යමය වශයෙන් රැස් කර ගන්නා ලද ධනයට වඩා බලගතු බව සහතික කරමින් අහිතකර ආකල්ප හා සමාජ සාරධර්මවලට යටත් නො වී සදාචාරය නගාලිය හැකි හා ශක්තිමත් කළ හැකි වන පරිදි සම්බන්ධ කර ගත හැකි ආකාරය සොයා බැලීමෙන් සිසුවාට රචනය තවත් දියුණු කළ හැකිව තිබිණ.

# සංවර්ධනය හා මනුස්සකම

## (පාරිසරික හා ජනහිතකාමී හෙටක් පිළිබඳ මගේ සිහිනය)

ශානිකා ඇන් මධුභාෂිණී ප්‍රනාන්දු
13 ශ්‍රේණිය,
හලා/ ශුද්ධවූ පවුලේ බාලිකා ම.ම. විද්‍යාලය, මාරවිල

නොයෙක් නාම වලින් රටවල් පවතී මේ පොළෝ තලයේ,
විවිධ වූ භූ ලක්ෂණ වලින් ද, විවිධ වූ සංස්කෘතීන් වලින් ද,
එකිනෙකින් බැඳෙමින් පවතින විටක,
ලෝකය දෙස නෙත් විදා බැලූ කලක,
ඇතැම් රටක දියුණුව ලබමින් ද,
ඇතැම් රටක් දියුණුව කරා පිය නගමින් ද,
යම් රටවල් නොදියුණු මට්ටමක පවතිමින් ද,
සිටින බව පෙනේවී අප දෙනෙත් හමුවේ.
එනමුදු මේ සැම රටකටම පොදුය මිනිස්කම,
මිනිස්කමට ගරු කරමින්, මිනිස්කම කුමක් දැයි වටහා ගෙන,
ඒ අනුව ක්‍රියා කරන රට, දිදුලාවි හෙළ අඹරේ,
තරුවක් වී සැමදා......

ඉහත සඳහන් නිසඳැස දෙස අප නෙත් විදහා බැලූ කල විශ්වයේ පවතින රටවල් අතුරින් ඇතැම් රටවල් දරිද්‍රතාවයේ උල්පතට කිඳා බසිමින් බැට කන බවද, ඇතැම් රටවල් සංවර්ධනය වෙමින් පවතින බවද, යම් රටවල් සංවර්ධනය අත් කර ගෙන සිටින බවද අපට මනාව පසක් කරයි. එනමුදු මේ සැම රටක්ම මිනිස්කමට ගරු කළ යුතු බවද අපට පෙන්වා දීමට උත්සුක වෙයි. කෙසේ නමුදු කිසියම් රටක් පවතින තත්ත්වයට වඩා මූර්ත වශයෙන් ද විවිධ වූ පරතරයන්ගෙන් ද ක්‍රම ක්‍රමයෙන් මුදුනත කරා ළඟා වීම නැතහොත් දියුණුව කරා පිය නැගීම සංවර්ධනය ලෙස අපට අර්ථ දැක්විය හැකිය. "සංවර්ධනය" යන වචනය අප දෙසවන් වලට ඇසුණ විටක අපට සිහිපත් වන්නේ හුදෙක් ආර්ථිකමය වශයෙන් දියුණුව අත් කර ගැනීමය. එනම් පාරවල් හා ගොඩනැගිලි ඉදි වී ආර්ථික වාසි ගලා එන පරිදි දියුණුව ළඟා කර ගැනීම සංවර්ධනය බව ඇතැමෙක් සිතති. කෙසේ නමුදු "සංවර්ධනය" යන තේමාව ආර්ථිකමය වශයෙන් පමණක් නොව මානුෂීය හා පාරිසරික වශයෙන් ද අත් කර ගත යුතුයි. එනම් ආර්ථිකමය වශයෙන් සංවර්ධනය අත් කර ගත්තත් මානුෂීය හා පාරිසරික වශයෙන් සංවර්ධනයක් අත්කර ගෙන නොමැති නම් එය වඩාත් සාක්ෂාත් සංවර්ධනයක් නොවේ. මානව සම්පතට හොඳින් සලකන අන් අය ගැන සිතන සංවර්ධනයට අත්‍යවශ්‍ය සාධකයකි. ලෝකය ඉදිරියේ රැඳී සිටීමට නම් සැම රටක්ම යම් හෝ සංවර්ධනයක් අත් කර ගත යුතුමය. කෙසේ සංවර්ධනයක් අත් කර ගත්තද මේ සැම රටකම මිනිස්කම රජයනවාද යන්න සොයා බැලිය යුතුය.

අතීත කාල වකවානුවලදී ජීවත් වූ මිනිසුන් ගේ තාක්ෂණය නොදියුණු වුවද එම ආර්ථිකය ශක්තිමත් වැටක් බඳු විය. ඔවුන්ගේ අවශ්‍යතා හා වුවමනා සීමිත වූ අතර ආර්ථිකයද ස්වයංපෝෂිත විය. එසේම ඇතැම් කාල වකවානුවලදී මිනිස් අවශ්‍යතා හා වුවමනා වර්ධනය වීමත්, සම්පත් සීමිත වීමත් නිසා විදේශ වලින් භාණ්ඩ හා සේවා ආනයනය කිරීමත් අදාළ රටවල අතිරික්ත නිෂ්පාදන අපනයනය කිරීමත් අත්‍යවශ්‍ය ප්‍රමාණයට පමණක් සිදු කළ අතර අනවශ්‍ය පරිභෝජනය බොහෝ දුරකට සීමා විය. එසේම බොහෝ රටවලට කිසිදු ආර්ථික සම්බාධක පැනවීමකින් තොරව නිදහසේ ජීවත් වීමට හැකියාව ලැබිණි.

කිසිදු සූරාකෑමකින් හෝ වංචාවකින් තොරව නිදහසේ ගනුදෙනු සිදු කිරීමට ආර්ථිකයන්ට අවස්ථාව උදා විය. සරල දිවි පෙවෙතක් පැවතීම හේතුවෙන් ආර්ථිකය ද සාමකාමීව පවත්වාගෙන යාමට පාලකයන්ට හැකි විය. මෙම යුගවල පැවති විශේෂ ලක්ෂණය නම් පුද්ගලයින් තමන්ගේ කරදර, විවිධ ගැටුම් හා දෛනික කටයුතුවලදී එකිනෙකා සමග සුහදශීලීව හා එකමුතුව කටයුතු කිරීමයි. එකිනෙකා තමාගේ දුර්වලතා තේරුම් ගනිමින් ඒවා මගහරවා ගැනීමට කටයුතු කරන ලදි. මෙම වකවානු තුළදී ද සංවර්ධනය කරා පිය නගන ආකාරය දක්නට ලැබුණු අතර මානුෂීය හෝ පාරිසරික වශයෙන් හානියක් සිදු වූයේ බොහෝ කලාතුරකිනි. එසේම සංවර්ධනයට ඇති බාධා මග හරිමින් වඩා ඵලදායී ලෙස කටයුතු කිරීම දක්නට ලැබුණි.

කෙසේ වුවද වර්තමානය වන විට ලෝකය විශ්ව ගම්මානයක් බවට පත්ව ඇත. අතීතය මෙන් නොව ලෝකයේ විද්‍යුත් වාණිජ්‍යය හා නවීන ක්‍රම භාවිතය පුළුල් වීම ක්ෂණිකව සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කරලීමත් ජාත්‍යන්තර ගනුදෙනු සහයෝගීව කිරීමත් අරමුණු කරගෙන භාණ්ඩ හා සේවා නිපදවීම කාර්යක්ෂමව කෙරුණු අතර අපනයන හා ආනයන කළ භාණ්ඩ හා සේවා ප්‍රමාණය වැඩිකොට එම කටයුතු විධිමත් කිරීමට පියවර ගන්නා ලදි. අද වන විට බොහෝ රටවල් සංවර්ධනය අත් කරගෙන හමාරය. අදාළ රටවල් සංවර්ධනය අත් කර ගැනීමට බොහෝ වෙහෙසක හා උත්සාහයක නිරත වූ බව අප කාටත් පෙනී යයි. බොහෝ සෙයින් ස්වාභාවික සම්පත්වලින් අනූන ඇමරිකාව මෙන්ම සීමිත සම්පත් ප්‍රමාණයන්ගෙන් හෙබි ජපානය හා චීනය වැනි රටවල් ලෝකයේ පවතින රටවල් සමූහය අතුරින් සංවර්ධිත රටවල්ය. ඔවුන් එසේ සංවර්ධනය අත් කර ගත්තේ තම රටට ඇති ගෞරවය භක්තිය වෙනුවෙන් තම ශ්‍රමය, කාලය කැප කරමින් ස්ථිර අධිෂ්ඨානයකින් යුතුව කටයුතු කළ හෙයිනි. සංවර්ධිත රටවල්වලට අමතරව ඇතැම් රටවල් සංවර්ධනය වෙමින් පවතින අතර අප රටද සංවර්ධනය වෙමින් පවතින රටවල් ගණයට අයත්ය. සංවර්ධනය වෙමින් පවතින රටවල් ද තම අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට පවතින සම්පත් උපරිම කාර්යක්ෂමතාවයකින් උපයෝජනය කරමින් සඵලදායීව මෙහෙයවීමට ක්‍රියා කරයි. සත්‍ය වශයෙන්ම සංවර්ධනය ළඟා කර ගැනීමට අද ලෝකයේ රටවල් තුළදී දක්නට ඇත්තේ ඉතා තරගකාරීත්වයකි. එකිනෙකා කාටත් පසුබට නොවී වේගයෙන් සංවර්ධනය දෙසට පිය නැගීමට රටවල් බෙහෙවින් ක්‍රියාමාර්ග ගනී. වර්තමාන සමාජයේ කුඩා ළමයාගේ සිට වැඩිමලා දක්වා "සංවර්ධනය" යන තේමාව හොඳින් දන්නා වකවානුවක අපි ජීවත් වෙමු. සත්‍ය වශයෙන්ම අතීතයේ මෙන් නොව වර්තමානයේ දී තාක්ෂණික හා විද්‍යාත්මක වශයෙන් දියුණු මට්ටමක් කරා ළඟා වී ඇති බව අප කාටත් සාක්ෂාත් වී ඇති කරුණකි.

ලෝකයේ ඇති රටවල් සමූහය අතුරින් වර්තමානය වන විටත් සෝමාලියාව හා නයිජීරියාව වැනි ඇතැම් රටවල් ආර්ථිකමය වශයෙන් සංවර්ධනය වී නොමැති නැතහොත් නොදියුණු රටවල්ය. සම්පත් සීමිතව පැවතීමත් අදාළ ආර්ථිකයන්හි දැනුම හා කුසලතා මඳ බවත් විශේෂයෙන් මෙයට බලපා ඇත.

ජනගහනය අධික වීමත් ඔවුන්ගේ අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීමට අවශ්‍ය සම්පත් සීමිත වීමත් නිසා ඔවුන් දරිද්‍රතාවය යන බිහිසුනු සතුරාගෙන් බැට කයි. ආර්ථිකමය වශයෙන් දියුණුවක් නොලද එම රටවල් ගත කරන්නේ ඉතා කටුක දිවි පෙවෙතකි.

සංවර්ධනය නොවූ බොහෝ රටවල් වල ජනතාව සාගින්නෙන් පෙළෙන බවත් ඇතැමුන් විවිධ වූ රෝගාබාධයන්ට ගොදුරු වී සිටින බවත් ජන මාධ්‍ය, පුවත්පත් හා අන්තර්ජාලය වැනි මාර්ගවලින් අපට දැන ගැනීමට හැකි වී ඇත. මෙසේ රටක සංවර්ධනය සඳහා වෙහෙසී ක්‍රියා කළ යුතු ශ්‍රම බලකාය ක්‍රමක්‍රමයෙන් ක්ෂය වී යාම රටවල් මුහුණ දෙන ශෝචනීය තත්ත්වයකි. මිනිසුන් වශයෙන් අප කවුරුත් වඩාත් ප්‍රිය කරන්නේ හොඳ රැකියාවක් කර අපගේ වියදම්

පියවා ගෙන ඉතිරිය අනාගතය උදෙසා ආයෝජනය කිරීමට ය. සත්‍ය වශයෙන්ම නොදියුණු රටවල්වල ජීවත් වන මිනිසුන්ට මෙවැනි ආසාවන් සැමදා නින්දේදී දකින සිහින හා සමානය. ඔවුන් කුමන හෝ රැකියාවක් කර ඉන් බලාපොරොත්තු වන්නේ තමාගේ හා තමාගේ පවුලේ උදවියගේ දෛනික ආහාර වේල් තුන සපුරා ගැනීමට වෙහෙසීමයි. තමාට ලැබෙන සුළු මුදලින් තම කුසගින්න හෝ නිවා ගැනීමට නොහැකි පුද්ගලයෝ සමූහයක් මෙම ආර්ථිකයන් හි ජීවත් වෙති. අප රටවල්වල ළමුන් මෙන් නොව ඉගෙන ගැනීමට කැමැත්තක් හා උනන්දුවක් ඇති දරුවන් සමුදායකට ශිල්ප සතර ලබා ගැනීම මහ මෙරක් තරම් වූ ස්වප්නයක් බඳුය. නොදියුණු රටවල් බොහොමයක සිප් සතර ලබා ගැනීමට වරම් උදා කර ගන්නේ බොහෝ සීමිත වූ පිරිසකි. මුදල් ප්‍රමාණවත් නොවීම මෙන්ම අධ්‍යාපනය ලබා දීමට ඇති සම්පත් එනම් මානව සම්පත් හා භෞතික සම්පත් ද බෙහෙවින් සීමිතය. සංවර්ධිත රටවල් වල ජීවත් වන මිනිසුන් සුඛෝපභෝගීව සම්පත් අධිපරිභෝජනය කරමින් කල්ගත කරන අවස්ථාවේ දී දුප්පත් රටවල වෙසෙන මිනිසුන් තම දෛනික වේල සපුරා ගැනීමට තම ශ්‍රමය කැප කරමින් වෙහෙසෙන අයුරු ඉතා දුක්ඛදායකය. සංවර්ධිත බොහෝ රටවල දරුවන්ට අධ්‍යාපනය ලැබීමට පූර්ණ නිදහස ලැබී ඇති අතර ඇතැම් සිසුන් තම දෛනික වේල සපුරා ගැනීමට තම ශ්‍රමය කැප කරමින් වෙහෙසෙනා අයුරු ඉතා ශෝචනීය තත්ත්වයකි. සංවර්ධිත බොහෝ රටවල දරුවන්ට අධ්‍යාපනය ලැබීමට පූර්ණ නිදහස ලැබී අතර ඇතැම් සිසුහු තමාට ලැබී ඇති රන් හා සමානව වටිනා කාලය හා මුදල් අපතේ හරිමින් නොමග යති. හොඳ නරක කුමක්දැයි හොඳින් තේරුම් ගැනීමට ඔවුහු පසුබට වෙති. මෙහිදී දුප්පත් රටවල දරුවන් අධ්‍යාපනය ලැබීමට නොහැකිව දුක්ඛිතව ජීවත් වන විට මෙවැනි සිසුන් කාලය හා මුදල් අපතේ හරිමින් ජීවත් වීම අද සමාජය පත් වී ඇති බැරෑරුම් විෂමතාවයකි. ඇතැමෙකු සැප විඳිමින් ද ඇතැමෙකු දුක තුරුළු කර ගනිමින් ද ජීවත් වීම සමාජ ආර්ථිකය තුළ දැකිය හැකි ශෝචනීය විෂමාචාරයකි.

ඇත්තෙන්ම සංවර්ධනය යන තේමාව මුල් කර ගත් රටක් නම් සත්‍ය වශයෙන් කළ යුතු වන්නේ මිනිස්කම අගය කිරීමයි. යථාර්ථය දෙස හැරී බැලුවහොත් අප එකිනෙකාට හැකි කාලයක් නැතිනම් ඇති කාලයක් හා නොමැති කාලයක් යනාදී වකවානුවලට මුහුණ දීමට සිදු වේ. මිනිස්කම අගය කරන්නේ නම් අප කළ යුතු වන්නේ අපට ඇති කාලයේදී නැති අය දෙස බලා සිනාසීම නොව හැකි පමණින් උදව් කිරීමයි.

සැබවින් මිනිස්කමට ගරු කරනා රටක් නම් අදාළ රටට හැකි පමණින් දුප්පත් රටවල දරිද්‍රතාවය එනම් එක් මිනිසෙකුගේ හෝ කුසගින්න නිවා ගැනීමට තම අත දෙන්නේ නම් සැබවින් එය උතුම් මිනිස්කමකි. ප්‍රශංසා හා විවිධ දීමනා ආදිය ලබා ගැනීමේ යටි අරමුණින් තොරව සංවේදී හදවත් ඇති රටවල් දුප්පත්කම තුරන් කිරීමට පියවර ගැනීම අගය කළ යුතු ක්‍රියාවකි. සංවර්ධනය යන වචනය වඩාත් එල දැරීමට නම් දුප්පත් පොහොසත් යන සීමා මායිම් වලින් තොරව සහයෝග යෙන් කටයුතු කර යුතුය.

නූතනයේ බොහෝ රටවල් සංවර්ධනය යන මුදුන එනම් ශීර්ෂය නැගීමට ඉමහත් වූ ආශාවකින් කටයුතු කරන බව අප සැමටම දැක ගත හැකි කාරණාවකි. මේ සඳහා රටවල් වලට ඇත්තේ සීමාමායිම් ඉක්ම වූ තරඟකාරීත්වයකි. හුදු ආර්ථිකමය වශයෙන් පමණක් සංවර්ධනය අපේක්ෂා කරන පාලකයෝ ඔවුන්ගේ රටවල පවතින සම්පත් භාවිතයත් වැඩි කරමින් කර්මාන්තශාලා හා මහා මාර්ග ඉදි කිරීම් මෙන්ම ශ්‍රමය උපරිම ආකාරයෙන් යොදා ගැනීමට පෙලඹෙති. මේ හේතුවෙන් ආර්ථිකය තුළවිවිධ වූ බාහිරතා හට ගනී. මේවා ධන හෝ ඍණ විය හැකි ය. කර්මාන්තශාලා නව ගොඩනැගිලි ඉදි කිරීම සඳහා භූමිය අත්පත් කර ගැනීමට ගස්වැල් කපා දැමීම සිදු කරයි. විශේෂයෙන් මහාමාර්ග ඉදි කිරීම සඳහා වනපෙත් එළිපෙහෙළි කිරීම් ගස් කපා දැමීම් ආදිය සිදුවේ. වනාන්තර එළිපෙහෙළි කිරීම හේතුවෙන් සතුන්ට ආහාර, වාසස්ථාන අහිමි වී ඔවුහු ආහාර හා වාසස්ථාන සොයා මිනිසුන් පදිංචි භූමි ප්‍රදේශ වලට පැමිණෙති. විශේෂයෙන්

අලි ඇතුන් වැනි සතුන් නිදසුන් ලෙස ඉදිරිපත් කළ හැකිය. සංවර්ධනය අත්කර ගැනීම සඳහා ස්වාභාවික වනපෙත් එළිපෙහෙළි කිරීම අනුචණ ක්‍රියාවකි. වනාන්තර එළිපෙහෙළි කිරීමෙන් සිදුවන ආපදා එනම් වැසි නොලැබී යාම වැනි අහිතකර ප්‍රතිවිපාක වලට මුහුණ දිය යුත්තේ ද සංවර්ධනය පසුපස හඹා යන මිනිසාමය. එසේම කර්මාන්තශාලා දියුණු වීමත් සමග රටේ මූර්ත ආදායම වැඩිවුවත් පාරිසරික වශයෙන් විවිධ වූ බලපෑම් එල්ල කරයි. කර්මාන්තශාලා වලින් නිකුත් කරන විෂ දුම් වායු ගෝලයට එකතු වීමෙන් ඕසෝන් ස්තරය ක්ෂය වීමටත් ඒ තුළින් අධික උෂ්ණයක් පොළොවට පතිත වීමටත් බලපා ඇත. වියළි කාලගුණයත් සමගම වැසි නොලැබීමත් නිසා ජලය නොමැතිව නියගය වැනි අතුරු ඵලවිපාක භුක්ති විඳීමට මෙලොව වෙසෙන සියලු ජීවීන් ට සිදුවේ. එසේ කර්මාන්තශාලා වලින් ඉවතලන අපද්‍රව්‍ය ගංගා වලට හා මුහුදට එක් කිරීම ද බරපතළ ප්‍රශ්නයකි. ඒ හේතුවෙන් කුඩා මසුන් බොහොමයක් විෂශරීර ගත වී මිය යාමද, විශේෂයෙන් ගංගා වලින් පානය කිරීමට ආදී පෞද්ගලික අවශ්‍යතාවයන්ට ජලය සපයා ගන්නා අසරණ මිනිසුන්ට ද විවිධ වූ ගැටලු සමුදායකට මුහුණ දීමට සිදු වේ. සංවර්ධනයත් සමග කාර්මික වශයෙන් දියුණුව ලබන විට ඒ තුළින් පරිසරයට ඇති කරන බලපෑම් ඉතා බැරෑරුම් තත්ත්වයක පවතී.

මෙවැනි වූ පාරිසරික බලපෑම් පමණක් නොව මානව සම්පත කෙරෙහි ද ඇතැම් බලපෑම් එල්ල කරයි. විශේෂයෙන් පෞද්ගලික අංශයේ ආයතන වල තම ආදායම ඉහළ නංවා ගැනීමට තම සේවකයන්ගෙන් විවිධ වූ කාර්ය සමුදායක් බලාපොරොත්තු වේ. ඇතැම් විට සාමාන්‍ය වැඩ සමුදායන්ට අමතරව අතිකාල දීමනා වැනි වරප්‍රසාද ලබාදෙමින් ආයතනයන්හි නිමැවුම් ඉහළ නංවා ගැනීමට හිමිකරුවන් පෙලඹී ඇත. ඇතැම් රාජ්‍ය ආයතන වලද මෙවැනි වූ කාර්ය සමුදායක් ඉටු කරනු ලැබේ.

නමුත් ඇතැම් සේවකයෝ තමාගේ කාර්යභාරයන් නිසි පරිදි ඉටු නොකර කාලය අපතේ හරිමින් සිටිති. මෙය සඵලදායී සංවර්ධනයට ඇති ප්‍රබල බාධකයකි. ඇතැම් රටවල් විශේෂයෙන් සංවර්ධිත රටවල් මානව සම්පත කෙරෙහි දැඩි නීති රීති පනවා ඇත්තේ මනුස්සකම ගැනවත් නොසිතාය. නිදසුනක් ලෙස ජපානය ගතහොත් ඔවුන්ගේ ජනගහනය වැඩිවීමත් සමග ජනගහනය අඩු කිරීමේ අරමුණින් විවිධ වූ නීතිරීති පනවනු ලබයි. මෙයින් අසරණ වන්නේ ද එරටෙහි ජනතාවයි. සංවර්ධිත රටවල නිදහසේ සතුටින් තම දරුවනුත් සමග ජීවත් වීම නීතියේ පරිදි සිදුවෙයි. ඇතැම් පාලකයන් සිතන්නේ සංවර්ධනය මිනිසුන් තළා පෙළා බලෙන් අත් කර ගත හැකි තත්ත්වයක් බවයි.

සැබෑ සංවර්ධනයක් අත් කර ගැනීමට නම් ජනහිතකාමීව උණුසුම් හදවතකින් පාලනය කිරීමට රටේ නියමුවන් සියලු දෙනාම පියවර ගත යුතුය. එය උතුම් වූ ක්‍රියාවකි. වේගයෙන් තරගකාරිත්වයට එක් වීමට පවතින සම්පත් අධි පරිභෝජනය කළහොත් වර්තමානය මෙන් නොව අනාගතයේ දී පරිභෝජනය කිරීමට සම්පත් නොමැතිව ජන සමූහයට බරපතළ ගැටුම් සමුදායකට මුහුණ පෑමට සිදුවේ. සංවර්ධනය යන පුළුල් මාතෘකාව එනම් පාරිසරික සංවර්ධනය, ආර්ථික සංවර්ධනය යනාදී විවිධ තේමා සඳහා දූරදර්ශීව සිතා බලා කටයුතු නොකිරීම හේතුවෙන් අනාගතයේ විවිධ වූ අරගල වලට මුහුණ දීමට සිදුවනු නොඅනුමානය. වර්තමානය වන විටත් ඉන් ඇතැම් ප්‍රතිවිපාක වලට මිනිසාට මුහුණ දීමට සිදු වී ඇත.

ඇතැම් රටවල් වල සම්පත් සීමිත වීම නිසා අවශ්‍යතා හා වුවමනා නිසි පරිදි තෘප්තිමත් කිරීමට ඇතැම් භාණ්ඩ හා සේවා ආනයනය කරයි. එසේම රටක සාපේක්ෂ වාසි න්‍යාය යටතේ අඩු පිරිවැයකින් හා වැඩි කාර්යක්ෂමතාවයකින් නිපදවිය හැකි භාණ්ඩ නිෂ්පාදනය විශේෂීකරණය කර රටේ පරිභෝජනයෙන් පසු ඉතිරි වන ප්‍රමාණය එනම් අතිරික්ත ප්‍රමාණය අපනයනය කර අදාළ රටට යම් භාණ්ඩයක් නිපදවීමට වැඩි පිරිවැයක් වැය වන්නේ නම් එම භාණ්ඩ ආනයනය

කිරීම තුළින් ආර්ථික ප්‍රතිලාභ රැසක් ජනනය කර ගැනීමට හැකියාව උදාවේ. ආර්ථික ප්‍රතිලාභ රටක ජනනය වීම සංවර්ධනය කරා පියනගන්නට මහගු අත්වැලක් සපයයි. වර්තමානය වන විට බොහෝ රටවල් ආනයන හා අපනයන වෙළඳාමෙහි විශේෂයෙන් අපනයනයට වඩා ආනයනය කිරීමට පෙලඹී ඇත. රටේ පවතින සම්පත් වල විභජනයේ විෂමතාවය හේතුවෙන් විදේශ වෙළඳාම බිහි වූවත් වර්තමානයේ එය තරඟකාරිත්වයක් බවට පත් වී ඇත. එසේම අදාළ රටවල් වල වෙසෙන බොහෝ දෙනෙකු සිතන්නේ තම රටවල් වල දේශීය නිෂ්පාදනයන්ට වඩා විදේශීය නිෂ්පාදන ගුණාත්වයෙන් හා උසස් ප්‍රමිතියෙන් යුක්ත බවයි. සත්‍ය වශයෙන් ම ඉතා ගැඹුරින් මෙම තත්ත්වය විශ්ලේෂණය කර බැලුවහොත් එය ඉතා අනුවණ දර්ශනයක් වනු නොඅනුමානය. මේ හේතුවෙන් දේශීය නිෂ්පාදන වලට ඇති ඉල්ලුම අඩු වී දේශීය කර්මාන්ත බිඳ වැටීමට පත් වේ. මේ හේතුවෙන් බොහෝ රටවල් වල සංවර්ධනයට දැඩි බාධා එල්ල වී ඇත. එසේම තීක්ෂණ සංවර්ධනයක් අත් කර ගැනීමේ අරමුණින් බොහෝ රජයයෝ විදේශ වලින් ණය ලබා ගැනීම සිදු කරති. ඇතැම් රටවල් ණය ලබා ගන්නේ රටේ පරිභෝජන වියදම් පියවා ගැනීමටය. සත්‍ය වශයෙන් විමර්ශනයක් සිදු කළහොත් කිසියම් රටකට පරිභෝජන වියදම් හෝ පියවා ගැනීමට නොහැකි නම් එම රට ඉතා අකාර්යක්ෂම තත්ත්වයක පවතියි.

මෙවැනි අකාර්යක්ෂම තත්ත්වයක් යටතේ ණය ලබා ගන්නා විට ඒවා ආපසු ගෙවීමේ දී දැඩි අපහසුතා වලට පත් වීමට සිදු වේ. මෙවැනි වූ තත්ත්වයන් වලදී විදේශ රටවලින් ණය ලබා ගැනීම කබලෙන් ලිපට වැටුණා හා සමානය. මෙවැනි වූ ණය ගැනීම් වලින් සමන්විත වූ රටක් තමන් ලද මූර්ත ආදායමින් වැඩි වශයෙන් වියදම් කරන්නේ ණය පොලී ගෙවීමටය.

ඒ මන්ද යත් විදේශ රටවල් වලින් ලබා ගන්නා ණය සඳහා ඉහළ පොලී ප්‍රතිශතයක් හිමි වීම නිසාය. බොහෝ ආර්ථිකයන් පිරිහීමට මෙය ඉතා ප්‍රබල සාධකයකි. ඇතැම් අදූරදර්ශී පාලකයන් ආර්ථික වෘද්ධිය හා සංවර්ධනය පිළිබඳ මඳ අවබෝධයකින් යුතුව ණය ලබා ගැනීම් වලින් පීඩාවට හා අසරණ තත්ත්වයකට පත් වන්නේ රටේ මහ ජනතාවය. රටේ ණය පියවා ගත නොහැකි අවස්ථා වලදී ඊට පිළියමක් වශයෙන් යොදන්නේ බදු ප්‍රතිශතය ඉහළ නැංවීමය. මෙහිදී භාණ්ඩ හා සේවා වල මිල ඉහළ යාමක් සිදු වෙයි. අසරණ පාරිභෝගිකයන්ට වැඩි මිලකට භාණ්ඩ හා සේවා මිලට ගැනීමට සිදුවේ. මෙම ක්‍රියාමාර්ගය ප්‍රබල වශයෙන් බලපාන්නේ අඩු ආදායම් ලාභීන්ටය. ආදායම් බෙදී යාමේ විෂමතාවය හේතුවෙන් මිල ඉහළ නැංවීමකදී ඔවුන් ලබන සුළු වැටුපෙන් පරිභෝජන වියදම් හෝ පියවා ගත නොහැකි තත්ත්වයන්ට පත්වේ. කුමන හෝ රැකියාවක් කර දෛනිකව උපයා ගන්නා මුදලින් පරිභෝජනය එනම් තමන්ගේ වේල් තුන හෝ සපුරා ගැනීමට නොහැකිව ඔවුහු දුක්ඛිත තත්ත්වයකට පත් වෙති. එසේම නිසි පරිදි ආහාර නොගැනීම හේතුවෙන් ඇතැම් පිරිස් විවිධ රෝගාබාධයන්ට ද ලක්වෙති. රටේ ආදායම් හා වියදම් නිවැරදිව හා සඵලදායීව කළමනාකරණය නොකිරීම හේතුවෙන් ජනතාවට මෙවැනි වූ ප්‍රශ්න සමුදායකට මුහුණ පෑමට සිදුවී ඇත. විශේෂයෙන් නූතන මිනිසා මුදල් පසුපස ලුහු බැඳීම බෙහෙවින් තියුණු වී ඇති අතර ධනය, බලය හා මාන්නයට මංමුළා වී එකිනෙකා පෙළා ගනිමින් අනෙකාට වඩා තමන් උසස් කර ගැනීමට වැර දරන සමාජයක අපි ජීවත් වෙමු. බොහෝ විට ධනවත් මිනිස්සු තමාට ඇති බලය පදනම් කර ගනිමින් දිළිඳුන් පෙළීම සිදු කරති. ඔවුන් තමා මෙන්ම එකම ලෙයින් හා කොඳු ඇට, මස් නහර වලින් සැදුම්ලත් මනුෂ්‍යයන් බව සිතන්නේ බොහෝ සීමිත පිරිසකි. මෙවැනි වූ අවස්ථාවන් වලදී මනුස්සකම කොතැනක සැඟවී ඇත් දැයි විමසා බැලිය යුතුය.

මෙහිදී සාවධානව සියලු කරුණු දෙස නෙත් යොමු කළහොත් "සංවර්ධනය" හා "මනුස්සකම" යන සංකල්ප දෙක එකට තෙරපෙන සංකල්ප දෙකක් බව අපට මනාව විද්‍යමාන වේ. අද ආර්ථිකයන් තුළ පවතින විවිධ වූ කාලීන ගැටලු පිළිබඳ හොඳින් අධ්‍යයනය කළහොත් මිනිස්කමට ගරු කරමින් එම ගැටලු නිරාකරණය කිරීමට යහපත් පිළියම් යෙදිය හැකි බව

අපට මනාව ප්‍රත්‍යක්ෂ වේ. සංවර්ධනය සඳහා මහාමාර්ග සෑදීමේ දී ගස් කොළන් කපා දමන බැවින් ඒ වෙනුවට පාර දෙපස ගස් කොළන් සිටුවා ඒවා නඩත්තු කිරීමට රජය පියවර ගත යුතුය. කර්මාන්ත ශාලා වලින් ගංගා වලට මුදා හරින අපද්‍රව්‍ය ඊට මුදා නොහැර වෙනයම් ක්‍රියා මාර්ගයකින් ඒවා නිසි පරිදි බැහැර කිරීමට පිළියම් යෙදිය යුතුය. පාරවල් සෑදීමට වනපෙත් එළිපෙහෙළි කිරීම හේතුවෙන් අසරණ වී සිටින සතුන් වෙනත් වනපෙත් කරා රැගෙන යාම හෝ වෙනයම් ක්‍රියාමාර්ග ඒ සඳහා යෙදිය යුතුය. මෙවැනි වූ ක්‍රියා සමුදායන් හරියාකාරව අනුග මනය කිරීම තුළින් සංවර්ධනය පරිසර හිතකාමී ලෙස පවත්වා ගෙන යාමට හැකියාව ලැබේ.

එසේම පරිසරයට පමණක් නොව රටේ වෙසෙන ජනතාවටද සංවර්ධනය තුළදීත් ගැටුම් සමුදායකට මුහුණ දීමට සිදු ව ඇති හෙයින් ඒ සඳහා විශේෂයෙන්ම රජයක් කළ යුතු වන්නේ ආදායම් බෙදී යාමේ විෂමතා අවම කිරීම සඳහා විවිධ නීතිරීති හා අණපණත් යෙදීමයි. එසේම රටේ සංවර්ධනයට මහගු රුකුලක් සපයන සේවානියුක්තිකයන් දිරිමත් කිරීම සඳහා විවිධ දීමනා හා වරප්‍රසාද ලබා දීම් එසේම විවිධ තරග යනාදී කටයුතු සංවිධානය කළ යුතුය. එසේම භාණ්ඩ හා සේවා සඳහා පනවා ඇති බදු ප්‍රතිශතය මහ ජනතාවට හිතකර ප්‍රශස්ත මට්ටමක පැවතිය යුතුය. එවිට රජයට විරුද්ධව මහ ජනතාව ක්‍රියාත්මක කරන්නාවූ උද්ඝෝෂණ යනාදිය සීමා කළ හැකිවේ. ආනයන කිරීම් වලට වඩා අපනයනය කිරීම් වැඩි කිරීම තුළදීත් දේශීය කර්මාන්ත දිරිගන්වා සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමට මහගු පිටිවහලක් සැපයිය යුතුය. දේශීය සැපයුම්කරුවන් දිරිමත් කිරීම සඳහා සහනදායී ණය ව්‍යාපෘති දියත් කළ යුතුය. මෙවැනි ක්‍රියා සමුදායන් මගින් ජනහිතකාමී ලෙස සංවර්ධනය කරා පිය නැගීමට ආර්ථිකයන්ට හැකියාව උදා වේ.

ඉහත ආකාරයන්ට මිනිස්කමට ගරු කරමින් සංවර්ධනය ඇති කරගෙන හෙළ අඹරේ දිදුලන තරුවක් වන්නට ආර්ථිකයන්ට හැකියාව ලැබේ. ඒ තුළින් පාරිසරික හා ජනහිතකාමී හෙටක් දැකීමේ මගේ සිහිනය සාක්ෂාත් වනු නොඅනුමානය.

# විචාරය

'සංවර්ධනය' දැඩි ලෙස ම ද්‍රව්‍යමය වූවක් හා තනිකර ම යටිතල පහසුකම් සංවර්ධනයට සීමා වූවක් නොවන බවටත් එහි නිර්වචනයේ කොටසක් ලෙස මිනිසාගේ මනුෂ්‍යත්වය හා පාරිසරික සවිඥ්ඥාණික භාවය දියුණු වීමට තුඩු දෙන පරමාර්ථ ඇතුළත් කළ යුතු බවටත් රචනය පැහැදිලි ස්ථාවරයක් පළ කරයි. මෙම ස්ථාවරය රචනය ආරම්භයේ දී ම ගනු ලබන අතර සංවර්ධනය සමාජ අසමානතා තුරන් කරන සාධකයක් විය යුතු ය යන අදහස ද ඊට ඇතුළත් කරනු ලැබේ. එම නිසා පරිසරය සුරැකීමට දායක වන යහපත් පරමාර්ථ ඇතුළත් කිරීමට අසමත් වීම සංවර්ධනයේ සාර්ථකත්වය සඳහා ඉතා ම යෝග්‍ය තත්ත්වයක් ලෙස දකිනු ලැබේ. කෙසේ වුව ද සෑම රටක් ම ලෝකය සමග ඉදිරියට යාමට නම් යම් ආකාරයක සංවර්ධනයක් සිදු විය යුතු බව ද රචනය ආරම්භයේ දී ම ප්‍රකාශ කරයි. එහෙත් මෙම ප්‍රකාශය සාමාන්‍ය අර්ථයෙන් කෙරෙන්නක් බව පෙනෙන අතර යම් 'ආකාරයක සංවර්ධනයක්' ලෙස සැලකිය හැක්කේ 'කිනම් දෙයක් ද' යන්න සම්බන්ධ අවම ප්‍රමිතියක් පිළිබඳ අදහසක් වත් ඉන් ඉදිරිපත් නො වේ. 'සංවර්ධනය' යනු කුමක් ද යන්න පිළිබඳ මිනුම් දණ්ඩක් නොමැති තත්ත්වය තුළ ඉතා සීමිත අර්ථ නිරූපණයක් සම්පාදනය කරති යි පෙනී යන බැවින් මෙම විධානාත්මක ප්‍රකාශය රචනය තුළ දී ධනාත්මකව දායක නො වන අතර යටිතල පහසුකම් පැවතීම සංවර්ධන ස්වරූපයක් ලෙස සුදුසුකම් ලැබීමට එය හේතු වනවා විය හැකි ය.

සිසුවිය 'තාක්ෂණික පසුගාමිත්වයක්' යැයි ප්‍රකාශ කරන තත්ත්වය පැවතිය දී ම රචනය පෙර යුගවල දී අප රට සතුව ස්වයං පෝෂණය පදනම් කර ගත් ඉතා ශක්තිමත් ආර්ථිකයක් තිබූ ආකාරය පැහැදිලි කරමින් සිත් ගන්නාසුලු දැක්මක් ඉදිරිපත් කරයි. කෙසේ වුව ද එකල පැවති ආර්ථික ස්ථාවරත්වයේ සැබෑ තත්ත්වය පිළිබඳ ඉතා පැහැදිලි නිරීක්ෂණයක් කරන නමුත් සැසඳීම කෙරෙන්නේ අතිශයින් ම වෙනස් යුග දෙකක් අතර බව හඳුනා ගැනීමට සිසුවිය අසමත් වෙයි. පැවති ආර්ථික ශක්තිය සම්බන්ධයෙන් අගය කිරීමට ලක් වන එම යුගවල දී දැන් පවත්නා තාක්ෂණය පවතින්නට ඇතැයි සිතිය නොහැකි ය. සැසඳීම සමබර නොවන අතර ආර්ථික ස්වයං පෝෂණය පිළිබඳව සිසුවිය කරන ප්‍රකාශයේ අගය ඌනනය කිරීමට හේතු වේ. ස්වයං පෝෂණය සාක්ෂාත් කර ගැනීම යන්නෙන් එවක දී නිසැකව ම අදහස් වූයේ එම අතීත යුගයේ මහජනතාව හා ආණ්ඩුව සිය ආර්ථික පරමාර්ථ කරා ළඟා වීම සඳහා අවශ්‍ය කරන්නේ කවරාකාර තාක්ෂණයක් දැයි දැන සිටි බව විය යුතු ය. ඒවා කෘෂිකාර්මික ආර්ථිකයේ වර්ධනය වේගවත් කරන්නට ඇත.

පෙර යුගයන් උත්කෘෂ්ට ඒවා සේ සැලකෙන අතර සූරා කෑමෙන් තොර වූත් සහයෝගිතාව හා සමාජ සුසංවාදය අතින් ප්‍රශස්ත මට්ටමේ පැවතියා වූත් යුග ලෙස හඳුන්වමින් ඒවා තරමක් දුරට පමණ ඉක්මවා පරමාදර්ශ බවට පත් කිරීමක් සිදු වේ. අතීත යුගයක් පිළිබඳ වඩා ප්‍රායෝගික වූ සත්‍යයන් සොයා ගැනීමට නම් ඇයට තම මතය මීට වඩා පුළුල්ව විශ්ලේෂණය කිරීමට සිදු වන නමුත් සමාජ ඒකාබද්ධතාව හා සුසංවාදය ප්‍රශස්ත මට්ටමේ පවතින සමාජ පටිපාටිය සංවර්ධනයට පවත්නා බාධාවන් සමස්ත ආකාරයකින් ඉවත් කිරීමට උපකාර වන බවට කරන ප්‍රකාශය සත්තකින් ම අතිශයින් ඒත්තු යනසුලු තර්කයකි.

රචනයේ සමහර ප්‍රකාශයන් සමාන්‍යකරණයන් වන අතර ඒවායේ මූලාශ්‍ර දක්වා තිබුණේ නම් ප්‍රයෝජනවත් විය හැකිව තිබිණ. අද දින වන විට බොහෝ රටවල් සංවර්ධනය සාක්ෂාත්

කර ගෙන ඇතැයි කරන ප්‍රකාශය එවැන්නකි. ලතින් ඇමරිකානු රටවල, අප්‍රිකානු රටවල මෙන් ම ඇමරිකා එක්සත් ජනපදයේ සමහර ඌන වරප්‍රසාදිත ප්‍රදේශවල පවා පවතින අන්ත දරිද්‍රතා මට්ටම් ඉහත සඳහන් කළ ප්‍රකාශය සිසුවියගේ ප්‍රකාශයන් පෘථිවි ගෝලයට ම අදාළ කළ නොහැකි මතයක් බව පෙන්නුම් කරයි. සෝමාලියාව හා නයිජීරියාව වැනි රටවල් ගැන සඳහන් කරන සිසුවිය ස්වාභාවික සම්පත් හිඟකම හා ජනතාව අතර නිපුණතාවන් නොමැතිකම නිසා ඒවා අසංවර්ධිත යැයි ප්‍රකාශ කරයි. මෙය බොහෝ අප්‍රිකානු රටවල් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ පවත්නා එක් ආකාරගත වැටහීමකි. දූෂණය හා බටහිර දේශපාලන මැදිහත් වීම් සහ මහජනතාවට ප්‍රතිලාභ ලබා දීම ප්‍රතික්ෂේප කරමින් ඔවුන් පරදුවට තබා ධනපතියන්ගේ අවශ්‍යතාවන්ට සේවය කිරීම සඳහා ස්වාභාවික සම්පත් අඛණ්ඩව ගසා කන විටින් විට බලයට පත් වන මර්දනකාරී පාලන තන්ත්‍ර විසින් පවත්වා ගෙන යන ආධිපත්‍යය නිසා අප්‍රිකානු රටවල අතිමහත් සමාජ අසමානතා පවතී. දියමන්ති සම්පත නිසා සියෙරා ලියොනය පත්ව සිටින අසීරු තත්ත්වය මීට එක් උදාහරණයකි. නයිජීරියාවේ තෙල් සම්පත තවත් උදාහරණයක් වේ. කොන්ගෝ ජනරජයේ ඉතිහාසය ඇතැම් විට මේ සම්බන්ධ ප්‍රශස්ත උදාහරණයක් විය හැකි ය. මර්දනය කරමින් හා 'බලාත්කාරී දරිද්‍රතාව' නිර්මාණය කරමින් බටහිර ධනවාදී පාලන තන්ත්‍ර එරට ජනතාව අවාසනාවන්ත ඉරණමකට ගොදුරු කර ඇත.

රචනය මේ වන විට වර්ධනය වෙමින් පවතින ගෝලීයකරණය වූ ආර්ථික පද්ධතිය ජාතීන් අතර ජාත්‍යන්තර අසමානතාවකට තුඩු දී තිබෙන ආකාරය ගැන අතිශයින් ම ඒත්තු යනසුලු තර්ක කිහිපයක් ඉදිරිපත් කරයි. මෙම රටවලින් සමහරක් පරිභෝජනවාදයේ ගැලී නාස්තිකාර තත්ත්වයට පත් වන අතරතුර වෙනත් රටවල ජනයා දවසකට එක වේලක් කා අසීරුවෙන් දිවි සරි කර ගනිති. ජාතීන් අතර සම්පත් පරිභෝජනය අතින් අතිමහත් අසමානතාවක් පවතින අතර අවධානය යොමු කළ යුතු ප්‍රධානතම ක්ෂේත්‍රයක් වන්නේ එයයි. සමාජ අසමානතාව මුලිනුපුටා දැමීම සංවර්ධනයේ නිර්වචනාත්මක අරමුණක් වන සංවර්ධන ස්වරූපයක් සාක්ෂාත් කර ගැනීමට නම් සම්පත් පරිභෝජනය සම්බන්ධයෙන් පවත්නා යට කී අසමානතාව පිළිබඳව අනිවාර්යයෙන් ම තක්සේරුවක් කිරීමට සිදු වේ. රචනය මහත් අවධානයකට ලක්ව ඇති ජල සම්පත් දූෂණය ද ඇතුළු පාරිසරික හා පරිසර විද්‍යාත්මක ගැටලු සම්බන්ධයෙන් අදට වඩා සැලකිලිමත් වීමේ අවශ්‍යතාව පිළිබඳව සමහර අගය කළ හැකි කරුණු ඉදිරිපත් කරයි. සංවර්ධන සංකල්ප පුද්ගල නිදහස පිළිබඳ සංකල්ප සමග ඒකාබද්ධ කළ යුතු ය යන අදහස ද අවධානය දිනා ගන්නකි.

සිසුවිය ප්‍රමුඛතම සැලකිල්ල ජනතාවගේ ආර්ථික යහපැවැත්ම කෙරෙහි යොමු කරන සංවර්ධනයක දී ආනයන හා අපනයන ප්‍රතිපත්තිවලට සංවර්ධන ප්‍රතිඵල හැඩ ගැස්විය හැකි ආකාරය පෙන්නුම් කරමින් එය අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍රයක් බව ද පෙන්වා දෙයි. සිසුවිය ජාත්‍යන්තර වෙළඳ හා වාණිජ පද්ධතිය තුළ දී දේශීයව නිෂ්පාදිත භාණ්ඩවල මිල පහත වැටීම ද සංවර්ධනයට බාධාකාරී වන බව හඳුනා ගෙන ඇත. ස්ථාවර ආර්ථිකයක් ස්ථාවර වාතාවරණයකින් සමන්විත වන අතර පරිසරය සුරැකිය යුතු ය යන සමස්ත අභිමතාර්ථය උදෙසා සංවර්ධනය සේවය කළ යුතු ය යන අදහස සමග මෙම සැලකිලිමත් වීම් සම්බන්ධ කරමින් සිසුවිය සංවර්ධනය සහෝදර මිනිසුන්ට පමණක් නො ව පරිසරයට ද සේවය කළ යුතු බවට ද එමගින් මනුෂ්‍යත්වයේ වඩා ශ්‍රේෂ්ඨ ස්වරූපයක් සාක්ෂාත් කර ගත යුතු බවට ද කරන යෝජනා ප්‍රශංසනීය ය. තර්කවලට රුකුල් දීම සඳහා තවත් පර්යේෂණාත්මක කරුණු එක් කර රචනය වැඩි දියුණු කළ හැකි ය. රචනයේ තානය හා භාෂා විලාසය කාව්‍යමය හා පාඨකයාට අදහස් ඒත්තු ගන්වනසුලු වේ.

# සංවර්ධනය සහ මනුස්සකම

එදිරිසිංහ ආරච්චිලාගේ චමිල දුමින්ද
13 ශ්‍රේණිය,
ගලහිටියාව මධ්‍ය මහා විද්‍යාලය - ගණේමුල්ල

"ඔබ ඔබේ දරුවන්ට ඉගැන්විය යුත්තක් වෙයි. මේ පොළොව අපගේ මාතාව බව ඔබේ දරුවන්ට කියා දෙනු. මක් නිසා ද පොළොවට සිදුවන දෙය ම ඔබේ දරුවන්ට ද සිදුවන නිසාය. මිනිස්සු බිමට කෙළ ගසත් ද ඔවුහු ඔවුනට ම කෙළ ගසා ගනිති."

-සියැටල්

ඉහත දාර්ශනික මතය පුද්ගල ජීවිතයට සපයන ආදර්ශය විශේෂිත ය. (යමෙකුට මිහිකත දෙපයින් නැඟිට සිටින්නට උපකාර කරන්නේද ඔහු දෙපයින් නැඟිටි පසු උපකාර කළ තැනැත්තා අමතක වීම කනගාටුදායක පුවතකි).

සංවර්ධනය කොටස් දෙකකි එනම්,

I. භෞතික සංවර්ධනය
II. මානව සංවර්ධනය

ඒ හා බැඳී පවත්නා මිනිස්කම ද බලවත් සංකල්පයකි. යම් විටෙක රටක් සංවර්ධනයේ හිණි පෙත්තට යා හැකිය. එය භෞතික වශයෙන්ම පමණක් වූ සංවර්ධනයකට සීමා වුවහොත් මානව සංවර්ධනය සිදු නොවීමෙන් බලාපොරොත්තු වූ සංවර්ධන ක්‍රියාදාමය සාර්ථක නොවනු ඇත. "කොබෝ මලෙන් ඇහැ කණ වීම" ඉතා සුළු දෙයකින් ඇති විය හැකි මහ විපතකි. එහෙයින් යමක අනාගත ප්‍රතිඵලය පිළිබඳ පූර්ව අධ්‍යයනයක් කළ යුතුය.

"ඔය දෑල දොඩමලුය සුවඳ බැරුවා ඉන්ට
නිල් වතුර තුරළු කර කෙසේ අතහැර යන්ද
කෙකටිය පඳුර සුදු මල් පොකුර වඩා ගෙන
සොඳුර නුඹ වාගෙම හිනැහෙන්නේය මා එක්ක"

-වස්සානේ කාව්‍ය සංග්‍රහය

ගංගාවේ ඉවුරු දෙක නිරන්තරව දොඩමලු වේ. දොඩමලු පෙම්වතුන් වාගේය. නිල්ල නිලන දිය දහර ගං මත්තේ උඩ පනින්නේ මිනිසා වැළඳ ගන්නට ය, තුරුළු කර ගන්නට ය. සොබාදහමේ ආදරයේ තරම කියා පාන්නේ දරුවෙකු මෙන් මල් පොකුරක් වඩාගෙන සිටින්නා වූ කෙකටිය පඳුරයි. සංවර්ධන ක්‍රියාවලියත් එක් පැතිකඩකින් මිනිසා ඔසවා තබන, මිනිසා වැළඳගන්නා, තුරුළු කර ගන්නා නිල්වන් දිය දහරාවකට සමානය. දූයේ දුවා දරුවන් හෙට ලොව පූදින මල් පොකුරු සේ විකසිත වන්නේ භෞතික සංවර්ධනය සහ මිනිස්කම මතිනි. මිනිසා කැමති බුද්ධිමත් ජීවියා ලොව බොහෝ අභියෝග ජයගෙන ඇත. එහෙත් එය භෞතික සංවර්ධන නැග්මකට සීමාවී ඇත. මානව වශයෙන් ආධ්‍යාත්මික ගුණ වගාව ඔහු තුළ මිහිදන්ව පවතී. තුන්වන ලෝකයේ රටවල් බොහොමයක් සංවර්ධනය වෙමින් පවතින කිසිදා සංවර්ධිත තත්ත්වයට පත් නොවීමට හේතුව මානව සංවර්ධනයේ පසුබෑමයි. සංවර්ධනය වූ කලි මිනිසා පොදු සමාජ යහපත කරා මෙහෙයවන මිනිස්කමේ කැඩපත බඳුය.

කුමක්ද අපි සංවර්ධනය ලෙස දකින්නේ, කුමක්ද අපි මිනිස්කම කියන්නේ යන්න අප ස්වයං අධ්‍යයනයකට යොමු කළ යුතු කරුණකි.

"බොහෝ දුර යාමට නම් සෙමින් ගමන් කළ යුතුය" මෙය ප්‍රසිද්ධ වදනකි. ඒ අනුව සංවර්ධනයන් සිදුවිය යුත්තේ මිනිස් හැසිරීමට උචිත අයුරිනි. පුද්ගලයාට පමණක් නොව එය පරිසර පද්ධතියට ද හිතකර සාධාරණ ක්‍රියාවලියක් විය යුතුය.

මිනිස්කම නැමති මහා නෞකාව පදවන නැවියා සංවර්ධනයයි. සියලු දෙනාගේ ජීවිත හා නැවෙහි ආරක්ෂකයා නැවියාවන අතර මිනිස්කම රැක ගැනීම ද සංවර්ධනය නැමති නැවියාට භාර වේ. ගමින් ගමට, රටින් රටට, පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වූ ලක්ෂණ පවතී. මේවා හඳුනා ගැනීම මිනිස්කමය.

"වේවැල් කෝටු නාරං සියඹලා අතු
කිතුල් පොල් ඉරටු කහඹිලිය අතු
මේ හැම ඉපල් මගෙ දෑසට නොපෑ යුතු
පමා නොවී එම් අකුරට මෙයින් මතු"

මෙම කවි පෙළ තුළ සංවර්ධනය හා මිනිස්කම මුහු වී ඇත. දරුවා පාසලට පැමිණීමේ ප්‍රමාදයෙන් දඬුවමට පත්ව ඇත. එහෙත් අවසාන පැදි පෙළින් දරුවා පවසනුයේ මින් මතුවට එසේ සිදු නොවන බවයි. එය දරුවාගේ දඬුවමට බිය නිසා හෝ දරුවාගේ කැමැත්ත මත සංවර්ධනය කරගත් ගුණාංගයකි. මේ අයුරින් අතීතයට වඩා අනාගතයේ වෙනසක් දැකීමේ සිහිනය සැබෑ වී ඇත. ඉපැරණි ලාංකික සමාජය තුළ මානව සංවර්ධනය යම්තාක් දුරට යහපත් වුවත් වෙනස්වන කාර්මික සමාජය තුළ එනම්, කාලීන සමාජය තුළ එහි පිරිහීමක් දක්නට ලැබේ. අතීතයේ ලක් දෙරණේ සංවර්ධනය ගොළුබෙලි ගමනට සමානය. එහෙත් සංවර්ධන ක්‍රියාවලි සිදුවිය.

සංවර්ධන ක්‍රියාවලිය අතීතයේ ඉබිගමනින් සිදු වූ නමුත් වර්තමානය වන විට එය විදුලි කෝච්චියක ගමනකට සමානය. "වන සතුන් සහ ඔවුන් පදිංචි කලාප මනස්කාන්ත හා අසිරිමත් වනයක් මෙන් ම අපගේ ස්වාභාවික දායාදයේ කොටසක් සේ සැලකිය යුතු වේ. අපගේ අනාගතය, සුභ සාධනය හා ජීවනෝපාය ඒ ඔස්සේ රැඳී ඇත."

ජුලියස් නයරේ පැවසූ අන්දමට අතීතයේ අසිරිමත් මෙන්ම මනස්කාන්ත වනගොමු දක්නට ලැබුණි. ඒවා මත කුඩා අඩි පාරවල්, කරත්ත පාරවල් මාර්ග ලෙස සකස් වී තිබුණි. එක් වරකට එක් ගමන් වාරයකට පමණක් සීමා වූ මේ කුඩා මාර්ග දූවිලි, මඩ වගුරු, ගල් ආදී බාධක රැසකගෙ න් යුක්ත විය. අතරමග වන සත්තු අරක්ගෙන සිටිති. මිනිසා සතුනට බියේ ගස්වැල්වල පිහිට පතා සැඟවේ. ඉතා දුෂ්කර ගමනක් ඔවුනට අත්වූවා මිස සුවදායක ගමනාන්තයක් ඔවුනට උදා නොවීය. ගැල් අදින ගවයාටත්, ගොපල්ලාටත් විඩාව ගමනට බාධකයකි. මඳ දුරක් ගොස් විඩාව මහන්සිය නිවා, ආහාර පාන ගෙන, දියකඩිතිවලින් ජලය පානය කොට නැවත ගමන අරඹති. මේ නිසා සංවර්ධනයේ ඡායාමාත්‍රයක් පෙනෙන්නට නොවීය. වෙළඳාමේ ගිය වෙළෙඳුන්ට දින, සති, මාස ගෙවමින් ගමන් කිරීමට සිදුවිය. අතරමගදී සිදුවන අනතුරු වලින් ගමන ප්‍රමාද විය. ඔරු පාරුවලින් ගමන් ගත් තොටියන් මුහුදු ගැබේ ගිලීමත් අතරමං වීමත් අතීතයේ සිදුවිය. සංවර්ධනය දැකීම එකල "කළු නික සෙවීමක්" විය.

එතරම් දුර්ලභ දෙයක් වූ සංවර්ධනය පිළිබඳසිතීමත් හාස්‍යයට කරුණක් විය. අනේක පීඩා විඳ දුක් ගැහැට මධ්‍යයේ ගෙවූ අතීත ජීවිතයට අනාගත පෙරනිමිති නොවීය.

පාසල් යන විට දෙපයට පාවහන් යුගලක්, ලිවීමට පත පොතක් හෝ පැන්සලක් නොමැති යුගයක් පැවතිණි. ගල් ලෑල්ලක් සහ ගල් කූරක්, අතැතිව ගවුම් හැඳි, සරමින් සැරසුණ ළමා පෙළ පාසල් යන්නේ අනාථයන් මෙන්ය. එවිට අධ්‍යාපනයේ සංවර්ධනයක්ද නොවීය.

"සමහර පොත් ඇත්තේ දිව ගා බැලීම සඳහා ය. සමහර පොත් ගිල දමනු සඳහා ය. තවත් සමහර ඒවා හපා ජීර්ණය කරගනු සඳහා ය."

ප්‍රැන්සිස් බේකන් පඬිවරයා පවසනුයේ එලෙසය. එහෙත් අතීතයේ පොතක් හෝ පිටුවක්වත් නෙත නොගැටුණු යුගයක් විය. ඒ තුළ අධ්‍යාපනයක් අවබෝධයක් දක්නට නොවීය. අනාගත ආයෝජනයක් මානව ප්‍රගතියක් උදාකර ගැනීමට එම ක්‍රියාවලිය උපකාරී නොවීය. එහෙත් එය ප්‍රායෝගික ජීවිතයට යමක්, අත්වැලක් සැපයීමට සමත් විය.

මෙම අධ්‍යාපනය සංවර්ධනය නොවූ අධ්‍යාපනයක් ලෙස පෙන්වීම සාධාරණ ක්‍රියාවලියකි. එය එසේ වන්නේ පුද්ගල බුද්ධිය යදම් වලට කොටු වීමය. ගිහි පක්ෂය ලෞකිකත්වයෙන් බැහැර වූ බුදුගුණ පදනම් වූ ග්‍රන්ථකරණයේ නියැලීම සාධක ලෙස පෙන්විය හැකිය. ගුරුවරයා ගෝලයෙකු මිස ශිෂ්‍යයෙකු බිහිකිරීමක් සිදුනොවීය. ඒ තුළ නිර්මාණය වූ පරපුර අඩු දැනුමකින් පුද්ගල සංවර්ධනයෙන් පහත් ස්තරයක විය. නමුදු ඔවුහු මිනිස්කම හඳුනාගත් දැහැමි, දුර්ගුණ බැහැර ලූ පෞරුෂවර්ධනයෙන් යුක්ත වූහ. සංවර්ධනය මානුෂීය සාධක මත නිරායාසයෙන් මුසුවිය. අද මෙන් නොව අතීතයේ ගැටුම් අවමය. පුද්ගලයා සරල දිවි පෙවතක් ගත කළේ ය. පුද්ගල අවශ්‍යතා සීමිත වීම ඊට හේතු ලෙස පෙන්වාදීමට පුළුවනි. "ගම් පෙරළිය" යනු මාර්ටින් වික්‍රමසිංහ නම් වූ හෙළයේ මහා ගත් කතුවරයාගේ ග්‍රන්ථයකි. එයින් ගමක් තුළ සිදු වූ විශාල පෙරළියක් සහෘදයාට සම්ප්‍රේෂණය කරනුයේ ඒ තුළට පාඨක අවධානය ගෙන එමිනි. ගමේ පෙරළිය ගම් පෙරළිය නමින් දොරටු වඩී. මෙයද යම් ආකාරයකට සංවර්ධනයේ ප්‍රායෝගිකත්වය පෙන්නුම් කරන්නකි.

"කට කොනකින් සිනාසෙද්දී ලෝකය මිනිසාට ප්‍රේම කළේ ය. ඔහු හඬ නගා සිනාසෙද්දී ලෝකය ඔහුට බිය වූයේය."

-රවීන්ද්‍රනාත් තාගෝර්

ඉහත විදග්ධ කියමනින් අපි සංවර්ධනයට පිය නැගූ මඟ ආවර්ජනය කර බලමු. බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් වූ පසු රටේ කාර්මික සංවර්ධනයක් ඇතිවිය. එපමණක් නොව දේශපාලනික, සමාජීය, ආර්ථික ක්ෂේත්‍රවල පුළුල් වෙනස්කම් රාශියක් ඇතිවිය. මේ අනුව හණමිටි අදහස් ඔපමට්ටම් කොට නවමු මාවතකට යොමුවිය. ඉංග්‍රීසීන් අපේ රටේ වටිනා භෝග, වස්තු සම්පත් රැසක් විනාශ කළ බව සත්‍ය කරුණකි. ඔවුන් අපට දායාද කළ දේ රටේ සංවර්ධනයට භෞතික සංවර්ධනයට අඩිතාලමක් ද විය.

විදේශීය ජාතීන් පැමිණි මුල් යුගවල ලක් වැසියෝ ඔවුන් දුටුවේ "ලේ බොමින් තිරුවානා ගල් කමින් සිටින වෙනත් ජීවි විශේෂයක් ලෙසය."ලේ පැහැයෙන් යුතු වයින් ද තිරුවානා ගල් වැනි පාන් ද සිංහල වාසීන් දුටුවේ ඒ අයුරිනි. මත්පැන් පිළිබඳ හෝ මේවා පාන් යැයි නොදත් ලක්වැසියා මේවා දැක බියගුලු විය. පසුව මේ ගැන දැනගත් ඔවුන් තුළ සුදු ජාතිකයන්ට වූ බිය තුරන්ව ගියේය. හැඩි දැඩි විශාල සිරුරුවලින් යුක්ත සුදු ජාතිකයා කාර්යශූරය. එහෙයින් ඔවුන් විසින් ලක්දිව මංමාවත් පද්ධතිය පුළුල් කර, දුම්රිය මාර්ග ද තනන ලදී. කඳු හාරා උමං මාර්ග ඔස්සේ දුම්රිය කඳුකරය දක්වා රැගෙන යන ලදී. මින් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රය ද දියුණුවට පත්විය. වෙළඳාම පුළුල් විය. පසුව සමාජීය ක්ෂේත්‍රයේ සංවර්ධනයක් ද ඇතිවිය. සමාජයේ රැකියා වෙළඳපොළ තුළින් මුදල් උපයා ගැනීමටත් ධනේශ්වර ආර්ථික ක්‍රියාවලියක්

සඳහාද ඒ තුළින් පදනම සකස් විය. වතු ආර්ථිකය තුළින් වතුකර ජන සමාජයට ආර්ථික අත්වැලක් ද සැපයිණි.

"අලි ගිය අඩිපාර බැලීමට කන්නාඩි අවශ්‍ය වීම" යමක් කිරීමට නුවුවමනා දේ මුල් කර ගැනීමට ලාංකික සමාජ මුල් නොවී ලැබුණු අවස්ථාවෙන් එල නෙළීමට කටයුතු කරන ලදී."

පරිසරය පිළිබඳ කිසිදු ඇල්මක් නොදක්වූ බ්‍රිතාන්‍යයෝ තම ආර්ථික ක්‍රියාවලිය හමුවේ ජනතාවට හිතවාදී සංවර්ධන මාර්ග හෝ පියවර නොගත්තෝය. ඒ වෙනුවට අපේ රටේ වන සම්පත විනාශ කරමින් ගස් කපා දැවයෙන් විවිධ ඉදිකිරීම් කරන ලදී. පාරිසරික විනාශයන් හමුවේ පස සෝදා ගොස් ගංගා පිරී ඒවායේ ජලය ගලා යාම අවහිර වී ගංගා පිටාර ගැලීම සිදුවිය. ඒ ආශ්‍රිතව ජීවත් වූ ගැමියා මෙම තත්ත්වයන් තුළ පීඩා විඳි අතර පරිසර මාතාවගේ සත්ව කොට්ඨාස මියැදී වඳ වී යාමේ තර්ජනයකට ද ලක්වූහ. වායුගෝලය දූෂණය වී පුද්ගල ජීවිතයට ද තර්ජන රැසක් එල්ල විය.

"කැලේ නසන්නට කැලේ ම ගසක් ඕන" බව සත්‍ය කරුණකි. යම් දෙයක පරිහානියට සමීපතම දෑ බෙහෙවින් ඉවහල් වේ. මාර්ග සංවර්ධනය වීමත් සමඟ කාර්යක්ෂම වූ ක්ෂේත්‍ර තුළ සංවර්ධනය ද වේගවත් විය. යන්ත්‍ර සූත්‍ර, අවි ආයුධ, රථ වාහන නිෂ්පාදනය ද සිදුවිය. මේවායේ පහසුව පමණක් සිතා අහිසි ප්‍රතිඵලය ගැන නොතකා නිෂ්පාදන ක්‍රියාවලියේ නිරත වීමෙන් ඇති වූ තත්ත්වය හා ප්‍රතිඵලවල භයානකභාවයද ක්‍රමයෙන් වර්ධනය විය. පුද්ගලයා මිනිස්කම පසෙකලා බල ලෝභයෙන් මත් වී ධනය සෙවීමට පෙළඹුණි. එයින් සංවර්ධනය තුළ අහිසි ඵලය දරා ගැනීමටද මිනිසාට මෙන්ම සත්ව සංහතියටම සිදුවිය.

"වැල යන අතට මැස්ස ගහනවා" වෙනුවට කළ යුත්තේ මැස්සට සුදුසු ලෙස වැල හැසිරවීමය. එසේ නොකිරීම නිසා සංවර්ධනය තුළ මනුෂ්‍ය හැඟීම් මානව සංවර්ධනය මිහිදන්ව ගිය බැව් පැහැදිලි වේ. කළ යුතු දේ නොකිරීමත් නොකළ යුතු දේ කිරීමට මිනිසා පෙලඹීමත් මේ තත්ත්වයට හේතුවිය. එය සමාජ පරිහානියේ මූල බීජයක්ද වනු ඇත. සියල්ලට වඩා තම පැවැත්ම සුරක්ෂිත කර ගැනීමේ අදිටන මුල්වීම මේ තත්ත්වයට හේතුවයි. පොදු සමාජ යහපත මෙහෙයවීම පුද්ගලයාගෙන් ගිලිහෙන කරුණකි. මේ හේතුව කනගාටුදායක පුවතකි.

සංවර්ධනයත් සමඟ මිනිසුන් තම පැවැත්ම තහවුරු කරගැනීමට වෙර දැරීමේ ප්‍රතිඵලය භයානකය. සංවර්ධනය රට තිරසරභාවයට උපකාරී වේ. එමෙන්ම මිනිස්කම එම තිරසරභාවය තහවුරු කිරීමට අත්‍යවශ්‍ය අංගයකි. දැනුම සංවර්ධනයේ අත්‍යවශ්‍ය අංගයකි. එය සංවර්ධනය වීම හෝ නොවීම තීරණය වීමටද බලපානු ලැබේ.

විසිඑක්වන සියවසෙහි ප්‍රාග්ධනය වනුයේ ඥානයයි. දැනුම යනු කිසිවෙකුගෙන් බලෙන් උදුරාගෙන ලබාගත හැකි දෙයක් නොවේ. එය අප වෙහෙස වී මහන්සි වී ඒ සඳහා කැප වී ලබාගත යුතු දෙයකි. සැබවින්ම දැනුම අපගේ බුද්ධියයි. සංවර්ධනය ඥානයේ මූලික හර පද්ධතිය වේ. අනාගතයේ සියලු ජාතීහු"දන්නා" හා "නොදන්නා" ජාතීන් යනුවෙන් දෙකොටසකට බෙදෙති.

අද ලෝකයේ සිටින මිනිසුන් සංවර්ධනය දැනුම මතින් සොයා නොයෑම දුක්මුසු කරුණකි. දැනුම පසුපස හඹා යයි නම් "දැනුම සංවර්ධනයේ තරඟය" බවට පත්වනු ඇත.

"දැනුම සෙවීම දැනුවත් ක්‍රියාවකි. තමන්ගේ දැනුම පමණක් සෑහේ යයි සිතීම දුර්වලකමකි."

-මැක්සිම් ගෝර්කි

ඔහු පුද්ගලයා සතුව දැනුම පමණක් ඇතැයි සිතීම දුර්වලකමක් ලෙස දකී. මිනිස්කම රැකීමට නම් නුවණින් යුක්ත විය යුතුය. ප්‍රඥාව නැමති මහා කැඩපතින් බැලූ කල බොහෝ අඩුලුහුඬු ඔබට සියැසින්ම දැකීමටත් ඒවා නිවැරදි කර ගැනීමටත් හැකියාව ලැබේ.

නමුත් දිනෙක කෙසේ හෝ දන්නා ජාතීන් කුමන අයුරින් හෝ නොදන්නා ජාතීන් පසුබා ඉදිරියට යනු ඇත. අද වනවිට ඇමරිකාව, ඕස්ට්‍රියාව, බ්‍රිතාන්‍යය, ජපානය මෙන්ම ඉතාලිය වැනි රටවල්ද ඉහළ සංවර්ධනයක් උදාකරගෙන සිටී. ප්‍රජාතන්ත්‍රවාදය තුළ පුද්ගල නිදහස රැකීමට ඔවුන් ව්‍යවස්ථාවෙන්ම පියවරගෙන ඒවාට නීතිමය රැකවරණයක් සපයා දී ඇත.

එමනිසා කුමන අයුරින් හෝ රටේ සංවර්ධනය මෙන්ම මිනිස්කම රැකගැනීමටත් තුන්වන ලෝකයේ රටක්වන ශ්‍රී ලාංකික ජන සමාජය ද උත්සාහ දැරිය යුතුය. ඒ සඳහා සියලු දෙනාම උනන්දු විය යුතුය. අධ්‍යාපනය තුළින් ලද හැකි සංවර්ධනය ප්‍රායෝගික වේ. ඒ වෙනුවෙන් දරුවන් මෙන්ම වැඩිහිටි පරපුරද උනන්දු විය යුතුය. දියුණු රටවල් අතරට එක්වීමට නම් ඔබත් ඔබේ දැනුම නැමති ප්‍රඥා ප්‍රදීපයෙන් මේ සමාජය ආලෝකමත් කළ යුතුය.

භාෂාව නැමැති
සුවිශාල ආලෝකය
ලොව පවත්නා තෙක්
නොදිලේ නම් යම් හෙයකින්
මුළු තුන් ලොවම අඳුරුයි

-ශ්‍රීමත් දණ්ඩිත්

ලෝකයේ කිසිඳු දේශයකට දෙවැනි නොවන්නා වූ දේශයක ඉපදීමට තරම් අපි වාසනාවන්ත වීමු. ලෝකයේ කිසිඳු ජාතියකට දෙවැනි නොවන්නා වූ අභිමානවත් ජාතියකට අපි උරුමකම් කියන්නෙමු.

සත්‍යයේ අග්‍රස්ථානය බඳු වූ යථා පූර්ණ ධර්මයක අනුගාමිකයන් වීමේවරම ද අපි ලබා ඇත්තෙමු. නිවහල් චින්තනයකට අපි උරුමකම් කියන්නෝ ද වන්නෙමු. සංවර්ධනයේ දිදුලන පහනක් වූ අතීතය ප්‍රශංසනීය විය. එහි අප පෙර අපර දෙදිග ලෝකයේ ප්‍රධානතම කේන්ද්‍රස්ථානය විය. වසර 2500 ක දිගු ඉතිහාසයේ සහ සභ්‍යත්වයේ මුඛ්‍ය ඵලය මෙරට භාෂාවේ සංවර්ධනයයි.

මෙම ශිෂ්ටාචාරය සංවර්ධනීය අවධියට කණ කොකා හැඬීම සිදුවූයේ වර්ෂ 1505 දී යටත් විජිත බලපෑමෙන්ය. සියලු බල පරාක්‍රම බිඳ දා, සංවර්ධන මඟට පිවිසි කල යුද්ධයේ භීෂණය අපේ නිම් වළලු වසා ලේ වගුරු මතට ඇද හෙළූ වත්මන් යුගය 30 වසරක ත්‍රස්තවාදී අරගලයේ කෲරත්වය නිසාවෙනි. සංවර්ධනයත් මිනිස්කමත් එකම සොහොනක වැළලීය.

"අඳුරට බිය වන දරුවෙකු කෙරෙහි අපට පහසුවෙන් අනුකම්පා කළ හැකිය. එහෙත් ජීවිතයේ සැබෑ දුක්ඛදායක සිද්ධිය නම් මිනිසුන් ආලෝකයට බිය වීමයි."

-ප්ලේටෝ

ග්‍රීක දාර්ශනිකයෙකු මෙන්ම දේශපාලන විද්‍යාඥයෙකු වූ මේ විදග්ධ පඬිවරයා පෙන්වා දෙන පරිදි අපේ රටේ යුද ක්‍රියාවලිය තුළ සංවර්ධනය සිරවී ගිය යුගයක් ඔබට මතකය. පුද්ගල දේපළ මෙන්ම ජීවිත රැසක් අහිමිකළ ඒ යුගය භීෂණකාරී අවධියකි. මිනිස්කම නොහඳුනන මානව අයිතීන් ප්‍රසිද්ධියේ කඩ කරන ම්ලේච්ඡ අවධිය අම්හිරි මතකයන් සේම අඳුරු සිදුවීම්

වලින් මුහුකුරා ගිය අවධියකි. සංවර්ධනය කර තිබූ භෞතික සම්පත් ලෙස රෝහල්, පාසල් සහ රාජ්‍ය සංස්ථා, පුස්තකාල, අධ්‍යාපන ආයතන රැසක් මෙම යුද්ධයෙන් විනාශ වී ගිය අතර, මහා ප්‍රාඥයන්, දේශපාලන විශාරදයන් මෙන්ම ප්‍රවීණ මාධ්‍යවේදීන්, තරුණ මහලු, ලොකු-කුඩා භේදයකින් තොරව ජීවිත රැසක් මරු තුරුලේ හෙබවූ ත්‍රස්තවාදය ලාංකේය අභිමානය ජාත්‍යන්තරතලයේ කළු පැල්ලම් බවට පත් කළේය. විශාල ලෙස නැව්, බස්රථ, ගුවන්යානා ආදිය විනාශ කරමින් රටේ ආර්ථිකය අඩාළ කළ මේ යුගය අප්‍රසන්න කාල පරිච්ඡේදයකි. එම තත්ත්වයන් තුළ මෙම සටන් තුළ යෙදුණ එල්.ටී.ටී.ඊ සංවිධාන සාමාජිකයින් මිනිස්කම නොතකා ඊලාම් රාජ්‍යයක අවශ්‍යතාවය ඉටුකරගැනීමේ අධිෂ්ඨානයෙන් කළ මහා විනාශය මෙතෙකැයි කියා තක්සේරු කළ නොහැකි ය. ගැබිණි මව්වරුන් ගෙල කපා මැරූ අවස්ථාද අපට මේ යුද සමයේ හමු වූ ඛේදජනක සිදුවීම්ය. මෙවැනි අමානුෂික වධහිංසා මධ්‍යයේ රටේ සංවර්ධනය ඇන හිටීමත් මානව සංවර්ධනය පිරිහීමත් සිදුවිය. කිසිවෙකු කිසිදා කළ නොහැකි යැයි පැවසූ ඒ යුද්ධය නවතා රට එක්සේසත් කොට ඒකීය රටක් ගොඩනැගීමට ජනනායකයා සමත්විය. රටේ ජනාධිපතිවරයා ලෙස රටවැසියාගේ ආරක්ෂාව දෝතට ගත් ඔහු විසින් තිස්වසරක අවිචාර සමය භීෂණ අවධිය මිහිදන්කොට සාමය ස්ථාපිත කරන ලදී.

"ඇස් නැති දා පොත් කුමට ද?" කියන්නා සේ කාලෝචිත නැති දෙයින් ඇති ඵලය කිම? ඵල සහිත දෙය වටහාගෙන තිස්වසරක යුද්ධය නිමාවෙන් පසුව රටේ සංවර්ධන වේගය ක්‍රමවත් කරන ලදී. "ආසියාවේ ආශ්චර්යය ශ්‍රී ලංකාව" නමැති තේමාව ඔස්සේ රට සංවර්ධනය කරන ලදී. එහි යෝධ පියවර ලෙස මහාමාර්ග සංවර්ධනය පෙන්වා දිය හැකිය. ඒ අනුව ලොව දියුණු රටවල සංවර්ධනයට හේතුවන මාර්ග සැලසුම්කරණය ලෙස අධිවේගී මාර්ග පද්ධතිය පෙන්වා දිය හැකිය.

එම මාර්ග අපේ රටට සිහිනයක්ව පැවති යුගයක ඒ දායාද රට තුළ මේ වන විට ඉදිකර හමාරය. රට වටා දිවෙන යෝධ සංවර්ධනය අනාගත ආයෝජනයේ දොරටු ලෙසත්, ආයෝජනයේ මූල්‍ය සංස්ථා ලෙසත් පෙන්වා දිය හැකිය. එලෙසම වරාය ඉදිකිරීම තුළින් රටවටා බැඳි දියවරින් ආයෝජන උල්පත් බාහිර ලෝකයට විවර වී ඇත. ගුවන්ගමන් මඟින් රටට දෙස් විදෙස් ආයෝජනය ගෙන ඒමට ගුවන් තොටුපළ සංවර්ධන ක්‍රියාවලිය තවත් සංවර්ධන පියවරකි.

කලාවට තෝතැන්නක් වූ ටෙලි සිනමා ගම්මානය මෙන්ම විවිධ අයුරින් රට සංවර්ධන කේන්ද්‍ර බවට පත් කරලන නාට්‍ය ශාලා, රංග ශාලා, විශ්වවිද්‍යාල සහ විවිධ වැඩසටහන් මෙන්ම ආකර්ෂණීය නගර නිර්මාණය ආදියත් සියලු අංශවලින් සමන්විත සාප්පු සංකීර්ණ මෙන්ම නිවාස ව්‍යාපෘතිත් සංවර්ධන ව්‍යාපෘති ලෙස ක්‍රියාත්මකවේ.

"පෙරදිග ධාන්‍යාගාරය" ලෙස විරුදාවලි ලත් ශ්‍රී ලංකාව නැවත නැවතත් එහි අභිමානය රැකෙන පරිදි කෘෂි ආර්ථිකය ශක්තිමත් කිරීමට ගෙන ඇති පියවර ප්‍රශංසනීය වේ. ඇළ වේලි නිර්මාණය, පොහොර සහනාධාර, දිවි නැගුම දෙපාර්තමේන්තුව, ජන සවිය සමෘද්ධි ආධාර සැපයීම ආදී විවිධ ක්‍රියාමාර්ග මඟින් රටේ සංවර්ධන වේගය භෞතික මෙන්ම මානව වශයෙන්ද ගෙනයාමට ගෙන ඇති පියවර රැසකි.

නූතන සංවර්ධනය භෞතික අතින් පමණක් සිදු නොවිය යුතුය. එය මානව වශයෙන් මිනිස්කම සමඟ බැඳී ඉදිරියට ගමන් කළ යුතු සංකල්පයකි. නූතන සංවර්ධනයට ගැළපෙන ලෙස මානවයා නව පියවරක් ලෙසතමාද සංවර්ධනය විය යුතුය.

පරිසරය රැකෙන පරිදි මෙම සංවර්ධන වැඩපිළිවෙළ තව තවත් කාර්යක්ෂම විය යුතුය. නූතන තාක්ෂණය මිනිසාට හිතකර අයුරින් ගොඩනගන්නේනම් එය තිරසර සංවර්ධනයට ද හේතු වේ. කාර්මීකරණයට අප අබිබවායාමට ඉඩ විවර නොකර අපට අවශ්‍ය පරිසර හිතකාමී අයුරින් එය භාවිත කළ යුතුය.

"කවුළුව හැර සුළං සුව විඳිමු
එහෙත් අපසතු දෑ ඒ සුළඟට
ගසාගෙන යන්නට
ඉඩ නොදෙමු"
-මහත්මා ගාන්ධි

"ධනය, බලය, කුලය, නම්බුනාම, නායකකම් මේ සියල්ල එකෙකු තවෙකෙකු යටපත් කිරීමේ අවිආයුධයි."

ඊ. ඩබ්ලිව් අදිකාරම් මහතා පවසන ලෙස මෙම පස් වැදෑරුම් අවි තවකෙකු යටත් කිරීමට යොදන බල පරාක්‍රම වේ. මේවා යොදා මිනිස්කම වැළලීම නොකළ යුතුය. ඔහුගේ වදනට කන් යොමු කළ යුතුය. මෙය සංවර්ධන ක්‍රියාවලියේදී අත්‍යවශ්‍ය කරුණකි.

සියල්ලට වඩා මානව සම්පතේ පැවැත්ම සහ මිනිස්කම රටක සංවර්ධනයට මුල් වේ. තමාට ගත හැකි ආයෝජනය පොදුවේ විවර වනුයේ එවිට පමණි.

"සංවර්ධනය හා මනුස්සකම" පරිසරයට පමණක් නොව ජනයාට හිතකාමී පරිසරයක් හෙට ලොවට දායාද කිරීමට ගෙන ඇති පියවර මෙවැනි තරඟාවලි සහ මාධ්‍ය ප්‍රචාරණය, පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් මඟින් ඉදිරියට ගෙනයාම සතුටට කරුණකි.

සියල්ලටම වඩා හෙට ලොවට වැඩිහිටියන් වන ලංකා මාතාවට ආභරණයක් බඳු මල් වැනි ළමා කැකුළුවල අදහස්, ආකල්ප ඉතා වැදගත් වේ. රටේ සංවර්ධනය මනුස්සකම හා බැඳීම අත්‍යවශ්‍ය වේ.

"කන්දක් විලිලා මීයෙකු වැදීම"ට වඩා එසේ නොවීමට වගබලා ගැනීමට සියලු දෙනාගේ අවධානය යොමුකළ යුතුය. යමක් කිරීමට පෙර එහි පසුව ඇතිවන ප්‍රතිඵලය පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතුය. මානවයා සංවර්ධනය වන තරමටම රටේ සංවර්ධනයද ශක්තිමත් වනු ඇත.

"මනුස්සකම අගයන, සංවර්ධනය ප්‍රශංසනීය වේ නම් ලක්මවට එය දායාදයකි." අපි අපිට හැකි අයුරින් රටේ සංවර්ධනය සහ මනුස්සකම රකිමින් ජනහිතකාමී අයුරින් කටයුතු කිරීමට වගබලා ගමු. එවිට පරිසරය සහ ජනහිතකාමී හෙටක් ගැන මගේ සිහිනය සැබෑ වනු ඇත.

# විචාරය

රචනය විචාරය ගොඩ නගන ප්‍රධාන පදනම ලෙස පළමුව සංවර්ධනය යනු කුමක් දැයි විමසා බලන අතර සිසුවා ද්‍රව්‍යමය ප්‍රගතිය පමණක් 'සංවර්ධනය' ලෙස හැඳින්විය හැකි ද යන ප්‍රශ්නය මතු කරයි. අනතුරුව සංවර්ධනය නිර්වචනය කිරීම සඳහා ප්‍රගතිශීලී හා හිතකර සංකල්පයක් ගොඩ නැගීමට අත්‍යවශ්‍ය වන අංග ලෙස මානව වර්ගයා සහ මනුෂ්‍යත්වය දැක ගනු ලැබීමේ ස්වරූපයෙන් ප්‍රශ්නයට පිළිතුරක් ලැබේ. කෙසේ වුව ද සිසුවා ඔහු නැවත නැවතත් අවධාරණය කරන 'මනුෂ්‍යත්වය' යන වචනය විස්තර කිරීමක් හෝ වඩා විස්තර කිරීමක් නොකරන අතර එසේ කළේ නම් ඉදිරිපත් කරන තර්කවල ප්‍රබලතාව වැඩි දියුණු කළ හැකිව තිබිණ. සානුකම්පික වන්නේ නම් සියලු දෙනා ම පොදුයහපත උදෙසා කටයුතු කිරීම කරා යොමු වන බවට සිසුවා කරන ප්‍රකාශය ප්‍රබල ලෙස අවධාරණය කෙරෙන අතර සත්තකින් ම එය සංවර්ධනය නිර්වචනය කිරීම සඳහා සිසුවා යොදා ගන්නා දැක්මේ කොටසක් විය හැකි ය. කෙසේ වුව ද ප්‍රකාශය පදනම් වන්නේ උපකල්පනයක් මත වන අතර වෙනත් මූලාශ්‍ර උපුටා දක්වා ඊට රුකුල් දීමක් සිදු නො කෙරේ. පෙර පරම්පරාවන් කළාක් මෙන් වඩා පරිසර හිතකාමී පරිචයන් යොදා ගැනීමේ අවශ්‍යතාව ඒත්තු ගැන්වීම සඳහා රචනය සාහිත්‍ය හා කාව්‍ය කෘති සහ කීර්තිමත් නායක සියැටල්ගේ අදහස සම්බන්ධ කර ගෙන තිබෙන ආකාරය අගය කළ යුතු ය.

කාර්මිකවාදය පෙරට ගමන් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වත්මන් සමාජය තුළ මනුෂ්‍යත්වය පිරිහීම ආර්ථික ආකෘතියක් උදෙසා වූ නව මග කුමක් දැයි නිර්වචනය කිරීමට යොදා ගැනීමේ දී ඒත්තු යන අයුරින් උපුටා දැක්වීම් කළ යුතුව තිබුණත් එසේ කර නැත. මෙහිලා සඳහන් කළ හැකි දෙයක් නම් කාර්මික විප්ලවය ධනවාදී ලාභ ගැරීමට මහා පරිමාණයෙන් මග පෑදූ කාලයේ දී එංගලන්තය තුළ ළමා ශ්‍රමය අණක් ගුණක් නැතිව සූරා කෑ ආකාරය සලකා බලන විට මෙම දැක්ම බෙහෙවින් සත්‍ය යැයි පැහැදිලි වන බව යි. විලියම් බ්ලේක් වැනි ඉංග්‍රීසි කවීහු මිනිසුන්ගේ වටිනාකම හුදු ප්‍රයෝජ්‍ය වටිනාකමක් සහිත ආර්ථික මෙවලම් මිස වෙනෙකක් නොවන තත්ත්වයට ඌනනය කළ කාර්මික විප්ලවය නිසා එංගලන්තය තුළ මානව වර්ගයා අතිශයින් පීඩාවට පත් වන ආකාරය විවිධ තේමාවන් ඔස්සේ ප්‍රකාශයට පත් කළහ.

සිසුවා ඉපැරණි ශ්‍රී ලංකාව ද ආර්ථිකව ප්‍රගතිය කරා ගමන් කළ නමුත් එය සිදු වූයේ පරිසරය කෙරෙහි සංවේදිතාවකින් යුතුව ආර්ථික දියුණුව උදෙසා ආකෘති සකස් කර ගන්නා සැටි ගැන ඉහළින් ම සැලකිලිමත් වෙමින් වඩා අඩු වේගයකින් බව පැවසීම සඳහා මනා තර්කානුකූල කරුණක් ඉදිරිපත් කරයි. කෙසේ වුව ද වර්තමාන නාගරීකරණ හා කාර්මීකරණ යෝජනා ක්‍රම සමග සසඳමින් පෙර පැවති ක්‍රමය අඩු වේගයකින් දියුණුවට පත් වූවක් ලෙස සලකන්නේ නම් එසේ වී තිබෙන්නේ දැන් ආර්ථික කළමනාකරණ ආකෘති සියල්ල ම බටහිර විසින් හඳුන්වා දීම නිසා බව සිත තබා ගත යුතු ය. එබැවින් සිසුවා එම එකිනෙකට වෙනස් ක්‍රම දෙක තුළ කාර්මික දියුණුව සම්බන්ධයෙන් පැවති වෙනස වූයේ එකක් අනෙකට වඩා පරිසරය සුරැකීම අගය කිරීම බව පෙන්වා දීමට අවශ්‍ය තීරණාත්මක සම්බන්ධ කිරීම නො කරයි. 'සංවර්ධනයේ' වර්තමාන මුහුණුවර ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලද්දේ බටහිර යටත් විජිතවාදයේ ප්‍රතිඵලයක් ලෙස යැයි සිසුවා පැහැදිලි ප්‍රකාශයක් කරයි.

සිත් ගන්නා කරුණ වන්නේ රචනය තුළ ගොඩ නැගෙන ප්‍රධාන තර්ක ධාරාව ඔස්සේ වර්තමාන ආර්ථික ප්‍රගතිකාරක ප්‍රවණතාවල ප්‍රතිඵලයක් ලෙස 'පුද්ගලවාදය' හා ආත්මාර්ථකාමය නැගී ඒම මනුෂ්‍යත්වය සෝදාපාළු වීමට හේතුවක් ලෙස දක්වා තිබීම යි. ඒ අනුව සිසුවා වර්තමාන ක්‍රමය හරහා ලබා ගැනීමට උත්සාහ කෙරෙන ආර්ථික ප්‍රගතිය සැබවින් ම සංවර්ධනය ද නැද්ද යන්න නිර්ණය කෙරෙන සාධකය වන්නේ මානවවාදී සාරධර්ම සුරැකීම ය යන තර්කය ද ඉදිරිපත් කරයි.

මනුෂ්‍යත්වය සුරැකීම සංවර්ධනය සහතික කිරීමට උපකාර වන බවට ඉදිරිපත් කෙරෙන තර්ක ධාරාවේ දී සිසුවා යුද්ධය හා කැරැල්ල මානුෂීය සාරධර්මවල බිඳ වැටීමක් ඇති කරන බව ද එම නිසා සංවර්ධනයට බාධාවක් වන බව ද ප්‍රකාශ කරයි.

එක් විශේෂ කරුණක් පිළිබඳව ඇසිය යුතු දෙය නම් සිසුවා රචනය තුළ දී නමින් සඳහන් නොකරන නමුත් හම්බන්තොට වැනි ප්‍රදේශවල සිදු කෙරුණු මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති ගැන ඉතා ධනාත්මක ස්වරයකින් සඳහන් කරන හා කතා කරන අතර ඒ සඳහා දැරූ මූල්‍යමය හා පාරිසරික පිරිවැය තරමට සැබවින් ම වටින්නේ ද යන කාරණය ගැන සොයා බැලුවේ ද යන්න යි.

සමාප්තිය ඉතා වැදගත් කරුණක් අවධානයට ලක් කරවයි. එනම් රටේ අනාගතය විය යුත්තේ රටේ දරුවන් උදෙසා ආයෝජනය කිරීම බව යි. සංවර්ධනයට අනාගත පරම්පරාවන් උදෙසා යහපත් ලෝකයක් ලබා දිය නොහැකි නම් එහි අභිමතාර්ථය ප්‍රශ්නකාරී ය යන නිගමනයට එළඹෙන බව ද පෙනේ. රචනය ලියා තිබෙන්නේ සිසුවා ඉදිරිපත් කරන ශෛලියේ ශක්තිය බවට 'කාව්‍යමය වාගාලංකාර' පත් කර ගනිමින් අගනා කාව්‍යාංග සහිතව ය.

# පාරිසරික සහ ජනහිතකාමී හෙටක් පිළිබඳ මගේ සිහිනය

ඉෂිනි චින්තිකා රාමචන්ද්‍ර
10 ශ්‍රේණිය,
ගා/ රිපන් බාලිකා විද්‍යාලය

"මේ මහ පොළොවේ සෑම බිම් අඟලක්ම මාගේ ජනතාවට පූජනීයයි. පාරිශුද්ධයි. ළා හිරු එළියෙන් බබළන දේවදාර ගස්වල සෑම සිහින් පත්‍රයක්ම, සෑම වෙරළ තීරයක්ම, සෑම මිහිදුම් සළුවක්ම, සෑම එළිමහන් බිමක්ම, සෑම කුඩා ජීවියෙකුම මාගේ ජනතාවගේ සිත් තුළත්, අත්දැකීම්වලත් ශුද්ධ වස්තු වේ."

නීල කසී සළු දවටාගත් හාත්පස හරිත තුරුලතා, සුපුෂ්පිතව හිනැහෙන විසිතුරු පැහැ කුසුම් පොකුරු, කුරුලු කිචි බිචියෙන් නිහැඬියාව බිඳලූ, ඒ ලයාන්විත රිද්මයට සලිත වන පරිසරය ශ්‍රේෂ්ඨ රතු ඉන්දියානු නායක "සියැටල්" ගේ ඇසින් "මිහිතලයේ ගීතයට" නැගුණේ එලෙස ය.

පරිසරය දූලක් වැනිය. එය අප විසින් ණයට ඉල්ලා ගත් දෙයක් ලෙස සැලකුවද, වරදක් නැත. එසේ හැඳින්විය හැක්කේ අප විසින් එය අනාගත පරපුරට ද යහපත් ආකාරයෙන් භාරදිය යුතුවන නිසාය. මිනිසා සහ පරිසරය යනු දෙකක් නොව එකකි. මන්ද අනාදිමත් කාලයක පටන් මිනිසා හා පරිසරය අතර සමීප සම්බන්ධතාවක් පවතින හෙයිනි.

"පරිසරය" යනු සාධක රැසක් ප්‍රධාන කොටගෙන නිර්මාණය වූවකි. තුරුලතා, ඇළ-දොළ, ගංගා, දියඇලි, වනාන්තර, වැව්, උද්‍යාන ආදිය එහි ප්‍රධාන සාධක වේ. එම සාධකයන් පෙරටු කොට ගෙන පරිසරය ගොඩනැගෙන්නා සේම, පරිසරයේ වර්ධනයට ද ඒ සියල්ලම රුකුලක් වන්නේ ය. පරිසරය එහි නිමැවුම් සාධක අතර සම්බන්ධතාවය දම්වැලක එකිනෙකට බැඳී තිබෙන පුරුක් සේය.

"තමා වනසන්නට එන මිනිසාට පවා සෙවණ දෙන පුදුම ජීවියෙකි." ඒ තුරුලතා පිළිබඳව අප තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අර්ථකථනයයි. උන්වහන්සේ එදා "ආරාම රෝපා, වන රෝපා" යනුවෙන් දේශනා කළේද තුරුලතා ඇතුළු සමස්ත පරිසරයේම අගය විවරණය කොට දක්වමිනි. උන්වහන්සේ වැඩි වශයෙන්ම වාසය කළේ ගස් යටය. ගල් ගුහාවලය. උන්වහන්සේ මෙලොව පහළ වූයේත්, උතුම් වූ ශ්‍රී සම්බුද්ධත්වය පසක් කළේත්, පරිනිර්වාණයට පත්වූයේත්, තුරු සෙවණකදී ය. මිනිසාගේ ආධ්‍යාත්මික ගුණ වගාව දියුණු කිරීමේ අරමුණින් මෙලොව පහළ වූ උත්තම පුරුෂයෙකු පරිසරය ඇසුරු කළේ එලෙසිනි.

අහිතකර කාබන්ඩයොක්සයිඩ් වායුව උරාගෙන ශ්වසනයට අවශ්‍ය පිරිසිදු ඔක්සිජන් වායුව අපට ලබාදෙන්නේ ගස් වැල් ය. ඒවායේ පත්‍ර, බීජ, මුල් ආදිය අපගේ කුසගිනි නිවීම පිණිස වේ. ගෘහස්ථ කටයුතු සඳහා අවශ්‍ය ඉන්ධන වලින් 90%ක්ම ලැබෙන්නේ දරවලිනි. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සඳහා ගස්වල අතු හා කඳන් උපයෝගී කර ගත හැකිය. පාංශු ඛාදනය වළක්වා පස සරු කිරීමට ගස්වැල්වලින් අගනා මෙහෙවරක් ඉටුවේ. විවිධ සතුන්ට වාසස්ථාන සඳහා ගස්වැල්වලින් සිදුවන්නේ අසීමිත සේවයකි. මිනිසාට නිරෝගී සුවය ලබාදීමට හා රෝග සමනය කිරීමට ගස්වල කොළ, පොතු, මල්, දළු, ගෙඩි, මුල් ආදිය දිව්‍ය ඔසු වැනිය.

සැඩ හිරු කිරණ වැදී වියළී යන පොළොවේ තෙතමනය රඳා පවත්වා ගැනීම උදෙසා තුරුලතාවලින් මහා කාර්යභාරයක් ඉටුකරනු ලැබේ. මෙවැනි හේතූන් නිසා ආදිකාලීන මිනිසා ගසක් "රුක් දෙවියෙකු" ලෙස හඳුන්වා වැඳුම් පිදුම් කර ඇත.

"ජලය" අපගේ ජීවයේ පදනමයි. පරිසරයේ ජීව රුධිරයයි. මිනිසාගේ විවිධ දෛනික කටයුතුවලට එනම් බීමට, නෑමට, සේදීමට හා අනෙකුත් විවිධ ගෘහස්ථ අවශ්‍යතාවයන්ට ජලය නැතිවම බැරි සම්පතකි. කෘෂිකාර්මික හා කාර්මික කටයුතුවලටත්, ප්‍රවාහන කටයුතු සඳහාත්, විනෝදාස්වාදය සඳහාත්, බලශක්ති උත්පාදනය සඳහාත් ජලය විසින් නොනිමි මෙහෙයක් ඉටුකරනු ලබයි. ලෝකයේ පවතින ජල ප්‍රභේද ගණනාවකි. ගංගා, දිය ඇලි, ඇළ දොළ, විල්, පොකුණු, ළිං, සාගර, මුහුදු ආදියෙහි අඩංගු වන්නේ ජලයයි. මිනිසාගේ පමණක් නොව මුළු මහත් සත්ත්ව සංහතියේම ප්‍රාණ වායුව රැකදීමට ජලය මඟින් ප්‍රශංසනීය සේවයක් ඉටු කරනු ලබයි.

"වනාන්තර" පරිසරයේ පෙණහලු ලෙස හඳුන්වනු ලැබේ. ජල චක්‍රයේ පැවැත්මටත්, වර්ෂාව ලබාදීමටත් වනාන්තර විසින් ඉටු කරනු ලබන්නේ මිල කළ නොහැකිම සේවයකි. මනා කාලගුණික තත්ත්වයක් පවත්වා ගැනීමට, සරුසාර පොළොවක් ලබාදීමට, මිහිමත තෙතමනය පවත්වාගැනීමට, වනවිල්, කඳුරැලි ආදිය බිහිකිරීමට, ස්වභාව සෞන්දර්යය ආරක්ෂා කිරීමට වනාන්තර උදාර මෙහෙවරක් ඉටු කරයි.

දඩයම් යුගයේදී සරල අවශ්‍යතා මත පදනම් වූ මිනිසා ගින්දර සොයාගැනීමත් සමඟ නව ප්‍රගමනයකට එළඹී, ඒ ප්‍රගමනයෙන් ඔප් නැංවී තම එදිනෙදා වැඩකටයුතු පහසු කරගැනීම සඳහා රෝදය, ආනත තලය ආදිය සොයා ගත්තේය. ඒ තුළින් වත්මන විජයග්‍රහණය කළ මිනිසා ක්‍රම ක්‍රමයෙන් සැලසුම් සහගත ලොවකට පා තැබුවේය. දහනව වන සියවස අගභාග යේදී යුරෝපයේ ඇරඹි කාර්මික විප්ලවයත් සමගම මිනිසා සිය වැඩකටයුතු බොහොමයක් යන්ත්‍රවලට භාර කළේය. දියුණුවට පත් වූ ලොවේ නව නිපැයුම් තුළින් ඉදිරියට පැමිණි මිනිසාගේ උසස් මනසෙහි පිහිටෙන් තාක්ෂණය මහා විප්ලවයක ස්වරූපයෙන් මෙලොව එළිය දුටුවේය. ආරම්භක යුගයේදීම එහි අග්‍රඵලය නෙළාගත් මිනිසා සුපසන් අනාගතයක් කරා පියමනිමින් සිටියි. එසේම එහි අවශ්‍යතාවය වටහාගත් කුමාරතුංග මුනිදාස ශූරීන් පවසා ඇත්තේ මෙසේය, "අලුත් අලුත් දෑ නොතකන ජාතිය ලොව නොනගී."

තාක්ෂණ පෙළහරේ දිග් විජයත් සමඟම සන්නිවේදනය පුළුල් විය. එතුළින් මුළු ලෝකයම විශ්ව ගම්මානයක් බවට පත් විය. භූගෝලීය වශයෙන් දූරස්ථ බව ඉක්මවා, සමාජයීය වශයෙන් ලෝකය සමීපව කටයුතු කිරීමට පටන් ගැනීමත් සමඟම ගෝලීයකරණය හිස ඔසවන්නට විය. සංචාරක කටයුතු දියුණු වීම, නව සංස්කෘතීන් පිළිබඳව දැනුම හුවමාරු වීම, ශ්‍රම වෙළඳපොළ පුළුල් වීම, නව රැකියා අවස්ථා උදාවීම, ජාත්‍යන්තර වෙළඳාම පුළුල් වීම හා වඩාත් කාර්යක්ෂම වීම යනාදිය එතුළින් ඇතිවූ වාසිදායක තත්ත්වයන් ගණයේලා සැලකිය හැකිය.

එහෙත් එමගින් තවත් නොසිතූ විරූ වෙනස්කමක් ඇතිවිය. එනම් පරිසරය දූෂණයයි. ජනගහනය වැඩිවීමත් සමඟම මිනිස් අවශ්‍යතා තව තවත් පුළුල් විය. එහි ප්‍රතිඵලයක් ලෙස නූතන තාක්ෂණය කරපින්නා ගත් පුද්ගලයෝ අයහපත් ක්‍රියාවන්ට නැඹුරු වන්නට වූහ.

අද අප පීඩා විඳින ගෝලීය උණුසුම, මුහුදු බාදනයන්, නියඟයන්, ඕසෝන් ස්තරය සිදුරුවීම් සහ හරිතාගාර ආවරණය මෙහිලා නිදසුන් ලෙස දැක්විය හැකිය.

සාමාන්‍යයෙන් පෘථිවියේ පාරිසරික පැවැත්මට අවශ්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 28ත්-34ත් ($28^0c-34^0c$) අතර වේ. දැනට වායුගෝලයේ පවතින උණුසුම ඉහළ යාම "මිහිතලය උණුසුම් වීම"(Global Warming) යනුවෙන් හැඳින්වේ. හරිතාගාර වායු සම්ප්‍රේෂණය මගින් මිහිතලය උණුසුම් වී දේශගුණික විපර්යාසයන් සිදුවන බව අද විද්‍යාත්මකව පිළිගෙන ඇත. වායු දූෂණයේ ප්‍රතිවිපාක හේතුවෙන් පරිසරයට සිදුවන හානිය වත්මන් ලෝකය තුළ වැඩි වශයෙන්ම දැකිය හැකිය. උෂ්ණත්වය වැඩි වීම හේතුවෙන් අයිස් ස්තර දියවෙමින් පවතින අතර, මේ නිසා මුහුදු මට්ටම ඉහළ යාමේ අවදානමක් ද ඇති වී තිබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස අනාගතයේදී බහුතරයක් රටවල් ලෝක සිතියමෙන් මැකී යනු ඇත. අපේ රටට නුදුරින් පිහිටා ඇති මාලදිවයින් දූපත් එම ඉරණමට ගොදුරු වෙමින් පවතී.

නියගයන් ඇතිවීම, කාන්තාරකරණය, කුණාටු හා ගංවතුර, නායයාම්, භූමිකම්පා, සුළි සුළං ආදී දේශගුණික විපර්යාසයන්ට තුඩු දෙන්නේ ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑමේ අවදානමයි. දේශගුණික වෙනස්වීම් මානව සෞඛ්‍යයටද අහිතකර ලෙස බලපායි. ජලය හා ආහාර මගින් නොයෙකුත් රෝගද ඇතිවේ. උණුසුම් තත්ත්වයන් යටතේ ආහාරවල රෝගකාරක බැක්ටීරියා වර්ධනය වේගවත් වේ. බීජාණු මේරීම ද ඉක්මන් වේ. යාන වාහනවලින් හා විවිධ කර්මාන්ත වලින් පරිසරයට මුදාහරින කාබන්ඩයොක්සයිඩ් ($co_2$), මීතේන් (CH4), කාබන්මොනොක්සයිඩ් (co) වැනි අහිතකර වායු වර්ග හෘද රෝග, ඇදුම, පෙණහලු පිළිකා, මොළයේ රෝග වැනි රෝගවලට පමණක් නොව ළදරු මරණවලට ද බලපායි. එපමණක් නොව බාහිර පරිසරයේ වායු දූෂණ වැඩිවීමට ද ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම බලපෑ හැකිය. ඕසෝන් හා වෙනත් රසායනික ඔක්සිකාරක මිනිස් සෞඛ්‍යයට අයහපත් වේ. සමේ පිළිකා ඇති වීම, ඇසේ සුද මතුවීම ආදිය මීට නිදසුන් ලෙස ඉදිරිපත් කළ හැකිය.

මෙම ගෝලීය උණුසුම ලෝක කෘෂිකර්මය කෙරෙහිද වැඩි වශයෙන් බලපායි. වැඩිවන උෂ්ණත්වයේත්, වර්ෂාපතන රටාවේත් වෙනස්වීම නිසා ඇතිවන ආන්තික තත්ත්වය කෘෂිකර්මය කෙරෙහි තදින් බලපානු ඇත. ගංවතුර හා නියගය නිසා වගා විනාශ වී යා හැකිය. පළිබෝධකයන්ගෙන් සිදුවන හානිද අස්වනු කෙරෙහි බලපායි. දේශගුණික වෙනස්වීම් ශාක පළිබෝධවල හා රෝගවල වැඩිවීමට හේතු වේ. මේ සියල්ලෙහිම අවසානය වනුයේ ආහාර හිඟවීමය. එය මන්දපෝෂණය ඇතිවීමටත්, සෞඛ්‍යය පිරිහීමටත් බලපානු ඇත.

"බ්‍රිතාන්‍යයේ ඇති වූ කාර්මීකරණය ඉන්දියාවේත් ඇති කළහොත් මිනිසුන්ට ජීවත්වීමට ග්‍රහලෝක කීයක් අවශ්‍ය වේද" යි වරක් මහත්මා ගාන්ධිතුමා ප්‍රශ්න කළේය. එම ප්‍රශ්නය අද මතු කළහොත් ගෝලීයකරණයේ අනිසි ප්‍රතිවිපාක රැසක් කරළියට එනු ඇත.

නිෂ්පාදනය වැඩිවීම නිසා සම්පත් භාවිතය වැඩිවීම, පාරිසරික ගැටලු වැඩිවීම, එච්.අයි.වී./ඒඩ්ස් (HIV/AIDS) වැනි මාරාන්තික රෝග පැතිරීම, ත්‍රස්තවාදය, මත්ද්‍රව්‍ය වැනි උවදුරු ව්‍යාප්ත වීම, ප්‍රබල සංස්කෘතීන් ඉස්මතු වන අතර අනෙක් සංස්කෘතීන් යටපත් වන බවට චෝදනා එල්ල වීම එවන් අහිතකර ප්‍රතිඵල රාශියකි.

තාක්ෂණික පෙළහරේ ප්‍රයෝජන කෙතෙක් වුවත් ඒවායින් පාරිසරික හා ජනහිතකාමී ප්‍රයෝජනයක් නම් සිදුවන බවක් නොපෙනේ. නොයෙකුත් මාදිලියේ තාක්ෂණික උපකරණ අද භාවිතයට පැමිණ ඇත. ජංගම දුරකථන, අන්තර්ජාලය, පරිගණක, ෆැක්ස්, ඊ-මේල්, ස්කයිප් වැනි නව තාක්ෂණික පහසුකම් ජනයාට හිතකර වුවත් පරිසරයට හිතකාමී නොවේ. අපේ අවධානය යොමුවිය යුත්තේ පරිසරය හා ජනහිතකාමී යන අංශ දෙකටම එකසේ ප්‍රයෝජනවත් දේට ය. වත්මන් ළමා හා තරුණ පරපුර තාක්ෂණයේ හොඳ නරක "හංසයා දියෙන් කිරි වෙන්කරගන්නා සේ" වෙන්කර ගත යුතුය. එහෙත් බොහොමයක් දෙනා එහි අයහපතම උකහා ගැනීම ඛේදයට කරුණකි.

ජනගහනයේ වර්ධනයත් සමගම භූමි භාගය සීමා වීම නිසා වනාන්තර එළි පෙහෙළි කිරීම, ගස් කපා දැමීම ආදිය වත්මන් පරිසර දූෂණයට හේතුකාරක වී තිබේ. කාර්මික අපද්‍රව්‍ය යාබද පරිසරයට මුදා හැරීම, කැලි කසළ නිසි ලෙස බැහැර නොකිරීම යන හේතූද පරිසරයේ සමතුලිතතාවය බිඳ දමයි. මේ තත්ත්වය මැඩලීමට නම් දැවැන්ත වැඩපිළිවෙළක් වහාම දියත් කළ යුතුය. දේශයක යහපත් පුරවැසියන් ලෙස අප ද එම සද්කාර්යයට පාසල් මට්ටමින් හෝ හැකි අයුරින් දායක වීම කාලීන අවශ්‍යතාවකි.

මාර්ටින් ලූතර් කිං මීන් දශක පහකට පමණ පෙර සමාජ සාධාරණත්වය පිළිබඳ දේශනයක දී ප්‍රකාශ කරන ලද්දේ විසි එක්වැනි සියවස ආරම්භයේ දී අද හා හෙට සම්බන්ධ කරන දේශගුණ අර්බුදයකට ලොව මුහුණපාන බවයි. එම අර්බුදය වැළැක්වීමට තවම අප ප්‍රමාද නැති බව එතුමා එදා පැවසීය. ඔහු එදා අනාවැකි පළ කළ අර්බුදයට අද අප මුහුණ පාමින් සිටී. අදත් එම අර්බුදයට පිළියම් යෙදීමට තවම ඉඩ ඇති බව අපට කිව හැකිය.

පරිසරය සුරැකීම සඳහා ගතයුතු පියවර ඉතා පැහැදිලිය. ඒ සඳහා ජනතාව දැනුවත් කිරීමත් නෛතික රාමුව ශක්තිමත් කිරීමත් අවශ්‍ය ය. එක් එක් රටවල් තනි තනිව ගනු ලබන ක්‍රියාමාර්ග යන් මෙන්ම ලෝක ප්‍රජාව සාමූහිකව ගනු ලබන ක්‍රියාමාර්ගයන් ද මේ සඳහා එක සේ වැදගත් වනු ඇත. ස්වාභාවික සම්පත් තිරසර ලෙස උපයෝජනය කිරීම මෙන්ම සංරක්ෂණය කිරීම, වනගහනය වර්ධනය කිරීම, කාර්මික අපද්‍රව්‍ය පාලනය කිරීම හා කළමනාකරණය, පරිසර දූෂණය පාලනය කිරීම, වන ජීවින් රැකගැනීම, කාබනික පොහොර භාවිතය, රසායනික පොහොර භාවිතය අවම කිරීම, ජනගහනය පාලනය කිරීම සහ පරිසරයට ආදරය කිරීමට හා පරිසරය සුරැ කීමට විශේෂයෙන්ම පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් තරුණ පිරිස් දැනුවත් කරලීම ආදිය ප්‍රමුඛතාව හිමිවිය යුතු කරුණු වශයෙන් පෙන්වා දිය හැකිය. එක් අතකින් පරිසර විනාශය හා පරිසර සංරක්ෂණය අතර අභියෝගයකට මිනිසා මුහුණ දී සිටී. තවත් අතකින් ජනගහන වර්ධනය හා තිරසර සංවර්ධනය අතර අභියෝගයකට මිනිසා මුහුණ දී සිටී.

පරිසර මිත්‍රශීලී තිරසර සංවර්ධන උපාය මාර්ගයක් තුළින් ජනගහන වර්ධනය පාලනය කරගනිමින් ආර්ථික සංවර්ධනයක් ලබාගන්නේ කෙසේද යන්න වත්මන් ලෝකය මුහුණ දී ඇති ප්‍රධාන අභියෝගයයි. එම අභියෝගය ජයගැනීම තුළින්ද අපට පරිසර හානිය වළක්වා ගත හැකිය.

ජගත් මිහිතල සම්මේලනයක් මුල්වරට පවත්වනු ලැබුවේ බ්‍රිතාන්‍ය ලේඛිකාවක වූ "රේචල් කාසන්" ගේ "නිහඬ වසන්තය" නම් ග්‍රන්ථය එළිදැක්වීමෙන් පසුවය. එම කෘතියෙහි තේමාව වූයේ "රාත්‍රියේ නින්දට යන ඔබ පසුදින උදයේ අවදි වූවිට ඔබට දැනෙන වෙනස කුමක්ද? එවැනි ලොවකට ඔබ කැමතිවේද?"යන්නයි. මේ සම්බන්ධයෙන් එරට විසූ තරුණ ප්‍රජාව පරිසර දූෂණයට විරුද්ධව පෙළගැසීමත් සමගම ප්‍රථම වරට මිහිතල සමුළුවක් පැවැත්වුණි. එමඟින් සෑම වසරකම ජූනි මස 05 වන දින "ජගත් මිහතල දිනය" ලෙස ප්‍රකාශයට පත්කෙරුණි. එමඟින් අද දක්වාම විවිධ පාරිසරික වැඩමුළු මගින් ජනතාව දැනුවත් කිරීමට දරන ප්‍රයත්නය සැබැවින්ම අගය කළ යුත්තකි.

විදේශීය දෑ කරපින්නාගෙන හැල්මේ දුවන යුගයක පාරිසරික සහ ජනහිතකාමී හෙටක් පිළිබඳ අවශ්‍යතාවය එයයි. පසුගිය දශක 3-4 තුළ විවිධ පරිසර සුරැකීමේ නීති, ප්‍රඥප්ති සකස් කරන ලද අතර ඒවා ක්‍රියාත්මක කිරීමටද පියවර ගෙන ඇත. ඕස්ට්‍රේලියාව, යුරෝපීය රටවල්, ඇමරිකාව, ඉන්දියාව, ශ්‍රී ලංකාව ආදී රටවල හරිත ව්‍යාපාර, පරිසර සුරැකීමේ සංවිධාන බිහි වූ අතර ශාක හා සත්ත්ව විශේෂයන් රැක ගැනීමෙහිලා එම සංවිධායකයන් මහත් වෙහෙසක් දරා ඇත. රැම්සාර් සම්මුතිය, වියානා සම්මුතිය, මොන්ට්‍රියල් සම්මුතිය හා කියෝටෝ සමුළුව ඊට නිදසුන් වේ.

ඇමරිකාවේ "ඇමසන්"(Amazon) වැසි වනාන්තරය මෑතක සිට දැව කර්මාන්තයට බිලිවේගෙන යන බවත් අසන්නට ලැබේ. අපේ රටේ අගනාම සම්පතක් වන සිංහරාජ වනාන්තරය ද, නුදුරු අනාගතයේදීම එම තත්ත්වයට ගොදුරු විය හැකිය. වැඩි වැඩියෙන් ශාක වගා කිරීම, වනගහනය පුළුල් කිරීම, සෙවණ සඳහා මග දෙපස ගස් සිටුවීම රුක් රෝපණයේ වැදගත් පියවර වේ.

අපගේ හුදෙක් වෑයම විය යුත්තේ කායික හා මානසික සුවය සපිරුණු, සත්ත්ව ප්‍රජාවගේ දිවිපැවැත්මට හානියක් නොවන පරිසර හිතකාමී ජනාවාසයන් ව්‍යාප්ත කිරීමයි. දේශීයත්වයට මුල්තැන දෙමින්, දේශීය දෙය අගය කරමින් අප සැමගේ බර දරන මේ පොළෝතලය මනා සේ සමබරව පවත්වා ගනිමින් පුළුල් චින්තන ශක්තියෙන් යුත් හෙටක් උදෙසා අපිත් පෙළ ගැසෙමු." පාරිසරික සහ ජනහිතකාමී හෙටක්" යන සංකල්පය සිහිනයක් නොව සැබෑ ලොව යථාර්ථයක් බව පසක් කරන්නට කාලය එළඹ ඇත. එය උදෙසා හැකි සේවය කිරීමට අපිත් උරදෙමු.

"මී මැස්සා මලින් මලට ගොස්, පැණි රැස්කර මී වදයක් බඳියි. මී වදය මී මැසි පරපුර රකින ආහාරය යි. මී මැස්සා මලින් මලට යාමේදී පරාග පෝෂණය වෙයි. එයින් මලෙහි ගෙඩි හටගැනේ. ඒවා මල් හට ගැන්වූ ගස්-වැල් පරපුර රැකගන්නා ආහාර ගබඩා ය. මලින් මලට යමින් රොන් ගැනුණත්, මල් පෙති නොතැළෙයි. මලේ වර්ණයට හෝ සුවඳට කිසිදු හානියක් නොවේ. මලට යහපතක් ම වෙයි. පරිසරයෙන් උපරිම ප්‍රයෝජන ගත යුත්තේ මල රැකගනිමින් බව මල් පෙති, මලේ පැහැය, මල් සුවඳ ආරක්ෂා කරමින් මී පැණි ගැනීමෙන් මී මැස්සා අපට උගන්වන පළමු පාඩමයි. පරිසරයෙන් ප්‍රයෝජන ගැනීමේදී එය සංවර්ධනය කළ යුතු බව පරාග පෝෂණය කිරීමෙන් මී මැස්සා අපට උගන්වන දෙවන පාඩම යි."

"ඔබේ ක්‍රියාව හරිතවත් කරන්න. එය පරිසර සංරක්ෂණය වනු ඇත."

**"Green up your act! It will be the environmental conservation."**

මේ මිහි මතැ වසන සතුට සෙත සැදේවා
ගහ කොළට පවා එම මෙත් සිසිල දූනේවා
භව බෝග සම්පතින් රටට සෙත සැදේවා
අපේ හුස්මෙන් පවා පරිසරය නිවේවා

# විචාරය

සිසුවිය තර්කය සඳහා තෝරා ගෙන තිබෙන්නේ ද්‍රව්‍යමය සුව පහසුව වඩා හොඳින් භුක්ති විඳිය හැකි තාක්ෂණිකව වැඩි දියුණු ශිෂ්ටාචාරයක් උදෙසා වූ මානව ප්‍රාර්ථනාවන් සාක්ෂාත් කර ගැනීමේ ක්‍රියාවලියේ දී ස්වභාව ධර්මය සුරැකීම හා ඊට ගරු කිරීම අතිශයින් ම වැදගත් බව පෙන්නුම් කරන පදනමකි. රචනයේ ආරම්භය මත් සිසුවිය ගෙන තිබෙන ස්ථාවරය පෙන්වා දෙයි. එහි දී ඔහු නායක සියැටල්ගේ ලෝක පූජිත ප්‍රකාශ පදනම් කර ගෙන ස්වභාව ධර්මයේ පාරිශුද්ධත්වය ගැන තර්ක කරයි. ස්වභාව ධර්මයට එදිරිව සංස්කෘතිය පිළිබඳ විවාදය විමසා බලන ප්‍රධාන තර්කයේ දී සිසුවිය කාව්‍යමය හා සෞන්දර්ය විද්‍යාත්මක අගයක් සහිත මූලාශ්‍ර උපුටා දක්වමින් ප්‍රශංසනීය තර්ක හා අදහස් මෙන් ම ප්‍රකාශාවලියක් ද ගොතා ඇත. සිසුවිය මෙහි දී ස්වභාව ධර්මයෙන් උකහා ගත් සංකල්ප රූප ඇසුරු කොට ගෙන උපමා රූපක නිර්මාණය කිරීමෙහිලා ප්‍රශංසනීය දක්ෂතාවක් පෙන්නුම් කර ඇත.

මිනිස් සංහතියට ගස්වල ඇති වැදගත්කම සහ කාර්මිකවාදයට මුල් තැන දෙමින් හා සීමාන්තිකව මිනිසා ලෝකය තුළ නිර්මාණය කරමින් සිටින ජීවත් වීමට දුෂ්කර වාතාවරණය පිළිබඳව සිසුවිය පැහැදිලි ලෙස තර්ක කර ඇත. අවධානය යොමු කළ යුතු අත්‍යවශ්‍ය සම්පතක් ලෙස සලකමින් ජලය පිළිබඳව කරුණු ඉදිරිපත් කෙරෙන අතර තාක්ෂණය, සන්නිවේදනය, යටිතල පහසුකම් හා වර්තමාන ආර්ථිකය තුළ දී ඒවායේ වැදගත්කම වැනි කාරණා පිළිබඳව ද සංක්ෂිප්තව කරුණු දැක්වේ. සංවර්ධනය අත් කර ගැනීමට උත්සාහ කිරීමේ දී අතිමහත් පරිසර දූෂණයකට තුඩු දෙන බව නො තකමින් ආර්ථික පරමාර්ථ හඹා යන බව රචනය අවධාරණය කරන ප්‍රබල කරුණකි. ගෝලීය උණුසුම් වීම මෙම තත්ත්වය නැවත නැවතත් ඇති වීමේ ප්‍රතිවිපාකයක් බව ද සිසුවිය පෙන්වා දෙයි. එපමණක් නො ව මෙම සංසිද්ධියේ ප්‍රතිඵලය දැන් කෘෂිකර්මය කෙරෙහි යම් තරමකට බලපා ඇති අතර ඒ සමගින් කෘමි නාශක යෙදීමේ අහිතකර පරිචයන් මිනිසාගේ සෞඛ්‍යය කෙරෙහි හානිකර අන්දමින් බලපා ඇත. මහත්මා ගාන්ධිගේ අදහස් උපුටා දක්වන සිසුවිය කාර්මිකවාදය පාලනය නොකළ හොත් ගෝලීය ව්‍යසනයකට තුඩු දෙන ආකාරය ගැන කතා කරයි. සිසුවිය ඩිජිටල් තාක්ෂණයේ වර්ධනය සහ එය තාරුණ්‍යය කරන තීරණාත්මක බලපෑම ගැන ද සඳහන් කරයි. නූතන තාක්ෂණයේ වර්ධනය මිනිසාට සුව පහසුකම් ලබා දී ඇති නමුත් ස්වභාව ධර්මය අවදානමට ලක් කර තිබෙන බව සිසුවිය අවධාරණය කරයි. ස්වාභාවික සම්පත් යොදා ගැනීම සඳහා මිනිසාට පවත්නා අවශ්‍යතා සහ ස්වභාව ධර්මය සුරැකීමේ අවශ්‍යතාව අතර ස්වභාව ධර්මය සමතුලිතව පවත්වා ගැනීමේ අවශ්‍යතාව ද එම නිසා වඩා යහපත් පාරිසරික නීති සම්පාදනය කොට ඒවා ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව ද ඉමහත් සැලකිල්ලක් දැක්විය යුතු කරුණු ලෙස පෙන්නුම් කෙරේ.

සංවර්ධනය පිළිබඳ නිර්වචනය මිනිසුන්ගේ මානසික හා කායික යහපැවැත්ම ඇතුළත් වන්නක් බව අවධාරණය කිරීමේ දී රචනය සංවර්ධන දැක්ම හැම විට ම පරිසර හිතකාමී හා ජන හිතකාමී විය යුතු යැයි යෝජනා කරයි. සිසුවිය යෝජනා කරන ආකල්පය ස්වභාව ධර්මයට හිතැති සංවර්ධනය පිළිබඳ සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික ආකල්ප මෙන් ම වර්තමාන ගෝලීය කාර්මීකරණ ප්‍රවණතා දැන් පරිසරය සමග ගැටෙමින් තිබෙන්නේ ය යන අවබෝධය ද දෝංකාර දෙවන්නකි. එම නිසා සිසුවිය මෙම රචනයේ දී ද්‍රව්‍යමය ප්‍රගතිය උදෙසාත් ශිෂ්ටාචාරයේ තිරසර වර්ධනය සඳහා පරිසරය සුරැකීම උදෙසාත් පවත්නා අවශ්‍යතාවන් අතර සුසංවාදය ඇති කළ හැකි නව මං සොයා ගැනීමේ අවශ්‍යතාව පෙන්වා දෙයි.

රචනය පරිසරය කෙරෙහි සහානුභූතිය ඇති කිරීම සහ මානවයාගේ තණ්හාව පිරිමැසීම සඳහා ගසා කෑමට ලක් නොකළ ලෝකයක වාසය කිරීමට සතුන්ට තිබෙන අයිතිවාසිකම් පිළිබඳව ප්‍රබල ලෙස අවධාරණය කරයි. සිසුවිය කාව්‍යමය වාග් විලාසයක් යොදා ගන්නා අතර ඉදිරිපත් කෙරෙන කරුණුවල වැදගත්කම අවධාරණය කිරීම සඳහා ගරු කටයුතු අතීත ප්‍රාමාණිකයන්ගෙන් උපුටා දක්වයි. ඇය එම කරුණු ඉදිරිපත් කර තිබෙන්නේ බටහිර දී කාර්මිකවාදයෙන් මෙහෙයවෙන සංවර්ධනය ලෝකය පත් කර තිබෙන තැන ගැන නැවත සිතා බලන ලෙස කෙරෙන පැහැදිලි අනතුරු හැඟවීමක ස්වරූපයෙනි.

# සංවර්ධනය සහ මනුස්සකම

ඩී. ජී. සසංක චලන ගිම්හාන
13 ශ්‍රේණිය,
ආනන්ද ජාතික පාසල - හලාවත

ධනේශ්වරයේ තුන්වන කාර්තුවට අයත් ශ්‍රී ලංකාද්වීපය අතීතයේ විරුදාවලි ලැබුවේ "පෙරදිග ධාන්‍යාගාරය" ලෙස ය. නමුත් වත්මනේ උදා වී ඇති තත්ත්වය කෙබඳු වාතාවරණයක් උසුලන්නේ ද? පෙරදිග ධාන්‍යාගාරය ලෙස විරුදාවලි ලැබූ ලක්මාතාව අද වනවිට සංවර්ධනය කරා පිවිසෙමින් සිටී.

"සමාජයේ සෑම දෙනාට ම වඩා හොඳ ජීවන තත්ත්වයක් ලබා දීම අත්‍යවශ්‍යයි. ආර්ථික, සාමාජික සහ සංස්කෘතික යන විවිධ අංශවල දියුණුව වර්තමානයේ සංවර්ධනය ලෙස සැලකේ."

මෙය සංවර්ධනය පිළිබඳ සමාජගත නිර්වචනයකි. කිසියම් රටක භෞතික වර්ධනය පමණක් සංවර්ධනය යන්නෙන් අදහස් නො කෙරේ. මේ සංකල්පය ලොව පුරා පැතිරී පවතී. සංවර්ධනය පිළිබඳ කතා කිරීමේදී ලෝකයේ රටවල් සංවර්ධිත, ඌන සංවර්ධිත, අසංවර්ධිත රටවල් හැටියට වෙන් කිරීමකට ලක් කෙරේ. ඇමරිකාව වැනි සංවර්ධිත රටවල් සංවෘත ආර්ථිකයක් පවත්වාගෙන ගිය ද ශ්‍රී ලංකාව, බංගලාදේශය වැනි ඌන සංවර්ධිත හෙවත් සංවර්ධනය වෙමින් පවතින රටවල් තුළ දකිය හැකි වන්නේ විවෘත ආර්ථිකයකි. භෞතිකව සිදුවන සජීවී සංවර්ධනය සමඟ ම මිනිසුන්ගේ චිත්තාභ්‍යන්තරයෙහි අජීවීව සිදු වන ආධ්‍යාත්මික සංවර්ධනය අනාගතයේදී කැපී පෙනෙන ලක්ෂණයක් වනු නො අනුමානය.

"රටක් දියුණු වන්නට සැපසම්පත් පමණක් නොව ගුණධර්මද වුවමනා ය."

-රාජේන්ද්‍ර ප්‍රසාද්

සංවර්ධනය කරා ගමන් කරන රටවල් ආර්ථිකය මුල් කරගෙන ආර්ථික සංවර්ධනය පමණක් අපේක්ෂා කරනු වර්තමානයේ දකිය හැකිය. වාණිජකරණයට නතු වූ රටවල් ආර්ථික සංවර්ධනය අපේක්ෂාවෙන් කඩිනම් ආර්ථික සැලසුම් ක්‍රියාවට නංවයි. එහෙත් ඒ කඩිනම් ආර්ථික සැලසුම් ප්‍රායෝගිකව කළ නොහැකි බව පසුගිය සමය තුළ සිදු වූ විවිධ සිද්ධි ඇසුරෙන් අපි වටහා ගතිමු. ජාත්‍යන්තරය ඉදිරියේ මේ සැලසුම් අසාර්ථක විය. යම් පාලන රජයක් ආර්ථික සංවර්ධනය පමණක් අපේක්ෂා කෙරේද, එවිට සිදුවන්නේ සමාජ සංස්කෘතික ආධ්‍යාත්මික සංවර්ධනය කඩා වැටීමකි. සෑම අතින් ම සිදුවන සංවර්ධනය රටකට වැඩදායක ය.

සංවර්ධනය යනු කුමක්දැයි වැටහීමෙන් පසු අවධානය යොමු කළ යුතු වන්නේ සංවර්ධනය සහ මනුස්සකම අතරැති සහසම්බන්ධතාවය පිරික්සා බැලීමටය. සංවර්ධනය සහ මනුස්සකම යහපත් රටක තිබිය යුතු ලක්ෂණයකි. සංවර්ධනය සහ මනුස්සකම තරාදියක් වැනි ය. රටක යහපැවැත්මට මේ තරාදියේ පැති දෙක ම එක හා සමානව පැවතිය යුතු ය. මනුස්සකමෙන් තොර සංවර්ධනයක් කිසිවෙක් බලාපොරොත්තු නො වෙති. එය ලෝකෙට පරකාසේ ගෙදරට මරගාතේ වැනි ද්විත්ව ජීවිතයක ගති ස්වභාව හෙළි කරන්නකි.

සඳ එළිය නොදුටු ළමයි මේ ලෝකයට වැඩදායකදැයි හෘදය සාක්ෂියෙන් විමසා බැලිය යුතු ය. අද සමාජයේ බොහොමයක් බොරලු උඩ ඇවිදින්නේ ගිනි අඟුරු උඩ ඇවිදිනවා වගේ ය. නිරුවත් දෙපාවලට පොළොවේ ස්පර්ශය ලබාදීමට හැකි නම් අපි කෙතරම් වාසනාවන්ත වෙමුද? රම්ප කොළය, කරපිංචා කොළය නො හඳුනන පිරිසක් රටක් සංවර්ධනය කිරීමට දායක කර ගත නො හැකිය. මිනිසාගේ සුබ විහරණය සඳහා බලාපොරොත්තු වන්නා වූ සැබෑ ම සංවර්ධනයක් අද ශ්‍රී ලංකාව තුළින් දැකීම අසීරු ය.

සංවර්ධනය සහ මනුස්සකම අතර සහසම්බන්ධතාව විෂය ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ පැහැදිලි කළ හැකිය. මේ ශ්‍රී ලංකාවේ දුප්පත්කම ඇති තෙක් මනුස්සකම පවතී.

පාරිසරික සංවර්ධනය පිළිබඳ නෙත් යොමු කිරීමේදී මිනිසා දිනෙන් දින දියුණුවත්ම ඔවුහු පරිසරය සමඟ තිබූ සමීප සබැඳියාව බිඳ දමමින් තම අවශ්‍යතාවන් සපුරා ගැනීමට උත්සුක වෙති. තාක්ෂණයේ ඉහළට ම ගමන් ගන්නා මිනිසාගේ විෂමාචාර ක්‍රියාකාරකම් නිසාම සොබාදහමේ සමතුලිතතාව බිඳවැටී තිබේ. විෂමාචාර ක්‍රියාකරකම්හි යෙදෙන මිනිස්සු 'සොබාදම් ලිය' හවුලේ දූෂණය කරති. අතීත මුතුන් මිත්තෝ සොබාදහම දේවත්වයෙන් සැලකූහ. ඔවුහු පරිසරයට ආදරය කිරීමේදී තම ලෙයින් උපන් දරුවකුට දක්වන තරමේ ආදරයක් රැකවරණයක් ලබාදුන්හ. තාක්ෂණික විධික්‍රමවලින් සංවර්ධන ඉලක්ක සපුරාලීමේදී දැකිය හැකි පාරිසරික ව්‍යසනය තීරණාත්මක ය.

ගම්මානවලට විෂ ද්‍රව්‍ය එකතු වීම මඟින් ගම්වාසීන් දැඩි අපහසුතාවලට ලක් වී තිබේ. සංවර්ධනය උදෙසා ඉදි කරන කර්මාන්තශාලාවලින් බැහැර කරන අපද්‍රව්‍ය ගංගාවලට ජලාශවලට එක්වීම නිසා දැඩි අර්බුදකාරී තත්ත්වයකට මුහුණ පෑමට සිදු වේ. උදාහරණයක් ලෙස මෑතක දී ජනමාධ්‍ය තුළින් හෙළි වූ රතුපස්වල ජල ගැටලුව දැක්විය හැකිය. ග්‍රාමීය කෘෂිකර්මාන්තයට ද බරපතළ තර්ජනයක් වන විෂ අපද්‍රව්‍ය ජලාශ, ගංගා ජලය සමඟ මිශ්‍රවීම නිසා ගංගාවලින් වී ගොවිතැනට ලබාගන්නා ජලය අපිරිසිදු වේ. එයින් කෘෂිකර්ම කටයුතු අඩාළ වේ. අස්වැන්න ඵලරහිත වේ. මිනිස්සු රෝගීහු බවට පත්වෙති. එලෙසම පරිසරයට ගස්වැල් වගේම සත්ත්වයෝද අත්‍යවශ්‍යය. සත්ත්ව ප්‍රජාව දිනෙන් දින විනාශවීම මුල් කොටගෙන පරිසර සමතුලිත බව පහළ මට්ටමක පවතී. මෙය බොහෝ සෙයින් බල පැවැත්වනුයේ කෘෂිකර්මාන්තයට ය. කෘෂිකාර්මික කටයුතුවලට හානි කරන කෘමීන් ඊට ප්‍රබල සතුන් විසින් විනාශ කර දමන ලදී. එයින් පරිසර සමබරතාව පැවැත්වේ. සොබාදහමේ සමබරතාව බිඳලන මිනිසා පසු විපත් ප්‍රතිසංස්කරණය වෙනුවෙන් අනපේක්ෂිත මුදලක් වැය කර අතරමං වේ. අශ්වයා ගිය පසු ඉස්තාලය වැසීමෙන් පලක් නැත. එනිසා ම සොබාදහම සමඟ කරන්නා වූ මෙකී අරගලයේදී අප වඩාත් යුහුසුලු විය යුතු ය.

"ඊළඟ සියවසේ පාන්දරින්ම අවදිවන ඉලෙක්ට්‍රොනික කුරුල්ලා කෘත්‍රිම තණතිල්ලකින්
ප්ලාස්ටික් පණුවෙකු ඩැහැගනු ඇත."

දාර්ශනික ඇමරිකානු කුඩා දරුවෙකු අනාගත බේදවාචකය මෙසේ පවසා ඇත. කොන්ක්‍රීට් වනාන්තර බිහිවීම නිසා ශරීර රෝගී බවට පත් වී ඇත. එලෙසම මිනිසා ස්වභාව ධර්මයාගෙන් ඈත්වීම නිසා සංහිඳියාව නැති වී හිත්පිත් නොමැති පිරිසකට පාර කියනු දැකිය හැකිය.

සමාජ සංවර්ධනය පිළිබඳ විමසීමේ දී බොහෝ දේ කතා කළ හැකිය. අනවසර ඉදිකිරීම් සහ අධිවේගී මාර්ග ඉදි කිරීමේ දී ප්‍රදේශවාසීන් ගම්බිම් හැරදා යාමට ඔවුන්ට කටයුතු සැලසී ඇත. එලෙසම විශාල වශයෙන් සිදු කරන ව්‍යාපෘති යෝජනා වලින් අහිංසක මිනිසුන් කාණුපල්ලට වැටේ. රජය මඟින් ඔවුන්ගේ වාසස්ථාන කඩා බිඳ දමා වෙනත් ස්ථාන වල පදිංචි කරවයි.

මානුෂික ලෙස මේ ක්‍රියාවලිය පවතින අවස්ථා ඇතත් බහුතරයක් අමානුෂික ආකාරයට අසරණ වෙති. උපන් ගම්බිම් හැර යාම නිසා අලුත් ජීවිතයකට ඔවුන් යොමු වුවද පෙර ජීවත් වූ මට්ටමට පැමිණීමට පෙර ජීවන මට්ටම සකසා ගැනීමට කල්ගත වීම හේතුවෙන් මනුස්සකම නැති බව පෙනී යයි. ඒ වගේම අහිංසක මිනිසුන්ගේ ඉඩම් බලෙන් පවරා ගැනීමටත් වත්මන් දේශපාලකයෝ ද උත්සුක වී සිටිති. උදාහරණයක් වශයෙන් දෙනියාය පිටිබැද්දර ප්‍රදේශයේ ඉඩමක් බලෙන් පවරා ගත් එම ප්‍රදේශයේ ප්‍රාදේශීය දේශපාලන නියෝජිතයෙකු සම්බන්ධයෙන් කරුණු අනාවරණය විය. එලෙසම කුලියාපිටිය රෝහලේ අපද්‍රව්‍ය පරිසරයට හානිකර ලෙස මුදා හරින ලද පුවතක් මාධ්‍ය තුළින් පසුගිය කාලයේ අනාවරණය විය. මෙවන් ගැටුම් නිසා මිනිසුන්ගේ ආකල්ප වෙනස් වේ.

පරාර්ථය වෙනුවට ආත්මාර්ථය වැපිරේ. ප්‍රභූන්ගේ මෙවන් අකටයුතුකම් හමුවේ දුප්පත් ග්‍රාමීය ජනයා නඩුත් හාමුදුරුවන්ගේ බඩුත් හාමුදුරුවන්ගේ යැයි සිතා බිම බලා ගනිති. ඒ වාගේම සංස්කෘතිය විනාශ වී යාමත් තර්ජනයක් බවට පත් ව තිබේ. සංස්කෘතික වටිනාකමකින් යුතු සංස්කෘතික අංගයන්ගේ යථා ස්වභාවය වෙනස් කිරීම නිසාත්, සංස්කෘතික අංග නොසලකා හැර විනාශ කිරීම නිසාත් ජාතියක චරිතය වන් සංස්කෘතිය නැති වී යයි. සංස්කෘතිකාංග ආරක්ෂා කිරීම උදෙසා අමාත්‍යාංශයක් පවා පිහිටුවා ඇත. නටබුන් වී ගිය ශ්‍රී විභූතිය මතු කරලීමට සංස්කෘතික ත්‍රිකෝණයෙන් පිටිවහලක් ලැබේ. නිදසුනක් වශයෙන් නාලන්දා ගෙඩිගෙය වෙනත් ස්ථානයකට රැගෙන යාම හා එකී ශ්‍රී විභූතිය කඩා බිඳ නැවත ගොඩනැඟීම යන කාර්යයන් දෙක වත්මන් සමාජයට පැටලී ඇත. මේ කාර්යයන් දෙකම එකක් ලෙස සිතන්නෝ ද මේ මිහිපිට නැතුවා නොවේ. මල නොතළා රොන් ගන්නා බඹරාගේ ආදර්ශය වත්මනයට අවැසිව ඇත්තේ මෙවන් තත්ත්වයන් හමුවේ ය.

සංස්කෘතිය ජාතියක, සමාජයක උන්නතියට මෙහෙයක් වුව ද භෞතික සංවර්ධනයේ දී ඇතැම් විට බාධා ඇති කරයි. නිදසුනක් ලෙස මස් සඳහා ගවයන් ඇති කිරීම සුරා සූදු ව්‍යාපාර වඩාත් ලාභදායී වන අතර සිංහල බෞද්ධ සංස්කෘතියේ මානුෂිකත්වයට පටහැනි ය. කිරි දරුවන් විකිණීම, ගණිකා වෘත්තිය, ළමා අපචාර සිදු වීමට ඉඩ නිදහස් ව පවතී. සංචාරක ව්‍යාපාරය ජාතික ආදායම ඉහළ යවන්නක් වුව ද ඒ මඟින් අශිෂ්ට ගති සිරිත්, ලෙඩ රෝග ආදී සමාජ රෝග මඟින් මිනිසා තුළ මනුස්සකම නැතිව යයි. අප හට දෙකට දෙවාරමේ සිටින්නට කාලය පැමිණ ඇත.

යහපත් ජීවන රටාවක් පවත්වා ගත යුතුව ඇත. එමඟින් දරිද්‍රතාවයෙන් තොර සමාජයක් බිහි කිරීමට අවැසිය.

"දරිද්‍රතාවය යනු ටිකක් තිබීම නොවේ. හුඟක් නොතිබීම දරිද්‍රතාවයයි"

-ඇන්විපේටර්

මෙහිදී ආහාර හිඟය, සෞඛ්‍ය ප්‍රශ්න උද්ගත වන අනෙක් ප්‍රශ්නවලට ද සාර්ථක විසඳුම් අවැසිය.

ආධ්‍යාත්මිකව ඇති කළ හැකි සංවර්ධනය පිළිබඳ කතා කිරීමේ දී සිරිත් විරිත් තාක්ෂණයට මුහුවීම නිසා ඒවා වෙනස් වී තිබේ. තාක්ෂණයේ දියුණුවත් සමඟ කර්මාන්තශාලා වල යන්ත්‍රසූත්‍ර තිබීම නිසා ශ්‍රමිකයන් අසරණභාවයට පත්ව විරැකියාවට මුහුණ දී සිටිනු දැකිය හැකිය. තාක්ෂණික ලෝකයේ වූ නව මාධ්‍ය භාවිතය සමාජ ප්‍රගමනයට නොව සමාජ විනාශයට හේතු වී ඇත. දිවි නසා ගැනීම් ආදිය ද මේ තේමාවේ බහුලව ශ්‍රී ලාංකේය ජන සමාජයෙන් අසන්නට දකින්නට ලැබේ. අද රෝහලක දැකිය හැකි වන්නේ ලෙඩ්ඩු තරමටම වෙදදුරන් නොමැති බවයි. හෙළ

වෙදකම වළ පල්ලට වැටී ඇත. සංගීත ක්ෂේත්‍රයේ ද තාක්ෂණය නිසා දක්ෂ නිර්මාණකරුවන් බිහි නොවේ. විශේෂ ප්‍රාගුණ්‍යයක් දැකිය නොහැකිය. එහිදී මනුස්සකම නැති වී යයි. අද සියල්ල පරිගණකගත වී ඇත. ආගමික පරිසරයේ ද අනුක්‍රමිකතා දැකිය හැකිය. අද දානයකට, බණ ගෙදරකට, පිරිත් ගෙදරකට ස්වාමීන් වහන්සේලාට ආරාධනා කරනුයේ දුරකථනයෙනි. සැබෑ අවමංගල්‍ය චාරිත්‍ර අද දැකීම පවා අසීරුය. වර්තමානයේ මිනිසුන්ටත්, මියගිය පසු සැප සේ වාහනයක මිහිදන් වන තෙක් යාමට හැකි වී තිබේ.

කිව යුතු විශේෂ දෙයක් තිබේ. පෙර කී පරිද්දෙන් අදත් ග්‍රාමීයව මේ චාරිත්‍ර වාරිත්‍ර, සාරධර්ම කෙසේ හෝ පවතී. නාගරික දනන් තුළ මෙබඳු සෑම අතකම සංවර්ධන පිරිහීමක් දැකිය හැකිය. නගරයේ ඇති භෞතික සංවර්ධනය පුස්සක් බවට සනාථ කළ හැකිය. "නැති බැරි අය ඇති හැකි අය" බවට පත් කිරීමේ අභිලාෂයෙන් දිළිඳුකම තුරන් කිරීමට ජනසවියෙන් ලැබෙන පිටිවහල ඉමහත්ය.

සැබෑ සංවර්ධනයක මනුස්සකම රඳා පවතිනුයේ සමානාත්මතාවය ඇති විටය. සංවර්ධනය සඳහා කාන්තා පරපුරේ සහභාගිත්වය වර්තමානය වන විට දැකිය හැකිය. පවතින ආර්ථික ප්‍රශ්න මත රැකියා සාපිපාසයෙන් විදේශ ගතවීම නිසා පවුල්වල දයාව, කරුණාව, සෙනෙහස අහිමි වීම ආධ්‍යාත්මික සංවර්ධනයට පිටුපාන කරුණකි.

සංවර්ධනය වන ලෝකයේ තාක්ෂණය සමඟ ගුරු වෘත්තිය වෙනත් දිශානතියකට යොමු වී තිබේ. ගුරුවරයාගේ සහ ශිෂ්‍යයාගේ සමීප සම්බන්ධතාවය ලැබූ අධ්‍යාපනය මනා සේ පිහිටීමට හේතු පාදක වේ. අද වන විට විවිධාකාර නව මාධ්‍ය ඔස්සේ ද, තැපැල් මඟින් ද ඉගැන්වීම සිදු වන බව නොරහසකි.

ක්‍රීඩාව සහ ශාරීරික සමබරතාවය පිළිබඳ සැලකීමේ දී උදයට පාසලට රාජකාරිවලට පයින් ඇවිද ගිය මිනිසා අද වෙනම කාලයක් ගෙන ශරීර සමබරතාවය උදෙසා යන්ත්‍ර සූත්‍ර මඟින් ශරීර හැඩ ගස්වා ගනියි. එයින් වර්තමාන ආහාර රටාවත් සමඟ ලෙඩ රෝග පැතිරේ. ශරීර ප්‍රතිශක්තිය හීන වීම නිසා ලෙඩ රෝග සුව වීමටද බොහෝ කල් ගත වේ.

සංවර්ධනය සහ මනුස්සකම අතර සහසම්බන්ධතාවය මෙවන් ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ විවරණය කළ හැකිය. තාක්ෂණ දියුණුවත් සමඟ හොර සහතික මුද්‍රණය, හොර මුදල් නෝට්ටු මුද්‍රණය පෙරමුණේ සිටියි. තවද සංවර්ධනය සඳහා ලැබන විදේශාධාර ප්‍රභූන් විසින් ගසා කෑමට ලක් කිරීමයි.

"සිරකරුවෝ මනුෂ්‍යයෝය"

මේ පාඨය වැලිකඩ බන්ධනාගාරයේ ඉදිරිපස තාප්පයේ සඳහන් වේ. සංවර්ධනය වන රටක සෑම මිනිසෙකු ම වැදගත් ය. මිනිසුන් විවිධ හේතූන් මත එක්ටැම් ගෙවල් වල තනි කර, සිරකොට තැබීම රටේම අයහපතට හේතු වේ. දරිද්‍රතාවය වැරදි කිරීමට මිනිසුන් පොලඹවයි. පැරණි වීදුරුවකට අලුත් වයින් පිරවුවාට කිසිදු වැඩක් නැත. ධනේශ්වර සමාජය බිහි වීම යනු විද්‍යාව සහ තාක්ෂණයේ අති දියුණුව සහ විශ්වාස කළ නොහැකි සීමා මායිම් පසු කිරීමකි. එය නූතන මිනිසාට, දුවන අශ්වයන් හට අං ලැබීමක් වැනිය.

සංස්කෘතික වටිනාකම්වලින් යුතු ඓතිහාසික ස්ථාන සංවර්ධනය උදෙසා සිදු කරන අදූරදර්ශී ක්‍රියා ලංකාවේ පමණක් ම නොව වෙනත් රටවලින් ද සොයා ගත හැකිය. ඉන්දියාවේ 'චාටිස්ග

ාර්' ප්‍රාන්තයේ පිහිටි 'බිල්ඩ්වාර්' නැමැති පෞරාණික ලෙනක් කඩා වැටී අට දෙනෙකු මියගොස් ඇති බව වාර්තා වේ. ඒ පිළිබඳව ඉන්දියා රජය විමර්ශන අරඹා ඇති අතර අනාවරණය වී ඇති කරුණු අනුව ලෙන කඩා වැටීමට හේතුව වශයෙන් දක්වා ඇත්තේ අසල වූ ගල් අඟුරු පතල්වල සිදුකෙරුණු පිපිරීම් බවට සැක කෙරේ.

සංවර්ධනය සහ මනුස්සකම යන තේමාව පිළිබඳ ඉහත ආකාරයට පූර්ණ වපසරියක සිට කතා කළ හැකිය. එහෙත් යහපත් ලක්ෂණවලට වඩා අයහපත් ලක්ෂණ වැඩිය. යහපත් ලක්ෂණ සීමාසහිත ය. සංවර්ධනය සහ මනුස්සකම පවත්වා ගැනීමෙහිලා දායක වූ දනට පවතින වටපිටාව පිළිබඳව විමසීමට බඳුන් කළ යුතුය.

තේමානුගතව යහපත් ලක්ෂණ සැලකීමේ දී භෞතික සංවර්ධනය බාහිරට නිරාවරණය වේ. ඉන් ජාත්‍යන්තරය ජය ගත හැකිය. රටවල් අතර සුහදත්වය ආර්ථික සැලසුම් හුවමාරු කර ගත හැකි වේ. ශ්‍රී ලංකාව තුළ භෞතික වශයෙන් පෙරට වඩා විශාල සංවර්ධනයක් දැකිය හැකිය. එහි ප්‍රතිඵලයක් හැටියට මෙවර පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුලුව අප රටේ පැවැත්වීමට අවස්ථාව උදා විය. එයින් ජාත්‍යන්තරය සමග ගනුදෙනු කළ හැකිය. මෙවන් සංවර්ධනයක් තුළින් දැකිය හැකි තවත් හොඳ ලක්ෂණයක් හැටියට තරගකාරිත්වය දැකිය හැකිය. එලෙසම වාණිජ වෙළඳපොළ පිළිබඳව හොඳ දැනුමක් ලබා ගැනීමට ද සංවර්ධනය ඉවහල් විය හැකිය.

දරිද්‍රතාව තුරන් කිරීමට ජනසවියෙන් ලැබෙන ආධාර සේම ශ්‍රී ලාංකේය ජනතාව මුහුණ දෙන ප්‍රශ්න අතර නිවාස ප්‍රශ්නයට විසඳුමක් හැටියට 1977 හි ආරම්භ කළ උදාගම් ව්‍යාපාරය සඳහන් කළ හැකිය. 1978 දී යාපහුව ආසනයේ අන්ත අසරණ දිළිඳු ගම්මානයක් වන බඩල්ගම උදාගමක් හැටියට දියුණු කොට "උදාගම" යන නම ඊට තැබීය. මෙම නිවාස දශලක්ෂයේ වැඩ සටහනේ දී ප්‍රධාන තැන ග්‍රාමයට හිමි වේ. එලෙසම වත්මනේදී "දිවි නැගුම""ගමට සවියක්" වැනි සංවර්ධන ව්‍යාපෘති පැවතීම පිළිබඳව සතුටු වන අතර එකී ව්‍යාපෘති රට පුරාම සමානාත්මභාවයෙන් යුතුව ව්‍යාප්තවීම අපි අපේක්ෂා කරමු. එලෙස ම "දැයට කිරුළ" වාර්ෂික සංවර්ධන ව්‍යාපෘතිය ද අගය කොට සලකන්නට පිළිවන.

තිස් වසරක් යුද්ධය නිමවා සාමයේ අරුණලු ලොවට පෙන්වීමට ශ්‍රී ලංකාවට හැකි වී තිබේ. මව් කුසක් තුළ ක්‍රමිකව මෝරා වැඩෙන කලලයක් පරිද්දෙන් මනුෂ්‍යත්වය තුළ මෝරා වැඩුණු යුදවාදී සංකල්පයන් අද වන විට මිනිස් සන්තාන අතැර ගොසිනි. යාපනය පුස්තකාලයේ අළු ගොඩවල් අතර ශ්‍රී ලාංකේය පණ ගැහෙන හදවත් වල මානුෂිකත්වය ගිගුම් දුන්නේය. උතුරේ සංවර්ධන කටයුතු සිදුවෙමින් උතුරේ නඩරාජාට යාල්දේවියෙන් දකුණට පැනීමට තරම් හැකියාවක් නිදහසක් අපි සතු වෙමු. සංවර්ධනය සහ මනුස්සකම අතරැති යහපත් සම්බන්ධතාව අපි යල්පානමෙන් දකිමු.

එලෙසම රටක ප්‍රගතිය උදෙසා සාහිත්‍යය තුළිනුත් විශාල කාර්යයක් ඉටු කරනු ලබයි. දියුණුවට මඟ අහුරන මිථ්‍යා විශ්වාස අතහැර දැමිය යුතුය. සංවර්ධනයට සහ මිනිසත් බව සුරැකීමට ලිංගිකත්වය යන තේමාව ද යටිපෙළ නිහඬ අරුතක් ගෙන හැර දක්වයි. සංවර්ධනය කරා ගමන් කරමින් සිටින රටක මිනිසුන්ගේ මානවීය ගුණය හඳුනා ගෙන සංයමයකින්ද යුක්තව කටයුතු කිරීමට ලක්දෙරණේ අනාගතය විෂයෙහි ජනමාධ්‍ය සතු වගකීම අසීමිතය.

සංවර්ධනය සහ මනුස්සකම ආරක්ෂා කර ගැනීමේ දී මෙතෙක් මෙරට ගෙන ඇති පියවර, ක්‍රියා මාර්ග සැලකීමෙන් මත්තට මනුෂ්‍යත්වයෙන් යුතු සංවර්ධනයක් කරා ගෙන යාමට යෝජනා කිහිපයක් ඉදිරිපත් කිරීමට පිළිවන.

ශ්‍රී ලංකාව ආසියාකරයේ ඌන සංවර්ධිත රටකි. ශ්‍රී ලංකාවට හොඳ සංවර්ධනයක් අත්‍යවශ්‍යය.

"කවුළුව හැර සුළං සුව විඳිමු. එහෙත් එම සුළඟට අප සතු දෑ ගසාගෙන යන්නට ඉඩ නොදෙමු"

-මහත්මා ගාන්ධි

මේ වන විටත් කවුළුව හැර හමාරය. අපි සුළං සුව විඳිමින් සිටින්නෙමු. නමුත් අප නොදැනුවත්ව ම ඒ සුළඟට අප සතු බොහෝ දෑ ගසාගෙන ගොස් හමාරය. අපි සංවර්ධනයක් අපේක්ෂා කරමු. එහෙත් ඒ සංවර්ධනය භෞතික වශයෙන් ද ආධ්‍යාත්මික වශයෙන් ද වර්ධනයක් පෙන්නුම් කරන්නට සමත් විය යුතුය. එලෙසම අපේ දේ රැකගෙන අපි සංවර්ධනය කරා පිය නඟමු. ආර්ථික, සමාජීය, සංස්කෘතික යන අංශ ත්‍රිත්වයම එක හා සමානව සංවර්ධනයක් සිදු වීමට කාලය පැමිණ ඇත. උත්සව සඳහා කෙරෙන අනවශ්‍ය මුදල් නාස්තිය රටක ප්‍රගතියට බාධාවකි.

එලෙස ම ග්‍රාමීය වශයෙන් සංවර්ධනය කිරීමට ඇති ආයතනයක් වන ග්‍රාමෝදය මණ්ඩලය වැනි ආයතනද එදිරිසිංහ සමූහ ව්‍යාපාරයේ සභාපති සෝමා එදිරිසිංහ මැතිණිය පවත්වාගෙන යන "ජන සරණ" වැනි ව්‍යාපෘති ද ඉදිරි අනාගතයේ දී ශ්‍රී ලංකාව පුරා ම ව්‍යාප්ත වී සංවර්ධනය සහ මනුස්සකම තහවුරු කිරීමට හැකිවේ යැයි මම සිතමි. දුප්පතුන්ගේ හදගැස්ම නියෝජනය කරන යුනෙස්කෝ සංවිධානය වැනි ආයතනද දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය තුළින් ද මෙරටින් දරිද්‍රතාව තුරන් කිරීමට අත්වැලක් වේ යැයි මම සිතමි.

"කොළොම්තොටින් නැව් නැග්ගා
අපේ රටේ මනුස්සකම
කොළොම්තොටට ගොඩ බැස්සේ
අමනකමයි ඒ වෙනුවට"

# විචාරය

රචනය ආරම්භයේ දී ම සංවර්ධිත, ඌන සංවර්ධිත හා අසංවර්ධිත රාජ්‍ය වර්ග අතර තීරණාත්මක සැසඳීමක් කරයි. එමගින් සංවර්ධනය යනු කුමක් ද යන මූලික ප්‍රශ්නය මතු කරයි. අද දින බොහෝ විට සංවර්ධනය යන වචනයට ලබා දෙන්නේ ඉතා සීමිත අනුමානාත්මක නිර්වචනයකි. එහි දී එය සැලකෙන්නේ හුදෙක් නාගරීකරණයෙන් හා කාර්මික ප්‍රගතියෙන් සමන්විත වූවක් ලෙස ය.

බටහිර විසින් තහවුරු කර තිබෙන වැඩි ප්‍රමුඛතාවකින් නිරීක්ෂණය කළ හැකි සංවර්ධන ආකෘති විමසා බලන අතරතුර බටහිර සංවර්ධන මතවාදවල ප්‍රතිඵලයක් ලෙස උද්ගතව තිබෙන ප්‍රතිවිපාක මොනවා ද යන ප්‍රශ්නය ගැන ඉතා තියුණු නුවණකින් යුතුව කෙටියෙන් කතා කරන සිසුවා ඒ නිසා අවශ්‍ය කරන්නේ නිර්වචනයේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස සලකා මනුෂ්‍යත්වය ඇතුළත් කර ගන්නා සමස්ත සංවර්ධනයක් බව පෙන්වා දෙයි. මේ අනුව සමාජය තුළ දී 'සංවර්ධනය' යනු කුමක් විය යුතු ද යන්න පිළිබඳ සිසුවාගේ ආකල්පය තුළට සංස්කෘතික හා ආධ්‍යාත්මික සංවර්ධනයේ වැදගත්කම ද ඇතුළත් වේ.

අප රට උදෙසා සංවර්ධනය ලෙස අපේක්ෂා කළ යුත්තේ අප තුළ මනුෂ්‍යත්වය වර්ධනය කිරීම සඳහා මානුෂීය සාරධර්ම අන්තර්ගත කර ගන්නා සංවර්ධන ආකෘතියක් බව සඳහන් කරන සිසුවා බොහෝ දෑ උගත හැකි ඉතා වැදගත් කරුණක් පෙන්වා දීමට පෙරට යයි. එනම් සාමාන්‍යයෙන් 'සහජ බුද්ධිය' හෙවත් අපගේ සංස්කෘතියට ආවේණික දැනුම ලෙස නම් කෙරෙන දෙයෙහි වැදගත්කම යි. කෙසේ වුව ද වර්තමාන නාගරීකරණ ප්‍රවණතා වඩා මානුෂීය සමාජයක් ගොඩ නැගිය හැක්කේ කෙසේ ද යන්න පිළිබඳව පෙර යුගවල පැවති දැනුම ඇසුරු කිරීමේ අවශ්‍යතාව මුළුමනින් ම පාහේ නො තකා හැර ඇති බව පෙනී යයි.

රචනය සංවර්ධනයේ නාමයෙන් පාරිසරික විපත් නිර්මාණය කරමින් ග්‍රාමීය ප්‍රදේශ කාර්මීකරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ජනයා මුහුණ පාන ගැටලු සම්බන්ධ වර්තමාන තත්ත්වය සඳහන් කරයි. රැකියා සම්පාදනය කිරීමට උත්සාහ කරන කාර්මීකරණ වැඩ සටහන් අන්ධානුකරණයෙන් පිළිගැනීමෙන් සැබවින් ම අවසානයේ දී පාරිසරික ගැටලුවලට පමණක් නො ව උපුටා දක්වා තිබෙන රතුපස්වල සිද්ධියේ දී පැහැදිලිව දක්නට ලැබුණා සේ ක්ෂණික සමාජ කැලඹීම්වලට ද තුඩු දෙන බරපතළ ජීවිත තර්ජන ඇති විය හැකි බැවින් තරුණ පරම්පරාව මෙම සිතිවිලි ධාරාව ග්‍රහණය කර ගැනීම තීරණාත්මක වේ. සිසුවා ඉන්දියාව වැනි ලෝකයේ වෙනත් ප්‍රදේශවල දී කාර්මික ප්‍රගතිය මානව ව්‍යසනයන්ට තුඩු දෙන ආකාරය පිළිබඳව සහ මෙය ලෝක පරිමාණව සැලකිලිමත් වන කාරණයක් ය යන්න පිළිබඳව ප්‍රශංසනීය අවබෝධයක් විදහා පායි.

සිසුවා නාගරිකත්වය හා මානව සෞඛ්‍යය පිළිබඳ ගැටලු ඉතා සූක්ෂම ඥානයකින් යුතුව සාකච්ඡාවට ලක් කර ඇත. ඔහු බටහිර සාරධර්ම හා තාක්ෂණය සමග තදින් බැඳී තිබෙන වර්තමාන නාගරීකරණ ආකෘතිය ප්‍රතික්ෂේප කරන බවක් පෙනේ. එම නිසා සිසුවාගේ ආකල්පය අප රටේ සංස්කෘතික උරුමය සෝදාපාළු කරන නාගරිකත්ව ආකෘති නිහීන ලෙස පිළිගැනෙද්දී සම්ප්‍රදායානුගත සාරධර්ම හා සදාචාරය පීඩාවට පත් වන ආකාරය ගැන කතා කරයි.

රචනය සදාචාරය ඇතුළත් කර ගත් සංවර්ධනයක අවශ්‍යතාව ගැන ද කතා කරන අතර එම නිසා ආර්ථික ප්‍රගතියෙන් පමණක් නො ව චරිත සංවර්ධනයෙන් ද සමන්විත මානව ප්‍රගති මාදිලියක් ගැන ද කතා කරයි. පැරණි සමාජ ක්‍රමවල දී මනුෂ්‍යත්වයට හා සහයෝගිතාවට වැඩි අවධානයක් ලැබෙන පරිදි සාම්ප්‍රදායික සාරධර්ම යළි හැඩ ගැස්වූ ආකාරය පිළිබඳව සිසුවා ඉතා ප්‍රබල ලෙස සාකච්ඡා කරයි. සිය තර්කයේ දී සිසුවා ගොඩ නගන දෙය නම් එය කායික හා මානසික යන දෙයාකාරයෙන් ම ඉතා නිරෝගී සමාජයක් වී ය යන්න යි. ඔහු එය ඒත්තු යන ආකාරයෙන් කරයි.

තාක්ෂණයේ සෘණාත්මක පැතිකඩවල් කෙරෙහි බෙහෙවින් විවේචනාත්මක වන සිසුවා යහපත් හා අයහපත් ලක්ෂණ කිරා මැන බලන විට අවාසිවලට වඩා වාසි වැඩි යැයි පැහැදිලිව ප්‍රකාශ කරන බව පෙනේ.

රචනයේ දී ඉදිරිපත් කෙරෙන ඉතා වැදගත් කරුණක් වන්නේ ප්‍රගතියට බාධා වන පරිදි මහජන මුදල් නාස්ති කෙරෙන ආකාරය ගැන කෙරෙන සඳහන යි. එම නිසා 'සංවර්ධන ව්‍යාපෘති' ආකෘති සකස් කරන විට ඒවා තුළ මහජනයාට වග වීම ඇතුළත් කළ යුතු යැයි සිසුවා පවසන බව පෙනේ.

අප රට පසු ගිය දශක තුන ගෙවා දැමූ ආකාරය ගැන කතා කරද්දී සිසුවා සාම්ප්‍රදායික ශ්‍රී ලංකාවට ආවේණිකව තිබූ මනුෂ්‍යත්වය සෝදාපාළු වීමකට මුල පුරමින් මුළුමනින් ම අපරීක්ෂාකාරීව හඳුන්වා දෙන ලද විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ගැන සඳහන් කරනු පෙනේ.

ආණ්ඩුව දරිද්‍රතාව තුරන් කිරීම සඳහා ක්‍රියාත්මක කරන යෝජනා ක්‍රම ගැන සාකච්ඡා කරන අවස්ථාවේ දී සිසුවා එම ව්‍යාපෘති දෝෂවලින් තොර යැයි පිළිගන්නා බව පෙනේ. රචනය තුළ දී වෙනත් උපකාරණ ගණනාවක් විවේචනාත්මකව සාකච්ඡාවට ලක් කර තිබෙන ආකාරය සැලකිල්ලට ගන්නා විට මෙම ප්‍රකාශය ප්‍රමාණවත් විශ්ලේෂණයකින් තොරව මතුපිටින් සලකා බලා සරල ලෙස කළ පිළිගැනීමක් සේ පෙනී යයි.

සිසුවා රචනය තුළ දී සංවර්ධනය සමාලෝචනයට ලක් කරන විට සෞන්දර්ය විද්‍යාත්මක ප්‍රකාශනය පිළිබඳ මනා දැනුමකින් එය කළ බවක් පෙන්නුම් කරයි. රචනය පාඨකයාට ආකර්ෂණීය වන පරිදි ලේඛන ශෛලියේ දී ඒත්තු ගැන්වෙනසුලු තානයක් හා කාව්‍යාංග කෙරෙහි අභිරුචියක් පෙන්නුම් කෙරේ.

# සංවර්ධනය සහ මනුස්සකම

කරුවලගස්හීන්ගේ ඥාණෝභාස හිමි,
ප්‍රාචීන ප්‍රාරම්භ (11 ශ්‍රේණිය),
ශ්‍රී ධර්මාලෝක මහ පිරිවෙන

"ඔබ හිනැහෙන විට මුළු ලොව
ඔබ සමගින් සිනාසෙයි
ඔබ වැලපෙන විට මුළු ලොව
ඔබ අතහැර සිනාසෙයි"

අතීතයේ සිට සංවර්ධනය වන මිනිසා සාරධර්මවලින් සහ ගුණධර්මවලින් ස්වයංපෝෂිත සත්වයෙක් ද යන්න ගැටලු සහගත කරුණකි. ඒ කියමන වනාහි"කථාවෙන් හෝ සිනහවෙන් හෝ මනින්නට බෑ මිනිසා" යන වදන සිහි ගන්වනු ලබන අතර නිල් අහස කළු වළාකුලින් වැසෙන විට අහසෙහි කිසිවක් නොපෙනී යයි. එසේම සංවර්ධනය සහ මනුස්සකම අඳුරු සෙවණැලි නැමැති අකටයුතුවලින් ඇලී ගැලී පවතීනම් එය නොපෙනෙයි. ඒ අනුව උසස් මනසක් ඇති මිනිසා සංවර්ධනය විය යුත්තේ කිරි දියෙන් වෙන් කරගන්නා හංසයෙකු මෙනි.

සංවර්ධනය සහ මනුස්සකම අතර ඇති සබැඳියාව පිළිබඳව ප්‍රභේද කාණ්ඩ දෙකකින් වර්ණවත් කළ හැකි අතර එසේ වෙන් කරගත් කාණ්ඩ මෙසේ සනිටුහන් කළ හැකිය.

- භෞතික සංවර්ධනය
- ආධ්‍යාත්මික සංවර්ධනය

මෙලොව එළිය දකින සත්වයා භෞතික වශයෙන් සංවර්ධනය වීමේදී ගේ දොර ඉඩ කඩම් ආදිය සංවර්ධනය කිරීමත් කෘෂිකර්මාන්තය වෙළඳාම ආදී අනිකුත් රැකියාවන් ස්වයංපෝෂිත කිරීමත් යන කරුණු ප්‍රධාන විය යුතු අතර තමා ලබන මුදල් පරිහරණය කිරීම පිළිබඳව මනා අවබෝධයෙන් කටයුතු කිරීමෙන්, තමාගේ භෞතික දියුණුවට මහඟු මෙහෙවරක් සිදුවනු ඇත. අධර්මයෙන් පෝෂණය වන මිනිසා සංවර්ධනය පිළිබඳව මෙවැනි අදහසක් පළ කරනු ලබයි.

"හා එන්න ප්‍රීති වන්න ගී කියන්න පෙම්බරෝ
මේ වගේ සැපක් තවත් ලොවේ තියේ ද සුන්දරෝ?
හැම් බේකන් කන්න සල්ලි
බල්ලෝ මරලා හරි සල්ලි හොයලා
ඉන්න ටිකේ ඉම්මු සුදෝ ජොලිය දමාලා"

ඒ අනුව යන මිනිසාට කිසියම් වූ ආකාරයකින් මුදල් සෙවීමට අවශ්‍යතාවයක් මතුව ඇත. "බල්ලෝ මරලා හරි සල්ලි හොයාලා" තම භෞතික දියුණුව සඳහා මුදල් රැස් කිරීමේ දී අධර්මවාදී පුද්ගලයා ධර්මයට පටහැනිව තමාගේ සංවර්ධනය සලසා ගනියි. අපට බුදු දහමේ උගන්වන ආකාරයට ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ දී මෙලොව දියුණුව සඳහා කරුණු හතරකුත් පරලොව දියුණුව සඳහා කරුණු හතරකුත් යන ආකාරයෙන් කරුණු පෙන්වා දී තිබේ.

එහි එන මෙලොව දියුණුවට බලපාන කරුණු හතර නම්,

- උට්ඨාන සම්පදා- උත්සාහ සම්පත්තිය
- ආරක්ඛ සම්පදා- ආර්ක්ෂණා සම්පත්තිය
- කල්‍යාණමිත්තතා- කල්‍යාණ මිත්‍රයන්ගේ ඇසුර
- සමජීවිකතා- පමණ දැන සමව ජීවත් වීම

යනුවෙන් දක්වා ඇති අතර, එහි එන පරලොව දියුණුවට බලපාන කරුණු හතර නම්,

- සද්ධා- ශ්‍රද්ධාව
- සීල- සීලය
- චාග- ත්‍යාගශීලීබව
- පඤ්ඤා- ප්‍රඥාව

යන කරුණු සතරයි. භෞතික වශයෙන් මිනිසාගේ ජීවිතය සාර්ථක කර ගැනීමෙහිලා ප්‍රධාන අංශ කිහිපයක් මේ සූත්‍රාගත ඉගැන්වීම් වලින් සාකච්ඡාවට භාජන කෙරේ. ව්‍යග්ගපජ්ජ සූත්‍රයෙහි එන උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා, සමජීවිකතා යන ඉගැන්වීම් වලින් ද සිඟාලෝවාදයෙහි ඇතුළත් ධන විනාශ මුඛ භෝග රැස් කිරීම හා පරිභෝජනය සම්බන්ධ කරුණු වලින් ද පරාභව සූත්‍රයෙහි දැක්වෙන පරිහානි කරුණු ගණනාවකින් ද විශේෂ සැලකිල්ල දක්වා ඇත්තේ මිනිසාගේ ආර්ථික දියුණුව සම්බන්ධයෙනි.

"එකේන භොග භුඤ්ජෙය්‍ය - ද්විහි කම්මං පයොජයෙ
චතුත්ථඤ්ච නිධාපෙය්‍ය - ආපාදාසු භවිස්සති"

බුදුරජාණන් වහන්සේ වදාළ මෙම කරුණු මිනිසාගේ සංවර්ධනයට බෙහෙවින් ඉවහල් වේ. භෞතික වශයෙන් සංවර්ධනය වන මිනිසාගේ අවසාන භාගයේ දී නොව පරිණාමයේ දීම සංවර්ධනය විය යුතු කරුණු කිහිපයක් පවතී. එනම්

- වාග් සංවර්ධනය
- කාය සංවර්ධනය
- මනෝ සංවර්ධනය

යනුවෙන් ඒ කරුණු ත්‍රිත්වයයි. වාග් සංවර්ධනය නම් වචන භාවිතයේ ඇති සංවරභාවයයි. එසේම කාය සංවර්ධනය නම් කයින් සිදු කරන ක්‍රියාවන් හි සංවර්ධනයයි. මනෝ සංවරභාවය නම් සිතෙහි ඇති සංවරභාවයයි. සංවර්ධනය මිනිසාගේ දියුණුව සඳහා අත්හළ යුතු මුල්ම කරුණ නම් අලසකමයි.

- ඉතා සීතය
- ඉතා උණුසුම්ය
- ඉතා සවස් වීයැයි
- ඉතා උදෑසන යැයි
- ඉතා කුසගිනි යැයි

යන කරුණු සියල්ල සංවර්ධිත මිනිසා විසින් අත්හළ යුතුය. මෙසේ යථෝක්ත සූත්‍ර ධර්මයන්ගෙ න් ගෘහස්ථ පුද්ගලයාගේ ආර්ථික සංවර්ධනය, සමාජ සම්බන්ධතාවන්ගේ සංවර්ධනය, සදාචාර

සංවර්ධනය හා ආධ්‍යාත්මික සංවර්ධනය යන අංශ සතර අවධාරණය කරමින් සමස්ත පෞරුෂ සංවර්ධනය ලබා දෙන සාර්ථක ජීවිත දර්ශනයක් ඉදිරිපත් වෙයි.

"පින් මඳ පුතුන් සියයක් ලදුවත් නිසරු
ගුණ නැණ බෙලෙන් යුතු පුතුමය ඉතා ගරු
එක පුන් සඳින් දුරු වෙයි ලොව ගණ අඳුරු
නෙක තරු රැසින් එලෙසට නොම වේය දුරු"

පිනෙන් පෝෂණය නොවන හෙවත් සංවර්ධනය නොවන පුද්ගලයන් සියයක් ඉපදුණත් ඉන් පලක් නොවේ. එසේම පිනෙන් පෝෂණය වන එක් පුද්ගලයෙකු සිටීම වැදගත් බව සංවර්ධිත මිනිසාගේ උපායමය කැඩපත වූ සුභාෂිතයෙහි සඳහන් කරනු ලබයි.

මිනිසා භෞතික වශයෙන් පෝෂණය වීමේ දී මිනිසා තුළ සංවර්ධිත ආකල්ප ගොඩනැගිය යුතුවේ. එසේ සංවර්ධිත මිනිසා තවත් ක්‍රමිකත්වයකින් සංවර්ධිත වේ.

ආධ්‍යාත්මික සංවර්ධනය කැඩපතක් කරගත් මිනිසා එදා මෙදා තුර චාරිත්‍ර වාරිත්‍ර හෙවත් සිරිත් විරිත් අනුගමනය කළේ නොමනා උත්සාහයකිනි. ඒ අනුව නිවන පසක් කරගැනීම සඳහා එම මාර්ගයට පිළිපන් මහ රහතන් වහන්සේ ද ආධ්‍යාත්මික වශයෙන් සංවර්ධිත මිනිසෙකු බව සඳහන් කිරීම මජ්ඣිම නිකායේ එන බොහෝ සූත්‍ර රාශියකින් පෙනීයයි. ඒ අනුව අම්බලට්ඨික සූත්‍රය වැනි සූත්‍ර දැක්විය හැකිය.

වත්මන් මිනිසා අහිතකර සිරිත් විරිත් වලට යටත් වී එය අනුගමනය කරමින් ආධ්‍යාත්මික දියුණුව පාගා දමයි.

"මගෙයි ඔබේ කය
ඔබෙයි මගේ කය
රැයින් රැයට අප
බිබී නටන විට
මමයි මගේ යන
මමත්වයන් නැත
පැවැත්ම තනි තනි
කැමැත්ත අනුවය
ඒ අපගේ කුල සිරිතය"

මෙසේ ශරීරයේ ඇති අනිත්‍යභාවය මෙන්ම තමාට එල්ල වන ව්‍යසනයන් පිළිබඳව ඉහත තුලනය සාක්ෂි දරයි. ආධ්‍යාත්මික සංකල්පවලට තුලනාත්මක අදහස් ඉදිරිපත් කිරීමේදී මාර්ටින් වික්‍රමසිංහයන් විසින් රචනා කරන්නට යෙදුණු ගම්පෙරළිය, කලියුගය, විරාගය, භවතරණය, පව්කාරයාට ගල් ගැසීම වැනි කෘතිවල ආධ්‍යාත්මික දියුණුව සාරවත් සංකල්ප යොදා ඉදිරිපත් කර ඇත. එසේ ම භවගාමී වන මිනිසා පිළිබඳ ටී.බී. ඉලංගරත්නගේ සසර නැමති කෘතිය තුළින් පෙන්නුම් වේ.

ආධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය වන මිනිසා දස රාජධර්ම නොපිරිහෙළා ඉටු කිරීම පංච කාම සම්පත් දුරලීම, තිදොර සංවර කරගැනීම මනෝ සංකල්පයෙන් යුක්ත වීම ආදී කරුණු රාශියක් පවතී. මෙම කරුණු රැස පිළිබඳව පරාභව සූත්‍රයේ මෙලෙස සඳහන් කරයි. 'කුසල

ධර්මයට කැමති තැනැත්තා දියුණු වේ' යන සඳහනින් ආරම්භ කරන මෙය පිරිහීම තුළින් සංවර්ධිත මිනිසාගේ පසුබෑම පිළිබඳවද ඉදිරිපත් කරනු ලබයි. අසත්පුරුෂයන් ප්‍රිය වීම අලසකම ස්වභාවයෙහි ඇලුණු බව ආදී කරුණු දාහතක් සනිටුහන් කරයි.

බුදුරජාණන් වහන්සේ විසින් පංච සීල ප්‍රතිපදාව නැමැති කරුණු පහ ඉදිරිපත් කරනු ලබන්නේ "කර්ම ක්ලේශ 4ට" අන්තර්ගත කොටයි. එනම් තම දියුණුව සලසාගත් පුද්ගලයා හඳුන්වනු ලබන්නේ කොහොඹ කොළයක් හා සමානව ය. මෙම කොළයේ මී පැණි තැවරුවත් එහි තිත්ත රස නොමැකෙන බව සඳහන් කළ හැකිය.

"කොපමණ ගුණ කළත්
දුදනෝ නොවෙති යහපත්
කිරි දියෙනි දෙව් යත්
අඟුරු සුදුවන කලෙක් නම් නැත්"

යන කියමන සටහන් කිරීමට ආධ්‍යාත්මික වශයෙන් හැකිවන්නේ නම් එම පුද්ගලයා සංවර්ධනය සහ මනුස්සකම ලත් අපූරු සුගම බස් වහරක් ඇති සාරගර්භී පුද්ගලයෙකි. නිර්ණයක් ලෙස ගත් කල ධර්මයෙහි හැසිරෙන්නා "ධර්මධර නම්" විනයෙහි හැසිරෙන්නා "විනයධර" බවත් නැවත සඳහන් කළ යුතු නොවේ. එසේම ආධ්‍යාත්මික වශයෙන් නොදියුණු පුද්ගලයා ගමේ හැසිරෙන චණ්ඩාලයෙකු වැනියි.

සිත දියුණු පුද්ගලයාගේ සිතුවිලි අපූරු නිර්මාණශීලිත්වයක් ප්‍රකාශ කරයි. ඒ අනුව සංවර්ධිත මිනිසා පිළිබඳව අගයන හිතෝපදේශය නමැති සංස්කෘත ග්‍රන්ථය තුළ පාඨකයාට ඉදිරිපත් කරන්නේ මෙවැනි සංකල්පයකි.

"ස ජතො යෙන ජාතෙන යාති වංශඃ සමුන්නතිම්
ස්වර්තිති සංසාරෙ මෘතඃ කො වා න ජායතෙ"

උපන්නා වූ මිනිසා රට දැයට සේවාවක් නොකර මියැදෙන්නේ නම් එම පුද්ගලයා උපදිනවාට වඩා කුසින්ම මියයෑම සුදුසු යන වදන තබන විෂ්ණු ශර්මන් පඬිතුමා ආධ්‍යාත්මික සංවර්ධනය පිළිබඳ එවැනි අදහසක් දරයි.

සංවර්ධනය සහ මනුස්සකම නොදන්න අය සිටින ස්ථානය පිළිබඳව හඳුන්වා දෙන ප්‍රබුද්ධ ග්‍රන්ථය සනිටුහන් තබනුයේ,

"අමු සොහොනක් නේද මේක ?
නාටකයක් නේද මේක ?
මට මෙන් අසහනයක් නැද්ද ඔබට ?"

යන ප්‍රශ්න ඉදිරිපත් කරන්නේ ආධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය නොවුණේ මන්ද යන්න අසමිනි. මිනිසා තම ආධ්‍යාත්මික සංවර්ධනය පතන්නේ මෙලොවට පමණක් නොව පරලොවටද එම පිහිට පතමිනි. මන්ද යත් කුසල් කිරීම මිනිසාගේ ආධ්‍යාත්මික තත්ත්වය සංවර්ධනය කරන බැවිනි.

සුගන්ධවත් වූ විලක සුපුෂ්පිත මලක් වූ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මෙම පරම සත්‍යය හෙවත් ආධ්‍යාත්මික තත්ත්වය පිළිබඳව දක්කේ තාදි ගුණය මුල්කරගෙන ය. අටලෝ දහමට අනුව කම්පා නොවීම මෙහි ලක්ෂණයයි. ආධ්‍යාත්මික තත්ත්වය පිළිබඳව මෙන්ම සාරධර්ම පිළිබඳව කරුණු රැසක් ඉදිරිපත් කරන මෑතකාලීනව බිහි වූ මාගම් සෝලිය වැනි ග්‍රන්ථ දක්විය හැකිය. මෙහි පාසලට යන ඇබිත්ත කොලුවා විස්මය ජනිත කරවන ක්‍රියා කලාපයක හැසිරීම පාඨකයා ආධ්‍යාත්මික වශයෙන් සිතුවිලිවලට රැගෙන යන අතර රහතන් වහන්සේ යනු කවුරුන්දැයි යන පැනයද මෙයින් විසඳෙනු ඇත.

භෞතික සංවර්ධනයෙහි සහ ආධ්‍යාත්මික සංවර්ධනයෙහි යුතු පුද්ගලයා සංවර්ධිත මිනිසා ලෙස ර්ථ ගැන්විය හැකිය. සංවර්ධනය මුලින්ම ආරම්භ වන්නේ මිනිසා තුළින්මය. මනුස්සකම ඉහවහා යනවාට වඩා සාරධර්මවලින් සපිරීම ඉතා වැදගත්වේ. එසේම මෙම කරුණු සංවර්ධනය සහ මනුස්සකම අතර ඇති සබැඳියාවට මුලපුරන්නේය.

ගසකට අතුපතර ඇතත් එම ගසට මල් සමූහයක් මෙන්ම සුගන්ධවත් බවත් අවශ්‍යවන බවද එසේම සංවර්ධිත මිනිසාට භෞතික සංවර්ධනය සේම ආධ්‍යාත්මික සංවර්ධනය ද අත්‍යවශ්‍ය වේ. මිනිසාගේ සංවර්ධනය සහ මනුස්සකම මිනිසා තුළින්ම කැඩපතක් ලෙසින් දැකීම මනුස්සකමයි. විශාල කාර්යභාරයක නියැලී සිටින මිනිසා සංවර්ධනය තුළින් මිනිස්කමේ නව ආකල්පළඟා කරගනියි. මිනිසා වැඩි වශයෙන්ම ලෞකික ජීවිතය සඳහා භෞතික සම්පත් පරිහරණය කරයි. වෙහෙසකාරීව දවස ගෙවන මිනිසා මනුස්සකම උසස්කොට සලකන්නේ තමාට ලැබෙන මුදල් මතය.

මිනිසාට ඇති රාජකාරී සමග තම ආකල්ප දිගහැරීමට කාල සීමාව මදිකමක් ව පවතී

"දුවන පනින
කපන කොටන
ළිප මොලවන
වතුර පැසෙන
කඩි මුඩියෙන්
වැසිකිළි යන
රැවුළ කපන
මුහුණ දොවන
ඇඳ බැඳ ගෙන
දුව පැන ගෙන
බස් නවතන
තැනට පැමිණ
ගැහැණු පිරිමි
දහසක් දෙන
දහසක් බුදුවරු උපදින
මේ උදෑසන
පටන් ගනිති මහා හටන"

මෙම ප්‍රකාශයෙන් පෙනී යන්නේ මිනිසා තුළ පවතින තරඟකාරීත්වය යි. විද්‍යාවේ දියුණුවත් සමග මිනිසා සංවර්ධනය වීමත් නව නිපැයුම් නිෂ්පාදනය වීමත් යන කරුණු සිදුවන අතර මෙහිදී සංවර්ධනය සහ මනුස්සකම තුලනාත්මක බවට පත්විය යුතුය. සමාජ සංවර්ධනයත්, මනුස්ස සංවර්ධනයත් අතර ඇති සංවර්ධනය ආගමට දහමට අනුකූල විය යුතු අතර ගුණධර්මවලින් ස්වයංපෝෂිත විය යුතුය. ඇන කොටා ගන්නා සමාජයක සංවර්ධනය සහ මනුස්සකම ඉහළ

නැංවීමට ආගම තුළින් මහඟු පිටුවහලක් ලැබේ. වර්තමානය වන විට මිනිසා මනුස්සකම කෙතරම් දුරට සංවර්ධනය කරගෙන ඇතිවාද යන්න බස්රථයකට නැගුණු විට පැවිදි භික්ෂූන්ට ආබාධිත පුද්ගලයන්ට සහ ගැබිණි මව්වරුන්ට අසුන් දීමට තරම්වත් නොපෙලඹීම තුළින් "සංවර්ධනය සහ මනුස්සකම" මිනිසා තුළ වර්තමානය වන විට වගා වී ඇති ආකාරය පැහැදිලි කරයි.

"එතෙ ච මඞගහා නාසසු න මාතා පුත්තකාරණා
ලභෙථ මානං පූජ් වා පීතාවා පුතන කාරණා"

යනුවෙන් එය පැහැදිලිය. ලෝකයෙහි මිනිසුන් අතර දැකිය හැකි ඉතාම සමීප සබඳතාව ඉතාම ළෙන්ගතු සබැදියාව පවත්නේ මව්පියොත් දරුවනුත් අතරය. යම් කරුණක් නිසා එය ද බිඳ වැටේ නම් ලෝකයෙහි අනෙක් කිසිදු පුද්ගලයන් දෙදෙනෙකු අතර පවතින කවර ම සබඳතාවක් වුව ද බිඳවැටීම සිදුවිය හැකිය. ඒ නිසා මව හා පුතු, පියා හා පුතු අතර ඒ දැඩි සබඳතා පවත්වා ගැනීමට තුඩු දෙන කරුණ මිනිසුන් අතර එකිනෙකා බැඳ තබන ඉතා තදබල කරුණකි.

දානය, ප්‍රිය වචන, අර්ථචර්යාවන් හා සමානාත්මතාව යනුවෙන් ඒ කරුණු සතරාකාරව ඉදිරිපත් වේ. දානය නම් දීමයි. සංවර්ධනය සහ මනුස්සකම උදෙසා එය විවිධාකාර ස්වරූප ගත හැකියි. මවගෙන් දරුවාට ලැබෙන ආහාර වූ කිරිහා සෙනෙහස පටන් පාලකයාගෙන් හෝ රජුගෙන් රටවැසියාට ලැබෙන මූලික අවශ්‍යතා සපුරාලන භාණ්ඩ හා සේවාවන් දක්වා ද දායකයාගෙන් පූජකයාට ලැබෙන ආමිසය, ගුරුවරයාගෙන් ශිෂ්‍යයාට ලැබෙන ශිල්ප දානය දක්වා වූ මේ සියල්ලමද දානයෙහි අන්තර්ගත වේ. මේ නිසා සතර සංග්‍රහ වස්තු වනාහි ගමන් කරන රථයක රෝදය නොගැලවීම සඳහා සවිකරන ලද ඇණයක් මෙනි.

සංවර්ධනය සහ මනුස්සකම පිළිබඳව ඇතැම් අදහස් දරන වියතුන් ප්‍රකාශ කරනු ලබන්නේ මෙය ඖෂධ තලියක් හා සමාන බවයි. කෙසේ වෙතත් මෙම සංකලනය තුළ මිනිසා නව දැක්මක් කරා ළඟා වෙයි.

"Without civilization there is no humanity, without humanity there is no real development of a country. Therefore, humanity has been playing a major role when country is developed by various method".

යන ආකාරයට අනුව සඳහන් කරන මෙම සංවර්ධනය සහ මනුස්සකම පුද්ගලයෙකුගේ තිබිය යුතු ආකාරය පිළිබඳව අන්‍යෝන්‍ය වශයෙන් ශිෂ්ටභාවය තිබුණත් මනුෂ්‍යභාවය නැතිනම් එයින් පලක් නැත. එසේම මනුෂ්‍යත්වය නැතිව රටක් සංවර්ධනය වන්නේ ද නැත. ඒ අනුව සංවර්ධිත මිනිසා භෞතික වශයෙන් තම ආකල්ප දියුණු කරගන්නා අතර ආධ්‍යාත්මික වශයෙන් ද තම ආකල්ප දියුණු කරගනියි. ගසට පොත්ත මෙන්ම පොත්තට ගසද අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පවතී. එසේම සංවර්ධනය සහ මනුස්සකම එකට බැඳී පවතී.

සාමකාමී පහන් සිතුවිලි පුරවා ගත් මනසින් යුතු මිනිස් සමාජයකට සංවර්ධනය ළඟා වන්නේ නිරායාසයෙනි. එබඳු සමාජයක නොවැරදී එල දරනුයේ මනුස්සකමයි.

සාරවත් අධ්‍යාපනයක එල නෙළාගත් පුද්ගලයා තිරසර බිමක සාරවත් අධ්‍යාපනය දිග හරින්නාසේ සරු දේ සරු හැටියටත් නිසරු දේ නිසරු හැටියටත් ගැනීම සංවර්ධනය සහ මනුස්සකම කියාපාන තවත් කරුණකි.

"සරංච සාරතො ඤත්වා
අසරංච අසරතො
තෙසාරං අධිගච්ඡනති
සම්මා සංකප්ප ගොචරා"

ධම්ම පදයෙහි එන මෙම ගාථාව තුළින් අපට පෙනීයන්නේ සාරගර්භ වූ මනුෂ්‍යත්වයේ මූලික පරමාර්ථයයි.

සංවර්ධනය යන්න ද අද වන විට පටු සීමාවක හිරවී සිටිනු දක්නට ඇත. එනම් මුදල්මය සංවර්ධනයයි. එහෙත් එය සාවද්‍ය කල්පනාවකි. මිනිස් සංවර්ධනය නම් මානසික, ආධ්‍යාත්මික, දේශපාලනික, ආර්ථික යන සකලාංගයන් ගෙන් පිරිපුන් එකක් විය යුතුය. මානසික සංවර්ධනයට සමීප වූ පුද්ගලයකු තුළ ඉවසීම, දයාව, කරුණාව, මෛත්‍රිය නිතැතින් ම පිහිටයි. මනා චිත්ත සංවර්ධනයක් ගොඩ නැගෙන මේ මිනිස් සමාජයෙහි භෞතිකමය සංවර්ධනයද ගොඩ නැගෙනු ඇත. විද්‍යාව හා තාක්ෂණය වුවත් සංවර්ධනයට මිස විනාශය සඳහා භාවිත නොකිරීමට ඔවුහු වග බලා ගනිති. ඒ සියලු කාරණා ක්‍රමවත්ව ඉටු වන්නට නම් සාමය මුල් විය යුතුය. සාමය හා බැඳුණු සංවර්ධනය යහපත් වන විට මනුස්සකම වැඩෙන්නේත් රැකෙන්නේත් නිරායාසයෙනි.

එහෙත් වත්මන වනවිට මුළු විශ්වයේම බොහෝ රටවල මේ සියල්ල කණපිට පෙරළී ඇත. භෞතික සංවර්ධනය පසුපස හඹා යන මිනිස්සු බලකාමයෙන්, ධන තණ්හාවෙන් කුලල් කා ගනිති. පැහැදිලි ආගමක් මත පිහිටා මානසික සංවර්ධනයත් ඒ හේතුවෙන් උත්තරීතර සාමය පදනම් වී ගොඩ නැගෙන සංවර්ධනයත් සංවර්ධනයේ ආසිරි මැද මනුෂ්‍යත්වයත් සදාචාරයත් ආරක්ෂා කර ගැනීමට පෙරමුණ ගත යුතුව ඇත. ඊට කැප නොවී ක්‍රියා කළහොත් සාමය, සංවර්ධනය දෙදරා මනුස්ස සංහතියේ මළ බෙර වැයෙනු ඇත.

සාමය යන්න නිර්වචනය කළ යුතු නොවුවද වත්මන් සමාජය දෙස නෙත් යොමු කිරීමේ දී එහි අරුත නොදත් සේ හැගේ. අප ජීවත් වන සමාජයේ අන්‍යෝන්‍ය සමගිය හා සහජීවනය සාමය නම් වේ. මානව වර්ගයා ලේ, මස්, ඇට නහරින් හැදි වැඩී ඇති බව පසක් කොට ගෙන සහජීවනයෙන් යුතුව පටු ජාති, ආගම්, කුල භේදවලින් නොබෙදී අන්‍යයන් ඉවසමින් ගරු කරමින් ජීවත් වන්නට හැකි නම් මනුස්සකම සහ සාමය එහි අරුත් ගැන්වී ඇත. ජීවිත යථාර්ථය අවබෝධ කොට ගෙන එකිනෙකා කෙරෙහි දයාපරවශව අවට සමාජය හා අත්වැල් බැඳ ගත හැකි නම් සාමය රජයන්නේය. මෙය තුළින් ගොඩ නැගෙන සංවර්ධනය සහ මනුස්සකම ඊටත් එහා ගිය ස්ථානයක පවතී.

"අල්ලට සිඟාවත් රස නැති කැවිලි කකා
වල්කොළ බිම අතුට නිදි නොලැබ දුක් තකා
කල් ගිය රෙදි වැරලි ඇඳ දූලි කුණෙන් වකා
ඇල්මෙන් අකුරු උගනිව් ඉදිරි වැඩ තකා"

අධ්‍යයනය තුළින් ජනතාව සමාජානුයෝජනය කරනවා පමණක් නොව සංවර්ධනයට ද ලක් කරනු ලබයි. කෙසේ වෙතත් මනුස්සකම රඳා පවත්වා ගැනීමට මිනිසා වෙහෙසවන්නේ බලවත් ලෙසිනි.

පුද්ගලයා හුදෙක් භෞතික හා ආර්ථික අංශය අවධාරණය හුරු වූ ලෝකයාට උභයාර්ථය අවධාරණය කිරීමෙන් වර්තමාන සමාජ ප්‍රශ්න බොහෝමයක් විසඳා ගැනීමට හැකි බව මේ බෞද්ධ ඉගැන්වීමෙන් පෙන්වා දෙනු ලැබේ.

‘ධරණීය සංවර්ධනය’ යන සංකල්පය (Sustainable Development) මෑතක දී ලෝකයාට හඳුන්වා දී ඇත්තේ අනාගත පරම්පරාවන් ගැන නොතකා සියලු ස්වාභාවික සම්පත් වර්තමාන මිනිසාගේ පරිභෝජනය සඳහා යොදා ගැනීමෙන් උද්ගත වී ඇති භයානක තත්ත්වයට පිළියමක් වශයෙනි. ලෝකයෙහි සියලු සම්පත් මිනිසාගේ ප්‍රයෝජනය සඳහාය යන වැරදි ආකල්පයෙන් මෙහෙයවන ලද මිනිසා විසින් ගොඩ නගා ගන්නා ලද ජීවන රටාව නිසා මේ අවදානමට ඔහුට මුහුණ දීමට සිදු වූයේය. සීමා නොතකා ප්‍රමාණය ඉක්මවා පරිභෝජනයෙහි යෙදීමෙන් විපාක වශයෙන් අත්දකින්නට සිදු වුණු අහිතකර ප්‍රතිඵලයකි. මෙය බුදු දහම උගන්වන්නේ ගතික බවින් (ඇලීමෙන්) මුච්ඡිත බවෙන් (මුලාවෙන්) අජ්ඣාපන්න බවෙන් (දැඩිසේ ඇලීමෙන්) තොරව මාත්‍රඥතාවෙන් යුක්තව (ප්‍රමාණය දන) පරිභෝජනයෙහි යෙදීමට ය. සමසේ දිවි ගෙවන ලෙසය. අන්‍යෝන්‍ය වශයෙන් මිනිසාත්, සතුනුත්, ශාක පද්ධතියත්, භෞතික වස්තූනුත් එකිනෙකා කෙරෙහි රඳා පවත්නා ආකාරය තේරුම් ගෙන ක්‍රියා කරන ලෙස ය. “පටිච්ච සමුත්පාද” ධර්මතාව ඉදිරිපත් කරන සමාජ දර්ශනය එයයි. මේ කරුණු වටහා ගත්තේ නම් වර්තමාන සමාජ ප්‍රශ්න රාශියක් උද්ගත නොවන්නට ඉඩ තිබිණි. මේ කරුණු දැන් හෝ වටහා ගන්නේ නම් උද්ගත වී ඇති ප්‍රශ්න නිරාකරණයට මග පෑදෙනු ඇත.

තමා කිසියම් වූ විමුක්තියන් කරා රැගෙන යන්නේ ආගමයි. තත්කාලීන සමාජය තුළ සංවර්ධනය සහ මනුස්සකම බුදු දහමේ පෙන්වා දෙන ආකාරයට සර්ව සම්පූර්ණ මනුස්සකම නම් සංවර්ධනයයි. ධනවත් රටවල් යුධ අවි සඳහා වැය කරන විශාල ඩොලර් ප්‍රමාණයෙන් සියයෙන් පංගුවක් වැය කොට දිළිඳු රටවල් සංවර්ධනය කළ හැකි ය. එහෙත් එය සිදු නොවේ. එහෙත් භෞතික සංවර්ධනය පතන ආධ්‍යාත්මික සංවර්ධනය දෙස නොබලා මිනිසා සියතින්ම සිය ගෙල සිඳ ගනිමින් සිටියි.

මානසික සංවර්ධනය ඔස්සේ ජාතික හා ජාත්‍යන්තර සංවර්ධනය ඇති කළ හැකි වනු ඇත. ආගමකින් ලබන සැබෑ මග පෙන්වීම ශිෂ්ටසම්පන්න මිනිසෙකු බිහිකරන බව අවධාරණය කළයුතු වේ.

මිනිස් සිත් සතන්හි මෛත්‍රී, කරුණා, දයා ආදී පිවිතුරු සිතිවිලි විකසිත වී නොමිනිස්කම් මග හැරී ගිය දිනෙක සාමයත් සහජීවනයත් ගොඩ නැගී සංවර්ධනයට අත වනනු ඇත. එවිට සදාචාරාත්මක මනුස්සකමක ගුණ සුවඳ විහිදෙනු ඇත. ඒ සුවඳ උදාකර ගන්නට මානව වර්ගයා වෙනුවෙන් කැප වෙමු.

# විචාරය

සිතිවිලි හා තර්ක පැහැදිලි ඒකාබද්ධතාවකින් යුතුව ගලා යන ඉතා මැනවින් ව්‍යුහගත කරන ලද රචනයකි. තර්කවල පදනමත් සංවර්ධනය නිර්වචනය වන්නේ කුමකින් ද යන්න හා ඒ සඳහා යොදා ගත යුත්තේ මොනවා ද යන්න සම්බන්ධයෙන් ගෙන තිබෙන ස්ථාවරයත් පැහැදිලිව ඉදිරිපත් කෙරෙන අතර සහානුකම්පික ලෙස බුදුන්ගේ ඉගැන්වීම් සහ ධාර්මික චර්යාව හා මානුෂීය ආකල්ප මත පාදකව තිබූ සාම්ප්‍රදායික සමාජයේ ඉගැන්වීම් මත පදනම් කෙරේ.

ආරම්භයේ දී ම අද දවසේ හා වර්තමාන යුගයේ සදාචාරය හා සංවර්ධනය ගැන සොයා බලනු ලැබේ. රචනයේ ආඛ්‍යානයෙන් වැටහෙන්නේ සමස්ත තර්කය ම සංවර්ධනය යන වචනය  සංකල්පගත කරන්නේ විවිධාකාර තාක්ෂණයන් හඳුන්වා දීම හරහා කාර්මිකවාදය හා නාගරීකරණය දියුණු කරන බටහිර ආකෘතියට සමාන ආකාරයෙන් බව යි. මෙලෙස රචනය වැටහීම්වල පැහැදිලිකම පෙන්නුම් කරන අතර සංවර්ධනය යන වචනයේ සාංකල්පික පදනම කරා ළඟා වෙයි. කෙසේ වුව ද සිසුවා මෙම නිර්වචනය ප්‍රකාශයට පත් කරන්නේ එය වචනානුසාරයෙන් ප්‍රකාශ කිරීමෙන් නො ව බුදුන්ගේ මෙන් ම සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික සමාජයේ ද ඉගැන්වීම් අනුව සංවර්ධනයෙන් අපේක්ෂා කරන්නේ කුමක් ද යන්න වක්‍රව පෙන්වා දීමෙනි.

සදාචාරයෙන් තොර මූල්‍ය ප්‍රගතිය අධාර්මික බව පැහැදිලිව පෙන්වා දෙන අතර ප්‍රගතිය කරා වූ ධාර්මික මාවත පෙන්නුම් කරන්නේ බුදුන් පහදා දුන් ධර්මය අනුව යමිනි. ධනය හා පරිභෝජනය පිළිබඳ සංකල්පය ද බුදුන්ගේ ඉගැන්වීම් අනුව පැහැදිලි කෙරෙන අතර අනතුරුව චර්යාමය පැතිකඩවල් හරහා චරිත සංවර්ධනයට සම්බන්ධ කරනු ලැබේ. එම නිසා පුද්ගල ප්‍රගතියේ ස්වරූපයෙන් සංවර්ධනය කරා ළඟා වීම පැහැදිලි කෙරෙන්නේ වගා කර ගත යුතු ගුණාංග හා පුද්ගලයා ඇති කර ගත යුතු ආකල්ප පිළිබඳ විස්තර සහිතව ය.

සංවර්ධනය සමාජීය හා පෞද්ගලික සංසිද්ධියක් ලෙස විස්තර කිරීමේ දී රචනය අතීත යුගවල දී සිංහල සාහිත්‍ය කෘති සමාජීය පරිසරය විදහා පෑ ආකාරය ගැන සඳහන් කරයි. සිය ද්‍රව්‍යමය ධනය පමණක් නො ව සිය බුද්ධිමය හා ආධ්‍යාත්මික පදනම් ද සංවර්ධනය කර ගත් ප්‍රගතිශීලී මිනිසෙකු සංවර්ධනයේ සැබෑ ලකුණ ධාර්මිකත්වය බව තේරුම් ගනු ඇත යන අදහස වෙත රචනය මෙම සාකච්ඡාව තුළින් පිවිසේ. යහපාලනය සංවර්ධිත සමාජයක අත්‍යවශ්‍ය අංගයක් යැයි පෙන්වා දෙන අතර එහි පදනම ලෙස රජුගේ ධාර්මිකත්වය පිළිබඳ ඉපැරණි නීති ගෙන හැර පානු ලැබේ. එම නිසා පුද්ගලයාගේ, සමාජයේ හා ආණ්ඩුවේ ඒ ඒ ක්‍රියාකාරකම් මට්ටම්වල දී සංවර්ධනය යන්නෙන් කුමක් අදහස් වනු ඇත් ද යන්නෙහි සමස්තාර්ථය ලෙස පෙනෙන දෙය සමග පවතින සම්බන්ධතා සහිතව 'සංවර්ධිත මිනිසා' යන්න සංකල්පයක් ලෙස අවධාරණය කරනු ලැබේ.

ඉන් පසුව ආචාර ධර්මාත්මක හා සදාචාරාත්මක චර්යාවන් සමග සම්බන්ධ කරමින් සංවර්ධිත මිනිසා නිර්වචනය කරනු ලැබේ. අද දවසේ වැටහීම අනුව නම් මිනිසාගේ ප්‍රගතිය හෝ වටිනාකම මැනෙන්නේ ඔහුගේ වැටුප් හා පරිභෝජන හැකියාව මගින් ය යන රචනයේ කේන්ද්‍රීය තර්කය ඉදිරිපත් කෙරෙන්නේ එම නිර්වචනය මාර්ගයෙනි. ඉන් පසුව රචනය ගොඩ නැගෙන්නේ සමාජීය හා මානව සංවර්ධනය ආගමික සංවර්ධනයට අනුකූලව සිදු විය යුතු බවට කෙරෙන

යෝජනාව මත ය. ළමයා සහ දෙමව්පියන් අතර පවත්නා සබඳතාව බිඳ වැටීමේ ප්‍රවණතාව වර්ධනය වීම සමාජයේ පදනම් සෝදාපාළු වීමක් ලෙස පෙන්නුම් කරනු ලැබේ. ඊළඟට මතු කෙරෙන ප්‍රශ්නය නම් බිහි වන සමාජය කොතරම් මානුෂීය වනු ඇත් ද යන්න යි. ශිෂ්ටාචාරයේ ලකුණ වන්නේ මනුෂ්‍යත්වය සමග පවත්නා නිසග සම්බන්ධතාවකි යි යෝජනා කරනු ලැබේ. එම නිසා ගසට පොත්ත වැනි ය යන උපමාව ශිෂ්ටාචාරය හා මනුෂ්‍යත්වය අතර සම්බන්ධතාවේ වැදගත්කම අවධාරණය කිරීමට යොදා ගන්නා සිත් ගන්නාසුළු ප්‍රකාශනයක් බවට පත් වේ.

තිරසර සංවර්ධනය යනු කුමක් ද යන කාරණය සංකල්පයක් ලෙස ගෙන රචනය අවධාරණය කරන්නේ අධිපරිභෝජනවාදයේ ප්‍රතිවිපාක හා ඉන් වැළකිය යුතු ආකාරය ගැන බුදුන් උගන්වා තිබෙන දෙය යි. තිරසර සංවර්ධන සංකල්පය ද බුදුන්ගේ ඉගැන්වීම්වල අඩංගු වන අතර රචනය ඒ බව අවධාරණය කරයි. ඉදිරිපත් කෙරෙන යෝජනාවේ ස්වරූපයෙන් රචනය අවසන් වශයෙන් අවධාරණය කරන්නේ මානසික හා ආධ්‍යාත්මික දියුණුව හරහා සංවර්ධිත ජාතියක් හා ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ ප්‍රාර්ථනාවන් සාක්ෂාත් කර ගත හැකි බව යි.

රචනය වනාහි දැන් පවත්නා නාගරිකවාදයෙන් මෙහෙයවෙන කාර්මීකරණ ආකෘති පදනම් කර ගත්තා වූත් රීතියක් වශයෙන් මානුෂීය සාරධර්ම සැලකිල්ලට නොගන්නා වූත් සංවර්ධන වැඩ සටහන්වලට විකල්පයක් ඉදිරිපත් කරමින් වර්තමාන සංවර්ධන ප්‍රවණතා හා ආකෘති පිළිබඳව කෙරෙන ප්‍රබල විවේචනයකි. රචනය මුළුමනින් ම බුදුන්ගේ ඉගැන්වීම් මත පදනම් වන යෝජනාවක ස්වරූපයෙන් එහි 'තර්ක පදනම' මත ඉතා ශක්තිමත්ව නැගී සිටී. එහෙත් නො සලකා හැරෙන තීරණාත්මක සාධකය වන්නේ තමන් තෝරා ගත් පරිභෝජනවාදයෙන් මෙහෙයවෙන සමාජයක් පිළිබඳ මාවත යළි සීරුමාරු කර ගැනීමට වර්තමාන සමාජයට හැකි වේ ද යන්න බව පෙනී යයි.

රචනය සංවර්ධනය උදෙසා වඩා විශාල වැඩ සටහන් නිර්මාණය කිරීමේ දී පරිසරය හෝ සාධකයක් ලෙස පරිසරය සුරැකීම අදාළ වන ආකාරය සාකච්ඡා කෙරෙන උපකාරණයක් ඇතුළත් නොකිරීම ද බෙහෙවින් කැපී පෙනේ. කෙසේ වුව ද පරිභෝජනවාදී ප්‍රවණතාවන් පාලනය කළ විට ඉබේ ම සුරක්ෂිත පරිසරයක් ඇති වන බව රචනය යෝජනා කරන ජීවන ක්‍රමය නිරීක්ෂණය කළ හොත් කිව හැකි වේ. රචනය මානව ප්‍රමුඛතාවන් විය යුත්තේ මොනවා දැයි නැවත සිතා බලන ලෙස ඉල්ලා සිටින අතර මානසික හා කායික යන දෙයාකාරයෙන් ම නිරෝගී නව ජීවන ක්‍රමයක් නිර්මාණය කිරීම ලෙස සංවර්ධනය යළි නිර්වචනය කර තිබීම ඉතා වැදගත් ය.

සිංහල කවි හා ගී මෙන් ම සූත්‍රවලින් උපුටා ගත් කොටස් යොදා ගැනීම පෙන්නුම් කරන්නේ ආගමික හා සාහිත්‍ය යන දෙයාකාරයේ ම ලේඛනවලින් තමන් යෝජනා කරන සංවර්ධන දැක්ම අවධාරණය කෙරෙන වග සිසුවා දන්නා බව යි. එම නිසා මෙහිලා සලකා බැලීම සඳහා ඉදිරිපත් කර තිබෙන්නේ හුදු පෞද්ගලික අදහස් නොවන බවත් පෙර යුගවල පැවති සමාජ ආකල්ප පිළිබිඹු කරන ආගමික ඉගැන්වීම් හා සාහිත්‍ය නිර්මාණ තුළ හමු වන සිතිවිලි හා ඉගැන්වීම් බවත් සිසුවා සිය රචනය තුළ දී පෙන්වා දෙයි. රචනය භාෂා ප්‍රවීණතාව, ව්‍යූහය ඔස්සේ පාඨකයන් ග්‍රහණය කර ගත හැකි රිද්මය මෙන් ම සාහිත්‍යාංග යොදා ගැනීම ද පෙන්නුම් කරයි.

# සංවර්ධනය සහ මනුස්සකම

ටී. පී. දීපානි චාමිකා,
13 ශ්‍රේණිය,
මාර/ දෙනියාය මධ්‍ය මහා විද්‍යාලය

පොල් අතු පැලේ ජීවත්වන දුප්පතාට කුප්පි ලාම්පුවද සඳ රැස් ද ගෙන දෙන්නේ මිල කළ නොහැකි ආලෝකයකි. එමෙන් ම කොන්ක්‍රීට් මන්දිරවල වෙසෙන මිනිස්සු විදුලි ආලෝකයෙන් සුඛෝපභෝගී ජීවිත ගත කරන්නෝය. මේ දෙපිරිස ම ජීවත් වන්නේ එකම ලෝකයක් තුළය. එසේ නම් සමාජීය විෂමතා හටගන්නේ මන්ද? සංවර්ධනයේ සැබෑ පැතිකඩ වන්නේ සමාජයේ එක් පිරිසකට උදාවන යහපත් ජීවන තත්ත්වය නොවන්නේය. සමස්ත අවශ්‍යතා සපුරාලීම සංවර්ධනයක් ලෙස සරලව අර්ථ දැක්විය හැකිය. සැබවින්ම සංවර්ධනය යනු මිනිසුන්ගේ ජීවන තත්ත්වය අයහපත් තත්ත්වයක සිට යහපත් තත්ත්වයක් වෙත මාරුවීමයි. මෙකී ජීවන තත්ත්වයේ වෙනස් වීම පාරිසරික වශයෙන් මෙන්ම මානුෂික වශයෙන් ද සිදුවිය යුතුය. සැබැවින් ම සංවර්ධනය සැබෑ සංවර්ධනයක් බවට පත්වන්නේ සංවර්ධනය පරිසර හිතකාමී හා ජනහිතකාමී වන තරමට ය.

පීනන්නට නම් දියට බැසිය යුතුමය. නමුත් ඊට මත්තෙන් ගොඩබිම සිට දිය පහර පිළිබඳව විපරම් කළ බැලිය යුතුමය. උක්ත ඡේදය හරහා සිදු කළේ පසු විපරමකි. සංවර්ධනය මිනිසා හා පරිසරය පදනම් කරගෙන කෙලෙස සිදුවේද යන සිහිනය යථාර්ථයක් බවට පත් කර ගැනීම කෙරේ අවධානය යොමුකිරීම කාලෝචිතය.

සංවර්ධන ක්‍රියාවලිය තුළ මිනිසුන්ගේ තෝරා ගැනීමේ පරාසයෝ පුළුල් වෙති. සංවර්ධනය තුළ සැබැවින් ම අන්තර්ගත කරුණු රැසකි. භෞතික අවශ්‍යතා වන නිවාස, ඇඳුම්, ආහාර ආදිය හිඟ නොවීම, ශාරීරික තත්ත්වය යහපත්වීම, සමාජ සම්බන්ධතා ශක්තිමත් වීම, සමාජ සුරක්ෂිතභාවය හා තීරණ ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ වීමේ හැකියාව යන කරුණු සංවර්ධනයේ ස්වභාවය විද්‍යමාන කරන්නේය.

වර්තමාන සංවර්ධනය පරිසරහිතකාමී හා ජනහිතකාමී සංවර්ධනයක් වනු දැකීම මගේ සිහිනයකි. එකී සිහිනය දකින්නට පෙර වර්තමාන සංවර්ධන ක්‍රියාවලියේ සැබෑ ස්වරූපය ආවර්ජනය කිරීම අත්‍යවශ්‍ය ය. සංවර්ධනයේ සැබෑ නිර්වචනයට අනුව ජනතාවගේ ජීවන තත්ත්වය යම් මට්ටමක් කරා ළඟාවීම හෝ යහපත් වීම අනිවාර්යයෙන් ම සිදුවිය යුතු ය. බැලූ බැල්මට වර්තමානයේ සමාජය සංවර්ධනය වී ඇත. තාක්ෂණික වශයෙන් ලබා ඇති දියුණුව සංවර්ධනයේ කැඩපත බඳුය. ලොව ඕනෑම තැනක සිදුවන සිදුවීමක් අසුරු සැණින් දැන ගන්නට තරම් වර්තමාන තාක්ෂණය දියුණුවීම සතුටට කරුණකි.

මාර්ග පද්ධති ශීඝ්‍රයෙන් වර්ධනය වීම ඔස්සේ සමාජ සබඳතා ශක්තිමත් වී ඇත. එමෙන්ම කාලය ඉතිරි කරගැනීමේ හැකියාව උදා වී ඇත. කුප්පි ලාම්පුවේ එළියෙන් ජීවත් වූ කාලයට ආයුබෝවන් කීමට ද කාලය එළඹ ඇත. තම මූලික අවශ්‍යතා පවා සපුරා ගැනීමට නොහැකි ව ජීවත් වූ මිනිසුන්ට වර්තමාන සංවර්ධන ක්‍රියාදාමය ඔස්සේ අනුනට අත නොපා ජීවත් වීමට හැකියාව ලැබී තිබීම භාග්‍යයකි. විරැකියාව ද බොහෝ දුරට තුරන් කිරීමට ද ඉඩ ප්‍රස්තාව ලැබී

ඇත. අධ්‍යාපනය හදාරන දරු පිරිස තුළ ද උනන්දුව, උත්සාහය හා තරඟකාරිත්වය මතම විශාල ප්‍රගතියක් අත්කරගෙන සිටී.

බොහෝ රෝගවලට ප්‍රතිකාර ක්‍රම සොයා ගැනීම හා සෞඛ්‍ය සේවාව විධිමත්ව ගම් නියම්ගම් සිසාරා ව්‍යාප්ත ව ඇත. යටිතල පහසුකම් නාගරික ප්‍රදේශවලට සමානව ග්‍රාමීය ප්‍රදේශවලට ද විදුලි වේගයෙන් ළඟා වෙමින් පවතින අතර සැබැවින් ම සංවර්ධනයට මනුස්සකම ද ඇතුළත් වන්නේ නම් සංවර්ධනයේ සැබෑ ප්‍රතිඵල අත්වීමට ලැබෙන ඉඩ ප්‍රස්තාව පුළුල් වනු නිසැක ය.

වර්තමානයේ සිදුවන සංවර්ධනය "තිරසර සංවර්ධනයක්" ම වන්නේ නම් ඉතා අගනේ ය. ඉන් අදහස් වන්නේ වර්තමාන පරපුර තම අවශ්‍යතා සපුරාගන්නා විට අනාගත පරපුරට ඔවුන්ගේ අවශ්‍යතා සපුරා ගැනීමේ හැකියාව කැප කිරීමට ඉඩ නොතැබිය යුතු බවය. එමෙන්ම පරසර සංවර්ධනය තුළ අවධාරණය කරන ආර්ථික, සමාජ හා පාරිසරික පැතිකඩවල් හමුවේ සැබෑ සංවර්ධනයක් ළඟා කර ගැනීමට අවස්ථාව උදාවේ.

වර්තමාන රජය විසින් සිදු කරන සංවර්ධන කාර්යභාරය සැබැවින් ම අගය කළ යුතු ය. ජනතාවගේ ජීවන තත්ත්වය සෑම අංශයකින්ම ඉහළ නැංවීමට රජය නිබඳව කටයුතු කරයි. දුප්පත් ජනතාවට අත දෙමින් ආදායම් ව්‍යාප්ති විෂමතාවන් අවම කරන්නටද හැකි වෙමින් පවතී. නමුත් එමගින් පරිසරයට හා ජනතාවට වන පීඩනය අවම වෙමින් සංවර්ධනය සිදු විය යුතුමය. පරිසරය විනාශ කරමින් බිහිවන සංවර්ධන ක්‍රියාදාමයන් පලක් නැත. පිරිසර පද්ධතීන්ට වන හානිය අවම කරගෙන සංවර්ධනය ළඟා කර ගත යුතුය. වර්තමානයේ ශීඝ්‍රයෙන් දියුණුවට පත් කර ඇති මාර්ග ජාලය බිහි කිරීමේ දී ජන ජීවිතයට ප්‍රබල තර්ජනයක් ඇති විය. බොහෝ මිනිසුන් ට තම ඉඩම් අහිමි වී ගියේය. එමෙන් ම වන විනාශයද දක්නට ලැබුණේය. සංවර්ධන ක්‍රියාවලියේ දී මෙවැනි විනාශකාරී තත්ත්වයන් සුලබ වුවද අප වග බලා ගත යුත්තේ අවම පිරිවැයකින් හා විනාශවීම් අවම කර ගනිමින් සංවර්ධනයේ සුන්දරත්වය අත්විඳීමටය. අධිවේගී මාර්ග ජාලය ඉදිකරන්නට ද ප්‍රාදේශීය මාර්ග සංවර්ධනය කාර්යක්ෂමව සිදු කිරීමට ද අවශ්‍ය ප්‍රතිපාදන වර්තමාන රජය දියත් කරන විට එහි වක්‍ර ප්‍රයෝජන රටේ ධනවතුන්ගේ මල්ලට වැටෙමින් සංවර්ධන ක්‍රියාවලිය නමට පමණක් සිදු කරන නිලධාරීන් ද වර්තමානයේ නැතුවාම නොවේ. ගලායන දියෙන් දෝතක් ගත්තට මොකදැයි සිතමින් සංවර්ධන ක්‍රියාවලියට වෙන්කර ඇති මුදල් යටිමඩි ගසා ගන්නට මාන බලන මිනිසුන් රටේ සංවර්ධනයට ප්‍රබල තර්ජනයකි එවැනි පුද්ගලයන් පිළිබඳව විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ නොයෙක් විට දැනගන්නට ලැබිණි. නිසි ප්‍රමිතිය නොතකා ඉදි කරන මාර්ග ජාලයන්ට අත්වන ඉරණම මෙන් රටේ මුදල් අපතේ යාම වළක්වා ගැනීම බලධාරීන්ගේ මෙන් ම සාමාන්‍ය ජනතාවගේ ද යුතුකම වන්නේ ය. සංවර්ධන ක්‍රියාදාමය යටතේ යට කී මාර්ග ජාලයන් හි දියුණුව මෙරට පමණක් නොව සමස්ත ලෝකයේ දක්නට ලැබේ. විශේෂයෙන් වනාන්තර ආශ්‍රිත ජන ශූන්‍ය ප්‍රදේශ ජනාකීර්ණ කිරීමේ අපේක්ෂාවෙන් මාර්ග පද්ධති අලුතින් නිර්මාණය කිරීම නිසා ම ජනතාවට හා පරිසරයට ප්‍රබල බලපෑමක් සිදු ව ඇත. රුසියාවේ දුම්රිය මාර්ග පද්ධතියක් ඉදිවීමෙන් වනාන්තර පද්ධතියට විනාශයක් සිදු වූ අතර වන සතුන්ටද තම නිජබිම් අහිමි විය.

කොංගෝ හා ඇමර්සන් වනාන්තර ආශ්‍රිතවද විශේෂයෙන් මාර්ග පද්ධති ඉදිවෙමින් පැවතීමෙන් එකී ප්‍රදේශවල ජීවත්වන ජන කොට්ඨාස, වන සතුන් හා ශාක ප්‍රභේද තුරන් වී යාමට ඉඩ ඇත. මින් විද්‍යමාන වන්නේ එකී සංවර්ධනය පාරිසරික හා ජනහිතකාමී නොවී ඇති බවයි. නමුත් අපි නිරන්තරයෙන් පාරිසරික හා ජනහිතකාමී සංවර්ධනයක් පිළිබඳව ම සිහිනය දැකිය යුතු වෙමු.

ප්‍රාදේශීය ප්‍රදේශ වල ගොවි ජනතාවට ජලය සැපයීම ද කෘෂිකාර්මික කටයුතු කාර්යක්ෂමව කිරීමේ අපේක්ෂාවෙන් වර්තමාන සංවර්ධන ක්‍රියාවලියේ දී ජලාශ ඉදි කිරීම් ද, වෙළඳ කටයුතු පුළුල් කිරීමට වරායන් ඉදිවීමද දක්නට ලැබේ. විශේෂයෙන් රට අභ්‍යන්තරයට පවා වරායන් ගෙන ඒම තුළ සාර්ථක සංවර්ධනයක් අත් කරලීමට වර්තමාන රජය සිහින දකී. එමෙන් ම එකී සංවර්ධන ක්‍රියාදාමය තුළ එක් අංශයක සිදු වන සුළු අතපසුවීමක් නිසා සමස්ත බලධාරීන්ට ම වින කිරීමට සමහරු බලා සිටිති. කිරි කළේට ගොම ඩිංගක් වැටුණා වගේ අවසානයේ දී එකී කාර්යයන් ම ප්‍රයෝජනයක් හෝ කීර්තියක් අත් නොවන්නේ ය. එබැවින් සංවර්ධන ක්‍රියාවලියේ දී නිරන්තර අවබෝධයක් හා සුපරීක්ෂාකාරී බව අත්‍යවශ්‍ය මය. වර්තමානයේ ජලාශ ඉදිකිරීමට හා ඒ සඳහා ක්‍රමෝපායන් සකස් කිරීමේ දී ද ජනතාවට හා පරිසරයට වන හානිය අවම කරමින් සංවර්ධන ක්‍රියාදාමය සිදු කළ යුතු මය. එමෙන් ම සංවර්ධන සැලසුම් සකස් කිරීමේ දී බොරු කකුලට පත්තු බඳින්න වගේ කිසිදු පලක් නැති වැඩක් කිරීමට දිවා රෑ වෙහෙසී සැලසුම් සකස් කිරීමෙන් පලක් නැත.

සංවර්ධනය පරිසර හිතකාමී හා ජනහිතකාමී වීම අත්‍යවශ්‍ය වන අතර ම සංවර්ධනයෙන් ජනතාවට නිසි ප්‍රයෝජනයක් අත් විය යුතු මය. ආතාට අටු කොස් දුන්න වගේ ලැබෙන්නාට ඉන් ප්‍රයෝජනයක් නොවන්නේ නම් එය "සංවර්ධනය" වචනයට පමණක් සීමා වන සංවර්ධනයකි.

වර්තමාන ශ්‍රී ලංකාවේ හම්බන්තොට ප්‍රදේශය සංවර්ධනයේ ඉණි පෙත්තේ වැජඹෙන ප්‍රදේශයක් බවට පත් ව හමාරය. නමුත් ඉන් ජනතාවගේ ජීවන තත්ත්වයේ සංවර්ධනයක් සිදු වී ඇති ද යන්න සැකයට කරුණකි. මන්ද සංවර්ධනය යන්නෙන් අදහස් වන්නේ ජනතාවගේ ජීවන තත්ත්වය අයහපත් තත්ත්වයක සිට යහපත් තත්ත්වය කරා මාරුවීම ය. ජනතාවට තම ස්වශක්තියෙන් නැගිටීමට දිරිය දී විරැකියාව දුරලමින් ප්‍රමාණාත්මක හා ගුණාත්මක සංවර්ධනයක් ඇති කළ යුතුමය.

ගුවන්තොටුපළ ඉදිවෙමින් ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් වීම ද සංවර්ධනයේ සැබෑ සිහිනයකි. මේ සියල්ල ම සිදුවන්නේ වර්ග කිලෝමීටර් හැටපන්දහස් පන්සිය පනස් පහක් වැනි සීමිත බිම්කඩක වන හෙයින් සංවර්ධන ක්‍රියාදාමය සූක්ෂ්මව සිදු විය යුතුය. එමෙන් ම ජනතාවගේ සාරධර්ම වලට, සංස්කෘතියට පහරක් එල්ල නොවන ලෙස සංවර්ධන ක්‍රියාදාමය දියත් කරන්නට වගබලා ගත යුතුය. නැතහොත් සිදුවන්නේ භෞතික යටිතල පහසුකම් හා ජීවන තත්ත්වය දියුණුවට පත්වන විට අපිට අපේ අනන්‍යතාවය නැති වී යාමය. සිරිත් විරිත් හා සම්ප්‍රදායන්ට බලපෑමක් එල්ල නොවන ලෙස සංවර්ධන ක්‍රියාවලිය සිදු විය යුතුය.

නගරයට පමණක් සීමා වී තිබූ තාක්ෂණය අද ග්‍රාමීය ප්‍රදේශවලට ද ළඟා වීමෙන් විද්‍යමාන වන්නේ තාක්ෂණික දැනුම ගම් දනව්වලට ද අත්‍යවශ්‍ය බව ය. විශේෂයෙන් තොරතුරු තාක්ෂණය කොළඹට පමණක් සීමා වී තිබූ පරිගණකයක් අතින් ඇල්ලීමට නොතිබුණු යුගය අවසාන ය.

වත්මන් සමාජය දෙස අවධානයෙන් දෑස් යොමු කළ විට ගම්‍ය වන්නේ තොරතුරු තාක්ෂණයෙන් ග්‍රාමීය දරුවන් ද සන්නද්ධ ව සිටින බවය. විශේෂයෙන් වත්මන් රජය දියත් කරන සංවර්ධන ක්‍රියාවලිය තුළ පරිගණක තාක්ෂණය සියලු පාසල්වලට ලබාදීමේ වැඩසටහන ඔස්සේ වත්මන් ශිෂ්‍ය පරපුර තොරතුරු තාක්ෂණික දැනුමින් පරිණත කිරීමේ අරමුණ සැබැවින් ම අගය කළ යුතුය. එමගින් කැලේ පිපෙන මල් කැලේම මිලින වී යාම වළක්වා ගැනීමට හැකි වීම සතුටට කරුණකි. වර්තමාන සංවර්ධන ක්‍රියාදාමය විවේචනය කරන්නන් මොනවා කීවත් පක්ෂ විපක්ෂ භේද නොතකා සංවර්ධනය තුළ සාක්ෂරභාවය ඉහළ මට්ටමක පැවතීම අත්‍යවශ්‍ය ය. එමෙන්ම සමස්ත ශිෂ්‍ය පරපුරටම සමාන අධ්‍යාපන අවස්ථාවන් ලැබිය යුතුය. නැතහොත් සිදුවන්නේ කොළඹට කිරි ගමට කැකිරි සේ දියුණු නගර සංවර්ධනයෙන් තව තවත් ඉදිරියට යන විට ග්‍රාමීය ප්‍රදේශ පිරිහීමට පත්වීමය. සැමට සමාන සංවර්ධනයක් අත්වීම ද මගේ සිහිනයකි.

සංවර්ධනය සඳහා අවශ්‍ය කොන්දේසි වශයෙන් විවිධ අරමුණු ද ළඟා කර ගත යුතු බව බොහෝ රටවල් ප්‍රකාශ කරයි. නමුත් සංවර්ධනය යනු මිනිසාගේ වර්තමාන තත්ත්වය වැඩි දියුණු කරගැනීම වන හෙයින් සෑම පුද්ගලයෙකුගේම අවධානය යොමුවීම අත්‍යවශ්‍යය. විශේෂයෙන් ආදායම් ව්‍යාප්තිය සාධාරණ විය යුතුය. වැටුප් මට්ටම ජනතාවගේ ජීවන බර පාලනය කර ගැනීමට උචිත මට්ටමක පවත්වා ගත යුතුය. එමෙන්ම සේවා නියුක්ති ඉඩ ප්‍රස්තා පුළුල් කරලීම ද විරැකියාව දුරලීමට නම් අත්‍යවශ්‍යමය. විශේෂයෙන් විරැකියාව දුරලීමට රැකියා අවස්ථා බිහි විය යුතුය. අධ්‍යාපන මට්ටමට ගැළපෙන රැකියා බිහි වන විට රටක් තුළ තරුණ පරපුර තුළ හටගන්නා ආවේගශීලී ක්‍රියාකලාපයන් ද තුරන් වනු ඇත. එවිට සැබැවින් ම ජනහිතකාමී සංවර්ධනයක් උදා වේ.

සංවර්ධනයෙන් අපි අපේක්ෂා කළ යුත්තේ අපේ රටේ ආර්ථිකයට ගැළපෙන තත්ත්වයකි. ළඟා කරගත නොහැකි සංවර්ධනයක් පිළිබඳව සිහින දැකීම මිරිගුවකි. 'කන්නේ නැතිව ඉඳගෙන බල්ලන්ට හැට්ට මහනව වගේ' ආර්ථිකයෙන් පිරිහී ලොවට ලොකුකම් පෙන්වීමට සංවර්ධන ක්‍රියාදාමයන් දියත් කරන්නේ නම් සැබෑ සංවර්ධනයක් ළඟා කර ගත නොහැකිය. අප රට උත්සාහ දැරිය යුත්තේ රටේ ශක්තියට සරිලන සංවර්ධනයක් ළඟා කර ගැනීමටය. කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නංවා ගනිමින් සමාජ සබඳතා ශක්තිමත් කර ගනිමින් හා ශාරීරික තත්ත්වය යහපත්ව පවත්වා ගනිමින් පියවරෙන් පියවර සංවර්ධනයේ ඉණිමග තරණය කළ යුතුය. එවිට පාරිසරික වශයෙන් ද ක්‍රමවත් හා විධිමත් ඵලදායී සංවර්ධනයක් ළඟා කරගත හැකි වනු නිසැක ය.

සංවර්ධනය හා මනුස්සකම නිරන්තරයෙන් එකිනෙකාට බැඳී පවතින විට ඵලදායී සමාජ පරිවර්තනයක් ළඟා කර ගත හැකිය. තාක්ෂණයේ දියුණුව, මාර්ග ජාලා පුළුල් වීම සන්නිවේදන පහසුකම් හා යටිතල පහසුකම් දියුණු වී මිනිසාගේ දෛනික ජීවිතය දියුණුවට පත්වන විට පුද්ගලයා තුළ ජනිතවන මානුෂීය හැඟීම්වලද සංවර්ධනයක් සිදු විය යුතුය. සමානාත්මතාවයෙන් යුතුව සංවර්ධනයේ ප්‍රතිලාභ භුක්ති විඳිය යුතුමය.

මනුස්සකම හඳුනන හදවත් බිහිවිය යුතුය. එවිට සැබෑ සංවර්ධනයක් ළඟා කරගත් රටක්, ජාතියක් ලෙස ලොවට හඬ නගා කීමට ශ්‍රී ලාංකික අපට අවස්ථාව උදා වනු ඇත. එකී අරමුණින් සංවර්ධනයක් ළඟා කරගැනීමට ලාංකික සැවොම සිහින දැකිය යුත්තෝය. උපතේ දී සිදුවන මරණ සංඛ්‍යාව අවම කරගනිමින් ජීවිතාපේක්ෂාව ඉහළ නංවා ගැනීමට ද ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන මට්ටම, සාක්ෂරතාවය, යටිතල පහසුකම් භාවිතය හා සක්‍රීය ජන ප්‍රතිශතය ආදී සංරචක සංවර්ධනයේ මිනුම් බවට පත්වන විට ඒ පිළිබඳව එකී අරමුණු මනුස්සකම පෙරදැරි කරගෙන යථාර්ථයක් බවට පත් කර ගැනීමට අප වෑර දැරිය යුතුය.

යට කී කරුණු ඔස්සේ සංවර්ධනය සිදු වූ අන්දම හා වර්තමානයේ සංවර්ධනය උදා වී ඇති අන්දම විද්‍යමාන ය. නමුත් ඉන් සෑහීමකට පත්ව සිටීම වෙනුවට සංවර්ධන ක්‍රියාවලිය තුළ අපට වැරදුණ තැන් නිවැරදි කරගෙන සැබෑ ප්‍රතිඵල අත්විඳින්ට හැකි වෙනු නිසැකය. අශ්වයා ගියාට පසු ඉස්තාලය වසා පලක් නැත. එමෙන්ම සංවර්ධන ක්‍රියාවලිය නිම වූ පසු අප මනුස්සකම පිළිබඳව සිතීම නිෂ්ඵලය. එසේ නම් සංවර්ධනය මනුස්සකම සමග එකට සුසංයෝගයෙන් ගමන් කළ යුතුය. පරිසර හිතකාමී හා ජනහිතකාමී සංවර්ධනයේ සිහිනය යථාර්ථයක් බවට පත්වීම මේ ඔස්සේ සිදු වනු ඇත.

ලැබී ඇති සංවර්ධනයේ ප්‍රතිලාභ සතුටින් භුක්ති විඳිනවා සේම පරිසර හිතකාමී තිරසර සංවර්ධනයක් උදාකර ගැනීමට මනුස්සකමේ පහනින් පියවර තැබීමෙන් සංවර්ධනය පිළිබඳ දකිනා සිහිනය නුදුරු දිනයේදී ම යථාර්ථයක් වනු නොඅනුමානය.

# විචාරය

සංවර්ධිත රටක් උදෙසා වූ දැක්මේ මූලික පදනම සංවර්ධනය යන්නෙන් ජන හිතකාමීව මෙන් ම පරිසර හිතකාමීව ජීවන තත්ත්වයන් වැඩි දියුණු කිරීම අදහස් කෙරෙන තත්ත්වයක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ. එබැවින් රචනය තුළ දී මෙම සංවර්ධන සිහිනයේ අත්‍යවශ්‍ය අංග පැහැදිලිව ප්‍රකාශ කර ඇත.

මේ දක්වා සාක්ෂාත් කර ගෙන තිබෙන සංවර්ධනය ලෙස වර්ගීකරණය කළ හැකි දෘශ්‍යමාන සාක්ෂි ප්‍රධාන වශයෙන් යටිතල පහසුකම්වලට, වෛද්‍ය පහසුකම්වලට හා ප්‍රවාහනයට අදාළව සඳහන් කර ඇත.

කෙසේ වුව ද පරිසර විනාශයේ ස්වරූපයෙන් එළඹෙන දරුණු ගැටලු සංවර්ධනයේ පිරිවැයට තරම් නොවන ඒවා ලෙස හඳුනා ගෙන ඇත. රචනය මේ සමග සංවර්ධනයට බාධාවක් සහ ජනතාවගේ පැත්තෙන් නාස්තියක් ලෙස සලකා දූෂණය ගැන කතා කරන ආකාරය සඳහන් කිරීම වටී. 'පිරිවැය' ඉහළ යන අතර ජනතාවට සේවා සැපයීම පිළිබඳ එහි අරමුණුවලට හානි වන හෙයින් වැඩි වශයෙන් පහසුකම් සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා දැරෙන පරිශ්‍රමයන්හි අගය අඩු වන බව ද සඳහන් කරනු ලැබේ. මෙම කාරණය හුදෙක් අදාළ බලධාරීන්ට පමණක් පැවරිය නොහැකි බව සහ ජනතාවගේ පැත්තෙන් පුරවැසියන් පදනම් කර ගත් වඩා කාර්යක්ෂම හා ප්‍රායෝගික වගකීම් දැරීමක් සිදු විය යුතු බව ගැන ද රචනය සාකච්ඡා කරයි.

පරිසරයට සහ ඇමසන් වැසි වනාන්තර හා කොන්ගෝව වැනි ජෛව විවිධත්වයෙන් පොහොසත් ප්‍රදේශවල පරිසර පද්ධතියට සැලකිය යුතු හානියක් කර තිබෙන යටිතල පහසුකම් ව්‍යාපෘති ගැන සඳහන් කරන රචනය ශ්‍රී ලංකාව කෙරෙහි පමණක් නො ව වඩා විසල් ගෝලීය දසුන කෙරෙහි ද අවධානය යොමු කරයි.

ලෝක සංවර්ධනය නාමමාත්‍රික නො විය යුතු බව හා තවත් ලේබලයක් පමණක් නො විය යුතු බව ප්‍රකාශ කරන රචනය අපේක්ෂා කළ යුත්තේ 'අර්ථාන්විත සංවර්ධනයක්' ය යන අදහස මතු කරයි. මේ සඳහා රචනය ඇත දකුණේ පිහිටි හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද මහා ව්‍යාපෘති එම ප්‍රදේශයේ මහජනතාවට සැබවින් ම ප්‍රතිලාභ අත් කර දී තිබෙන්නේ ද යන්න පිළිබඳ තීරණාත්මක ප්‍රශ්නයක් මතු කරයි.

රචනය මෙවැනි ව්‍යාපෘති සංචාරක ව්‍යාපාරය සමග බැඳී ගත් ජාත්‍යන්තර වෙළඳාමට හා වාණිජ්‍යයට සේවය කිරීමට උත්සාහ කරන ආකාරය සහ විදේශීය සාරධර්මවල හා වැටහීම්වල බලපෑමට ලක් වීම අපගේ අනන්‍යතාව කෙරෙහි බලපාන ආකාරය ගැන ද සොයා බලයි. මෙහි දී ග්‍රාමීය හා නාගරික බෙදීම යා කිරීමට උපකාර වන සාධකයක් ලෙස සලකා යහපත් හා ධනාත්මක යැයි සැලකෙන නමුත් තොරතුරු සන්නිවේදන තාක්ෂණ විෂය ද මීට සම්බන්ධ කරනු ලැබේ. රචනය යට කී බෙදීම දකින්නේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාව වර්ධනය කිරීම හරහා පිළියම් යෙදිය යුතු අඛණ්ඩ සමාජ අසමානතාවක් ලෙස ය. මේ සම්බන්ධයෙන් සඳහන් කළ හැකි දෙය නම් සංචාරකයන් හා ආයෝජකයන් ලෙස විදේශිකයන් අප රටට ගෙන්වා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන මහා පරිමාණ ව්‍යාපෘති

නිසා සාම්ප්‍රදායික සාරධර්ම සෝදාපාළු විය හැකි යැයි සඳහන් කරන රචනය එම සෝදාපාළුව තවත් උග්‍ර කරමින් තොරතුරු සන්නිවේදන තාක්ෂණය කොතරම් දුරට සාම්ප්‍රදායික වැටහීම් හා සාරධර්ම කෙරෙහි බලපෑ හැකි ද යන කාරණය ගැන සොයා නොබලන බව යි.

සංවර්ධනය රට උදෙසා සැලසුම් කළ යුතු ය යන කාරණයට අදාළව රචනය යෝජනා කරන්නේ ගැළපෙන සංවර්ධන ආකෘතියක් සකස් කර ගත යුතු ය යන්න යි. සමාජීය බැඳීම් ශක්තිමත් කරන අතර කායික සෞඛ්‍යයට ද ප්‍රමුඛතාව දෙන අනාගත දේශීය සංවර්ධන ආකෘතියක කොටසක් බවට පත් විය යුතු සාධකයක් ලෙස කෘෂිකර්මයේ ඵලදායිතාව වර්ධනය වීම ගැන සඳහන් කරනු ලැබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස පරිසර හිතකාමී සංවර්ධනය සාක්ෂාත් කර ගත හැකි ය යන අදහස සිසුවා පළ කරයි.

සිසුවාගේ එම අදහස අනුව වඩා වැදගත් ප්‍රතිඵලය වන්නේ යටිතල පහසුකම් හා සන්නිවේදන තාක්ෂණය සහ වෙනත් එවැනි සාධක නිරෝගී හා මානුෂීය සමාජයක් උදෙසා සේවය කරන ඵලදායක සමාජ පරිවර්තනයක් අපේක්ෂා කළ හැකි වීම යි. අවධාරණය කෙරෙන අවසන් කරුණ වන්නේ සංවර්ධනය මනුෂ්‍යත්වය සමග අත්වැල් බැඳ ගත යුතු ය යන්න හා ප්‍රතිඵලය ලෙස අපේක්ෂා කෙරෙන්නේ මානුෂීය සමාජයක් ය යන්න යි.

සමහර වැදගත් කරුණු අවධාරණය කරන රචනය සිත් ගන්නාසුලු තර්ක ඉදිරිපත් කරයි. කෙසේ වුව ද සිසුවා තර්කවලට ආධාරක විය හැකි හා පළ කෙරෙන අදහස් තව දුරටත් ශක්තිමත් කළ හැකි වන තරමට මූලාශ්‍ර ඇතුළත් කර නැති බව පෙනී යයි. සිසුවා යොදා ගන්නා නිබන්ධාත්මක භාෂාව විදහා පාන්නේ ආකාරගත ශෛලියකි. එහෙත් එය සතුව ඒත්තු ගන්වනසුලු තානයක් ඇත. සාහිත්‍යාංග වැනි සමහර සෞන්දර්ය විද්‍යාත්මක අංග ඇතුළත් කිරීම හා වෙනත් ලිඛිත මූලාශ්‍රවලින් උපුටා දැක්වීම නිසා රචනයේ සාරවත් බව නිසැක ලෙස ම වැඩි දියුණු වනු ඇත.

# සංවර්ධනය සහ මනුස්සකම

පී. ශෙහානි රන්දිකා සිල්වා,
12 ශ්‍රේණිය,
හලා/වෙන්/ ශු. පවුලේ බාලිකා මහ විදුහල

## තෙවන ස්ථානය

"සංවර්ධනය යනු ලෝක ජනගහනයේ ජීවන තත්ත්වය ඉහළ නංවාලීම ය."

පළමුවන සංවර්ධන දශකයේදී (1961-1970) එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් "සංවර්ධනය" යන්න එසේ අර්ථ දක්වනු ලැබුවේය. ඩඩ්ලි සියර්ස් නම් වූ බ්‍රිතාන්‍ය ජාතික ආර්ථික විද්‍යාඥයා සංවර්ධනය පිළිබඳව 1972 වර්ෂයේදී ඉදිරිපත් කරන්නේ මෙවැනි අදහසකි.

"සංවර්ධනය යනු දරිද්‍රතාවය, ආදායම් විෂමතාවය සහ විරැකියාව අවම කිරීමේ ක්‍රියාවලිය යි."

කෙසේ නමුත් ඉහත සඳහන් අර්ථ නිරූපණයන් ද සැලකිල්ලට බඳුන් කරමින්, සංවර්ධනය යනු ආර්ථික, සමාජයීය, දේශපාලනික සහ සංස්කෘතික අංශයන්ගේ සමස්ත වර්ධනය ලෙස නිර්වචනය කළ හැකි ය.

"මනුෂ්‍යත්වය යනු යමකු දේව ස්වරූපයක්, තිරිසන් ප්‍රාණියක් හෝ නොලබා යන්ත්‍රයක් බවට හෝ පත් නොවී මනුෂ්‍යයකු බවට පත්වීමේ තත්ත්වයයි."

ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයේ මනුෂ්‍යත්වය යන පදය විස්තර කෙරෙන්නේ ඒ අයුරිනි. එලෙසම අවිහිංසාවාදයේ පියා වන මහත්මා ගාන්ධි, මනුෂ්‍යත්වය පිළිබඳ මෙසේ රුවන් වැකි පළ කළේය.

"මනුෂ්‍යත්වය පිළිබඳ ඔබේ ශ්‍රද්ධාව නැති කර නොගන්න. මන්දයත් මනුෂ්‍යත්වය යනු මහා සාගරයකි. එහි දිය බිඳු කිහිපයක් අපිරිසිදු වූ පමණින් මුළු මහත් සාගරයම අපිරිසිදු නොවන්නේය." මාර්ටින් ලූතර් කිං නම් මනුෂ්‍යත්වයේ හඬ ද ඇමරිකානු දේශයේ හිඳ මෙසේ මොර ගැසුවේය.

"පුද්ගලයකු ස්වකීය පටු පෞද්ගලික අවශ්‍යතා පසෙක දමා මනුෂ්‍යත්වයේ පුළුල් වූ අවශ්‍යතාවන් වෙනුවෙන් නැඟී සිටින්නේද ඔහු ජීවත්වීම අරඹා ඇත්තේ එතැන් සිටය."

සංවර්ධනය ද මනුෂ්‍යත්වය ද එක මල්ලේ ලුණු කෑ අවධියක් ලෙස පුරාණ රජ දවස හඳුන්වා දීම කෙසේවත් අතිශයෝක්තියක් නොවනු ඇත. දස රාජ ධර්මයට අනුකූලව රට පාලනය කළ රජ දරුවෝ ජනතාවගේ මානුෂීය අවශ්‍යතාවන් සැපිරීමට මුල් තැන දුන්නෝය. කෙතරම් කෲර යැයි සැලකෙන දඬුවම් ක්‍රම රටේ යහපාලනය සඳහා යොදා ගත්තද, තම රටවැසියන්ගේ අවශ්‍යතා දෙස රජවරු මනුෂ්‍යත්වයේ නෙත් යොමු කළෝය. දස රාජ ධර්මයේ පළමුවැන්න වන "දානය" ඒ බව සනාථ කරයි. දානය වනාහි අනුනට අභිමත වස්තු දීමය. එනම් ආහාරපාන, ඇඳුම්, නිවාස හා බෙහෙත් ආදියෙන් සංග්‍රහ කිරීම ය. ප්‍රතිලාභ බලාපොරොත්තු නැතිව දන් දීම ය. රටේ කර්මාන්තකරුවන්ට, ගොවියන්ට හා ව්‍යාපාරිකයන්ට එකී වැඩ කටයුතු දියුණු කිරීම උදෙසා අවැසි ප්‍රාග්ධනය ලබා දීම ද දානය මගින් අපේක්ෂා කෙරුණකි.

"ආරෝග්‍යාපරමා ලාභා
සන්තුට්ඨී පරමං ධනං"
-ධම්මපදය

"ශරීර සනීපයට වඩා අගනා ධනයක් නැත්තේය.
හෘදයේ ප්‍රීතියට වඩා උසස් සතුටක් නැත්තේය."
-ශු. බයිබලය

එකල සිරිලක් භූමියේ විසූ ශ්‍රේෂ්ඨ නරපතිඳුහු සැබවින්ම නිරෝගිකම නම් උතුම්ම ලාභය හා ධනය තම වැසියනට ලබා දීමට තම ඥානයද ශ්‍රමය ද කැප කළහ. අනුරපුර රාජධානියේ ආරම්භක නරපතියාණන් වන පණ්ඩුකාභය නිරිඳුන්ගේ රාජ්‍ය සමය සුවිශේෂී වේ. දිවයිනේ උතුරු මැද ප්‍රදේශය වැව් බැඳි රාජ්‍යයක් කරමින් මිහිපිට සුරපුරක් බවට පත්කිරීමේ පළමු පියවර එසවූවෝ පණ්ඩුකාභය නිරිඳුය. තම රටවැසියන්ගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව මෙතුමන්ගේ විශේෂ අවධානයට ලක්විය. රටෙහි සම්පත් උපරිම ලෙස යොදාගනිමින් සමෘද්ධිමත් රටක් බිහිකිරීමේ අවශ්‍යතාව පණ්ඩුකාභය නිරිඳුන්ගේ ඒකායන අභිප්‍රාය විය. ආර්ථිකයෙන් සමෘද්ධිමත් මෙන්ම සෞඛ්‍යසම්පන්න ජනතාවගෙන් යුත් රාජ්‍යයක් ගොඩනැඟීමේ කර්තව්‍යයට ඉමහත් සේ උරදුන් පණ්ඩුකාභය නිරිඳු තම දසවන රාජ්‍ය වර්ෂයේදී දිවයිනේ ග්‍රාම සීමා නම් කළේය. සැලසුම් සහගත නගරයෙහි, නගර අංගන, උද්‍යාන මෙන්ම සුසාන භූමි ද ඉදි කළේය. සොහොන් පල්ලන් ලෙස සැඬොල් කුලයේ ජනතාව පත් කළේය. දිවයිනේ ආරෝග්‍ය ශාලා ඉදිකිරීමට අනුග්‍රහය දැක් වූ පණ්ඩුකාභය රජ දේශීය වෙදකම සවිබල නැංවීය.

දෙවැනි ජෙට්ඨතිස්ස රජුට පසුව රජ පැමිණි බුද්ධදාස රජු අති දක්ෂ වෛද්‍යවරයෙකි. හේ ජීවක වෙද පරපුරේ අයෙක් ම වූයේ ය. මනුසතුන්ට මෙන්ම තිරිසන් සතුන්ට ද කරුණාව නැමති මහා අමෘතයෙන් සංග්‍රහ කළ හෙතෙම සිරිලක් භූමියෙහි සෞඛ්‍යසම්පන්න ජන පවුරක් ගොඩනැඟීම සඳහා බොහෝ පියවර ගත්තේ ය. ඒ පිළිබඳ මහාවංසය මෙසේ හෙළිදරව් කරයි.

"ද්වීපවාසීන් කෙරෙහි පැවති මහා කරුණායෙන් හැම ගමකට ම ආරෝග්‍ය ශාලාවක් බැගින් කරවා වෛද්‍යවරයන් පත් කළේ ය. රජතුමා වෛද්‍ය ශාස්ත්‍රයෙහි සාරාර්ථයන් අන්තර්ගතකොට සාරාර්ථසංග්‍රහ නම් ග්‍රන්ථය රචනා කළේ ය. ගම් දසයකට වෙදකු බැගින් පත්කොට ඔවුන්ගේ යැපීම පිණිස වීයෙන් විස්සෙන් කොටසක් දෙන ලෙස නියම කළේ ය."
(මහාවංසයේ XXXVIII වැනි පරිච්ඡේදය)

වසර 2500කට එහා ඉතිහාසයේදී රටෙහි සෞඛ්‍යසම්පන්න පරපුරක් ගොඩනැඟීම සඳහා අතීත රජදරුවන් දැරූ ප්‍රයත්නය සැබවින්ම ප්‍රශංසනීය ය. වර්තමානයේ ශ්‍රී ලංකාව ද ඉතා ශීඝ්‍ර සංවර්ධනයක් අත්පත් කරගනිමින් සංවර්ධිත ලෝකය සමඟ ඉදිරියට ඇදෙයි. සෞඛ්‍යසම්පන්න හෙට දිනක් වෙනුවෙන් දිවයිනෙහි ඉදිවන්නා වූ නව පහසුකම් සහිත රෝහල් දෙස කෘතවේදී දෑසකින් බැලිය යුතු ය. මන්දයත් නවීන මාදිලියේ රෝහල් ඉදිවීම, වෛද්‍ය විද්‍යාවේ හා සෞඛ්‍ය අංශයේ දියුණුව මෙන්ම රටෙහි ජනතාවගේ සෞඛ්‍ය ගැටලුවලට කඩිනම් විසඳුම් ලැබෙන බව පෙන්වන සුබදායී ලකුණක් විය හැකි බැවිනි.

2012 වර්ෂය සඳහා වන මහ බැංකු වාර්තාව අනුව නම් වෛද්‍යවරුන් මෙන්ම හෙද සේවක සංඛ්‍යාවද සැලකිය යුතු ලෙස වර්ධනය වී තිබේ (මහ බැංකු වාර්තාව 2012, 91 පිටුව, 3.8 සංඛ්‍යා සටහන). එහෙත් කනගාටුදායක තත්ත්වය වන්නේ රෝහල් අක්‍රමිකතාවන්ගේ වර්ධන වේගය ප්‍රායෝගික ව ගත් කල ඊට වඩා වැඩි බව පෙනී යාම යි. අත්‍යවශ්‍ය ඖෂධ වල දරුණු හිඟයක් රට තුළ ඇති වීමෙන් හැඟී යන්නේ ඖෂධ නොමැති රෝහල් කොල්ලෑ නොමැති ඔරු බවට පත්ව ඇති බවයි.

භාවිතය ට නුසුදුසු කල් ඉකුත් වූ ඖෂධ තොග වශයෙන් ආනයනය වන විට, සුවයක් පතා රෝහල් කරා ඇදෙනා රෝගීන්ට සිදුවන්නේ වඳින්න ගිය දේවාලය හිසේ කඩා වැටීමකි. සැත්කම් සඳහා වුව ද දිගු පෝළිම් වල රැඳී සිටීම ට රෝගීන්ට සිදුව තිබේ. වගකිව යුතු බලධරයන්ගේ මෙම ක්‍රියා කලාපය යටතේ, නුසුදුසු තත්ත්වයේ ඖෂධ රෝගීන්ට නොමිලේ ලබාදීම, පොට්ට සල්ලිය පිනට දීමක් බවට පත්ව තිබේ. ජීවිත ගලවා ගන්නා සෞඛ්‍ය අංශයේම මෙවන් අක්‍රමිකතා ඇස්පනාපිටම සිදුවන විට, මනුස්සකම කොළොම්තොටින් නැව් නැග්ගාදෝ යන සැකය මහජනතාවගේ සිත් සතන් හි හොල්මන් කිරීමට පටන් ගන්නේ නිරායාසයෙනි.

අතීතයේ වැව් බැඳි රාජ්‍යයක් බවට පත් වූ අනුරාධපුරය වර්තමානයේ ක්‍රමයෙන් වකුගඩු රෝගී රාජ්‍යයක් බවට පත්වීම අතිශය ඛේදජනකය. කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය, අඩු ජල ප්‍රමාණයක් පානය කිරීම සහ දීර්ඝකාලීනව කිවුල් ජලය භාවිතය වැනි නොයෙකුත් හේතු ඉදිරිපත් කෙරුණ ද තවමත් නිශ්චිත හේතුවක් හෝ පිළියමක් නොමැති මෙම ගැටලුව හමුවේ අසරණභාවයට පත්වන්නේ අහිංසක ජනතාවයි. ආශ්චර්යමත් සංවර්ධනයක් කරා රට දිනෙන් දින ඉදිරියට යා යුතුය. එය සැබෑවකි. මන්දයත් අප තවදුරටත් යටත් විජිතවාදයේ අතකොළු විය යුතු නැති බැවිනි. එහෙත් සෞඛ්‍ය සම්පන්න ජනතාවක් නොමැති තැන රටක සංවර්ධනය කා සඳහා ද යන්න මත භේදයට තුඩු දෙන්නකි. මේ පිළිබඳ ව වගකිය යුතු ඇතැම් බලධරයන් තම මඩිය තර කර ගැනීමේ අරමුණු ඇතිව මුනිවත රකින්නේ පහත් තැනින් ජලය බැස යාමට සැලසීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරමිනි. පුද්ගලයකුගේ ඖෂධ ලබාගැනීමේ මානුෂීය අයිතිය අහිමි කිරීමෙන් සිදුවන්නේ මනුෂ්‍යත්වය කල් ඉකුත් වී භාවිතයට නුසුදුසු තත්ත්වයට පත්වීමයි. මෙම තත්ත්වය මර්දනය කිරීම සඳහා පියවර ගෙන ඇතැයි පැවසුණ ද, දිවයිනේ පුවත්පත් වල මෙවැනි ශීර්ෂපාඨ නම් සුලබ දසුනකි.

"මාතලේ පවුල් 3000ක් මාරාන්තික අවදානමක"
-රිවිර, 2013 නොවැ. 10

"කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වකුගඩු රෝගීන් 2675 ක්"
-ලංකාදීප, 2014 මාර්තු 16

"කොළඹ මහ රෝහලේ බෙහෙත් ගන්න යුද්ධයක්"
-ලංකාදීප, 2014 මාර්තු 16

2012 මහ බැංකු වාර්තාවට අනුව 2011 වර්ෂයේදී රු.බි. 89.2 බවට පත්ව තිබූ රජයේ මුළු සෞඛ්‍ය වියදම 2012 වර්ෂයේදී රු.බි. 99.0 බවට පත්ව තිබේ. එනමුත් මේ වනතුරුත් ජාතික පුවත්පත් බොහොමයක මුලසුන හොබවන ඉහත සඳහන් ආකාරයේ ශීර්ෂපාඨ, තවමත් නොවිසඳුණු ප්‍රබල සෞඛ්‍ය ගැටලු පිළිබඳ ඉඟි පළ කරන්නේ ගින්නක් නැතිව දුමක් නොනඟිනා බව මතක් කර දෙමිනි.

සෞඛ්‍යය පිළිබඳව මෙන්ම ජනතාවගේ පෝෂණ අවශ්‍යතාවන් කෙරෙහි සොයා බැලීම ද රජු තම ප්‍රධාන කාර්යයක් ලෙස සැලකුවේය. ජලාශ්‍රිත ශිෂ්ටාචාර පාලන සංවිධානයේ රජු ට පැවැරුණ ප්‍රධාන ත්‍රිවිධ කාර්යයන්ගෙන් එකක් ලෙස"ගොවිතැන් කටයුතු සඳහා වාරිමාර්ග පහසුකම් සලසා දීම" හැඳින්විණි. රට බත බුලතින් පෝෂණය කිරීම සඳහා රජදරුවෝ නොමසුරු දායකත්වයක් සැපයූහ.

එසේ පවසමින් රටක් සමෘද්ධිමත් කිරීමේ දී ජලයෙහි ඇති වටිනාකම පහදා දුන් මහා පරාක්‍රමබාහු නිරිඳුන්ගේ වාරි කර්මාන්තය ගැන මහාවංසය මෙසේ ගෙනහැර දක්වයි.

"අතිශයින් සාධු මනුෂ්‍ය වූ ඒ රජ තෙම සත්ත්වයන්ගේ දුර්භික්ෂ දුක්ඛය නසන පිණිස ඒ ඒ තන්හි නොයෙක් වැව් ද මාතිකාවන් ද කරවූයේය."

-මහාවංසයේ LXXIX පරිච්ඡේදය

මෙතුමා විසින් කරවන ලද විශිෂ්ටතම වැව වශයෙන් පිළිගනු ලබන්නේ දුම්බුටුළු වැව, තෝපා වැව හා එරබදු වැව ඒකාබද්ධ කොට තැනූ පරාක්‍රම සමුද්‍රයයි. චූලවංසයට අනුව මහා පරාක්‍රමබාහු රජු තම රාජ්‍ය කාලය ඇතුළත වැව් 165ක්ද ඇළවල් 3910ක්ද මහවැව් 163ක්ද කළ බව හෙළිවේ. මේ අනුව පළමුවන පරාක්‍රමබාහු රජතුමා වාරිමාර්ග ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම රජෙකු ලෙස අගය කළ හැකි ය.

"මේ තණබිම් වලට ඉහළින් ඇතින් හිරු එළියේ කැඩපතක් මෙන් දිලිසෙන මහා ජලාශයක් ඔබ නෙත ගැටෙනු ඇත. එය මහාවංසයේ මිණිහෙර නමින් සඳහන් වන මින්නේරිය වැවයි. සැබවින් ම ඒ වැව් බැම්ම නිර්මාණය කිරීමේදී මිනිසාට වඩා වැඩි කාර්යභාරයක් ස්වභාවධර්මයා විසින් කර ඇති බව පෙනී යයි. මිනිසා විසින් සාදන ලද බැම්ම විසින් කැර ඇත්තේ හුදෙක් කඳු දෙකක් අතර ඇති කපොල්ලක් වසා දැමීම පමණකි."

බ්‍රෝහියර් දුටු ලංකාව නම් කෘතියෙහි මහසෙන් නිරිඳාණන් විසින් ඉදිකරන ලද මින්නේරි වැව පිළිබඳ එසේ විස්තර කෙරේ. මහසෙන් රජතුමා කරන ලද වැව් පිළිබඳ මහාවංසයේ සඳහන් වන්නේ "ඒ රජතෙමේ රට සුභික්ෂය පිණිස සොළොස් වැවක් කරවීයැ" යනුවෙනි. මෙම වැව් කර්මාන්තය නිසා සිදු වූ පොදු ජන සේවාව හේතුවෙන් මහසෙන් රජු හට "මින්නේරි දෙවියෝ" යනුවෙන් දේවත්වයක් ද ආරෝපණය කරන ලදී. මේ සා විශාල වාරි කර්මාන්තයක් ඉදිකිරීමෙන් රජ දරුවන් අපේක්ෂා කළේ ඔවුන්ගේ නාමයන් අමරණීය කරවීම නොව තම උපන් රටට වසන්තය උදා කර දීම ය.

තම රට වැසියන්ගේ පෝෂණ අවශ්‍යතාව දෙස මනුෂ්‍යත්වයේ නෙත් යොමු කිරීමට ය. එබැවින් ඒ උත්තරීතර සේවාව සඳහා නිසි ගරු බුහුමන ජන හදවත්හි ජනිත වුණි. මේ රජදරුවන්ගේ, රට ස්වයංපෝෂිත කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් සිරිලක් දෙරණ පෙරදිග ධාන්‍යාගාරය නම් විරුදාවලියෙන් ද පිදුම් ලැබුවේය.

කෘෂිකර්මාන්තය මෙන්ම මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ද එකල ජන සමාජයේ දැකගත හැකි විය.

"ලංකාවේ මසුන් නැති කුඩා දිය අගලක් හෝ සොයා ගැනීම දුෂ්කර ය. මහවැලි ගඟ මසුන්ගෙන් ගහන වුණේය...... ග්‍රීෂ්ම සමයෙහි ගංගා වල ජලය අඩු වූ විට අතු වලින් හෝ බට පතුරු වලින් සෑදූ උපකරණයක් ගඟ හරහා දමා දිය පහර සමඟ එන මසුන් එහිම ඇති කොටුවකට රිංගා ගනිති."

-එදා හෙළදිව - රොබට් නොක්ස්

රජුන්ගේ පරිපාලනය යටතේ ස්වයංපෝෂිත වූ ගම්බිම් හා කෘෂිකර්මය මත පදනම් වූ සමාජ සංස්ථාව පිළිබඳ "මධ්‍යකාලීන සිංහල කලා" කෘතිය මෙසේ සාක්ෂි සපයයි.

"ගම් බොහෝ සෙයින් වෙන් වෙන් ව පිහිටියේ ය, අවශ්‍ය දෙයින් ආඪ්‍ය විය. ලුණු හැර බාහිර ලෝකයෙන් බලාපොරොත්තු වූ අන් දෙයක් නැත.

"සිංහල සමාජය සාකල්‍යයෙන් වී මත ගොඩනැගුණු මනුෂ්‍ය සංහතියක් බව මොනවට පැහැදිලිය.

රජු ඇතුළත් හැම මිනිසා කෙරෙහිම ගොවිතැන පිළිබඳ ලොකු ඇල්මක් හා ඕනෑකමක් පැවතිණි. හැම මිනිසා ම පාහේ සියතින්ම ගොවිතැන් කළේය."

එවන් වූ අභිමානනීය කෘෂි ආර්ථිකයක සාඩම්බර උරුමකරුවන් වන අපි අද 21 වන සියවසට එළඹ සිටින්නෙමු. රටේ ආර්ථිකයට ප්‍රධාන දායකත්වයක් සපයනා කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා වත්මන් ආණ්ඩුව ගෙන ඇති පියවර බොහෝ දුරට අගය කළ හැකිය. "අපි වවමු - රට නගමු" සංකල්පය ද මහජනතාවගේ හදවත් හි නිල්ල නඟන හෙට දිනක් පිළිබඳ සිහිනය අවදි කිරීමට ප්‍රධාන දායකත්වයක් ලබා දුන්නේය. "දිවි නැගුම" වැඩ පිළිවෙළද ගැමි ජනතාවගේ ජීවිතවලට නව අරුණැල්ලක් එක් කළේය. නව කෘෂි උපකරණ, කෙටි කාලීන බෝග සහ පොහොර වර්ග ගොවි ජනතාවට හඳුන්වා දීමේ ක්‍රියාවලිය කෘෂිකර්මාන්තයේ සැලකිය හැකි තරමේ යම් දියුණුවක් ඇති කළේය. කටින් බතල කොළ සිටුවීම ඉතා ලාභදායී ලෙස සිදුවන යුගයක, ගොවි ජනතාවට එවන් වූ අනුග්‍රහයක් හෝ ලබා දීම සතුටට කරුණකි.

2013 නොවැම්බර් 03 වන ඉරිදා ලංකාදීප පුවත්පතේ "මේ අයවැය යෝජනා හරිද" යන ශීර්ෂපාඨය යටතේ පළවූ ලිපියකට අනුව 2014 වර්ෂය සඳහා වන අයවැය යෝජනාවන් හි, කෘෂිකර්මය වෙනුවෙන් රු. බිලියන 43 ක මුදලක් ආණ්ඩුව විසින් වෙන්කරනු ලැබ තිබේ. එවන් වූ මුදලක් කෘෂිකර්මාන්තය වෙනුවෙන් වෙන් කිරීමේ ක්‍රියාවලිය මඟින් ගොවි රජුන් සුරකින්නට තැත් කරන්නන් විසින් ම "යළි පුබුදමු ශ්‍රී ලංකා" වැඩසටහන යටතේ ගොවි ජනතාවට කණකොකා හඬවන බීජ පණතක් කරළියට ගෙන ඒම පිළිබඳව වග කිවයුත්තෝ මුකවාඩම් ලා සිටිති.

ලංකාදීප පුවත්පතෙහිම 2013 දෙසැ. 8 ඉරිදා දින "ගොවියාගේ ගෙල සිර කරනා බීජ පණත" නැමති ශීර්ෂපාඨය රැගත් ලිපියක් ද ඒ බව තහවුරු කරයි. රොබට් නොක්ස්ගේ "එදා හෙළදිව" කෘතියෙහි තුරු - පල - තුරු පරිච්ඡේදය යටතේ ඇති සටහනක් මෙසේය.

"මොවුහු ආහාර සඳහා ගන්නා පලතුරු පමණක් රෝපණය කරති. සෙසු ඒවා ඉබේ වැවෙන්නට හරිති. පැසුණු ගෙඩිවල ඇට පතිත වීමෙන් ඉබේම පැළහට ගනී."

මෙතරම් සාර භූමියකට අප උරුමකම් කියන විට ද බීජ ආනයනය කිරීම මඟින් ගොවියාගේ ශිෂ්ටාචාරගත උරුමය වූ බීජ නිපදවීමේ, සුරැකීමේ සහ හුවමාරු කිරීමේ අයිතිය පිළිබඳව බලධරයන් අනුගමනය කරන්නේ පල නොකියා පලා බෙදීමේ ප්‍රතිපත්තියකි. කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා විකල්ප බීජ ආනයනය සිදු වන්නේ නම් එහි කිසිදු වරදක් නැත. එහෙත් මෙම බීජ පණත හේතුවෙන් ගොවියන්ට සිදුවී ඇත්තේ කබලෙන් ලිපට වැටීමටය. හොඳ අස්වැන්නක් සඳහා අවශ්‍ය කෘෂි රසායන හා පළිබෝධනාශක නිසැකව ම මිලදී ගැනීමට ඔවුන්ට සිදුවේ. මන්දයත් ඔවුන් ට ඇතා ලබාගත් පසු හෙණ්ඩුව නොගෙන සිටීමට නොහැකි බැවිනි. ඒ සමඟ ම ඔවුන් ට ජීවිත කාලයට ම අමතර දීමනාවක් ලෙස වකුගඩු රෝග ද හිමි වේ. තමන් උපන් භූමියේ පස මත බීජයක් රෝපණය කර හෙට දිනයේ සරු අස්වැන්නක් ලබා ගැනීමේ මනුෂ්‍යත්වයේ සිහින සොරකම් කිරීමට බලය හිමි කිසිවෙක් නැත. මෙවන් වූ පණතක් ක්‍රියාවට නැංවීමෙන් ගොවි රජුන්ගෙන් උදුරා ගනු ලබන්නේ මනුෂ්‍යත්වය නිපදවීමේ, සුරැකීමේ සහ හුවමාරු කරගැනීමේ අයිතිය යි.

අතීත රජදවස, යන්ත්‍රෝපකරණ තාක්ෂණය වර්තමානය ට සාපේක්ෂව ඉතා අඩු තත්ත්වයක පවතින විට ද, රජදරුවෝ සමුදුරු පරයන මහ වැව් ඉදිකළෝ ය. එබැවින් වත්මන් බලධරයන්ගේ වගකීම විය යුත්තේ එම අගනා වාරි කර්මාන්තය මතු පරපුර සඳහා ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය විධි විධාන සූදානම් කිරීම ය. මන්දයත් ජනතාවගේ කුසගින්න නිවීමේ ත්, රට සහලින් ස්වයංපෝෂිත කිරීමේත් මානුෂීය අවශ්‍යතාවයේ දී වාරි කර්මාන්තය ආරක්ෂා කර ගැනීම ප්‍රධාන

ස්ථානයක් ගන්නා බැවිනි. වත්මන් ආණ්ඩුව මේ සඳහා යම් ප්‍රතිපාදන ගෙන තිබුණ ද ඒවා කෙතරම් දුරට ප්‍රමාණවත් දැයි යන්න විවාදයට කරුණකි. මේ ඊට උදාහරණ සපයනා පුවත්පත් වාර්තා දෙකකි.

"තිත්තවැල්ලේ වැව් හයක් වසර තිහකින් පිළිසකර කර නෑ."

(2013 ඔක්. 06)

"වසර හැටකින් පිළිසකර නොවූ පොල්කඩුවාවත්ත මූකළාන වැව"

(2013 දෙසැ. 29)

කෘෂිකර්මාන්තය ඉහළ නැංවීම සඳහා බීජ ආනයනය කිරීමට යොමු වන්නේ යැයි පැවසුණ ද ශ්‍රී ලාංකීය උරුමය ආරක්ෂා කරගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක නොකිරීම තවත්, වත්තම බද්දට දී ඇස්සට දත නියවීමක් බවට පත්වනු ඇත. එසේ වීමෙන් හුදෙක් වාරිකර්මාන්තය පමණක් නොව මනුෂ්‍යත්වය ද යළි පිළිසකර කළ නොහැකි ලෙස අභාවයට පත්වනු නිසැකය.

සෞඛ්‍යය, පෝෂණය හා කෘෂිකර්මාන්තය මෙන්ම අධ්‍යාපනයද එකල පාලන සංවිධානය තුළ රජුන් විසින් විශාල අනුග්‍රහයක් දැක්වූ අංශයකි.

"අධ්‍යාපනය යනු කරුණු ඉගෙන ගැනීම නොවේ. ඔබේ මනස සිතීමට පුහුණු කිරීමයි."

-ඇල්බට් අයින්ස්ටයින්

ඇල්බට් අයින්ස්ටයින් නම් විද්‍යාඥයා එසේ පවසද්දී අවුරුදු 2500ක ඈත ඉතිහාසයේ ද කරුණු මත පමණක් පදනම් නොවී මිනිසා සිතන්නට පුරුදු කළ අධ්‍යාපන ක්‍රමයක් අපට උරුමව තිබිණි. මනුෂ්‍යත්වය ඔප්නැංවූ අධ්‍යාපන ක්‍රමයේ උන්නතිය වෙනුවෙන් රජදරුවෝ ඉමහත් සේවාවක් ඉටු කළහ.

"තුන්වැනි විජයබාහු (ක්‍රි.ව. 1236) රජතුමා ගමක් පාසා පාසල බැගින් පිහිටුවා ඒ පාඨශාලා පරිපාලනයෙහි යෙදුණු භික්ෂූන්ට තමන්ම දිවෙල් දෙන හෙයින් සිසුන්ගෙන් කිසිත් නොගන්නා ලෙස නියම කළ බව රාජරත්නාකාරයෙහි සඳහන් වේ."

-මධ්‍යකාලීන සිංහල කලා

ගමක් ගමක් පාසා පාඨශාලා ආරම්භ කරමින් රටවැසියන්ගේ ඥානය පුබුදුවාලීම සඳහා තුන්වන විජයබාහු රජතුමා දැරූ ප්‍රයත්නය කෙතරම් අගනේද? එතුමා පමණක් නොව එතුමාගේ පුත් කුමරාණන් වූ දෙවන පරාක්‍රමබාහු රජතමා ද සාහිත්‍යය වෙනුවෙන් සුවිශාල මෙහෙවරක් කරන ලද නිරිදාණ කෙනෙකි. එතුමාගේ ඒ මෙහෙවර උදෙසා කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන විරුද නාමයෙන් ද පිදුම් ලැබුවේය. කෝට්ටේ රාජධානිය සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස කිරුළු දරා සිටියි. කෝට්ටේ යුගයේදී තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, වීදාගම මෛත්‍රිය හිමි, කැරගල වනරතන හිමි සහ හයවන පරාක්‍රමබාහු රජතුමා වැනි උගත්තු බිහි වූහ. පරෙවි සන්දේශය, ගිරා සන්දේශය, සැළලිහිණි සන්දේශය, කෝකිල සන්දේශය, කාව්‍යශේඛරය, බුදුගුණාලංකාරය ආදිය කෝට්ටේ යුගයේ ලියැවුණු ප්‍රකට ග්‍රන්ථ වේ.

කෝට්ටේ යුගයේ රජ පැමිණි හයවන පරාක්‍රමබාහු රජුගේ අධ්‍යාපනික හා ශාස්ත්‍රීය සේවාව පිළිබඳ, ඉතිහාසය මෙසේ සාධක සපයයි.

"කෝට්ටේ රාජධානිය කොට රාජානුශාසනා කළ සවැනි පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1410-1462) රජතුමා පඬිවරයෙක් හා ග්‍රන්ථ කතෘවරයෙක් වූයේ උගතුන්ට බොහෝ සංග්‍රහ කළේය. හෙතෙම ශ්‍රේෂ්ඨ විද්‍යා පීඨ ද්වයක් වූ තොටගමුව හා කැරගල පිරිවෙන් කරවා ඒවායේ චිරස්ථිතිය සඳහා ධනධාන්‍යාදි පරිත්‍යාග කළේය."

පී. අරුණාචලම්, "ලංකා ඉතිහාසය පිළිබඳ ලුහුඬු සටහන්"
- Sketches of Ceylon History

හයවන පරාක්‍රමබාහු රජ තම මෑණියන් සිහිවීම පිණිස පැපිලියානේ සුනේත්‍රා දේවී පිරිවෙන කරවීය. වීදාගම ශ්‍රී ඝනානන්ද පිරිවෙන, කැරගල පද්මාවතී පිරිවෙන, දෙවිනුවර ඉරුගල් කුලතිලක පිරිවෙන ආදී අධ්‍යාපන මධ්‍යස්ථානයන්හි දියුණුවට රජවරුන්ගේ නොමඳ අනුග්‍රහය ලැබීම හේතුවෙන් පිරිවෙන් අධ්‍යාපනය ද දියුණු විය.

නිදහස් අධ්‍යාපන පණත ගෙන ආ අවස්ථාවේ, "අපට පොල් ගහකට නග්ගන්න මිනිහෙක් නැති වේවි" යැයි පවසමින් ඇතැම්හු තම විරෝධය පළ කළහ. එහෙත් අනාගත පරම්පරාවන්ගේ වාසනාවකට මෙන් නිදහස් අධ්‍යාපන පණත සම්මත විය. නිදහස් අධ්‍යාපනයේ පියා වූ සී.ඩබ්.ඩබ්. කන්නන්ගර ශ්‍රීමතාණන්ගේ නාමය එදා මෙදා තුර සිරිලක් අඹරේ නොනැසී දිදුලන්නේ එබැවිනි.

දිවයිනේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් ආණ්ඩුව අනුගමනය කරනා ඇතැම් ක්‍රියාමාර්ග සැබවින් ම ප්‍රශංසනීය යි. සංවර්ධනය වෙමින් පවතින රටක් වී තිබියදීත් නොමිලේ අධ්‍යාපනය ලබා දෙමින් පෙළපොත් හා නිල ඇඳුම් ලබාදීමේ පහසුකම් සැලසීම පිළිබඳව අප කෘතවේදී නොවන්නේ නම් එය ගඟෙන් වතුර බී මුහුදට ආ වැඩීමකි. දිවයිනෙහි විසිරී ඇති පාසල් දහසක් සංවර්ධනය කිරීමේ වැඩපිළිවෙළ ද අගය කළ හැකි ප්‍රයත්නයකි. දූයේ දරුවන්ගේ නැණස පෑදීමේ පුණ්‍යකර්මයට බලධාරීන්ගේ අවධානය යොමු වූ අවස්ථාවක් ලෙස "මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර" ලබාදීම ගෙන හැර දැක්විය හැකි ය.

2012 වර්ෂය සඳහා වන මහබැංකු වාර්තාවේ 93 වන පිටුවෙහි සඳහන් 3.9 සංඛ්‍යා සටහන අනුව 2011 වර්ෂයේ අධ්‍යාපනය සඳහා රජයේ මුළු වියදම රු. බිලියන 121.4 සහ 2012 වර්ෂය සඳහා 136.2 ලෙස සටහන් වී තිබේ. එහෙත් දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස ගත් කල එය වර්ධනයක් නොව ක්‍රමයෙන් පහළ බැසීමකි. මහ බැංකු වාර්තාවේම 3.5 රූපසටහන ඊට සාක්ෂ්‍ය සපයයි. මේ කප්පාදු වෙමින් පවතින්නේ හුදෙක් අධ්‍යාපනය සඳහා වැය කරනා මුදල පමණක් නොවෙයි. මනුෂ්‍යත්වයද මානුෂීය අයිතීන්ද එසේ කප්පාදුවට ලක්වෙයි. මනුෂ්‍යත්වය ප්‍රථමයෙන්ම බිහිවන්නේ මිනිස් සිතුවිලි තුළය. සිතන්නට පුරුදු කරනා අධ්‍යාපනය කප්පාදුවට ලක්වන කල මනුෂ්‍යත්වය පිළිබඳ කවර නම් කතා ද?

"පාසලක් ආරම්භ කිරීම යනු සිරගෙයක් වසා දැමීමකි."
-වික්ටර් හියුගෝ

දිනෙන් දින උග්‍ර වන ග්‍රාමීය පාසල් වසා දැමීමේ අර්බුදය දරුවන් මෙන් ම දෙමාපියන් ද පීඩාවට පත් රන්නකි. ජීවන අරගලය සමඟ පොරබදනා අහිංසක ගැමි දෙමාපියන්ට තම දරුවන්ගේ අධ්‍යාපනය සඳහා ඇති පාසල වසා දැමීම යනු ගහෙන් වැටුණු මිනිසාට ගොනා ඇනීමකි. මේ අහිංසකයන්ගේ යටහත් පහත් බවින් ප්‍රයෝජන ගන්නා වගකිවයුත්තෝ තැළෙන යකඩය දුටු කල උඩ පැන පැන තළමින්, ගැමි දරුවන්ටද ජනප්‍රිය පාසල් කරා සංක්‍රමණය විය හැකි බව

පවසා සිටිති. දහවල මහපොළොව සමඟ ද රාත්‍රියේ වන අලි සමඟ ද පොරබදනා මොවුන් ට නගරයේ පාසල්වලට ඇතුළත් විය හැකි තරමේ ශක්තියක් තිබේද යන්න තවමත් නොවිසඳුනු ගැටලුවකි.

"පැලැන වජිරඥාන විදුහලේ ප්‍රාථමික අංශය ඉවත් කරනවාට විරෝධයක්"

-ලක්බිම, 2012 ජනවාරි 27

"වසා දැමූ පුදුක්කුලම විදුහලේ විනාශයට යන ගොඩනැඟිලි"

-ලංකාදීප වයඹ, 2013 ඔක්.6

පාසලක් ආරම්භ කිරීමෙන් සිරකඳවුරක් වසා දැමුණද පාසලක් වසා දැමීමෙන් සිරකඳවුරු එකක් නොව දහයක් විවෘත වේ. ලංකා ඉතිහාසයේ ප්‍රබල අමිහිරි මතකයන් ඉතිරි කළ '71 කැරැල්ල' මෙහි ලා සිහිපත් කිරීම වැදගත් ය. මෙහිදී ප්‍රධාන වශයෙන් ම විප්ලවය සඳහා පෙරට පැමිණියේ පක්ෂ පාට භේදයට වඩා, වරප්‍රසාද අහිමි වූ ගැමි තරුණයන් ය. හුදෙක් පෞද්ගලික ලාභ ප්‍රයෝජන ලබාගැනීමේ පටු අරමුණින් මෙම '71 කැරැල්ල' භාවිත කිරීමට සැරසුණද, සත්‍ය කෙසේ නම් වසන් කරන්නද? තමන්ට අහිමි වූ මානුෂීය වරප්‍රසාදයන් නිසා හටගත් ආවේගය කෙතරම් ද කිවහොත් දිවි දෙවැනි කොට ඔවුහු විප්ලවයට එක්වූහ. කැරැල්ලක් යනු ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා සුදුසු මාර්ගයක් නොවන බව සැබෑවකි. එහෙත් වගකිවයුත්තන් මෙම පීඩිත පන්තිය පිළිබඳ නිසි අවධානය යොමු කළේ නම් මෙවන් තත්ත්වයක් ඇතිවීම වළක්වා ගත හැකිව තිබිණි. වර්තමානයේ ක්‍රියාත්මක වන්නා වූ මෙම ක්‍රමය වෙනස් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග නොගතහොත් අනාගතයේ දී වඩාත් බිහිසුණු විප්ලවයක් ඇතිවීමේ අවදානමක් ඇත. එබැවින් කළයුතු වන්නේ අඩු පහසුකම් සහිත ග්‍රාමීය පාසල් වසා දමමින් හිසරදයට කොට්ට මාරු කිරීම නොව, ග්‍රාමීය පාසල් සංවර්ධනය කිරීමයි.

සංවර්ධන ක්‍රියාවලියත් සමඟ ප්‍රධාන වශයෙන් ම බලපෑමක් එල්ල වන අංශයක් ලෙස පරිසරය හැඳින්විය හැකි ය. මනුෂ්‍යත්වය මනුෂ්‍යයනට පසක් කර දෙන පරිසරය ආරක්ෂා කර ගැනීම වර්තමානයේ මානුෂීය ඉල්ලීම් අතර ප්‍රමුඛස්ථානයක් ගනියි. මුළු ලොවම පරිසරය සුරැකීම සඳහා බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කරයි. මිහිකත සමුළුව ඒ අතරින් ප්‍රධානය. වර්ෂ 1992 දී රියෝ ද ජනයිරෝ නගරයේ පැවති එක්සත් ජාතීන්ගේ පරිසරය සහ සංවර්ධනය පිළිබඳ සම්මේලනය හෙවත් මිහිකත සමුළුවේ දී අවධානයට ලක් වූ එක් කරුණක් මෙසේය.

"පාරිසරික සමතුලිත බවින් යුත් සංවර්ධනයක් කේන්ද්‍රගත වන්නේ මනුෂ්‍යයා වටා ය. පරිසරය හා සබැඳුණු සෞඛ්‍යසම්පන්න සහ ඵලදායී ජීවිතයක් ගත කිරීම සඳහා මනුෂ්‍යයා හට අයිතියක් ලබා දී ඇත."

-පරිසර සංවර්ධනය පිළිබඳ රියෝ සම්මුතියේ පළමුවන ප්‍රතිපත්තිය

වඩාත් පරිපූර්ණ හා ඵලදායී සංවර්ධනයක් කරා ගමන් කිරීමට නම් අප කළ යුත්තේ පරිසරයට එරෙහි වීම නොව පරිසරය සමග ජීවත් වීමයි. ජාත්‍යන්තර වශයෙන් සැමරෙන පරිසර දිනය මෙන් ම අප රටේ භික්ෂූන් වහන්සේලා විසින් වෘක්ෂයන් මහණ කිරීම සඳහා කටයුතු කිරීමද වටිනා පරිසරය මතු පරපුර සඳහා සුරක්ෂිත කර දීමේ අගනා පියවර වේ. සෑම මොහොතකම නිහඬ අමරණීය සේවයක යෙදෙන පරිසරය තමාට හානි කරන්නන් දෙස ඉතාමත් උපේක්ෂා සහගත ලෙස බලා සිටියි. තමා නසන්නට එන මිනිසා හට පරිසරය පහර දෙන්නේවත් පරුෂ වචනයෙන් බැණ වදින්නේවත් නැත. ඩාවින්ගේ පරිණාමවාදය ඉදිරිපත් වීමටත් පෙර මිනිසාත් පරිසරයත් අතර ඇති මනුෂ්‍යත්වයේ බැඳීම පිළිබඳව රතු ඉන්දියානු නායක සියැටල් මනාව අවබෝධ කරගෙන සිටියේ ය.

ක්‍රි.ව. 1845 දී ඇමරිකානු ජනාධිපතිවරයා වූ සුදු ජාතික ෆ්‍රැන්ක්ලින් පියර්ස් රතු ජාතීන්ගේ ඉඩම්

මිලදී ගැනීමට අපේක්ෂා කරන බව පවසා ඔහුගේ සුහද බව පළ කරමින් රතු ඉන්දියානුවන් වෙත ලිපියක් යැවීය. ඊට පිළිතුරු ලෙසරතු ඉන්දියානු නායක සියැටල් යැවූ ලිපියෙහි මෙසේ සඳහන් වේ.

"සුදු ජාතිකයෝ අහසේ තරු මත පා තබන්නට යන විට ඔවුන්ගේ උපන් බිම් අමතක කර දමති. එහෙත් අපගේ මළගිය ඇත්තෝ කිසි විටක මේ මහ පොළොව අමතක නොකරති. ඒ රතු ඉන්දියානුවන්ගේ සදාදර මාතෘත්වය මහ පොළොව වන බැවිනි."

දිනෙන් දින සංවර්ධනය වන මිනිසා ක්‍රම ක්‍රමයෙන් පරිසරයෙන් ඈත් වී යාම පිළිබඳව සියැටල් ඉතාමත් අපූර්ව ලෙස විස්තර කරයි. මාතෘ දාරක සෙනෙහසින් යුතු ව මහ පොළොව පිළිබඳව සිතීමට තරම් රතු ඉන්දියානුවන් ට පරිසරය හා තිබූ ආත්මීය බැඳීම කෙතරම් පුදුම සහගතද?

"අපි පෘථිවියේ කොටසකි. පෘථිවිය අපේ කොටසකි. සුවඳැති මල් අපගේ සොයුරියෝ වෙති. මුව පොව්වෝ, රාජාලියෝ හා අශ්වයෝ අපගේ සොහොයුරෝ වෙති. ගිරි මුදුන් වල සිට තණබිම් වනාන්තර අතරින් ගලා බස්නා දිය දහරා ද අශ්වයාගේ සහ මිනිස් සිරුරේ උණුසුම ද යන මේ හැම දේ එකම පවුලක සාමාජිකයෝය."

මුළු මහත් පරිසරය ම අපගේ සොයුරු සොයුරියන් නම් අප එරෙහි වී ඇත්තේ අපගේ ම පවුලට ය. අපේම ලේවලටය. අපට ආදරය කරනා, අප ආරක්ෂා කරනා පවුලට එරෙහිව ඔවුනට වින කටිමින් අත්කරගන්නා සංවර්ධනය කිසිසේත්ම පරිපූර්ණ සංවර්ධනයක් නොවන්නේය. පරිසරය විනාශ මුඛයට ඇද දමමින් සංවර්ධනය සහ මානුෂීය අයිතිවාසිකම් සුරැකේ යැයි අපේක්ෂා කිරීම තවත් එක් උඳු වපුරා මුං බලාපොරොත්තු වීමක් පමණි.

"මිහිකත ඇති ජීව ජාලය මිනිසා විසින් ගෙතුවක් නොවේ. මිනිසා යනු එහි එක් හුයක් පමණි. මේ ජාලයට මිනිසා විසින් යම් හානියක් පමුණු වන ලද ද ඔහු එයින් තමාට ම හානිකර ගනී. ඒ බව මතක තබා ගන්න."

-සියැටල්ගේ ලිපියෙන්

එබැවින් පරිසරය රැක ගත යුතුය. එය අපගේ යුතුකමක් සේ ම වගකීමකි. එහෙත් පරිසරය සුරැකිය යුතු බැවින් ලෙඩා මළත් බඩ සුද්දයි න්‍යාය අනුගමනය කරමින් රට සංවර්ධනය නොකර සිටීම හුදෙක් අනුවණකමකි. කළ යුතු වන්නේ පරිසරය සුරකිමින් පූර්ණ සංවර්ධනයක් කරා යොමු වීමය. පරිසරය ද සුරකිමින් සංවර්ධනය කරා පියමං කරන ලද එකල කොළඹ නගරය පිළිබඳව කොළොම්පුර පුරාවෘත්තයෙහි මෙසේ සඳහන් වේ.

1757 වන විට නගරය විශාල සංවර්ධනයක් අත්පත් කරගෙන තිබූ බව ඒ කාලයේ මෙහි පැමිණි සර්වින් අයිවස් නම් බ්‍රිතාන්‍ය නාවික නිලධාරියාගේ විස්තරයෙන් දැනගත හැකියඃ

"නගරයේ වීථි ඉතා පුළුල්ය. දෙපස අලංකාර වෘක්ෂවලින් සුසැදී ඇත. වීථි දෙපස ඇති ගෘහස්ථ හා මහා වීථිය අතර පළල් පදික මාවතකි. එය මනාව සකස් කර ඇත. වෘක්ෂ අතර ඇති නීලමය පොරෝනය සිත් ඇද ගන්නා සුලුය. සියලු දේම ඉතා චමත්කාර දර්ශනයක් මවයි."

එහෙත් ක්‍රමයෙන් කොළඹ නගරයේ වූ ස්වාභාවික පරිසරය විනාශයට පත් විය. කාලයක් මුළුල්ලේ හමස් පෙට්ටියට දමා තිබූ යෝජනා ක්‍රියාත්මක කිරීමෙන්, කොළඹ නගරයේ හරිත සංවර්ධනය වෙනුවෙන් වත්මන් ආණ්ඩුවෙන් ගෙන ඇති පියවර පිළිබඳව නම් අගය කළ යුතුය. අවාසනාවකට මෙන් රට අභ්‍යන්තරයේ ම සංවර්ධනය හා පරිසර සංරක්ෂණයේ ගැටීම

හේතුවෙන් මානුෂික අයිතීන් උල්ලංඝනය වන අවස්ථා දැකිය හැකි ය.

මානුෂීය අවශ්‍යතාවයන් අතර පිරිසිදු පානීය ජලය යනු ප්‍රධාන සාධකයකි. සංවර්ධනය හේතුවෙන් පානීය ජලය ලබාගැනීමේ මානුෂීය අයිතිවාසිකම කඩ වේ නම් එතැන ඇත්තේ බලවත් ගැටලුවකි. මෑත කාලීනව රතුපස්වල සහ තුන්තානේ යන ප්‍රදේශවල ඇති වූ ජල ගැටලුව ජීවිත බිලිගන්නා තරමේ මහා අර්බුදයක් බවට පත් විය. අවසන එය ජලයෙන් හට ගත් ගින්නක් ම වුණි. සංවර්ධනය වන්නාවූ රටක කර්මාන්තශාලා ඉදි විය යුතුය. රටේ දියුණුව යනු ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරලීමය. එහෙත් ජනතාවගේ මානුෂීය අයිතීන් ඔවුන්ගෙන් උදුරා ගැනීම හමුවේ සිදුවන සංවර්ධනය කිසි විටකත් ස්ථිරසාර නොවන්නේය.

රටෙහි ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සියල්ල පලිප්පු දමමින් අගය කළ නොහැකි වුවද ඉන් සමහරක් බොහෝදුරට රටෙහි සංවර්ධනය ට දායක වී තිබේ. අධිවේගී මාර්ග පද්ධතිය ඒ සඳහා නිදසුනකි. උතුර, දකුණ යා කරමින් පිවිසුම් දොරටුවෙන් ඇතුළු වූ ආශ්චර්යය, විහිදුම් සේල ඔස්සේ රට පුරා නිදහසේ ඉගිළ යයි. දින, පැය බවට පත් වෙමින් ද පැය, විනාඩි බවට පත් වෙමින් ද රටේ ප්‍රවාහන සේවය පුනරුදයට ලක් වෙමින් පවතී. සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් එය අප ලද ජයග්‍රහණයකි. සුදු අලි අතර කොට අදිනා අලි ද සිටින බව හඳුනාගෙන ඒ සේවය අගය කිරීම අපගේ යුතුකමකි. එසේම අගනුවර ආශ්‍රිතව ඉදිවීමට සැලසුම් කෙරෙනා මහල් නිවාස සංකීර්ණ ද ජනතා අවශ්‍යතාවන් දෙස මනුෂ්‍යත්වයේ නෙත් හෙළීමකි. මෙම නිවාස ව්‍යාපෘතීන්හි යම් යම් අක්‍රමිකතා තිබිය හැකි ය. එහෙත් අක්‍රමවත් පැල්පත් ජීවිතයට වඩා ඔවුන්ගේ හිසට ලැබෙනා මේ සෙවණ වඩාත් ඵලදායකය.

රටේ දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වන විටත් රටේ ම පෙදෙස්වල ජනතාව සාගින්නේ පෙළෙන්නේ නම් එතැන උද්ගතව ඇත්තේ මනුෂ්‍යත්වය හා සංවර්ධනය අතර පරස්පර විරෝධී බවකි. සංවර්ධනය හා මනුෂ්‍යත්වය අතර ඇති සම්බන්ධතා පිළිබඳ බෲට්ලැන්ඩ් කොමිසම් වාර්තාව මෙසේ විස්තර කරයි.

"වර්තමානයේ අවශ්‍යතා සපුරන සහ අනාගත පරම්පරාවන් ට ඔවුන්ගේ අවශ්‍යතා සපුරා ගැනීමේ හැකියාව අවදානමට ලක් නොකරන්න. සම්පත් ක්ෂය වීම වළක්වන අන්දමේ සංවර්ධනයක් ඇති කිරීමේ හැකියාව ඇත්තේ මනුෂ්‍යයන්ටය."

"අපේ පොදු අනාගතය" නම් වූ බෲට්ලැන්ඩ් කොමිසම් වාර්තාවේ පළමු කොටසෙනි, 1987

එබැවින් මනුෂ්‍යත්වය හා සංවර්ධනය යනු එක්ව බැඳී පවතින්නකි. මනුෂ්‍යත්වය ඉවත දැමීමෙන් ආදර්ශමත් ආණ්ඩුවක් හෝ සමෘද්ධිමත් රටක් ගොඩනැගීමට අපට නොහැකිය.

අවසන, කොමියුනිස්ට් පක්ෂ නායක මාඕ සේ තුං විසින් 1934 ජනවාරියේ දී ච්යාංසි පළාතේ ජුයිචිං නුවර දී පවත්වන ලද කම්කරුවන්ගේ හා ගොවි නියෝජිතයන්ගේ දෙවන ජාතික සම්මේලනයේ දී කළ අවසාන කථාවේ කොටසක් මෙසේ සටහන් කිරීමට කැමැත්තෙමි.

"තවත් අවස්ථාවක, මිනිසුන් තුන් දෙනෙක් සයින් පෙළෙමින් සිටියහ, එහෙයින් නියම්ගම් ආණ්ඩුවත් අන්‍යෝන්‍ය - ආධාර සමිතියත් වහාම ඔවුන් ට හාල් දුන්නෝය. පසුගිය ග්‍රීෂ්ම ඍතුවේ දී ඇති වූ සාගතයේ දී, නියම්ගම් ආණ්ඩුව, බහු ජනයාට සහනය සලසනු පිණිස, ලී දෙසියයට වඩා ඈතින් පිහිටි කුංලුවේ කෝරලයෙන් හාල් ලබා ගත්තේය. එබඳු නියම්ගම් ආණ්ඩු ඇත්ත වශයෙන් ම ආදර්ශ ආණ්ඩු වෙති.

ඔවුන්ගේ එල ප්‍රයෝජනය උදෙසා මහත් ඕනෑකමින් සහ අවංක ලෙස වැඩ කළ යුත්තෙමු. නිෂ්පාදනය සහ එදිනෙදා ජීවිතය පිළිබඳ ඔවුන්ගේ සියලු ප්‍රශ්න ලුණු, හාල්, නිවාස, වස්ත්‍ර, දරු උපත් යනාදිය පිළිබඳ ප්‍රශ්න විසඳිය යුත්තෙමු. අප එසේ කරනවා නම් බහුජනයා නිසැකවම අපට අනුබල දෙනවා ඇත.

මනුෂ්‍යත්වය සුරකිමු. සුරකිමින් සංවර්ධනය කරමු. එවිට මනුෂ්‍යත්වය අප සුරකිනු ඇත. ආසියාවේ පමණක් නොව මුළු ලොවෙහි ම ආශ්චර්ය අපම, අප පමණක්ම වනු ඇත.

# විචාරය

රචනය එහි අන්තර්ගත කරුණු හා දැක්මවලින් එය මනා පර්යේෂණයකින් පසුව කරන ලද රචනයක් බව පෙන්නුම් කරයි. මෙම රචනයේ කැපී පෙනෙන ප්‍රශංසනීය ගුණාංගයක් වන්නේ එහි එන එක ද ප්‍රබල කරුණක් හෝ පාඨක සිත් තුළ කා වැද්දීමේ දී එය කාව්‍යමය ලේඛන ශෛලිය හා සිත් අලවන වර්ණනා මත රඳා පැවතීමට උත්සාහ නොකිරීම යි. සිසුවිය ඉතිහාසයෙන් කරුණු උපුටා දැක්වීමේ දී මූලාශ්‍ර සඳහන් කිරීමේත් පෞද්ගලික අදහස් ව්‍යාජ ලෙස ඓතිහාසික කරුණුවල ස්වරූපයෙන් ඉදිරිපත් නොකිරීමේත් ප්‍රශංසා කටයුතු ගුණය විදහා පා ඇත. සිසුවිය කරුණු හා තර්ක මෙන් භාෂාව ද මැනවින් හසුරුවා ගැනීමේ හැකියාවක් පෙන්වා ඇත.

සිසුවිය කැපී පෙනෙන ක්ෂේත්‍ර දෙකක් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති පිළිබඳ විචාරාත්මක අදහසක් ඉදිරිපත් කරයි. එනම් වර්තමාන කෘෂිකාර්මික ප්‍රතිපත්ති සමග ද බැඳී තිබෙන අධ්‍යාපන හා සෞඛ්‍ය අංශ ගැන යි. සංවර්ධන සංකල්පය පිළිබඳ සමාලෝචනයක් සූදානම් කිරීම සඳහා මෙම දැක්ම පදනම් කර ගැනීමේ දී සිසුවිය ඉපැරණි ශිෂ්ටාචාරයන්ගෙන් කිහිපයකට පමණක් සමතැන් ගත හැකි උරුමයක් වන අපගේ වාරිමාර්ග තාක්ෂණය පිළිබඳ ඉතිහාසය විමසුමට ලක් කරයි.

සිසුවිය ප්‍රතිපත්ති සම්පාදනය හරහා ආරක්ෂා කළ යුතු සම්පතක් ලෙස ජලයේ තිබෙන වැදගත්කම සැලකිල්ලට ගනිමින් සංවර්ධනය පිළිබඳ කාරණයට ප්‍රවිෂ්ට වීමේ වැදගත්කම පෙන්වා දෙයි. යටිතල පහසුකම් සංවර්ධනය ප්‍රයෝජනවත් විය හැක්කේ පිරිසුදු ජලය හා වාතය සහ පෝෂ්‍යදායී ආහාර මත රඳා පවතින නිරෝගී සමාජයක් සහතික කරන මූලික සාධක සංරක්ෂණය කෙරෙන්නේ නම් පමණක් බවට රචනය ඉතා ප්‍රබල විග්‍රහයක් ඉදිරිපත් කරයි. සැබවින් ම අනාගතයේ දී වාරිමාර්ග ඉංජිනේරු ඉතිහාසය පිළිබඳ පර්යේෂණාත්මක ශාස්ත්‍රීය වෘත්තියක ස්ථිරව නියැලීමේ හැකියාව සිසුවියට තිබෙන බව රචනයෙන් පෙනේ. මෙකී ඉතිහාසය දැනට වඩා පුළුල්ව ගවේෂණය කළ යුතු අධ්‍යයන ක්ෂේත්‍රයක් වන අතර මහාචාර්ය සී.ආර්. පානබොක්කේ වැනි කීර්තිධර විද්‍යාඥයන්ගේ මෑත ම පොතපත ශ්‍රී ලංකාවට විජය කුමරු පැමිණීමටත් පෙර සිට පැවත එන ඉපැරණි කුඩා වැව් පද්ධති යනු ස්වභාව ධර්මයට හිතැති යහපත් තාක්ෂණයක් ලෙස වර්ධනය කර ගැනුණා වූත් එවකට වී නොව කුරහන් වගාවෙන් සමන්විතව තිබූ අතිවිශාල කෘෂි පද්ධති සඳහා යොදා ගැනුණා වූත් වාරිමාර්ග තාක්ෂණයක් වූ සැටි පෙන්වා දී ඇත.

තාක්ෂණය යනු බටහිර ජයග්‍රහණයකැයි ද තාක්ෂණය යන වචනය සම්බන්ධ නිර්වචනය හා අදහස සකස් වන්නේ තනිකර ම යාන්ත්‍රීකරණය හා කාර්මිකවාදය පදනම් කර ගත් නූතන යන්ත්‍රණයෙනැයි ද සිතන බව පෙනෙන වර්තමාන පරම්පරාව 'තාක්ෂණය' යන වචනය හා සංකල්පය මත් මීට වඩා ගැඹුරින් අවබෝධ කර ගත යුතු ය. කෙසේ වුව ද මෙම රචනයේ දී එවැනි ආකාරගත චින්තනයකට

යන්තමින් හෝ අවකාශයක් සැලසී නැති බව සිසුවිය පෙන්නුම් කරයි. විචාරාත්මක චින්තන ක්‍රමය හා නව්‍ය අදහස් ඉදිරිපත් කිරීමට දරන පරිශ්‍රමය ප්‍රශංසනීය වේ.

රචනය මහජන සෞඛ්‍යයට සම්බන්ධ වර්තමාන දැවෙන ප්‍රශ්න ගණනාවක් කෙරෙහි අවධානය යොමු කරයි. ශ්‍රී ලංකාවේ උතුරුමැද පළාත තුළ දහස් ගණනකගේ ජීවිත බිලි ගෙන තිබෙන පුළුල්ව පැතිරුණු වකුගඩු රෝගය එවැන්නකි. සිසුවිය අපගේ කෘෂි වාරිමාර්ග උරුමය සුරැකීමේ අවශ්‍යතාව අවධාරණය කරන අතරතුර වර්තමාන තත්ත්වයට තුඩු දී තිබෙන රජයේ විනාශකාරී ප්‍රතිපත්ති කෙරෙහි ද අවධානය යොමු කරවයි.

රචනය පෙර යුගවල දී සංවර්ධනය අධ්‍යාපන පද්ධති සමග සම්බන්ධ කළ ආකාරය ගැන මෙන් ම අපගේ ඉතිහාසයේ විවිධ අවධිවල දී සාහිත්‍ය කලාව තුළ ඉමහත් සෞන්දර්ය විද්‍යාත්මක වර්ධනයක් දැකිය හැකි වූ ආකාරය ගැන ද කතා කරයි. එම නිසා සිසුවිය අධ්‍යාපන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ද කැපී පෙනෙන විග්‍රහයක් ඉදිරිපත් කරයි. කෙසේ වුව ද හිටපු විශිෂ්ට දේශපාලනඥයෙකු වන සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර හඳුන්වා දුන් නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය අගය කරන නමුත් සිසුවිය වර්තමාන අධ්‍යාපන ක්‍රමය හා ප්‍රතිපත්ති නිර්මාණය කර තිබෙන්නේ වඩා සානුකම්පික හා විනයගත සමාජයක් නිර්මාණය කිරීම උදෙසා ද යන ප්‍රශ්නය මතු නො කරයි. එක් අතකින් රචනය තර්ක ගොඩ නැගීමට මග පෑදෙන තීරණාත්මක ප්‍රශ්නයක් විය හැකි යමක් මතු කිරීමට අසමත් වන බව කිව හැකි ය. වර්තමාන අධ්‍යාපන ප්‍රතිපත්ති සැලසුම් කළේ ඉපැරණි යුගවල තිබූ යහපත් පරිචයන් පුනර්ජීවනය කිරීම සඳහා ද? රචනය ප්‍රගතිය උදෙසා පරිසර හිතකාමී ප්‍රතිපත්තියක අවශ්‍යතාව පෙන්වා දෙන නමුත් පූර්ණ සංවර්ධන සංකල්පය විමසා බැලීමක් හෝ ප්‍රශ්නයට බඳුන් කිරීමක් නො කරයි. එම නිසා සිසුවිය වචනය සියල්ලන්ට ම පිළිගත හැකි යැයි සිතන බවක් පෙනේ. කෙසේ වුව ද පසු ගිය සියවසේ දී ප්‍රවර්ධනය කර තිබෙන බටහිර සංවර්ධන මාදිලි විචාරාත්මකව තක්සේරු කළ හොත් ඇය නිර්දේශ කරන ප්‍රමිතීන් බිහි වන්නේ අපගේ වැනි රටවල දී ආර්ථික හා සමාජීය ප්‍රගතිය කරා ළඟා වීමේ ඉපැරණි ක්‍රමවලට අනුව කෙරෙන ප්‍රාර්ථනාවන් නො තකා හරින මුළුමනින් ම බටහිර වූ ප්‍රතිපත්තියකින් බව පෙනී යා හැකි ය.

රචනය 'ආසියාවේ ආශ්චර්යය' නමැති සංවර්ධන වැඩ සටහන යටතේ ක්‍රියාත්මක කෙරුණු මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති ගැන කතා කරන නමුත් බොහෝ දෙනා විසින් 'සුදු අලින්' ලෙස හඳුන්වා තිබෙන මෙම ව්‍යාපෘතිවලින් ජාතික නිෂ්පාදනයට එක් වී තිබෙන සැබෑ නිෂ්පාදනය හෝ ආදායම් උත්පාදනය කුමක් ද යන්න පිළිබඳව සිසුවිය කිසිදු ප්‍රශ්නයක් මතු නො කරයි.

සිසුවිය ඉදිරිපත් කරන සමස්ත තර්ක හා විචාරාත්මක චින්තන ධාරාව ම පෙන්නුම් කරන්නේ සමාජ අසමානතාව තුරන් කිරීමේ අභිප්‍රාය ඇතිව සෞඛ්‍යයට හා මානවවාදයට සම්බන්ධ සාධක මත ගොඩ නැගෙන සංවර්ධන දැක්මකි. මේවා ස්වභාව ධර්මය සමග සුසංවාදී සම්බන්ධයකින් යුතු සාමකාමී වූත් ඒකාබද්ධ වූත් සමාජයක් කරා යන මග පෙන්වා දෙන සාධකයන් ය. නාගරීකරණයෙන් හා කාර්මිකවාදයෙන් සමන්විත වත්මන් සංවර්ධන ප්‍රවණතා විවේචනය කිරීමේ දී මතු කෙරෙන වැදගත් ප්‍රශ්නයක් වන්නේ මහජනතාව රෝගී වූත් ප්‍රතිලාභ භුක්ති විඳිය නොහැකි වූත් තත්ත්වයක පසු වන්නේ නම් ආර්ථික සමෘද්ධියෙන් ඇති වන යහපත කුමක් ද යන්න යි. මෙය යොමු වන්නේ ඉතා වටිනා සත්‍යයක් වෙත යඃ එනම් නිරෝගිකම ධනය යි.

# සංවර්ධනය සහ මනුස්සකම

ඕ.ඩබ්ලිව්. රිස්නි යසස්වි වීරසූරිය
10 ශ්‍රේණිය,
කෑ/ ශාන්ත ජෝශප් බාලිකා මහා විද්‍යාලය

## දෙවන ස්ථානය

"සංවර්ධනය වනාහි පළමුව නිවසත්, දෙවනුව ගමත්, තෙවනුව රටත්, ඉදිරියෙන් ඉදිරියට පියමං කරන්නා වූ දැවැන්ත බලවේගයක් යැයි කිවහොත් එය ඉතා නිවැරදි ය." රටක සංවර්ධනය යනු එම රටේ ආර්ථික, දේශපාලනික සහ සමාජීය වශයෙන් ඇතිවන්නා වූ දියුණුවයි. එනම් මෙය ශ්‍රේෂ්ඨතම ලොවක් සොයා යන මිනිසෙකු මත පදනම් වූ මුල් පියවර ලෙස හැඳින්විය හැකි ය.

අපි මෙලොවට බිහි වූ දා පටන් මියෙන මොහොත දක්වා ගතකරන්නා වූ කාලය තුළ ළමා විය, තරුණ විය, මහලු විය නැතිනම් වැඩිහිටිවිය වශයෙන් අවධි තුනක් ගත කරන්නෙමු. මෙහිදී අපට වඩාත් වැදගත් වන්නේ තරුණ වියය. මෙම අවධිය මිනිසා නොයෙක් පෙලඹවීම්වලට ලක්වන බව අපි දනිමු. එසේම බුද්ධිමත් අධ්‍යාපනයක් කරා පෙරට ඇදෙන තරුණ පරපුර නොයෙක් තාඩන පීඩන හමුවේ අභියෝගයන්ට මුහුණ දෙමින් ඉදිරියට ගමන් කරති. මෙසේ ඉදිරියට ගමන් කරන මිනිසා දේශපාලනික, සමාජමය වශයෙන් තම තරුණ විය කැප කරමින් කාර්යශූර මිනිසෙකු ලෙස ඉදිරියට ඇදී යන්නේ කුමක් නිසාද? තම වීරත්වය රටට හඬගා කියා පාන්නටත්, තම ජන්මභූමිය බේරා ගැනීමටත්, ස්වයංපෝෂිත පිරිපුන් අනාගතයකට යාමට සුදුසු වාතාවරණයක් රට තුළ ඇති කිරීමටය.

අප රට සියවසකට වැඩි කාලයක් විදේශාධිපත්‍යයට යටත්ව පැවතියේය. කෘෂිකර්මාන්තයට උරුමකම් කියන අප රට තවමත් සංවර්ධනය වෙමින් පවත්නා රටකි. මෙසේ සංවර්ධනය ආර්ථික, දේශපාලනමය, සමාජීය වශයෙන් මූලිකාංගවලට බෙදා දැක්විය හැකි අතර ආර්ථික සංවර්ධනය කෙසේ විය යුතුද? විදේශීය ආධිපත්‍යයට ශ්‍රී ලංකාව ගොදුරු වීමත් සමගම වැව් බැඳි රාජ්‍යය අධිරාජ්‍යවාදීන් විසින් දයා විරහිතව විනාශ කර දැමූ හෙයින් ගොවිතැන් අඩපණ විය. සරුසාර කුඹුරු යායවල් වල් බිහි වූ වනාන්තර බවට පත්විය. ගොවියෝ අසරණ වූහ. අධිරාජ්‍යවාදීන්ට අවශ්‍ය වූයේ ශ්‍රී ලංකාව අනාථ කඳවුරක් වශයෙන් පවත්වාගෙන යාමට ය. කුසට යැපෙන අහරක් ලබා දී සංවර්ධන ක්‍රියාවලිය අඩපණ කිරීමට ය.

රටක ආර්ථික සංවර්ධනය උසස් මට්ටමක රඳවා ගැනීමට දේශීය කෘෂිකාර්මික එලදාව වර්ධනය ඉහළ මට්ටමකින් පවත්වා ගත යුතුය. අපනයන ආදායම තුළින් ලැබෙන විදේශ විනිමය, රටේ ජාතික නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය ප්‍රාග්ධන භාණ්ඩ සඳහා වැය කළ හැකි විය යුතුය. කෘෂිකර්මයත් කර්මාන්තත් සම මට්ටමකින් පවත්වාගෙන යාම අත්‍යවශ්‍යය. එමගින් රටේ ආර්ථික වර්ධනය වේගවත් කර ගත යුතුය. කෘෂිකර්මාන්තය තුළින් අතිරික්තයක් රඳවා ගත හැකි නම් අපනයන ආදායම අත්‍යවශ්‍ය ආහාර ගෙන්වා ගැනීම සඳහා වැය කිරීමට සිදු නොවේ. කෙටිකාලීන සැලසුම් මගින් නිෂ්පාදන ධාරිතාව වැඩිකර ගත හැකිවනු ඇත. මේ සඳහා කුඩා දරුවාගේ පටන් වැඩිහිටියා තෙක් සෑම පුරවැසියෙකුම නියෝජනය වන අයුරට සංවර්ධන ක්‍රියාවලියට දායකත්වයක් ලබා දිය යුතුය. දුෂ්කරතා කලකට ඉවසා විඳ දරා ගත හැකි විය

යුතුය. සියලුම දෙනා දැනුවත් වන අයුරට සංවර්ධන සැලසුම් ජනමාධ්‍ය හා සම්මන්ත්‍රණ මගින් ජනතාවට හඳුන්වා දිය යුතුය.

ඉලක්කයක් කරා ධෛර්යයෙන් හා අධිෂ්ඨානයෙන් යුතුව සියලු දෙනාම එකම මිනිස් පවුලක් සේ වාද භේද දුරැර කටයුතු කිරීමේ අවශ්‍යතාව මෙහිදී වැදගත් වනු ඇත. වේගවත් සංවර්ධනයක් අපේක්ෂා කරන සෑම පුරවැසියෙකු විසින්ම සකසුරුවම පෙරදැරිව නාස්තිය පිටුදැක ක්‍රියාශීලීව කටයුතු කිරීමෙන් ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සඵල කර ගැනීමට උනන්දු විය යුතුය.

අප රට තුළ සිංහල, දමිළ, මුස්ලිම්, බර්ගර් වශයෙන් ජාති හතරක ජනතාවක් ජීවත්වෙති. මේ අය කලක් තිස්සේ තම තමන්ගේ ජාතිය අනුව කටයුතු කරන්නට යාම නිසා රටේ දියුණුව ඇනහිට තිබේ. සෑම කෙනෙකුම තමන් ජාතීන් වශයෙන් හඳුන්වා නොදී ශ්‍රී ලාංකිකයන් වශයෙන් හඳුන්වා දී පොදු හැඟීමෙන් කටයුතු කිරීමට සුදුසු කාලය එළඹ තිබේ. රටේ බුද්ධිමතුන් ආගමික නායකවරුන්, කලාකරුවන්, ජනමාධ්‍යකරුවන් එකට එක් වී "අපි ශ්‍රී ලාංකිකයෝ වෙමු" යන තේමාව යටතේ සංවිධානාත්මක වැඩපිළිවෙළක් වහාම ක්‍රියාත්මක කළ යුතුව ඇත.

පාසල් මගින් නාට්‍ය, රචනා, කථික, චිත්‍ර, තරඟ මගින් ලොකු කුඩා බාල, මහලු සෑම දෙනම ඊට දායක වීම වටිනේය. "එකම දැයක් වී එක බලයක් වී පෙරටම යමු ලංකා" යන තේමාව මීළඟට ඉදිරිපත් කර ගනිමින් රටේ සංවර්ධන ක්‍රියාවලිය පණ ගැන්විය යුතුය. රට පුරා සම්මන්ත්‍රණ ප්‍රදර්ශන පවත්වා කිසියම් කාල සීමාවක් තුළ මෙම වැඩසටහන් දියත් කළ යුතුය. රාජ්‍ය අංශයේද, පරිපාලන ක්‍රියාවලිය හා සම්බන්ධයෙන් මෙය සම්බන්ධීකරණ විය යුතුය.

ශ්‍රී ලාංකිකයින් ලෙසට ජාති භේදය තුරන් කර යන මේ ඉදිරි ගමනට ශ්‍රී ලාංකික සෑම දෙනාගේම සහභාගිත්වය අවශ්‍ය වෙයි. අද රටේ පරිහානියට හේතු වී ඇති "නිකං සිටිමින් කෑමේ" ප්‍රතිපත්තිය වහාම නවතා සෑම දෙනාම ක්‍රියාත්මක වෙමින් රට ගොඩනැඟීමේ වැඩපිළිවෙළ ඵල ගැන්වීමට ක්‍රියා කළ යුතුයි. බාහිර ආටෝපය, පුරසාරම්, නාගරීකරණය වැනි තේරුමක් නැති මුදල් අපතේ යන දෑ ගැන නොසලකා සකසුරුවම, ඵලදායිතාව, සංවර්ධනය වැනි සාරවත් තේමාවන් ගැන සිතා ක්‍රියා කිරීම වටනේය. නාස්තිය, දූෂණය, අවිචාරය පිටු දැකිය යුතු ය. රජය පැත්තෙන් පමණක්ම නොව ජනතාව පැත්තෙන්ද මෙම යුතුකම් ඉටු විය යුත්තේය. මිනිසත් බවේ නාමයෙන් සෑම දෙනාම වගවීමෙන් කටයුතු කිරීම යෙහෙකි.

"රජය යනු මහජනතාවයි. මහ ජනතාව යනු රජයයි", යන ආකල්පය සිත් සතන් තුළ රෝපණය කර ගත යුතුය. රජයේ උසස් නිලධාරියාගේ පටන් සුළු සේවකයා දක්වා සෑම කෙනෙකුම සංවර්ධනයට දායක වීම වටනේය. අද රජයේ කාර්යාල රස්තියාදු ගුහා වී ඇත. බොහෝ දෙනෙක් වැඩ නො කරති. පඩි ලබති. ඉල්ලීම් ඉල්ලති. වැඩ වරති. ජනතාවට හිරිහැර වේ. රට පිරිහේ. මේ තත්ත්වය තව වසර කීපයක් පැවතුණහොත් රටට කුමක් වේදැයි කිව නො හැකිය. මේ අයුරින් සියලු භේද ඉවතා දමා අපේ රට යන ආකල්පය ඇතිව ක්‍රියා කළ යුතුය.

එසේම යහපත් දේශපාලන වාතාවරණයක් ද රට තුළ තිබිය යුතුය. ආර්ථික සමාජීය වශයෙන් රටක් සංවර්ධනය වන විට දේශපාලන සංවර්ධනයක්ද තිබිය යුතුය. ප්‍රජාව විසින් ප්‍රජාව පාලනය කරන්නා වූ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ ක්‍රමයක් හා එහි සංවර්ධනයක්ද තිබිය යුතුය. රටක මැර දේශපාලනයක් නොතිබිය යුතු වේ.

පක්ෂ දේශපාලන ක්‍රමය අද අප රටේ ජනතාව භේද භින්න කරලීමට තුඩුදෙන බලවේග යක් බවට පත්ව තිබේ. රැකියා ස්ථාන මාරු කිරීම, රැකියාවන්ගෙන් එළියට දැමීම, නව

රැකියා අපේක්ෂා කරන අයට දේශපාලන පක්ෂය ගැන සලකා බලා රැකියා තනතුරු, උසස්වීම් ලබාදීම ක්‍රියාත්මක වේ. ඒ නිසා සුදුස්සා කොන් වී නුසුදුස්සා ඉස්මතු වීමද දක්නට ලැබේ. මින් නිසියාකාර සංවර්ධනයක් බලාපොරොත්තු විය නො හැකිය.

ඉහත සඳහන් කළ අයුරට කුමන අංශයකින් සංවර්ධනය වුවත් එම සංවර්ධන ක්‍රියාදාමයේදී ආධ්‍යාත්මික සංවර්ධනයක්ද තිබිය යුතුමය. තමාගේ මෙන්ම සමාජයේද සාමකාමී ප්‍රීතිමත්, අර්ථවත්, සමබර සංවර්ධනයක් සඳහා කෙනෙකු සතුව තිබිය යුතු උසස්ම ගුණය වන්නේ ආධ්‍යාත්මික සංවර්ධනයයි. මෙම යහගුණයෙන් පිරුණු මනසක් ඇත්තෙකු වන්නට නම් ජීවිතයේ කවර අවස්ථාවක වුවද, සමාජ ප්‍රවර්ධනයට සම්බන්ධ දෑ උගත යුතුය. බාලයන්ට පෙර වැඩිහිටියන් සදාචාර සම්පන්න වීමෙන් බාල පරපුරට දෙනු ලබන ආදර්ශය මෙහිදී ඉතා වැදගත් වේ. වත්මන් ළමා පරපුර බොහෝ විට අවිචාර ලෙස හැසිරීමට හේතු වී ඇත්තේ වැඩිහිටියන් විසින් යා යුතු නිවැරදි මග පෙන්වා නොදුන් නිසා විය හැකි ය.

මිනිස් සිත් තුළ විවිධ නොසන්සුන්තාවන් නිසා හට ගන්නා සමාජමය ගැටලු බොහෝ ය. මේ අතර ජාති, ආගම්, කුල, පන්තිභේද නිසා උද්ගත වී ඇති ප්‍රශ්න සමාජ සංවර්ධනය අඩපණ කිරීමට අතීතයේ මෙන්ම අද ද හේතු වී ඇත. මෙසේ උද්ගත වන ප්‍රශ්න සමනය කොට ගත හැකි වන්නේ සමාජය දෙස බුද්ධිමත්ව හා මානව දයාවෙන් යුතුව බැලීමෙනි. එවිට පෞද්ගලික ආරාවුල් පැන නොනගින අතර සමාජයේ පැවැත්මට අහිතකර වූ බාහිර ගැටීම්ද ඇති නොවනු ඇත. පුද්ගලයාගේ සමාජයේ හා පරිසරයේ සංවර්ධන ඇති කිරීම සඳහා අධ්‍යාපන ක්‍රියාවලියේ ප්‍රධානතම කාර්යය විය යුත්තේ ඉගෙනීමක් ලබන්නාගේ සන්තානය පිවිතුරු බවින් යුක්ත කිරීමය. එවිට සාමකාමී බව, සමාජශීලී බව, අන්‍යයන්ට ගරු කිරීම, නිර්මාණශීලී බව හා සුවිශේෂී හැකියාවලින් පිරුණු ආධ්‍යාත්මික සංවර්ධනයෙන් පිරුණු ගුණ ගරුක මිනිසුන් සමාජයට අවතීර්ණ වනු ඇත.

රටක සමාජ සංවර්ධනය උදෙසා ආධ්‍යාත්මික දියුණුව ඇති කිරීමෙහිලා ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාව ද ප්‍රබල ලෙස දායක වේ. මෙසේ ලබා ගන්නා අධ්‍යාපනය තුළින් ශිෂ්‍ය අභ්‍යන්තරයේත්, බාහිර සමාජ පරිසරයේත් මුළු මහත් විශ්වයේත් පැන නගින ගැටලු හා ඊට විසඳුම් මුල් කොටගත් මානව කේන්ද්‍රීය අධ්‍යාපන රටාවට ශිෂ්‍යයා යොමුවන අතර අනාගතයේ තමාට, සමාජයට, රටට මෙන්ම ලොවටද වැඩදායකයෝ වෙති. එවැන්නන්ගෙන් සමාජයක් බිහි වූ විට සංවර්ධනයේ විශිෂ්ටත්වය කියා නිම කළ නොහැකි තරම් ය. "ගාන්ධිතුමා විසින් ඉදිරිපත් කළ ආත්ම දමනය හා ස්වයං විනය තුළින් ඥානය වර්ධනය කොට අවිහිංසා වාදයෙන් සත්‍ය සෙවිය යුතු යැයි යන අදහසේද ගැබ්ව ඇත්තේ කෙනෙකුගේ ආධ්‍යාත්මික දියුණුව අධ්‍යාපනයෙන් ලබා ගත යුතු ක්‍රමයයි.

තරගකාරී ලොවක මුදල් පසුපස හඹා යන වත්මන් සමාජයේ සාපරාධී ක්‍රියා පොදු දේපළ විනාශ කිරීම්, කල කෝලාහල හා අසමගිකම් සුලබවත් නිරතුරුවත් දක්නට ලැබේ.

පාසල් අධ්‍යාපන කාලය තුළ ඉන්ද්‍රිය දමනය පිළිබඳව පුහුණුවක් නොලැබීම හා ලෞකික පද්ධතීන් ඉටු කර ගැනීම සඳහා පමණක් දරුවා අධ්‍යාපනයට යොමු කිරීමෙන් අද සිදුවෙමින් ඇත්තේ මෘදු කුසලතා යටපත් වීමකි. තාක්ෂණික කුසලතා ඔප්නංවා ගැනීමකි. දැනුමෙන් අගතැන්පත් වුවත්, ආධ්‍යාත්මික දියුණුව නැති පිරිස් සමාජගත වූ විට මිනිසත් බවින් පිරි සංවර්ධනයක් දැකිය නොහැකිය. කාලයක් තිස්සේ මෙම අභාග්‍ය සම්පන්න තත්ත්වය හඳුනාගත් පෙරඅපර දෙදිග දාර්ශනිකවාදීන් විසින් සාමකාමී, සමාජශීලී ගුණදමින් පිරුණු බුද්ධිමත් දරුවකු බිහිකිරීම අධ්‍යාපන ක්‍රියාවලියේ ප්‍රධාන කාර්යභාරය ලෙස ප්‍රකාශ කොට ඇත.

පුද්ගල සංවර්ධනය මගින් ලොව සංවර්ධනය කොට සුහද ආචාරශීලී මානව සම්බන්ධයක් ගොඩ නැංවීමේ අපේක්ෂාව "යුනෙස්කෝ" යෝජනා අතරේද දැකිය හැකිය. මෙහි අදහස වී ඇත්තේද ආධ්‍යාත්මික සංවර්ධනයයි. අද විවිධාකාර අධ්‍යාපන පද්ධතීන් ලොවපුරා ක්‍රියාත්මක වුවත් ඒ සඳහා ශ්‍රමය හා මුදල් මහා පරිමාණයෙන් වෙන්කොට දැනුම ලබා ඔවුන් වෙසෙන දියුණු සමාජවල පවා උන්මන්තක ක්‍රියාවලින් හා අධික ලෙස ඉඳුරන් පිනවීමට උත්සාහ කිරීම තුළින් බොහෝ වියවුල් සහගත තත්ත්වයන් ඇති වී අධ්‍යාපන ආයතනවල පවා බිහිසුණු ක්‍රියා ගැන නිතර අසන්නට ලැබේ. මව පියා නොහඳුනන තරමට, සහෝදරයා සහෝදරිය නොහඳුනන තරමට සමාජය කිලිටි වී හමාරය.

"මිනිසාමයි ලොව දෙවියන් වන්නේ
මිනිසාමයි ලොව තිරිසන් වන්නේ ....."

මින් ගම්‍ය වන්නේද ආධ්‍යාත්මික ගුණ වගාවෙන් පෝෂිත වූ පුද්ගලයා හා නොවූ පුද්ගලයා අතර පවත්නා පරස්පරතාවයි. සංවර්ධනයේ මුවාවෙන් කෙතරම් ජාවාරම් සිදුවේද? සංවර්ධනය කියාගෙන වන විනාශය සිදු කරති. මාර්ග ඉදිකිරීමට යොදන සිමෙන්ති, ගල්වැලි, මුදල් ආදිය ඇතැම්හු ගසා කති. සාදා නිම වූ පසු මාර්ගය ඉරි තැළෙයි. පාලම පුපුරයි. කාපට් ගැලවී යයි. එසේ වන්නේ මිනිසත්කම නොවූ නිසාවෙනි. මෙපමණක් නොව තවත් ඛේදවාචකයන් අනන්තය.

- "පාසල් සිසුවා දළි පිහියෙන් විදුහල්පතිගේ බඩ කපයි".
- "සිවු මස් දැරිය දූෂණය කරයි".
- "මල් පෝච්චිය අසල බිළිඳු මළ සිරුරක්".
- "දහතුන් හැවිරිදි දියණිය බිල්ලට ගත් පියා වසර දහනවයක් හිරේ".

මෑත භාගයේ අසන්නට ලැබුණු පුවත්පත් වල පළ වූ ඛේදවාචකයන්ය. තවත් මේ ගැන කරුණු සඳහන් කරන විට 1997 වර්ෂයේ අගෝස්තු මස 4 වන දින දිවයින පුවත්පතෙහි මෙසේ සඳහන් වී තිබුණි.

- "පොලීසියේදී පුතා පියාට දණ ගසා වදියි. දෙවනුව පියා පුතාට දණ ගසා වැඳ සමාව ගනියි".
- "කුඩා දැරියක දූෂණය කළ මහල්ලා වසර හතරක් හිරේ."

මෙවන් ඛේදවාචකයන්ට හේතු වී ඇත්තේ මිනිස් මනසේ වර්ධනයට අදාළ වන ආත්ම විශ්වාසය, මධ්‍යස්ථ බව, සාමය, ආදරය, කරුණාව, විනය ගරුක බව, ඔවුන් සිත් තුළ රෝපණය නොවීමයි. යම් කෙනෙකුගේ පුද්ගල සන්තානය දියුණු වුවහොත් ආධ්‍යාත්මික පාරිශුද්ධත්වය මෙන්ම සාමාජික ශුභ සිද්ධියද, සැලසෙනු නියතය.

ඇතැම් පුද්ගලයන්ගේ හිසට සෙවණ දෙන පැල්පත කඩා දැමූයේ සිත් පිත් නැති යන්ත්‍ර මෙනි. බැකෝ යන්ත්‍රයේත්, මිනිස් හදවතේත් කිසිදු වෙනසක් දැකිය නොහැකි තරමට මිනිසා වෙනස් වී ඇත. ඇතැමුන්ට යාමට ඒමට තැනක් නොමැත. ඉඩම් ලබා දෙන බව ප්‍රකාශ කළත්, ලද ඉඩමක් නැත. ලද නිවසක් ද නැත. එවන් වූ පීඩිත පන්තියේ අහිංසක මිනිසුන්ගේ දැවෙන ප්‍රශ්න මිනිස් මූලික අයිතිවාසිකම් ලබා දී සංවර්ධනය කරා පියමං කරන්නේ නම් මැනවි.

(කුමන රටක වුවද සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කරන විට පරිසර ගැටලු මතුවන්නට ඉඩ තිබේ. ඒවා සපුරා වළක්වා ගත නොහැකි වුවත් අවම කර ගැනීම වැඩදායකය.) නිෂ්පාදනය

වැඩි දියුණු කොට සංවර්ධන කටයුතු කිරීම සඳහා අලුතෙන් කර්මාන්ත ව්‍යාපෘති ඇරඹිය යුතුය. ජනාකීර්ණ ප්‍රදේශවල ඒවා ඉදිකිරීමේදී පරිසර ගැටලු රාශියක් මතුවිය හැකි නිසා ඒවා අවම කරනු සඳහා කැලෑ ප්‍රදේශ තෝරා ගැනීම යෝග්‍ය වනු ඇත.

කැලෑ එළි පෙහෙළි කිරීමද පරිසර ගැටලු ඇති කරන්නකි. ඒ ආශ්‍රිතව වෙසෙන සතුන්, සිවුපාවුන්, බෙහෙත්, ඖෂධ පැළෑටි විනාශ වේ. පක්ෂීන්ට උන්හිටි තැන් අහිමි වේ, වල් අලි පවා ගම් වදී. වනාන්තර මැදින් ගලා බස්නා දියඇලි, ගංගා ආදිය වියළී යාම නිසා වනාන්තරයට යාබද ගම්වල ගොවි ජනතාවට ජලය ලැබීම අසීරු වෙයි. වගා පාළු වෙයි. ඒවා අවම වන පරිදි කටයුතු කිරීම අත්‍යවශ්‍ය වෙයි.

කැලෑ එළි පෙහෙළි කොට බිම් සැකසීම සඳහා අධි බලැති යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක වන විට වාතය ඇතුළු මුළු පරිසරයම දූෂණය වෙයි. ජන ජීවිතයට මේ නිසා විවිධ පරිසර ගැටලු මගින් දනෙන පීඩනයද වැඩිවෙයි. වැඩබිම් ඉදිවන විට නානා මාදිලියේ ප්‍රවාහන සේවා පැවැත්වීමටද සිදුවෙයි. ඉන් පිටවන දුම් රොටුවලින් පරිසරය වෙළෙයි. වාතය දූෂණය වෙයි. වාහන හඬින් පරිසරය ගිගුම් දෙයි. පීඩාකාරී තත්ත්වයක් උද්ගත වෙයි. මේ නිසා නවකර්මාන්තපුරවරයන් ඉදි කරන විට ජනාකීර්ණ පෙදෙස්වලින් බැහැර වූ පෙදෙස් ඒ සඳහා යොදා ගැනීම සුබදායකය.

(භෞතික වශයෙන් කොතරම් සංවර්ධනයක් ලැබුවද ආධ්‍යාත්මික සංවර්ධනයක් ලද නොහැක්කේ නම් ඒ ලබන දිනන සංවර්ධනය අර්ථවත් නොවනු ඇත.) යමෙකුගේ පුද්ගල සන්තානය දියුණු වුවහොත් ආධ්‍යාත්මික පාරිශුද්ධත්වය මෙන්ම සාමාජික ශුභසිද්ධියද සැලසෙනු නියතය. සමූහයකගේ එකතුව සමාජය නමින් හැඳින්විය හැකි අතර එම සමූහයාගේ යහපත් මෙන්ම පූර්ණ වර්ධනය නොහොත් දියුණුව සමාජ සංවර්ධනය ලෙස පිළිගැනේ.

සමාජයක සැබෑ සංවර්ධනය වන්නේ භෞතික මෙන්ම සදාචාරාත්මක දියුණුවයි. අතීතයේ අප රටෙහි පූර්ණ සංවර්ධනයක් තිබූ බවට සම්භාව්‍ය සාහිත්‍ය කෘති මෙන්ම වැව් අමුණු ආදියද, දාගැබ් පිළිම ආදී ආගමික වස්තුන්ද හේතු සාධක වේ.

එසේ නම් අතීතයේ පැවති අප රටේ සංවර්ධනය යළි දැකිය හැකි වන්නේ අප සිත් තුළ ඉහත කී ආකාරයට ගුණ දම් වගා කොට ආධ්‍යාත්මික සංවර්ධනයක් ලැබීමෙන් පමණි. ඒ සඳහා නොපමාව ක්‍රියා කිරීමේ අවශ්‍යතාවය දැන් උදා වී ඇත.

සාධාරණව බලන විට රජය හෝ සමාජය යන ද්විත්වයෙන් එක් පාර්ශ්වයකට පමණක් වරද පැටවිය නො හැකිය. ඒ මන්ද යත් එය වඩාත් නිවැරදි තීරණයක් නොවන නිසා ය. නව තාක්ෂණය යොදා ගනිමින් විවිධ වූ සංග්‍රාමයන් සිදු කළ ද, මනුස්සකම හිරු දුටු පිණි බිඳු මෙන් කෙමෙන් කෙමෙන් තුරන් වෙයි. මෙය ලංකාද්වීපයට පමණක් සීමා වූවක් නොවේ. සමස්ත ලෝකයම ගත් විට එය එසේමය.

(මිනිසාගේ උපතත්, මරණයත් අතර සියලුම ජීව ක්‍රියාවලි මුදල් නැමති ධර්මතාවය විසින් ගිලගෙන හමාර ය.) පැරැන්නන් ඉපයූ වස්තුව ගෙන ගියේ නැත. නමුදු අද පුද්ගලයා පරම්පරා හතකටත් වැඩියෙන් ධනය ගොඩගසා අවසානය. ඔහු අසීමාන්තික ආශාවන් කෙරෙහි ලුහුබඳියි. මෙය පුද්ගල තරාතිරමෙහි අරුමය කියාපාන්නකි. ගිහියා පමණක් නොව පැවිදිකමද මුදලට බණ දේශනා කරන කලාවක් අද උද්ගත වී ඇත. අනාගතයේදී මෙය තවත් ඔද්දල් වනු ඇත. සමාජය වළපල්ලට යනු ඇත. එය ඉඩ නොදී රැකගත යුතු කාලය එළඹ ඇත. ලොව පහළ වූ අමා මෑණී බුදු පියාණන් වහන්සේගේ දහම නිතර සිහිපත් කළ යුතුය. එය දෙලොවටම වැඩදායක දහමක්ම

වෙයි. සිඟාලෝවාද සූතුර, වාසෙට්ඨ සූතුර ආදී සූත්‍ර දේශනාවලින් මැනවින් පෙනෙන්නේ පුද්ගල සංවර්ධනය ඇති කර ගත්තේ කෙසේද යන්න ගැනයි. පුද්ගල සංවර්ධනයකින් තොරව සමාජ සංවර්ධනයක් ගැන සිතිය නොහැකිය. එපමණක්ද නොවේ. උන් වහන්සේ රටක සංවර්ධනයට අවශ්‍ය වන්නා වූ මූලික කරුණු ගෙන ධර්මය දෙසූ සේක. දස සක්විතිවත්, දස රාජ ධර්ම, සතර සංග්‍රහ වස්තු, සප්ත අපරිහානීය ධර්ම මේ අතර ප්‍රධාන තැනක් ගනී.

සමාජයේ යහපැවැත්මට මූලිකත්වය දෙන්නා වූ රාජ්‍ය පාලනය බොදු පාලක ක්‍රමය වේ. එවිතරක් නොව ඛුද්දක නිකායට අයත් ධම්ම පදයෙහිද දියුණුවට මෙන්ම මිනිස්කම වර්ධනයට අවශ්‍ය අවවාද රැසක් දැක්වෙයි.

"උට්ඨාහමතො සතිමතො
සුචිකම්මස්ස නිසම්ම කාරිනො
සඤ්ඤතසසච ධම්ම ජීවිනො
අප්පමත්තස්ස යසෝභි වඩ්ඪති"

නොපසුබස්නා වීර්යයත්, විමසා බලා බුද්ධිමත්ව ක්‍රියා කරන ගතියත්, තිදොස් නිවැරදි ලෙස කටයුතු කරන ස්වභාවයත්, නොපමා බවත් යමෙකුගේ දියුණුවට හේතු වෙයි. මේ අනුව රටක සංවර්ධනයට මෙන්ම පුද්ගල චරිත සංවර්ධනයටද බුදු දහමින් මෙන්ම බුද්ධ චරිතයෙන්ද වටිනා යමක් ලබා ගත හැකි ය.

කෙසේ වුව ද සමස්ත ලෝකය විශ්ව ගම්මානයකට අත්වැල් බැඳ ගනිද්දී අපේ පුංචි දිවයිනට හුදෙකලා වී සිටිය නො හැකිය. ළිඳේ සිටිනා ගෙම්බන් මෙන් කාලය ගෙවිය නො හැකිය.

කුමරතුගු මුනිදසුන් ප්‍රකාශ කළේ:
"අලුත් අලුත් දෑ නොතකන ජාතිය ලොව නොනගී" යනුවෙනි. එසේ නම් කළ යුත්තේ යහපත් දේ උකහාගෙන සෑම අංශයකින්ම ඉදිරියට පියමං කිරීමයි. කුඩා කල සිටම දරුවා යහමගට යොමු කොට ඉන් එල නෙළා ගත යුතු ය. යහපත් සමාජයක පදනම දහම් පාසලයි. සෑම දරුවෙකුටම දහම් අධ්‍යාපනය ලබා දීමට රජය කටයුතු කළ යුතුය. එය අනිවාර්ය කළ යුතුය. නොමිනිස්කම් දුරලන මිනිසත්කම් රජයන හෙටක් අපට උදාකර ගත හැක්කේ එවිටයි.

එබැවින් සංවර්ධනයේ යහපත් පැත්ත මෙන්ම අයහපත් අංශයන්ද විමංසනාත්මකව ග්‍රහණය කරගෙන කටයුතු කළහොත් සමාජයේ රටෙහි සැබෑ සංවර්ධනයක් දැකිය හැකි වෙයි. එසේ නම් අපිත් කුඩා කල සිටම සැබෑ මිනිසත් බව හදෙහි රුවාගෙන රටේ දැවැන්ත සංවර්ධන කාර්යයට උර දෙන පුංචි කැකුළු බවට පත්වෙමු.

# විචාරය

රචනය එහි ව්‍යූහය හා තර්ක ගොඩ නැගීම හරහා පෙන්වා දෙන්නේ පළමුව සංවර්ධනය පිළිබඳ අදහස කුමකින් සමන්විත වේ දැයි නිර්වචනය කර ගැනීමේ හා අප රට අපගේ සංවර්ධනය ප්‍රශ්නයට බඳුන් කරන වර්තමාන ගෝලීය වාණිජවාදී පද්ධතිය මත රඳා පැවතීමට බලපෑ ඓතිහාසික සාධක අවබෝධ කර ගැනීමේ වැදගත්කම යි. සිසුවිය යටිතල පහසුකම් ව්‍යාපෘති හරහා ජාතිය සමස්තයක් ලෙස වඩා යහපත් ප්‍රතිඵල අත් කර ගැනීම ආපසු හරවන සාධක සහ අධ්‍යාපනය, ආකල්ප හා අනන්‍යතාව පිළිබඳ සංකල්ප ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරන වර්තමාන සමාජයේ චිත්ත ස්වභාවය ගැන ද සාකච්ඡා කරයි.

සිසුවිය රටක ආර්ථික සුරක්ෂිතතාව දෙස ජාතික ආරක්ෂාව සැලකිල්ලට ගනිමින් බැලිය යුතු ආකාරය පිළිබඳව ඉතා නැණවත්ව කතා කරයි. කෙසේ වුව ද වඩා පුළුල් කතිකාව තුළ දී ජාතික ආරක්ෂාවට අප රටේ වැඩි දෙනා සිතන බව පෙනෙන හුදු හමුදාමය සැලකිලිමත් වීම් පමණක් නො ව බොහෝ ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර ඇතුළත් වේ. යටත් විජිතවාදය කෘෂි ක්‍රමයක් මත කේන්ද්‍රගතව තිබූ අපගේ පෙර පැවති ආර්ථිකය විනාශ කළ ආකාරය සම්බන්ධයෙන් සිසුවිය ඉතා වැදගත් කරුණක් අවධාරණය කරයි. ඒ අනුව තර්කානුකූලව මතු වන කරුණ නම් අපගේ සාම්ප්‍රදායික ආර්ථික ක්‍රමය වනසා දැමීම හා විස්ථාපනය කිරීම හරහා පරම්පරා ගණනාවක් තිස්සේ අපගේ ජාතික ආරක්ෂාව අනතුරේ හෙළා ඇත යන්න යි.

ජාතික අනන්‍යතාව පිළිබඳ කාරණය සාකච්ඡා කරන සිසුවිය ජාතික තලයේ දී සංවර්ධනය කරා ළඟා වීමට ඇවැසි ජාතික එකමුතුකම උදෙසා වූ අවශ්‍යතාව ද සාකච්ඡාව තුළට රැගෙන එයි. රචනය මෙම තර්කයට ම සම්බන්ධිතව රජයේ ප්‍රතිපත්ති සම්පාදනය සංවර්ධනය සඳහා ජාතික ධනය වෙන් කරන ආකාරය ප්‍රමුඛතාකරණය කිරීමේ දී ඇතැම් ආකාරවලින් අසමානතාවක් පෙන්නුම් කර තිබෙන ආකාරය ගැන ද කතා කරයි. සිසුවිය කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික මධ්‍යස්ථානවල ක්‍රියාත්මක කර තිබෙන අලංකරණ ව්‍යාපෘති ප්‍රශ්නයට බඳුන් කරන අතර ඇය පවසන්නේ එවැනි ව්‍යාපෘති වඩා පුළුල් ජාතික සංවර්ධන අදහසට එක් කරන්නේ සුළු දෙයක් පමණක් විය හැකි බව යි. සිසුවිය මෙම ව්‍යාපෘතිවලින් සමහරක් පැහැදිලි නාස්තියක් ලෙස ගෙන හැර පායි. සිසුවිය මෙම කරුණට අමතරව දූෂණය ජාතියක ප්‍රගතිය පමා කරන සාධකයක් බවට පත් වන ආකාරය ගැන ද කතා කරයි.

සංවර්ධන ව්‍යාපෘතිවල පාර්ශවකරුවන් අතර පැවතිය යුතු වගකීම පිළිබඳ කාරණය ගෙන හැර පාන විට සිසුවිය ඵලදායක ක්‍රියාවලියක් තුළ එකිනෙකා සමග එක්ව වැඩ කරන රජය හා ජනතාව අතර සමාජ වගකීමක් පැවතිය යුතු බව ගැන පැහැදිලි ලෙස කතා කරයි. රචනය මීට සම්බන්ධිතව දේශපාලනිකව පරිණත සමාජයක දී ප්‍රජාතන්ත්‍රවාදී චින්තනයෙන් ජනනය වන්නේ කුමක් ද යන්න ගැන ද සැලකිය යුතු සැඳහුමක් කරයි. සංවර්ධිත සමාජයක සිටින්නේ දේශපාලනය හා දේශපාලන ව්‍යූහයන් පොදු ජනතාව සම්බන්ධ කර ගත් ක්‍රියාවලියක් ලෙස ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ පරිණත අවබෝධයක් සහිත ජනතාවක් යැයි සිසුවිය පැහැදිලිව දකින බැවින් පොදුවේ ගත් කල වර්තමාන ශ්‍රී ලාංකික සමාජය තුළ 'දේශපාලනික පරිණත භාවයක්' නොමැතිකම ද වඩා දැවැන්ත සංවර්ධනයකට අකුල් හෙළන සාධකයක් බවට පත් වේ.

සිසුවිය නිවැරදිව පෙන්වා දෙන පරිදි සංවර්ධිත සමාජයක් යනු සාමකාමී සමාජයක් ද වන බැවින් වඩා ආධ්‍යාත්මික සංවර්ධනයක් උදෙසා වන අවශ්‍යතාව වර්තමාන සමාජ අවශ්‍යතාවක් ලෙස දකිනු ලැබේ. දිගු කාලයේ දී ස්වභාව ධර්මයට හානි කරන විනාශකාරී බව වසන් කිරීම සඳහා ම ලේබල් ගැසූ ව්‍යාජ සංවර්ධන මතිමතාන්තර ප්‍රතික්ෂේප කරන රචනය ඒ අතරතුර වර්තමාන පරම්පරාවේ තත්ත්වය සලකා බලන විට වඩා සදාචාරාත්මක වියමනක් අවශ්‍ය බව පෙනී යන ආකාරය ගැන ද කතා කරයි. අතීත අවධිවල දී සමාජ ප්‍රගතිය පුද්ගලයා තුළ සදාචාරාත්මක ගුණාංග ගොඩ නැගීම කෙරෙහි ද අවධානය යොමු කළ ආකාරය ගැනත් සිසුවිය කතා කරයි.

දක්ෂතාවන් හා නිපුණතාවන් සංවර්ධනය කරන අතරතුර සුචරිතය, විනය හා ආත්ම දමනය පුද්ගල සංවර්ධනයේ වැදගත් පැතිකඩවල් බව අමතක නොකළ යුතු යැයි සිසුවිය පෙන්වා දී ඇත. ඒ අනුව සංවර්ධනයේ පරිපූර්ණත්වය යනු හුදෙක් බාහිර යටිතල පහසුකම්වල ප්‍රගතිය පමණක් නො ව 'සංවර්ධිත සමාජයක්' උදෙසා වූ වඩා විසල් අදහස තුළ පුද්ගල සංවර්ධනය සාක්ෂාත් වීම පිළිබඳ කාරණයක් ද වේ. රචනය මේ සම්බන්ධයෙන් සමාජ ප්‍රගතියේ පරමාර්ථයට එනම් හුදු ද්‍රව්‍යමය පරමාර්ථ හඹා යාමේ ප්‍රතිඵලයක් ලෙස පැන නගින පුද්ගලවාදය හා රාජවංශික අභිලාෂයන් මග හැරීමට අදාළ ඉතා වැදගත් තර්කයක් මතු කරයි. එහෙයින් සිසුවිය සමාජ ප්‍රගතියෙහිලා ප්‍රමුඛ සාධක වන පුද්ගල සංවර්ධනය හා යහපාලනය පිළිබඳ අත්‍යවශ්‍ය මූලධර්ම කියා දුන් බෞද්ධ ඉගැන්වීම් අවධාරණය කරයි.

සිසුවිය පෙන්වා දෙන පරිදි සුචරිතවත් හා ධාර්මික සමාජයක් යනු සංවර්ධිත සමාජයක් බිහි වීමේ පළමු පදනම වන අතර අනතුරුව සමානාත්මතාවෙන් හා ප්‍රගතියෙන් යුතු සමාජ වියමනක් තුළ ද්‍රව්‍යමය ප්‍රතිලාභ නෙළා ගත හැකි වනු ඇත.

# සංවර්ධනය හා මනුස්සකම

ආර්.පී. දේදුනු වත්සලා රාජපක්ෂ
12 ශ්‍රේණිය,
බප/හෝ/රාජසිංහ මධ්‍ය විද්‍යාලය - හංවැල්ල

## ප්‍රථම ස්ථානය

**"අත්තාහි අත්තනෝ නාථො කොහි නාතෝ පරෝසියා."**

**ධම්ම පදය**

**"ඕනෑම තත්ත්වයක් ළඟාකරගත හැක්කේ පුද්ගල ශක්ති වර්ධනයෙන්ය."**

මිනිසාගේ ජීවන තත්වයේ ධනාත්මක වෙනස සංවර්ධනය ලෙසින් මූලික වශයෙන් හැඳින්විය හැකිය. සංවර්ධනය මිනිසා විසින් මිනිසා සඳහා සිදුකරන්නක් වන අතර, එහි ප්‍රතිඵල නෙළාග න්නේද මිනිසා විසින්මය. මෙහිදී මිනිසාගේ පැවැත්ම සඳහා වන අවශ්‍යතාවයන් සපුරා ගැනීමට ඇති බාධක ඉවත්විය යුතු බව අදහස් කෙරේ. අගහිඟකමින් තොරවීම, නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත වීම තුළ අර්ථවත් ජීවිතයක් ගතකිරීමට මිනිසාට හැකියාව ලැබීමද පුද්ගල සංවර්ධනය ලෙස හැඳින්විය හැකිය.

එමෙන්ම සංවර්ධනය යනු නිබඳවම වෙනස්වීම් වලට බඳුන්වන්නාවූ වර්ධනාත්මක, ගතික ගුණාංගවලින් පෝෂිත වූ ක්‍රියාවලියකි. ජනයාට අවශ්‍ය ආහාර නිෂ්පාදනය, බෙදාහැරීම, අධ්‍යාපනය, සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු පවත්වාගෙනයෑම, නිවාස, ගොඩනැඟිලි, මහාමාර්ග වැනි යටිතල පහසුකම් සංවර්ධනය, ජල විදුලිය, සන්නිවේදන ක්‍රම ආදී සෑම කාර්යයක්ම සංවර්ධන ක්‍රියාවලියට අයත්ය.

සැලසුම් සහගත ලෙස ආකල්ප සංවර්ධනය කිරීම ශ්‍රී ලංකාව වැනි රටකට සංවර්ධනය සඳහා අවශ්‍යම කාරණයකි. ජාතිකත්වය පිළිබඳව මානුෂීය චරිත නිර්මාණය හා නිර්මාණශීලීත්වය, සංවේදී බව හා පූර්ණ පරිකල්පනයෙන් යුත් සමාජයක් ගොඩනැඟීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කළ යුතුය. ජපානය වැනි රටක් උදාහරණ ලෙස ගෙනහැර දක්වීමේදී පුද්ගලයා කුඩා අවධියේ සිටම එනම් පාසල් අවධියේ සිටම තම රට සංවර්ධනය සඳහා යන ගමනට හුරු කරනු සුලභව දැකිය හැකි කරුණකි. තවද ඉන්දියාව වැනි දකුණු ආසියාතික රටක් ජාතිකත්වය රට ගොඩනැඟීමට භාවිත කරනු දැකිය හැකිය. ජාතික සංවර්ධනයේ පෝෂිතම කලාපය අධ්‍යාපන ක්ෂේත්‍රය බව ජපන් ජාතීහු හඳුනාගෙන ඇත. එසේ හඳුනාගෙන තම රටේ සංවර්ධනයට ගැළපෙන ලෙස අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදුකරනු ලැබීය.

"සැබෑ සංවර්ධනය මිනිසාගේ සුභසාධනය සඳහාම විය යුතුය" යන්න ආත්මාර්ථකාමී සිතුවිල්ලක්ව පවතී. සංවර්ධනය ඉක්මවා ගිය මිනිසත්කම මිනිස් සංහතිය සතු මහඟුම දායාදය වේ. මිනිසා ඇතුළු සමස්ත ජීවි හා අජීවි පරිසරයම පමණක් නොව අනාගත සංවර්ධන විභවතාවද සුරැකීමේ

ප්‍රබල දර්ශනයක් මිනිසත්බව සතුය. මිනිසාගේ සුභසාධනය තිරසර වශයෙන් සකස්වීමට නම් ඒ සඳහා පරිසර සංරක්ෂණයේ ඇති වැදගත්කම මිනිසත්භාවයට තදින්ම ඒත්තුගැන්විය යුතුය. සෑම කරුණකටම පූර්වගාමීව මිනිසත්බවේ මහරු ගුණදහම් ඉස්මතුකොට හුවා දැක්වීම මඟින් මිනිසාට පමණක් නොව සෑම ජීවී හා අජීවී පරිසරයට යහපත් ප්‍රතිලාභ උරුම වනු නිසැකය.

සංවර්ධනය අභිභවා ඉස්මතු වන මිනිසත් බව සමාජීය, ආර්ථික, සංස්කෘතික, දේශපාලන, ආගමික, පාරිසරික හා අධ්‍යාපනික යන සෑම සමාජ තත්වයක් උදෙසාම බලපාන බව අප වටහාගත යුතුය. එමෙන්ම මිනිසත්කම පාගා සංවර්ධනය පමණක් ඉස්මතු වුවහොත් සංවර්ධනයේ අනිෂ්ට ප්‍රතිවිපාක මිනිසා විසින් විඳදරාගත යුතු වේ.

වර්තමානය වන විට එම විපාක මිනිසාට පමණක් සීමා වූවක් නොවේ. වර්තමානයේ ශ්‍රී ලංකාවේ අලි මිනිස් ගැටුම මීට හොඳම උදාහරණය වේ.

සාවද්‍ය සංවර්ධනයේ අනිටු විපාක මිනිසාට පමණක් නොව මිනිසාට ඉතා සමීප සත්වයින්ටද, මුළු පෘථිවි තලයටද, පෘථිවි තලයෙන් ඔබ්බට බලපෑම් කළ විශ්වයද අනතුරේ හෙළීමට හේතු වේ. උදාහරණයක් ලෙස ගත්කල මිනිසා විසින් සිය සුඛ විහරණය සඳහාම නිපදවන ලද CFC වායුව අවසානයේදී පෘථිවි වායුගෝලයේ ඉතා දුරස්ථව පිහිටි ඕසෝන් වියන සිදුරුකිරීමට හේතු වූ අයුරු දැක්විය හැකිය. එය මානව සංහතියට පමණක් නොව මුළුමහත් වූ ජීවී, අජීවී පරිසරයේ සමස්ත සැලැස්මම උඩු යටිකුරු කරවූ සිදුවීමකි.

විසි එක්වෙනි සියවසේ උදාවත් සමගම ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල් විවිධ අභියෝගයන්ට මුහුණදෙමින් සිටී. එය ගෝලීයකරණයේ ප්‍රතිඵලයක් ලෙසින්ද හුවා දැක්විය හැකිය. මෙම අභියෝග අතර ආර්ථිකයේ විවිධ විෂමතාද ප්‍රබලව දැකිය හැකිය. ජෛවගෝලයට කම්පනයට පත්කරමින් සංවර්ධනය නාමයෙන් සිදුකරන ස්වාභාවික සම්පත් පරිහරණය අද විශාල ගැටලුවක් බවට පත්ව තිබේ. තොරතුරු තාක්ෂණය භාවිත කිරීම සම්බන්ධයෙන් මතුවන ගැටලු හා සාරධර්ම පිළිබඳව පැන නැඟී ඇති විවිධ විෂමතා උග්‍ර ගැටලුකාරී තත්වයන් උසුලයි.

අද්‍යතන සමාජයට අවශ්‍යවන්නේ මෙබඳු අභියෝගයන්ට නොබියව නොසැලී මුහුණදීමට සමත්වන විශ්ව පුරවැසියන් උත්පාදනය කිරීමේ කාර්යභාරය වේ. පුද්ගලයා යනු සුවිශේෂී අයෙකි. මෙබඳු විශ්ව පුරවැසියන් බිහිකිරීමේදී මනුස්සකමට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. අද්විතීය මිනිසෙකු බිහිකිරීමේ කාර්යභාරයේදී ප්‍රගුණ කළ යුතු නිපුණතා රැසකි.

එනම්,

- විශ්ව සමාජයේ සාමාජිකයෙකු ලෙස ක්‍රියාකිරීමේදී විවිධ ගැටලුවෙත ළඟාවීමේ හැකියාව, ඒවා නිසි පරිදි අවබෝධ කර ගැනීමේ හැකියාවෙන් පරිපූර්ණ වීම.
- සාමකාමී ක්‍රමෝපායන් ඔස්සේ ගැටලු නිරාකරණය කරගැනීමේ හසල බුද්ධියෙන් යුතුවීම.
- විවිධ සංස්කෘතීන් පිළිගැනීමේ හා ගරු කිරීමේ ගුණාංගය තිබිය යුතුවීම.
- නිරන්තරව දැනුම සොයන්නෙකු ලෙස ක්‍රියාකිරීම.
- අන්‍යමත ඉවසීම, විරුද්ධ මතවලට සවන්දීම ආදී ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවකට අනුගතවීමේ හැකියාවෙන් යුතුවීම.

- මනුෂ්‍ය ප්‍රජාව සහිත ජෛව ලෝකය පිළිබඳව වත්මනේ සිට අනාගතය දක්වා සිතීමේ හැකියාව නොඑසේනම් පරිසර හිතකාමී පුද්ගලයෙකු බවට පත්වීම යනාදිය දැක්විය හැකිය.

මෙවැනි නිපුණතා වලින් හෙබි පුරුවැසියෙකු බිහිකිරීම සංවර්ධනය සහ මිනිසත්බව එකට එකතුවීමේ මහඟු ඵලය ලෙස දැක්විය හැකිය.

ඒ සඳහා නිපුණතා පාදක අධ්‍යාපනයක් කෙරේ සුවිශේෂී අවධානය යොමුවිය යුතුය. දැනුම, කුසලතා, ආකල්ප හා වටිනාකම්වල සංකීර්ණ සංකලනයන් සිදුවිය යුතුමය.

ලෝක ජනගහනයෙන් තුනෙන් දෙකකටත් වැඩි සංඛ්‍යාවක් තරුණ පරපුර වේ. ජාතික සංවර්ධනය උදෙසා උගත් බුද්ධිමත් තරුණ පරපුර විසින් ඉටුකළ යුතු කාර්යභාරය සුළුපටු නොවේ. කාර්මික විප්ලවයෙන් පසු අපි දිනෙන් දින, මොහොතින් මොහොත වෙනස්වන ලෝකයක දිවි ගෙවමු. එකී ලෝකයේදී විවිධාකාර ගැටලුවලට මුහුණපෑමට ජීවින්ට සිදුවේ. ලෝක ඉතිහාසයේ අන් කවරදාකටවත් වඩා නොවූ විරූ අයුරින් ජන සංඛ්‍යා වර්ධන වේගය ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. ජනගහනයේ වර්ධනයට සාපේක්ෂව ආහාර හා අනෙකුත් අවශ්‍යතා නිෂ්පාදනය නොවීමද සංවර්ධනය කරා පියමනින කවර රටකට වුව බරපතළ ප්‍රශ්නයකි. එමනිසා මනුස්සකම පෙරදැරිව සංවර්ධනය කරා පානඟන ගමන අන් කවර කලකටත් වඩා කඩිසරව අනලස්ව යෑමට කාලය පැමිණ තිබේ.

යටත් විජිත යුගයේදී මෙරට විසූ බ්‍රිතාන්‍ය පාලකයින් ඇතිකළ අධ්‍යාපන ක්‍රමයත්, දේශීය කර්මාන්ත කෙරෙහි දැක්වූ වැරදි ආකල්පත් නිසා එකල තරුණ ශ්‍රමය පිළිබඳව වූයේ හැල්ලුවට බඳුන් වූ සිතුවිල්ලකි. එහෙත් අද අපි නිදහස්, නිවහල් ජාතියක් ලෙස ලෝකයා ඉදිරියේ අභිමානයෙන් සිටිමු. මනුස්සකම පෙරදැරිවූ දේශීය සංස්කෘතියෙන් ලද ආභාසය පෙරදැරිව ස්වාධීන ආර්ථික ක්‍රමයකට රට සංවර්ධනය කළයුතු අවස්ථාවකට රට පැමිණ ඇත. රටේ ජනතාවද මෙම මාහැඟි කාර්යයට පරිත්‍යාගශීලීව සහභාගි වීමට පෙරමඟ බලා හිදිනවා නොඅනුමානය.

නවීන විද්‍යාවේ ශීඝ්‍ර දියුණුවත් කාර්මික ක්ෂේත්‍රයන්හි මනා සංවර්ධනයත් නිසා අද බොහෝ පහසුකම් සැලසී ඇත. නවීන විද්‍යාවේ යහගුණ සියල්ල මඟින් සංවර්ධන ක්‍රියාවලීන් වේගවත් කරගැනීමට මිනිසා ඇපකැප විය යුතුය. සංවර්ධනය හා මනුස්සකම එකමඟක ගමන් ගන්නා සමාන්තර රේඛා දෙකක් විය යුතු බව පාසල් සිසුවියක ලෙසින් මාගේ මතය වේ. එකී සමාන්තර මාර්ගය තුළ සහභාගීත්වය හා සාමය මතින් තිරසර සංවර්ධනයක් ළඟාකරගැනීමට හැකිවනු නොඅනුමානය. මිනිසත්බව පෙරදැරිකරගෙන සංවර්ධනය කරා පියමනින කටු කොහොලින් පිරි මාවතෙහි සංවර්ධන ක්‍රියාවලියේ පෙරගමන්කරුවන් වන සමස්ත ප්‍රජාව කෙරෙහි,

- නිසි අවධානය යොමු කිරීම.
- නිසි පිළිගැනීමක් ලබාදීම.
- සමාජයීය ප්‍රශ්න කෙරේ පුළුල් අවබෝධයක් ඇතිකරලීම.
- ප්‍රශ්න විසඳීමේදී ඒ ඒ රජයන් හා ආයතනයන්හි ප්‍රතිපත්ති කෙරේ යොමුකරවීම ආදී කරුණු වලට ප්‍රමුඛත්වය ලබාදිය යුතුය. තවද තරුණ පරපුරට රැකියා හා ඒ පිළිබඳව පුහුණුවක් ලබාදීමේ පුළුල් වැඩපිළිවෙළක් මඟින් ඔවුන් ජාතික සංවර්ධනයට ඍජුවම සහභාගි කරගැනීම කෙරේ අවධානය යොමුකළ යුතුය.

මිනිස් සිත හා චරිතය සකස් කිරීමේ සහ පෝෂණය කිරීමේ ප්‍රධාන මාධ්‍යයන් වන ආගමික ධර්මය, කලා ශිල්ප වෙසෙසින්ම අධ්‍යාපන කාර්යයෙහිලා පුද්ගල මනස යොමුකරවීම කාලෝචිතය. මිනිසත්බවේ මාහැඟි අනුහස ඉන් උද්දීපනය වනු ඇත. නිබඳවම මනුෂ්‍යයා හා ස්වභාවධර්මය අතර පවත්නා සමීපස්ථභාවය අඩුවී නොයාමට වගබලාගතයුතුය. එලෙසින් මිනිසා හා සොබාදහම අතර සමීපස්ථ ඥාතීත්වය අඩුවීයාම මිනිසා තුළ ඇති මනුස්සකම හෙවත් කරුණාව, හෘදයංගම බව, සහෝදරත්වය, ආදරය වැනි රසික හැඟීම් විරහිත අන්‍යෝන්‍ය අවබෝධය තහවුරු නොවන ස්වභාවයන් පෙන්නුම් කරනු ඇත. අනාගතයේදී භෞතික සම්පත් හිඟය, දරිද්‍රතාවය, යුද්ධ තන්ත්‍රවාදය වැනි ගැටලු රැසකට මුහුණදීම සමස්ත ලෝකවාසීන්ට සිදුවනු ඇත. මේ ස්වභාවයෙන් මිදීමට නම් මිනිසුන්ගේ සිත් සතන් තුළ ආදරය, මිත්‍රත්වය, අවබෝධය, පරිත්‍යාගශීලීභාවය, ප්‍රීතිමත්බව රෝපණය කළ යුතුය. එය සමස්ත මානව වර්ගයා වෙත පමණක් නොව සකල ජීව ලෝකය මුළුල්ලේම ව්‍යාප්ත කළ යුත්තකි. මේ සඳහා එකමුතුකම ඒකාග්‍රතාවය ඇතිකරවන අන්‍යෝන්‍ය බැඳීම තදින්ම බලපායි. පොදු සම්පත් සේම පරිසරයද හවුලේ අහිතකර නොවන අයුරින් භුක්තිවිඳිමින් ජීවත්වීමට මානවයා සිය මනුස්සකම උපයෝගී කරගත යුතුය.

තවද පරිසරය හා බැඳි භෞතික හා මනෝමූලික ගුණාංගයන් තහවුරුකර පරිසරය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබාදීමත් කාලෝචිතය. අද භෞතික සම්පත් පරිහරණය කරන අයුරු හා ඉන් සිදුවන ආදීනව ප්‍රමුඛව දැකිය හැකි කරුණකි. පරිසරය පොදු වස්තුවකි. සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේදී එහි ඵල ප්‍රයෝජන ලබාගත යුත්තේ පොදුබව සිහියේ තබාගනිමිනි. භූමිය වෙරළ සයුර වනපෙත ගංගා ඇළදොළ වනාන්තර වායුගෝලය ජල උල්පත් සියොතුන් සෑම විශේෂයන්ම පරිසරයට අයත් සෞන්දර්යාත්මක අංගයන්ය. එකී සෞන්දර්යාත්මක දෑ සුරැකීමටත් සාධාරණ ලෙස ඉන් ප්‍රයෝජන ගැනීමටත් ඉඩ ප්‍රස්තාව තිබිය යුතුය. මිනිසාගේ තණ්හාවත්, සංවර්ධනය පිළිබඳව ශක්තිමත් පදනමක් නොමැති වීමත් නිසා පරිසරය විනාශ වෙමින් පවතී.

මිහිතලය උණුසුම් වී ඇති අතර බොහෝ ප්‍රදේශ කාන්තාරකරණයට ලක්වී ඇත. මේ නිසා කුඩා අවධියේ සිටම මිනිස් සන්තානය තුළ පරිසරය කෙරේ වගකීමක් රෝපණය කළ යුතුය. ද්‍රව්‍යමය සම්පත් පරිහරණය පිළිබඳව මනා ශික්ෂණයක් ගොඩනංවා එය මානුෂික ගුණාංග ඔස්සේ වර්ධනය කළයුතු බවත් තහවුරු වන අයුරින් ක්‍රියාකිරීමට කාලය එළඹ ඇත. අද සංවර්ධනය යන්න අභියෝගයට පත්වූ සංකල්පයක්ව ඇත්තේ ද්‍රව්‍යමය ලෝකයක, ද්‍රව්‍යමය සම්පත් එක්රැස්කර ගැනීමට යාමේදී මානුෂික ගුණාංග පිරිහීමේ ප්‍රවණතාවයන් දක්නට ලැබීම නිසාය. සංවර්ධනයේ නාමයෙන් මිනිසාට ජීවත්විය නොහැකි ලොවක් බිහිවුවහොත් එහි ඇති ඵලය කිම?

එබැවින් පුද්ගලයින්ගේ ආත්මීය සංවර්ධනය සිදුවීම මත ඇතිවන මනුස්සකම පෙරදැරි කරගෙන, හැමදෙනා සතුවන නිර්මාණාත්මක කුසලතා නිපුණතා ඔප්නංවා සංවර්ධනයේ මහඟු පෙරග මනට සුබදායීව දායකවීම ඔබේත් මගේත් සමාජ වගකීම වනු ඇත.

# විචාරය

සංවර්ධනය සහ මනුස්සකම තේමා කර ගත් මෙම රචනය මානව අවශ්‍යතාවන්ට හා වුවමනාවන්ට සම්බන්ධිතව සංවර්ධනය නිර්වචනය කරන ප්‍රධාන පදනම බවට මානව අභිලාෂය හා දැක්ම පත් කරයි. ඒ අනුව සිසුවියගේ අදහස වන්නේ සංවර්ධනයට පොදු පදනමක් පැවතිය හැකි නමුත් එය ඒ ඒ අවධියට ගැළපෙන ගතිකත්වයකින් හා වෙනසකින් ද සමන්විත වන බව යි. සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමට මිනිසා කරන ක්‍රියාවන්හි ධනාත්මක හා ඍණාත්මක ප්‍රතිඵල අත්දකින්නේ මිනිසා ම බවට සිසුවිය පළ කරන අදහස සපුරා ම සත්‍ය වේ.

රචනය සංවර්ධනයෙන් මුදුන් පමුණුවා ගැනීමට උත්සාහ දරන දෙය තුළ ගැබ් වන ප්‍රමුඛ අවශ්‍යතා එකිනෙක දක්වන අතරතුර 'ආකල්ප සංවර්ධනය' සම්බන්ධයෙන් මතු කරන තර්කය ඉතා වැදගත් ය. මෙම තර්කය රචනයේ තේමාව සමග මැනවින් සම්බන්ධ වූවක් වන අතර සිසුවිය දකින පරිදි සංවර්ධනය පසුපස පවත්නා ගාමක බලවේගය වන්නේ මානව අභිලාෂය යි. රචනය මීට අදාළ කොට සැලසුම්ගත ආකල්ප සංවර්ධනය ගැන කතා කරයි. ජපානය හා ඉන්දියාව වැනි රටවල් අත්දුටු ආර්ථික නැගීම පසුපස පවතින එක් ගාමක බලවේග යක් වන්නේ එය බව රචනය පවසයි. පොදුවේ රටට ම ප්‍රතිලාභ අත් වන පරිදි සේවය කිරීමට උත්සාහ කිරීම පිළිබඳ පුද්ගල ආකල්පය අතිශයින් ම යහපත් දේශානුරාගයකින් යුතු සමහර රටවල සාර්ථකත්වයේ එක රහසක් ලෙස දක්නා ලැබේ.

අර්ථාන්විත සංවර්ධනය නිර්වචනය කිරීමට යොදා ගන්නා ප්‍රධාන ම අංගය වන මානව සුභසාධනය ගැන කතා කරන්නේ එය මනුෂ්‍යත්වය මෙන් ම පරිසරය සුරැකීම ද පුළුල් කරන්නක් ලෙස සලකමිනි. එමෙන් ම මනුෂ්‍යත්වයෙන් තොර සංවර්ධනයෙන් අත් වන්නේ විනාශකාරී ප්‍රතිඵල බව ද සිසුවිය පැහැදිලිව ප්‍රකාශ කරයි. රචනයේ දී ඉදිරිපත් කෙරෙන අදහස් හා තර්ක මාලාව තුළ ගැබ් වන ප්‍රශංසාත්මක දෙය නම් සිදු වෙමින් පවත්නා සුඛෝපභෝගී අබාධිත සංවර්ධනය පසුපස පවත්නා අදහස් හා සාරධර්ම සමූහය මහජනතාව මුළා කරන හා පොදු සුභසාධන පරමාර්ථයෙන් දුරස් වන 'ව්‍යාජ සංවර්ධනයක්' ලෙස හැඳින්වීමට තරම් සියුම් නුවණක් සිසුවියගෙන් පළ වීම යි.

ගෝලීය ආර්ථිකයේ වර්තමාන ප්‍රවණතා සමාජ අසමානතාව චිරස්ථායී කරන්නා වූ සූරා කෑම පදනම් කර ගත් ආර්ථික ප්‍රගතිකාරක පද්ධතියක් නිර්මාණය කර ඇත. මෙම නිරීක්ෂණය කරන සිසුවිය දැන් සමාජ වියමන වඩ වඩා අස්ථාවර වෙමින් පවතින ආකාරය ගෙන හැර පායි. මෙම තත්ත්වය සදාචාරය කෙරෙහි දරුණු අන්දමින් බලපාන නූතන තොරතුරු සන්නිවේදන තාක්ෂණය හරහා නිර්මාණය වන සමාජ අවිනීත භාවය සමග සම්බන්ධ වී තිබීම ද සංකීර්ණ ගැටලුවකි.

ප්‍රශ්න මතු කරන වැදගත් සාධකයක් ලෙස සිසුවිය අවධාරණය කරන උපකාරණා හෙවත් ක්ෂේත්‍රවලින් එකක් නම් නිර්වචනය කළ හැකි ආකාරය පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු මූලාශ්‍ර නොමැතිව සංකල්පගත කෙරෙන 'ගෝලීය පුරවැසියා' ගැන ප්‍රකාශ කරන දෙය යි. 'ගෝලීය පුරවැසියා' යනු කවුරුන් ද යන්න ඇතැම් විට සමස්ත ගෝලීයකරණ සංකල්පය ම මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් විය හැකි ය. මෙම සංකල්පයෙන් ඉදිරිපත් කෙරෙන්නේ සාර්වත්‍රික භාවය පිළිබඳ හැඟීමක් විය හැකි නමුත් ජාතික දේශ සීමා හරහා අබාධිතව එහා මෙහා යා හැකි

යැයි සැබවින් ම කියා සිටිය හැක්කේ හා තමන්ට පුරවැසියෙකු ලෙස ගෝලීය පිළිගැනීමක් ඇතැයි ඒකාන්තයෙන් ම කියා සිටිය හැක්කේ කවුරුන්ට ද යන ප්‍රශ්නය ඈත සිට තර්ජනය කරයි. මේ මොහොතේ නම් මෙම වරප්‍රසාදය හොඳින් ම ලබන්නේ වඩාත් ම බලගතු ජාතීන්ට අයත් පුරවැසියන් හා අද දින පොහොසතුන්ගේත් පොහොසතුන් බවට පත්ව සිටින පුද්ගලයන් ය. සිසුවිය ගෝලීය පුරවැසියාට ආවේණික ලක්ෂණ දක්වා ඇතත් එම සංකල්පය මෙම රචනයේ දී මීට වඩා හොඳින් විචාරාත්මකව සාකච්ඡා කළ හැකි ක්ෂේත්‍රයක් බව පෙනේ. සිසුවිය පෙන්වා දෙන ලක්ෂණවලින් ප්‍රකට වන්නේ ඇයගේ පෞද්ගලික දැක්ම වුවත් සංකල්පය ඉදිරිපත් කෙරෙන්නේ සත්‍යාසත්‍යතාව පරීක්ෂා කළ හැකි වඩා පැහැදිලි ප්‍රකාශයක් තුළින් බැවින් ඒවා මීට වඩා පැහැදිලිව ප්‍රකාශ කළ හැකිව තිබිණ.

සිසුවිය ඉදිරිපත් කර තිබෙන හා ඒ අනුව අන් කිසි රචනයක දක්නට නොලැබෙන පරිදි අවධාරණය කර තිබෙන ඉතා වැදගත් ගැටලුවක් වන්නේ එළඹෙමින් පවත්නා ලෝක ආහාර හිඟය පිළිබඳ ගැටලුව යි. හිටපු විදේශ ලේකම් ආචාර්ය පාලිත කොහොන මෙම ගැටලුව අප රට ප්‍රසිද්ධ කතිකාව තුළ ප්‍රබල ලෙස මතු කළේ ය. ආචාර්ය කොහොන ආහාර රැස් කිරීමේ සාර්ථක ක්‍රමවල හා අපගේ ජාතික ආහාර නිෂ්පාදනය මීට වඩා හොඳින් පරිහරණය කිරීමේ අවශ්‍යතාව කෙරෙහි අවධානය යොමු කළත් ශ්‍රී ලංකාව තුළ ප්‍රතිපත්තිමය තලයේ දී ඒ කෙරෙහි ක්‍රියාකාරී උනන්දුවක් දක්වා ඇති බවක් තව මත් නොපෙනේ. සාක්ෂාත් කර ගත හැකි විසඳුම් සහිතව අප්‍රමාදීව අවධානය යොමු නොකළ හොත් මෙය ලෝකය තුළ දැවැන්ත නොසන්සුන්තාවක් නිර්මාණය කරන ගැටලුවක් බවට පත් වනු ඇත. එළඹෙමින් පවත්නා මානව අර්බුදයන්ට විසඳුම් සොයා ගත හැක්කේ කෙසේ දැයි සලකා බලන සංවර්ධන ප්‍රතිපත්ති දෙස බැලිය යුත්තේ අනාගත පරම්පරාවන්ගේ නො නැසී පැවැත්ම උදෙසා වන ජාතික සංවර්ධන දෘෂ්ටි කෝණයෙනි. මෙම රචනය එළඹෙමින් පවත්නා ආහාර හිඟය පිළිබඳ අර්බුදයට විසඳුමක් වශයෙන් වඩාත් ම වැදගත් යෝජනාව කරා ළඟා වන්නේ මෙම කරුණ සාකච්ඡා කිරීමේ දී ය. සිසුවිය යෝජනා කරන්නේ අපගේ ජාතික සුරක්ෂිතතාව සහතික වන්නේ ස්වයං පූරිත ස්වයං පෝෂිත ආර්ථිකයක් නිර්මාණය කිරීමෙහිලා අප යොදා ගත් පැරණි ක්‍රම පුනර්ජීවනය කිරීමෙන් බව යි.

මෙම රචනයේ දී යුද්ධය හා සාගතය නිසා ඇති විය හැකි යථාර්ථයන් සහ ආසන්න අනාගතයේ දී සමස්ත මනුෂ්‍ය වර්ගයා ම මුහුණ පෑ හැකි අන්ත දරිද්‍රතාව පිළිබඳව කල්පනා කර ඇත්තේ සිසුවියගේ පැත්තෙන් වඩා දුර දිග යන චින්තනයක් පෙන්නුම් කරමිනි. පරිසරය මානව සංහතියට පොදු සම්පතක් ය යන කරුණ සම්බන්ධයෙන් සිසුවියගේ මතය ලෙස ප්‍රකාශ කරන තිබෙන දෙය ඉහළින් ම ප්‍රශංසාවට ලක් කළ යුතු වේ. ස්වභාව ධර්මය නිෂ්පාදනය උදෙසා පවත්නා සම්පත් ගබඩාවක් පමණක් නො ව මානව වර්ගයා උදෙසා පවත්නා සෞන්දර්යාත්මක අගයක් සහිත සම්පතක් ලෙස ද දැකීමෙන් සිසුවිය ස්වභාව ධර්මය සංරක්ෂණය කිරීමට හා තිරසර අනාගතයක් සාක්ෂාත් කර ගැනීමට නම් පරිභෝජනයේ පාලනයක් සිදු විය යුතු ය යන යෝජනාව කරා එළඹේ. විනයගත හා පාලිත පරිභෝජනය යනු පොදු යහපත සලසන සංවර්ධන පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම උදෙසා වූ නිසැක ප්‍රායෝගික ක්‍රමයකි.

රචනය සිසුවියගේ අදහස් හා තර්ක මැනවින් ව්‍යූහගතව ගලා යන ආකාරය පෙන්නුම් කරන අතර මනා භාෂා නිපුණතාව හා ප්‍රගතිශීලී චින්තනය ඊට ආලෝකයක් වී ඇත.

# අවසාන වටය සඳහා තේරුණු චිත්‍ර දහය




එම්. සිතාරා සුභාෂිණී, රජපොල මහා විද්‍යාලය, 13 ශ්‍රේණිය



ඩබ්. එම්. වරුනි රන්ශිමාලා ගල්ලැල්ල, රාජකීය විද්‍යාලය - වයඹ, 11 ශ්‍රේණිය



එන්. ජී. උපුලි හංසිකා, ශ්‍රී රාහුල මහා විද්‍යාලය, 11 ශ්‍රේණිය




ප්‍රසාන්තිකා සඳරේණු මීගහගෙදර, කලුවිල සේන මහා විද්‍යාලය, 12 ශ්‍රේණිය



ආර්. ෂෙහානි තාරකා රත්නකුමාර, කඩුගන්නාව ජාතික පාසල, 12 ශ්‍රේණිය



එච්. පී. සමාධි ලෝචනා ප්‍රේමසිරි, ගෝතමී බාලිකා විද්‍යාලය - කොළඹ 10, 11 ශ්‍රේණිය



එච්. ඒ. කේ. වෙනුර දිල්ශංක ද සිල්වා, රාහුල විද්‍යාලය - මාතර, 12 ශ්‍රේණිය

තෙවන ස්ථානය



විනුරි නිහාරා උඩුවෙල, මහමායා බාලිකා විද්‍යාලය, 11 ශ්‍රේණිය

දෙවන ස්ථානය



ආර්. රජිත ලක්ෂාන්, කඩුගන්නාව ජාතික පාසල, 11 ශ්‍රේණිය



ප්‍රථම ස්ථානය

චානක මධුශංක තෙන්නකෝන්, මලියදේව ආදර්ශ මහා විද්‍යාලය - කුරුණෑගල
13 ශ්‍රේණිය

# සංවර්ධනය නැවත සිතා බැලීම සහ ප්‍රතිනිර්මාණය

**චන්ද්‍රගුප්ත තේනුවර සමඟ කළ සංවාදයක් ඇසුරෙන්**

මෙම ලිපිය සම්පාදනය කර ඇත්තේ දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය මගින් 'සංවර්ධනය සහ මනුස්සකම' මැයෙන් සංවිධානය කරණු ලැබූ දීප ව්‍යාප්ත පාසල් චිත්‍ර තරඟයෙන් පළමු ස්ථාන දහය දිනාගත් චිත්‍ර පිළිබඳව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චන්ද්‍රගුප්ත තේනුවර මහතා අප සමග දැක්වූ අදහස් පදනම් කොටගෙනය.

ඔහු ප්‍රථමයෙන් අප හා පවසා සිටියේ, චිත්‍ර සියල්ලක්ම පාහේ, ඒවායේ නිර්මාපකයන් ජීවත්වන පරිසරයෙන් අභාෂය ලබා ඇති බවයි. සංවර්ධනය පිළිබඳ ඔවුන්ට ඇති අදහස් ද එම පරිසරය මගින්ම හැඩගැසුණු ඒවා වේ. පැසැල හරහා හා මාධ්‍ය හරහා සංවර්ධනය පිළිබඳ ඔවුන් හට ලබාදී ඇති, එක ආකාරයකට දෘෂ්ටිවාදීමය යැයි පැවසිය හැකි අදහස්, මේ චිත්‍ර හරහාද නිරූපණය වන බව, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තේනුවර ගේ අදහසයි.

තරඟයෙන් ප්‍රථම ස්ථානය දිනාගත් කුරුණෑගල මලියදේව ආදර්ශ මධ්‍ය මහා විද්‍යාලයේ, චානක මධුශංක තෙන්නකෝන් ගේ චිත්‍රය විග්‍රහ කරමින් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තේනුවර, එහි අභ්‍යවකාශ යුගයක් දැක්වන රූපවල හොලිවුඩ් චිත්‍රපටවලින් ලැබී ඇති අභාෂය ගැන සඳහන් කළේය. චිත්‍රයේ හරි මැදම වගේ බටය ගැට ගැසූ පිස්තෝලයකි. එය හේත්තු කර ඇත්තේ ඉංග්‍රිසියෙන් gavel යනුවෙන් හැඳින්වෙන උසාවියේදී භාවිත වන කුඩා මිටියකටය. මෙයින් නිරූපණය වන දෙය අපට වටහා ගැනීමට අපහසු නැත. චානකගේ අනාගත සිහිනය, හිංසනයෙන් තොර, සාධාරණත්වය රජයන්නක් වේ. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තේනුවර චානකගේ චිත්‍රය මගින් හිංසනය පිටුදැකීම අගය කළේය. අවිහිංසාව සහ සාධාරණත්වය සංවර්ධිත සමාජයක අනිවාර්ය ලක්ෂණ විය යුතුය. දශක ගණනාවක් හිංසනයෙන් බැටකෑ අපේ සමාජය හිංසනය ප්‍රතික්ෂේප කිරීම සංවර්ධනය සඳහා පූර්ව කොන්දේසියක් වන්නේය.

අපි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තේනුවර සමග විචාරශීලි සංවාදයක යෙදුනෙමි. ජයග්‍රහණය කළ චිත්‍රවල සාධනීය ලක්ෂණ පමණක් නොව, ඒවායේ අඩුලුහුඩුකම්ද අපගේ සංවාදයට බඳුන් විය. තේනුවර මහතාගේ අවධානයට ලක්වූ ප්‍රධාන කරුණක් නම්, බහුතරයක් චිත්‍ර වලින් ගම්‍ය වන ඒවායේ නිර්මාපකයන්ට සංවර්ධනය පිළිබඳව ඇති සීමිත සහ ඒකාකෘතික (stereotypical) අවබෝධයයි. ප්‍රථම ස්ථානය දිනාගත් චානකගේ චිත්‍රයද සංවර්ධනය පිළිබඳව ඒකාකෘතික අදහස් වලින් යම්කිසි පෙළඹවීමක් ලබා ඇත. අභ්‍යවකාශයේ පාවෙන විශාල ගොඩනැගිලි, අනාගතය කරා දිවෙන අධිවේගී මාර්ගය සංවර්ධනයේ හැඟවුම් කාරක වේ. සංවර්ධනය හුදෙක් භෞතික සංවර්ධනය ලඝු කළ නොහැක. නිදහස් වෙළඳපොළ ධනවාදය මගින් සංවර්ධනය සංකල්පගතකර ඇත්තේ භෞතික සංවර්ධනය ලෙසය. සංවර්ධනය හුදෙක් ගොඩනැගිලි, අධිවේගී මාවත් සහ යානා වාහන නොවේ. සැබෑ සංවර්ධනය භෞතික සංවර්ධනය හා සමපාතව මානුෂීය ගුණධර්ම හා සමාජයක ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් තහවුරු කරන්නක් විය යුතුය.

තේනුවර මහතා සඳහන් කළ පරිදි චානකගේ චිත්‍රයේ සංවර්ධනය කලාත්මකව ප්‍රතිනිර්මාණය වන්නේ හිස් අවකාශයකය. එහි මිනිස් පුළුටක් හෝ නැත. සංවර්ධනය සිදුවන්නේ මිනිස්සුන්ගෙන් තොරවූ හිස් අවකාශයකයකද ? මෙය සමරහරවිට චානක සංවර්ධනය පිළිබඳ නගන සාහසික

උපහාසයක්ද විය හැක. චානකගේ චිත්‍රය පිළිබඳ අපට ඇති මෙම කියවීම, චිත්‍රයේ හරයට විරුද්ධ කියවීමක් (reading against the grain) වන්නත් පුළුවන්.

චානකගේ චිත්‍රයේ ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය සූර්ය පැනලයක් මත දැක්වෙන චන්ද්‍රිකාවක් ඇත. මෙය පසුගිය කාලයේ කතා බහට ලක්වූ චීනයට කියා කක්ෂගත කරා යැයි කියන චන්ද්‍රිකාව විය හැක. එසේත් නොමැති නම් අභ්‍යවකාශ මධ්‍යස්ථාන විසින් අඩ සියවසකට වඩා වැඩි කාලයක් විසින් අත් ලෝක ජයගැනීම් පිළිබඳව ඇති කර ඇති බලාපොරොත්තුව විය හැක. සූර්ය පැනලය මත ඇති ජාතික කොඩිය, ජාතික විඥාණය හා සංවර්ධනය පිළිබඳ අවිඥානක අපේක්ෂාව පෙන්නුම් කරයි. නූතනත්වය කරා යන ගමනේදී සම්ප්‍රදාය රැකීම පිළිබඳව අවිඥාණක අපේක්ෂාවද පෙන්නුම් කරයි. නූතනත්වය සහ සම්ප්‍රදාය පිළිබඳ ඇති සංකාවෙන් පෙළේ. චානක තම සිතුවම මගින් ප්‍රකාශ කරන්නේ මම පරස්පර විරෝධීතාවය විය හැක. තවද රටක් සංවර්ධිත නම් එය මෙලොව දියුණුව පමණක් නොව අභ්‍යවකාශය ද අත්පත් කර ගත යුතුය. සංවර්ධනය පිළිබඳ මෙවන් අදහස් අපිට ලැබෙන්නේ, ධනපති සංවර්ධන මොඩලයට අපද අනුගත වීම නිසාය. කථිකාචාර්ය තේනුවර ප්‍රකාශ කළ පරිදි, සංවර්ධනය පිළිබඳ විකල්ප කියවීමක ඇති අවශ්‍යතාවය, බහුතරයක් චිත්‍ර වලින් මනාව පෙන්නුම් වේ.

දෙවන ස්ථානය දිනාගත් රාජිත ලක්ශාන් ගේ චිත්‍රය, තේනුවර මහතා ප්‍රකාශ කළ පරිදි පිකාසෝ වැනි ඝනිකවාදීන්ගේ (cubist) චිත්‍ර වල ලක්ෂණ පෙන්නුම් කරන්නකි. ශ්‍රී ලාංකික චිත්‍ර කලාවට ඝනිකවාදයේ (cubism) බලපෑම විශ්ෂ්ට ශ්‍රී ලාංකික චිත්‍ර ශිල්පියෙකු වන ජෝර්ජ් කීට් හරහා ද ලැබේ. බොහෝ පාසල් දරුවන් අතර ජෝර්ජ් කීට් ගේ චිත්‍ර ප්‍රචලිතය. රාජිත ගේ චිත්‍රයට කීට් ගේ හෝ යුරෝපීය ඝනිකවාදීන්ගේ අභාෂය ලැබෙන්නට ඇතැයි අපට උපකල්පනය කළ හැක. රාජිත ගේ වර්ණ සංකලනය සහ ශෛලිය අපි අගය කළ යුතුය.

රාජිත ජාතීන් අතර සහජීවනය සංවර්ධනයේ කොටසක් ලෙස දකී. චිත්‍රයේ ඉදිරියෙන් ම පෙනෙන්නට ඇත්තේ භාජනයක් අතින් දරා ගෙන සිටින ගැහැනුන් දෙදෙනෙකි. මෙම චිත්‍රයේ ගැහැනුන් දෙදෙනාගෙන එක් අයෙක් දමිළය. අපි ඇ දමිළ කියා හඳුනාගන්නේ ඇ අඳින පළඳින ආකාරය මෙන්ම, සමේ වර්ණයද හේතුවෙනි. ඇය සිංහල ගැහැණියට වඩා අඳුරුය. තේනුවර මහතා අප හා පැවසූ පරිදි අපට රාජිතගේ චිත්‍රයේ හමුවන්නේ සිංහල සමාජයේ දෙමළ ගැහැණිය පිළිබඳව ඇති ඒකාකෘතික අදහසයි. ඇය සැමවිටම කළුය. අනිවාර්යයෙන්ම සිංහල ගැහැණියට වඩා කළුය. ඇය නිතරම පාහේ පොට්ටුවකින්ද, නාසයේ පැළඳගෙන සිටින මුදුවකින්ද සැරසී සිටී. මෙය සාමාන්‍යකරණය කිරීමකි (generalisation). සියලුම දෙමළ ගැහැනුන්ට මෙබඳු පෙනුමක් නැත. එය එසේනම් චිත්‍ර ශිල්පියා දෙමළ ගැහැණිය තම චිත්‍ර වල නිරූපණය කරන්නේ කෙසේද? යථාර්ථය ප්‍රති-නිර්මාණය කිරීමේදී කලාකරුවා මුහුණ පාන අභියෝගයකි මේ.

චිත්‍රයේ දක්නට ඇති බෞද්ධ භික්ෂුව සහ ජේසුස් වහන්සේ කුරුසිය ඔසවාගෙන යන අවස්ථාවට (Passion) සමාන දර්ශනය, සංවර්ධනයට ආගමික නැඹුරුවක් ද අවශ්‍ය බව පෙන්වා දේ. ඈතින් සංවර්ධනය සංකේතවත් වන ගොඩනැගිලිය. මෙම ගොඩනැගිලි අප විසින් ඉහත සඳහන් කළාක් මෙන් සංවර්ධනය පිළිබඳ අප සමාජයේ ඇති ඒකාකෘතික අදහස් පිළිබිඹු කරයි. බොහෝ චිත්‍ර වල සංවර්ධනය නිරූපණය කිරිම සඳහා ගොඩනැගිලි සහ මංමාවත් භාවිත කොට ඇත. ගොඩනැගිලි, මංමාවත් සහ යාන වාහන වලට එහා ගිය සංවර්ධනයක් පරිකල්පනය කිරීම කාලීන අවශ්‍යතාවයක් බවට පත්ව ඇත.

තෙවන ස්ථානය දිනාගත් වෙනුරි නිහාරා උඩුවෙලගේ චිත්‍රය අනෙකුත් චිත්‍ර වලට වඩා බෙහෙවින් වෙනස්ය. තේනුවර මහතා ප්‍රකාශ කළ පරිදි, ඇයට සංවර්ධනය පිළිබඳ ඇති දැක්ම

අනෙක් අයට වඩා හාත්පසින් වෙනස් වූවකි. සංවර්ධනය පිළිබඳ විකල්ප කියවීමක් ඉදිරිපත් කිරීමට ඇය දරා ඇති උත්සාහය අපි අගය කළ යුතුය. ඇයගේ චිත්‍රයෙන් ඉදිරිපත් වන්නේ සංවර්ධනය සහ නූතනත්වය මගින් ඇය දකින හැටියට ඇතිකරන සමාජ ප්‍රතිවිපාකය. සිගරට්, මත්පැන් සහ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීම, වෙනුරිට අනුව සංවර්ධනයේම අතුරු ඵල වේ. ධනේශ්වර සංවර්ධනය මගින් ඇති කරන සමාජ ව්‍යාකූලතාවයන් මෙම චිත්‍රය මගින් මොනවට විදහා දැක්වේ. චිත්‍රයේ එක් කෙළවරක සූදුව සංකේතවත් වන රූලේට් මේසයක් ඇත. සූදුවෙන්, සුරාවෙන් සහ මත්ද්‍රව්‍ය භාවිතයෙන් අගතියට පත් තරුණ ජීවිත නිහාරා සිතුවමට නගා ඇත. පසුගිය වකවානුවේ ලංකාවේ කැසිනෝ ආරම්භ කිරීම පිළිබඳ විශාල ආන්දෝලනයක් ඇති විය. කැසිනෝ ආරම්භ කිරීම සංවර්ධනයේම කොටසක් බවට හුවා දක්වනු ලැබීය. තේනුවර මහතාට අනුව නිහාරාගේ චිත්‍රය සංවර්ධනය පිළිබඳ ඇති වර්තමාන කතිකාව විවේචනයට ලක් කරන්නෙකි. මුදල් පසුපස හඹා යෑම, මුහුණු පොතට ලොල් වීම සහ හිංසනය යනාදිය නිසා වල්මත් වූ ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාව නිහාරාගේ චිත්‍රයට විෂය වේ. අහස උසට නැගෙන ගොඩනැගිලි, සුපිරි මෝටර් රථ මධ්‍යයේ සමාජ වටිනාකම්වල ඇතිවී ඇති බාදනය මෙම චිත්‍රය තුළ දැකිය හැක.

කොළඹ, ගෝතමී බාලිකා විද්‍යාලයේ සමාධි ලෝචනා ප්‍රේමසිරි ගේ චිත්‍රය සංවර්ධනය දකින්නේ, සිංහල බෞද්ධ සංස්කෘතියේම දිගුවක් ලෙසය. චිත්‍රයේ ගැහැණු පිරිමි සැරසී ඇත්තේ සිංහල බෞද්ධ ඇඳුම් පැළඳුම් වලිනි. ඇය භාවිත කර ඇති සංක්තද, බොහෝවිට සිංහල බෞද්ධ සංස්කෘතියෙන් උකහා ගත් ඒවා වේ. සෞභාග්‍ය සංකේතවත් කරන්නේ පුන්කලසින් සහ සඳ හිරු යන රූප වලිනි. බුදු දහම නිරූපණය කිරීම සඳහා සමාධි යොදා ගන්නේ චෛත්‍යයකි. පුන්කලසට නුදුරින් අමාරුවෙන් සොයා ගන්නට හැකි කුරුසයකි. මෙයින් ක්‍රිස්තියානි ආගම සංක්තවත් වේ. මුස්ලිම් ජාතිකයෙක් කෙළවරක පිළිඹිබු කරන්නීය. සියළු ආගම් ඇතුල් කිරීමට ගත් උත්සාහයයි ඒ. චිත්‍ර ශිල්පිනියගේ ලෝක දෘෂ්ටිය සහ පරිකල්පනය ස්වකීය නිර්මාණය තුළින් ගම්‍යමාන වන්නේ මේ ආකාරයෙනි.

චිත්‍රයේ මිනිස් රූප සම්ප්‍රදායික ඇඳුම් පැළඳුම් වලින් සැරසී සිටී. අප ඉහතදීද සඳහන් කර ඇති පරිදි, සිංහල බෞද්ධ සංස්කෘතිය දැක්වෙන සංකේතයන් චිත්‍රය පුරා දක්නට ඇත. නූතනත්වය පෙන්නුම් කරන පරිගණකයක් ද, විද්‍යාත්මක දියුණුව සංකේතවත් වන, රසායනාගාර උපකරණද චිත්‍රයේ සොයා ගත හැක.  අප පෙරද සඳහන් කර ඇති ආකාරයට, සංවර්ධනය, නූතනත්වය සහ සම්ප්‍රදාය අතර ඇති ආරවුල මනාව නිරූපණය කරන්නකි. සමාධි ගේ චිත්‍රයද, සංවර්ධන දකින්නේ, නූතනත්වය හා සම්ප්‍රදාය අතර මුහුවක් ලෙසය. මෙය කොතරම් දුරට යථාර්ථවාදීද යන්න ප්‍රශ්නයකි. සංවර්ධනය පිළිබඳ සමාධිට ඇති කියවීම, සාංකාවෙන් වෙලී ඇත. අපි මෙම ලක්ෂණය චානකගේ චිත්‍රයේද දැක්කෙමු.

තේනුවර මහතා පවසන පරිදි කඩුගන්නාව ජාතික පාසලේ, ෂෙහානි තාරකා රත්නකුමාරගේ චිත්‍රයේ සංවර්ධනය සඳහා ශ්‍රමය සපයන්නේ ගැහැණුන් පමණි. ෂෙහානිගේ චිත්‍රයේද දෙමළ ගැහැණිය නිරූපණය කර ඇත්තේ කළු පැහැයිනි. රාජිත ලක්ෂාන්ගේ චිත්‍රයේ ද අපි මේ දෙය දැක්කෙමු. දෙමල ගැහැණිය කළු පැහැයන් චිත්‍රණය කිරීම මගින්, ගම්‍යමාන වන්නේ දෙමළ ගැහැණිය පිළිබඳ ඇති ඒකාකෘතික අදහසයි. මෙම චිත්‍රයේද සංවර්ධනය නිරූපණය කිරීම සඳහා ගොඩනැගිලි භාවිත කොට ඇත. සංවර්ධනය පදනම් වී ඇත්තේ, ස්ත්‍රී ශ්‍රමය මතවේ යන්න ෂෙහානිගේ චිත්‍රය පිළිබඳව ගොනුකර හැකි එක කියවීමක් වන්නේය. ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇඟලුම් ක්ෂේත්‍රය මගින් අති විශාල දායකත්වයක් ලැබේ. ඇඟලුම් ක්ෂේත්‍රයේ බහුතරයක් ශ්‍රමිකයෝ කාන්තාවන් වේ. අති විශාල කාන්තාවෝ ප්‍රමාණයක් විදේශ ශ්‍රමිකයන් ලෙස රටට විදේශ විනිමය සපයති. එම නිසා ෂෙහානිගේ චිත්‍රය සංවර්ධනය සඳහා වැයකළ අති විශාල ස්ත්‍රී ශ්‍රමය නිරූපණය වන්නක් ලෙස දැකිය හැක.

ඒ කෙසේවෙතත් ෂෙහානිගේ චිත්‍රයට අනුව, කාන්තාවන් ශ්‍රමය සපයන්නේ, ගෘහනියන් හා මව්වරුන් වශයෙන් සහ ගොවිතැනේදී පිදුරු ඔසවා ගෙන යෑමටත්, අස්වනු නෙලා ගැනීමටයත් පමණි. මේවා සාම්ප්‍රදායිකව ගැහැණිය සමඟ අනන්‍ය කර ඇති වෘත්තීන් සහ වගකීම් වේ. තමන් කරන රැකියාව බොහෝවිට ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව නිර්ණය වේ. ගැහැනුන්ට සුදුසු රැකියා මෙන්ම නුසුදුසු රැකියාද ඇත කියා අපගේ සමාජය සිතයි. මේ ආකාරයෙන් ගැහැනියගේ ශ්‍රමය එක්තරා පටු වැඩ-රාමුවක් තුල සිර වේ. ගැහැනිය පිළිබඳව මෙයාකාරයෙන් ඇති අදහස් සදාචාරාත්මක වටිනාකම්, ආර්ථිකය- සමස්තයක් වශයෙන් ගත් කළ සමාජයක බලපවත්නා දෘෂ්ටිවාදය මගින් තීරණය වේ. ෂෙහානිගේ චිත්‍රයේ ඇඟලුම් කර්මාන්ත සේවිකාවන් හෝ විදේශ ශ්‍රමිකයන් නැත්තේ මේ නිසාය.

තවද ෂෙහානිගේ චිත්‍රයේ ස්ත්‍රීන් පරමාදර්ශයක් බවට පත් කර ඇති බවක් පෙනේ. ගැහැනිය ගෙවිලියක් ලෙස දැක්වීම එක් අතකට ඇය අරුමැසිවාදී වස්තුවක් බවට පත් කිරීමක් කියා තර්ක කළ හැක. තේනුවර මහතාට අනුව මාධ්‍ය තුල බොහෝවිට ගොවිතැන සහ ගම අරුමැසිවාදී පරමාදර්ශයන් බවට පත් කරනු ලැබේ. සිංහල - හින්දු අලුත් අවුරුදු සමයේ අපට මෙය මනාව නිරීක්ෂණය කළ හැක. මාධ්‍ය මගින් ලෝකයේ හෝ නැති අරුමැසිවාදී ගමක් මවා පෙන්වනු ලැබේ. ගෙවිලියන් වර්ණවත් ඇඳුමෙන් සැරසී, ලතාවට අස්වනු නෙළා ගෙන යෑම, ඒ අරුමැසිවාදී මවාපෑමේ ම කොටසක් නොවේද? ෂෙහානිගේ චිත්‍රයේ අගය කළ යුතු සුන්දරත්වය තුල සැඟව ගිය කරුණු මේවාය.

වයඹ රාජකීය විද්‍යාලයේ වරුණි රන්ශිමාලා ගල්ලැල්ල ගේ චිත්‍රය සංවර්ධනය පිළිබඳව පරමාදර්ශීය අදහසක් නිරූපණය කරයි. තුරුලතා අතරින් ඇතින් පෙනෙන මාර්ග, උයන්, දිය පොකුණු සහ ගොඩනැගිලි අතර වැඩිහිටියන්ට ගරු කරන, මුව පොව්වන් හා සෙල්ලම් කරන, කුරුළු දාන දෙන, අත්වැසුම් දා වගා කරන යහපත් මිනිසුන්ගෙන් චිත්‍රය පිරී ඇත. සාමකාමී පලවැල නෙළා කන අලියෙක්ද පෙනෙන්නට ඇත. වරුණි ගේ චිත්‍රයේ ඉදුණු කෙසෙල් කැන, මේරූ වට්ටක්කා ඇතුළු අනෙකුත් පළා සහ පලතුරු සශ්‍රීකත්වය නිරූපණය කිරීමට යොදාගෙන ඇත. සංවර්ධනය පිළිබඳ ඇගේ සිහිනය ඉතා යහපත් එකක් බව කිසිදු සැකයක් නැත. නමුත් වරුණිගේ චිත්‍රයේ සංවර්ධනය පිළිබඳ විචාරශීලි අදසක් ඇති බවක් නොපෙනේ. සංවර්ධනය සම්බන්ධයෙන් වරුණිට ඇති සර්ව සුභවාදී හැඟීම, ඇයගේ විචාර දෘෂ්ටිය තරමක් දුරකට මොට කර ඇති බව පෙනේ. ඇයගේ චිත්‍රය සංවර්ධනය නැවත සිතාබැලීමක් කියා සැලකිය නොහැක. වරුණි ගේ චිත්‍රයේ අපි බොහෝ දුරට දකින්නේ සංවර්ධනය පිළිබඳ සුලභව අපට හමුවන අදහස්ය. සංවර්ධනය ගැන වරුණිට ඇති පරමාදර්ශීය සිහිනය සැබෑවක් වනු ඇතිදැයි යන්න සැක සහිතය.

ප්‍රථම ස්ථානය දිනාගත් චානකගේ චිත්‍රයේ මෙන්ම වරුණි ගේ චිත්‍රයේ ද සංවර්ධනය සංකේතාත්මක කිරීමට මහා මාර්ගයක් යොදා ගෙන තිබේ. ඒ මාර්ගය වැටී ඇත්තේ උයනක් වටාය. රාජපොල මධ්‍ය මහා විද්‍යාලයේ සිතාරා සුභාෂිනිගේ චිත්‍රයේද අධිවේගී මාර්ගයක් දක්නට ඇත. ඒ අධිවේගි මාර්ගයට ඉහලින් ඇති පාලම් වලින් සංවර්ධනය වෙත ළඟා වන පිරිසක් දක්නට ඇත. අධිවේගී මාර්ග හා නගරාශ්‍රිත උයන් නිර්මාණය කිරීම පසුගිය කාලයේ සංවර්ධනය ලෙස අර්ථගන්වනු ලැබීය. සමහර චිත්‍ර මෙම අදහසින් පන්නර ලබා ඇති බවක් පෙනෙන්නට ඇත. නමුත් සැබෑ සංවර්ධනය යනු මෙයද යන ප්‍රශ්නය බහුතරයක් චිත්‍ර නගන්නේ නැත.

කලුවිල සේන මහා විද්‍යාලයේ ප්‍රසන්තික මීගහගෙදර ගේ චිත්‍රයේද සංවර්ධනය නිරූපණය කරන්නේ හුදු භෞතික සංවර්ධනය ලෙසය. ඒ අතර ජාතීන් අතර සංහිඳියාවට ද තැනක් ඇත. සිංහල, දෙමළ, මුස්ලිම් යන ආගම් ත්‍රිත්වය නිරූපණය වන ලෙස, ආගමික සිද්ධස්ථාන චිත්‍රයට නගා ඇත. ගුවන් යානා, අධිවේගී දුම්රිය, දැවැන්ත ජලාශ, සන්නිවේදන කුළුණ යනාදියෙන් සංවර්ධනය නිරූපණය කරයි.

කළු සුදු වර්ණයෙන් යුත් රාහුල මහා විද්‍යාලයේ උපුලි හන්සිකාගේ චිත්‍රය, ශෛලිය පැත්තෙන් ගත් කළ අනෙක් ඒවාට වෙනස් වූවක් බව තේනුවර මහතා ප්‍රකාශ කර සිටියේය. මෙම චිත්‍රයේ භාවිත කොට ඇත්තේ කළු සහ සුදු වර්ණ පමණි. චිත්‍රයේ පහලින් දකින්නට ඇත්තේ බිත්තියක් ගොඩ නගන පෙදරේරුවන් පිරිසකි. මෙම පෙදරේරුවන්ට, තේ ගෙනෙනා තවත් පුද්ගලයෙකි. මේ පෙදරේරුවන්ට මුහුණු නැත. උපුලි කියන්නට උත්සහ කරන්නේ ශ්‍රමයට අනන්‍යතාවයක් නොමැති බවද? කාල් මාර්ක්ස් ධනපති නිෂ්පාදන මාදිලිය තුල (Capitalist mode of production) ශ්‍රමිකයා පරරෝපණය (alienation) වීම ගැන කථා කරයි. නිෂ්පාදන කාර්යය තුල ශ්‍රමිකයාට තම අනන්‍යතාවය අහිමි වීම පරාරෝපණය ලෙස අපට අවබෝධ කරගත හැක. මේ පෙදරේරුවන්ගේ ශ්‍රමය මත ගොඩනැගුනු විශාල නගරයක් පසුබිමේ ඇත. ගුවන් පාලම්, රථ වාහන, ගොඩනැගිලි පමණක් නොව, ලන්ඩන් නුවර ඇති London Eye සිහිගන්වන අති විශාල රෝදයක් ද දක්නට ලැබේ. මේ සියල්ලෙන්ම උපුලි නිරූපණය කිරීමට වෑයම් කරන්නේ සංවර්ධනයයි. තේනුවර මහතා නැවත නැවතත් අවධාරණය කර පරිදි මේ ආකාරයෙන් සංවර්ධනය නිරූපණය කිරීම සඳහා වෙනත් සංස්කෘතීන්ට අයත් වස්තු යොදා ගැනීමේ ගැටළුවක් පවතී. සංවර්ධනය පිළිබඳ මෙයට වඩා පුළුල් අවබෝධයක් පාසල් සිසුන් අතර ඇති කිරීමේ වැදගත්කම ඔහු අවධාරණය කළේය.

මාතර රාහුල විද්‍යාලයේ වෙනුර  දිල්ෂංක ද සිල්වාගේ චිත්‍රයද ශෛලිය අතින් තරමක් දුරට වෙනස් වන බව තේනුවර මහතා ප්‍රකාශ කර සිටියේය. මෙහි වර්ණ සංයෝජනයේදී භාවිත කර ඇත්ත් වර්ණ කිහිපයක් පමණි. සංවර්ධනය සඳහා අරමුණු කරගනෙ ඇත්තේ ගොඩනැගීම යන තේමාවයි. සංවර්ධනය සහ ශ්‍රමය අතර ඇති සම්බන්ධය මෙම චිත්‍රය මගින් නිරූපණය වී ඇතැයි කිව හැක. ගිනිදැල් මෙන් ඉහලට නැගෙන අත් වලින්ද ශ්‍රමය සංක්තවත් වේ. මෙම චිත්‍රයේද පෙදරේරුවන් සහ ගොඩනැගිලි ඉදි කිරීමට දායක වන කම්කරුවන් සංවර්ධනය සඳහා ප්‍රමුක දායකත්වයක් ලබා දෙන්නන් ලෙස නිරූපණය කර ඇත. චිත්‍රයේ හරි මැද ඇත්තේ අහස උසට නැගෙන කුලුනකි. ලෝකයේ රටවල් අතර උසම කුලුන හෝ උසම ගොඩනැගිල්ල නිර්මාණය කිරීම සඳහා නොතිත් තරඟයක් පවතී. තමන් සංවර්ධිත යැයි ලොවට ප්‍රදර්ශනය කරන්නේ මෙවන් තරඟ තාවකාලිකව හෝ ජය ගැනීමෙනි. ශ්‍රී ලංකාවද මෙම තරඟයට දැන් එක්වී ඇත. නමුත් කුලුන ගොඩ නැගීම සැබෑ සංවර්ධනයද යන්න සැක සහිතය.

හොඳම චිත්‍ර දහයට තේරුණු චිත්‍ර වල සාධනීය ලක්ෂණ බොහෝ ඇත. හිංසනය පිටුදැකීම, ජාතීන් අතර සංහිඳියාව අගය කිරීම, සංවර්ධනයේ මානුෂික පැතිකඩ අවධාරණය කිරීම ඒවායෙන් කිහිපයක් වේ. ඒ කෙසේ වෙතත් සංවර්ධනය යනුවෙන් අපි බහුතරයක් වටහා ගන්න ආර්ථික සංවර්ධනයේ ප්‍රතිවිපාක ගැන තම චිත්‍රයෙන් ප්‍රශ්න කරන්නේ තෙවන ස්ථානය දිනාගත් වෙනුරි පමණි. අනෙක් බොහෝ චිත්‍ර කලාත්මක වශයෙන් සාර්ථක වුවත්, අප මෙම සංවාදය තුල අවධාරණය කර ඇති පරිදි, සංවර්ධනය පිළිබඳ සාමාන්‍යකරනයන්ගෙන්, ඒකාකෘතික අදහස් වලින් ඒවා මිදී නොමැත. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තේනුවර, පාසැල් සිසුන් අතර සංවර්ධනය පිළිබඳ මෙයට වඩා පුළුල්, හරවත් සහ විචාරශීලි අවබෝධයක් ඇති කිරීමේ වැදගත්කම අවධාරණය කළේය.